
# ඉතිහාසය

## ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

## 7 ශ්‍රේණිය



සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

# ඉතිහාසය

## ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

## 7 වන ශ්‍රේණිය

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
2008

පළමුවන මුද්‍රණය: 2007

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN 978 - 955 - 654 - 088 - 8

"ආසියානු සංවර්ධන බැංකුවේ
ද්විතීය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය
මගින් මුද්‍රණය කරන ලදී."

සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

*මුද්‍රණය:*
*රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව,*
*පානළුව, පාදුක්ක.*

# පෙරවදන

නව සහශ්‍රයේ දී සිදුකළ පළමු විෂයමාලා සංශෝධනය වන මෙය පාසල් පද්ධතිය තුළ දැනට පවතින ගැටලු කිහිපයක් නිරාකරණය කර ගැනීමේ ප්‍රවේශයක් ලෙස සැලකිය හැකිය. මෙම විෂයමාලාව සැලසුම් කොට ඇත්තේ තරුණ පරපුර අද මුහුණ පා සිටින සිතීමේ, සමාජීය හා පුද්ගල දුර්වලතා මගහරවා ගැනීමේ අභිලාෂයෙනි.

ආසියාවේ අධ්‍යාපන ක්‍රමය සලකා බැලීමේ දී මෙයට වසර කිහිපයකට පෙර ශ්‍රී ලංකාව අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ බොහෝ ඉදිරියෙන් සිටියේ ය. නමුදු වර්තමානයේ දී ආසියාවේ අනෙකුත් රටවල් ශ්‍රී ලංකාව අභිබවා ඉදිරියෙන් සිටි තම දැක්මකින් තොරව පවතින දෙය මත පමණක් තීරණ ගනිමින් ඒ දේ පමණක් ම නැවත නැවත ඉදිරිපත් කිරීම මෙම පසුබෑමට එක් හේතුවකි.

මෙම තත්ත්වය මඟ හරවා ගැනීම පිණිස ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරීන් පැහැදිලි දැක්මකින් යුතුව විෂය මාලාව සංශෝධනය කිරීමට වෙර දරා ඇත. නව විෂයමාලාවේ අරමුණු සකසා ඇත්තේ ශිෂ්‍ය පරපුර විසින් දැනටමත් දන්නා දේත්, නව අදහස් හා ගවේෂණාත් මගින් අනාගතය ගොඩනගා ගැනීම පිණිස ශිෂ්‍යයන්ගේ නිපුණතා වර්ධනය කර ගැනීමට හැකිවන ආකාරයෙනි. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස ගුරුවරයාගේ කාර්ය භාරයෙහි පරිපූර්ණ වෙනසක් අත්‍යවශ්‍ය වේ. දැනට පවතින ගුරු කේන්ද්‍රීය ක්‍රමය වෙනුවට ශිෂ්‍ය කේන්ද්‍රීය, නිපුණතා පාදක, ක්‍රියාකාරකම් මූලික ක්‍රමයක් මෙම නව අධ්‍යාපන ක්‍රමයෙන් අපේක්ෂා කෙරෙන අතර ගුරුවරුන් අභයෝගවලට මුහුණ දීමට සූදානම් විය යුතු වේ.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය ගුරුවරුන්ට එවැනි ක්‍රමයක් සකසා ගැනීමට මහත්සේ උපකාරී වනු ඇතැයි යනු පූර්ණ විශ්වාසයයි. මාර්ගෝපදේශ සංග්‍රහයෙහි දී ඇති මඟ පෙන්වීම පිළිපැදීම මගින් ඔබට සාර්ථක ගුරු භවතකු වීමට හැකියාව ලැබෙනු ඇත. එය ඔබට ඉගැන්වීමේ දී මෙන් ම ශිෂ්‍යයන් ඇගයීමේ දී උපකාරී වනු ඇත. ගවේෂණය හා ගුණාත්මක යෙදුම් සම්බන්ධයෙන් දී ඇති මාර්ගෝපදේශන ශිෂ්‍යයාට උපකාරී වන ආකාරයෙන් ඉදිරිපත් කොට ඇත. එලෙසම එය විදුහල්පතිවරුන්ට කාල සටහන් පිළියෙල කිරීමේ දීත්, සීමිත සම්පත් වෙන් කර දීමේදීත් අභ්‍යන්තර අධීක්ෂණයේ දීත් මහත් සේ උපකාරී වනු නොඅනුමාන ය.

මෙම මාර්ගෝපදේශ සංග්‍රහයෙහි ඉදිරිපත් කොට ඇති දෙයට පමණක් සීමා නොවී ගුරුවරුන් නිර්මාණශීලී බව ප්‍රදර්ශනය කරමින් තමන් විසින් ම සුදුසු ක්‍රියාකාරකම් සකසා ගැනීම කළ යුතුය. මක්නිසාදයත්, මෙම මාර්ගෝපදේශ සංග්‍රහයෙහි සඳහන් ක්‍රියාකාරකම් අනුරූප හෝ ආදර්ශ වන නිසාත්, ප්‍රාදේශීයව ඇති වෙනස්කම් එම ප්‍රදේශයේ ගුරුවරුන් වඩා හොඳින් දන්නා බැවින් ඔවුනට ඒ අනුව ක්‍රියාකාරකම් සකස් කර ගත හැකිවනු ඇත.

අධ්‍යාපනඥයින්ට, ගුරු උපදේශකවරුන්ට හා බාහිර අධීක්ෂණය හා නියාමනයෙහි යෙදෙන සියලු නිලධාරීන්ට උපකාරී වන මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පිළියෙල කිරීමට සහභාගී වූ සියලු දෙනාටම මගේ කෘතඥතාවය පිළිගන්වමි.

මහාචාර්ය ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

# සංදේශය

ශ්‍රී ලංකාවේ විෂයමාලාව ප්‍රතිපත්තියට අනුව අවුරුදු අටකට වරක් පාසල් විෂය නිර්දේශ යාවත්කාලීන විය යුතුය. මේ අනුව 2007 වර්ෂයේ සිට ආරම්භ කෙරෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩ සටහන යටතේ විෂය නිර්දේශය සහ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය හඳුන්වා දෙනු ලැබේ.

මෙතෙක් පැවති විෂය නිර්දේශවල යම් විෂයකට අදාළ විෂය මාතෘකා රාශියක් ද ඒ ඒ විෂය මාතෘකාවට අදාළ විෂය කරුණු ද දක්නට ලැබුණි. මෙම විෂය කරුණු ඉගැන්වීම ගුරුවරයා ගෙන් සිදු විය. මෙම ක්‍රියාවලිය නිසා බොහෝ විෂය කරුණු දන්නා සිසු පිරිසක් බිහිවූහ.

නව විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ හඳුන්වා දෙන විෂය නිර්දේශවල ඒ විෂය යටතේ සිසුන් අත්පත් කර ගත යුතු නිපුණතා හඳුනාගෙන නිර්දේශ කර ඇත. මෙම නව ප්‍රවේශය තුළින් බොහෝ විෂය කරුණු දන්නා බවින් ඔබ්බට ගිය ප්‍රායෝගික අංශයට වඩාත් නැඹුරු නිපුණතා පිරි සිසු පරිසක් බිහිවීම අපේක්ෂා කෙරේ. එබැවින් නව විෂය නිර්දේශය භාවිත කරන ගුරු මහත්ම මහත්මීන් මෙම වෙනස පිළිබඳ විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය.

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි ක්‍රියාකාරකම් සන්තතිය නම් කොටසේ දී හමුවන නව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සහිත පන්ති කාමරයක් යෝජනා කර ඇත. මෙම ක්‍රියාවලිය යටතේ සිසුන් පුස්තකාල භාවිතය හා පොත්පත් කියවීම්, පරිසරය නිරීක්ෂණය, සම්පත් පුද්ගලයන්ගෙන් කරුණු රැස්කර ගැනීම, තම මිතුරු මිතුරියන්ගෙන් බොහෝ දේ ඉගෙනීම සහ තම යහළු යෙහෙළියන්ට තමා දන්නා දේ කියාදම, හැකි අවස්ථාවන්හි දී අන්තර්ජාලයෙන් තොරතුරු රැස් කර ගැනීම ආදී ගවේෂණාත්මක ව ඉගෙන ගන්නා සංස්කෘතියක් දැකිය හැකි විය යුතු ය. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇති පෙළපොත ද සම්පත් පොතක් ලෙස භාවිතා කළ යුතු ය. මෙසේ සොයා ගන්නා කරුණ වඩාත් නිවැරදිව සංවිධානාත්මක ව හා අංග සම්පූර්ණ ව සිසුන්ට ග්‍රහණය කරවීම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ. එබැවින් ගුරුවරයාගේ භූමිකාව ද නව දැනුමෙන් පොහොසත් වූවකු විය යුතු ය. එය සිසුන් සොයා ගන්නා සියළු කරුණු අභිබවා යන බහුශ්‍රැත භාවයක් ප්‍රදර්ශනය කරයි. මෙම ක්‍රියාකාරී ඉගෙනුම් පරිසරය, සිසුන්ට බෙහෙවින් ආකර්ශනය වනු ඇත.

මේ සඳහා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ යෝජනා කර ඇති පාඩම් තවත් බොහෝ පාඩම් සකස් කර ගැනීමට මග පෙන්වීමක් බව සිතන්න. මේවා ඇසුරෙන් නිර්මාණශීලී ගුරුවරයකු ලෙස නව පාඩම් සකස් කර ගැනීම විශේෂයෙන් අපේක්ෂා කෙරේ.

නව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී හැම විට ම සිසුන් ක්‍රියාකාරීය, එබැවින් ඔවුන්ගේ දක්ෂතා හා ප්‍රබලතා ප්‍රදර්ශනය වෙයි. ඒවා අගය කරන්න. දිරිමත් කරන්න. තව ද ඇතැම් විට සිසුන් මුහුණ දෙන දුෂ්කරතා ද ඔබට දක්නට ලැබේ. ඒ හැමවිටම එම දුෂ්කරතා ඉවත් කර ගැනීමට උදව් කරන්න. ආසන්න මිතුරු මිතුරියන්ට උදවු කිරීමට යොමු කරන්න. මෙසේ පාඩමත් සමඟ කෙරෙන තක්සේරු ක්‍රියාවලිය වඩාත් ඵලදායි ඉගෙනුමකට හේතු වේ.

තව ද මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ යෝජනා කර ඇති ඉගෙනුම් දීර්ඝ කිරීමේ පැවරුම් හා අභ්‍යාස සිසුන් උගත් දේ තව දුරටත් ශක්තිමත් කිරීමට සමත්වන ආකාරය ගැන අවධානය යොමු කරන්න. එම සිසුන් මෙසේ ඇගයීම් කළ හැකි හොඳ අවස්ථාවක් ලෙසට සලකන්න. මෙබඳු තවත් ඉගෙනුම් දීර්ඝ කිරීමේ බොහෝ අභ්‍යාසවල සිසුන් යොමු කිරමට සැලකිලිමත් වන්න.

විමල් සියඹලාගොඩ
සහකාර අධ්‍යක්ෂ ජනරාල්
(භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

# පටුන


පිටු අංක

**පෙරවදන** iii
**සංඥාපනය** iv
**නාමාවලිය** vi
**හැඳින්වීම** vii

**විෂය නිර්දේශය ( පළමුවන කොටස )**
1.0 හැඳින්වීම 1
2.0 7 ශ්‍රේණියට අදාළ විෂයයේ අරමුණු 2
3.0 විෂය නිර්දේශය 3 - 11
4.0 පාසැල් ප්‍රතිපත්ති හා වැඩ සටහන් 12

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය ( දෙවන කොටස )**
හැඳින්වීම 14 - 16
ඉතිහාසය ඉගැන්වීමේ උපාය මාර්ග 17
7.1 පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාර 18 - 43
7.2 ශිෂ්ටාචාර ව්‍යාප්තිය 44 - 68
7.3 දකුණු ඉන්දියානු ආක්‍රමණ හා අනුරාධපුර රාජධානියේ බිඳ වැටීම 69 - 95
7.4 පොළොන්නරු රාජධානිය 96 - 115
7.5 මධ්‍යකාලීන යුරෝපය 116 - 132
7.6 පොළොන්නරුව බිඳ වැටීමෙන් පසු ශ්‍රී ලංකාව 133 - 150

**තක්සේරුව හා ඇගයීම ( තුන්වන කොටස )**
හැඳින්වීම 152 - 153
ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය දීර්ඝ කිරීමේ උපකරණ 154 - 162

# නාමාවලිය

උපදේශක මණ්ඩලය

| | | |
|---|---|---|
| මහාචාර්ය ජේ.ඩබ්. වික්‍රමසිංහ මයා | - | අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| විමල් සියඹලාගොඩ මයා | - | සහකාර අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| මහාචාර්ය මාලනී ඇඳගම මිය | - | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |
| මහාචාර්ය එම්.යූ. ද සිල්වා මයා | - | රුහුණු විශ්ව විද්‍යාලය |
| මහාචාර්ය ඉන්ද්‍රාණි මුණසිංහ මිය | - | කොළඹ විශ්ව විද්‍යාලය |
| ආචාර්ය එස්. අනුෂියා මිය | - | අග්නිදිග විශ්ව විද්‍යාලය |
| ටී. රාජේන්ද්‍රන් මයා | - | විවෘත විශ්ව විද්‍යාලය |

අධ්‍යක්ෂණය

| | | |
|---|---|---|
| යූ. නවරත්නම් මයා | - | අධ්‍යක්ෂ, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |

සම්බන්ධීකරණය

| | | |
|---|---|---|
| ඩී.එච්. චන්දිමා නිෂානි ධර්මපාල මිය | - | ව්‍යාපෘති නායක - ඉතිහාසය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය |

ලේඛක මණ්ඩලය

| | | |
|---|---|---|
| බී.එල්.ආර්. රෝහණ කුමාර මයා | - | ජාතික අධ්‍යාපන ආයතනය (විශ්‍රාමික ) |
| එස්.එම්. දයානන්ද මයා | - | ජාතික අධ්‍යාපන ආයතනය (විශ්‍රාමික ) |
| සී.එස්. ජයසිංහ මයා | - | ගුරු මධ්‍යස්ථානය, හොරණ |
| ඒ.ඉන්ද්‍රානි මිය | - | ර/ජේසු බිළින්දාගේ කන්‍යාරාමය, ජාපා.,<br>රත්නපුර |
| ජේ.වී. කාන්ති මිය | - | කලාප කාර්යාලය, පානදුර |
| නන්දා මනම්පේරි මිය | - | ශාන්ත ජෝසප් බාලිකා ම.වි., කෑගල්ල |
| ආර්.ඩබ්.එස්. දෑල මිය | - | ද මැසනඩ් විද්‍යාලය, කඳාන |
| මංජරී පුංචිහේවා මිය | - | සිරිමාවෝ බණ්ඩාරනායක බාලිකා විද්‍යාලය,<br>හගුරන්කෙත |
| එස්.ඒ.එන්. පෙරේරා මිය | - | කෑ/ රන්වල මහානාග ම.වි., කෑගල්ල |
| එච්. වීරරත්න මයා | - | ගුරු උපදේශක, (විශ්‍රාමික) |
| යූ.එල්. ශිෂර්ඩීන් මරික්කාර් මයා | - | භාරතී දෙමළ මහා විදුහල, වත්තේගම |
| එස්. බාලසුන්දරම් මිය | - | ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව |
| එන්. සිතම්පරනාදන් මයා | - | ජාතික අධ්‍යාපන ආයතනය (විශ්‍රාමික) |
| එන්. එම්.එම්. මොහිදීන් මයා | - | ගුරු උපදේශක ( විශ්‍රාමික ) |

| | | |
|---|---|---|
| සිතියම් | - | කේ.එල්.ඒ. ගීතානි මෙනවිය - ජාතික අධ්‍යාපන ආයතනය |
| පරිඝනක පිටු සැකසුම | - | දිල්හානි පෙරේරා මිය |
| පිට කවරය | - | සන්ධ්‍යා අතපත්තු මෙනවිය |
| විවිධ සහාය | - | එම්.එන්.එෆ්. රිහානා මෙනවිය |
| | - | ශිරානි සමරක්කොඩි මිය |
| | - | ආර්.එම්. රූපසිංහ මයා |

# හැඳින්වීම

2007 වසරේ සිට ක්‍රියාත්මක වීමට නියමිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුකූලව නව ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයක් හඳුන්වා දී ඇත. මෙය ඒ අනුව සැකසූ 7 වන ශ්‍රේණිය ඉතිහාසය විෂය සඳහා වූවකි.

මෙම මාර්ගෝපදේශ සංග්‍රහය කොටස් තුනකින් සමන්විත වේ. ඒ අනුව පළමු කොටස විෂය නිර්දේශය ලෙස ද, දෙවන කොටස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද ලෙස ද, තෙවන කොටස ඇගයීම් ලෙස ද සඳහන් වේ. විෂය නිර්දේශ තුළින් 7 ශ්‍රේණිය ඉතිහාසය විෂය සඳහා අදාළ විෂය අන්තර්ගතය සඳහන් කර ඇති අතර දෙවන කොටස මගින් ඊට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද යෝජනා කර ඇත. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය මගින් අපේක්ෂිත ඉගෙනුම් ඵල සිසුන් විසින් ලඟා කර ගැනීම තහවුරු කර හඳුනා ගැනීම සඳහා තක්සේරුව හා ඇගයීම උපකාර වනු ඇත.

මෙහි දී සැලකිලිමත් විය යුතු කාරණයක් වන්නේ විෂය අන්තර්ගතය සම්පූර්ණයෙන් ම ආවරණය වන පරිදි ක්‍රියාකාරකම් සකසා නොමැති බවයි. මෙහි ඉදිරිපත් කර ඇත්තේ ආදර්ශ කිහිපයක් පමණි. එම ආදර්ශ සැලකිල්ලට ගනිමින් ඔබ ක්‍රියාකාරකම් සැකසීම ද කළ යුතු අතර ඉදිරිපත් කර ඇති ආදර්ශ ක්‍රියාකාරකම් ද ඔබගේ නිර්මාණශීලීත්වය අනුව සංවර්ධනය කර ගැනීමට හැකි ය.

ඒ අනුව ඉතිහාසය විෂයේ අරමුණු ඉටු කරමින් නිපුණතා සපිරි නව ලොවට උචිත සිසු පිරිසක් බිහි කිරීමට අත්වැලක් සැපයීම මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය තුළින් ලැබෙනු ඇතැයි අපේක්ෂා කරමු.

ඉතිහාසය විෂය කමිටුව

1. ර මු නී ස 070836
2. ර. මු. නී. ස. 070836
3. ර. මු. නී. ස. 070836
4. ර. මු. නී. ස. 070836
5. ර. මු. නී. ස. 070836
6. ර. මු. නී. ස. 070836
7. ර. මු. නී. ස. 070836
8. ර. මු. නී. ස. 070836
9. ර. මු. නී. ස. 070836
10. ර. මු. නී. ස. 070836
11. ර. මු. නී. ස. 070836
12. ර. මු. නී. ස. 070836
13. ර. මු. නී. ස. 070836
14. ර. මු. නී. ස. 070836
15. ර. මු. නී. ස. 070836
16. ර. මු. නී. ස. 070836
17. ර. මු. නී. ස. 070836
18. ර. මු. නී. ස. 070836
19. ර. මු. නී. ස. 070836
20. ර. මු. නී. ස. 070836
21. ර. මු. නී. ස. 070836
22. ර. මු. නී. ස. 070836

## පළමුවන කොටස

# විෂය නිර්දේශය

# 1.0 හැඳින්වීම

ඉතිහාසය ඉගෙනීම මානව ශිෂ්ටාචාරයේ වර්ධනයේ දී සිදු වූ දේශපාලන, ආර්ථික, සමාජීය, ආගමික සහ සංස්කෘතික ක්ෂේත්‍රවල මතුවන ගැටළුවල සහ ජයග්‍රහණවල විවිධාකාර වූ ස්වභාවය තුලනාත්මක ව හා විවේචනාත්මක ව අවබෝධ කොට ගැනීමයි. එය පරිසරය හා ජාතික උරුමයන් රැක ගනිමින් සියලු මනුෂ්‍ය වර්ගයාට එක් ව විසීමට හැකි යහපත් සමාජයක් ගොඩ නැගීමේ අරමුණු පෙරදැරි වන්නක් ද විය යුතුය.

2007 වසරේ සිට ක්‍රියාත්මක වීමට නියමිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරන තුළින් ද හයවන ශ්‍රේණියේ සිට එකොළොස්වන ශ්‍රේණිය දක්වා ඉතිහාසය පාසල් විෂය මාලාවට හර විෂයක් ලෙසින් ඇතුළත් කර ඇත. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ හඳුන්වා දෙන පාසල් විෂය මාලාව නිපුණතා පදනම් කර ගෙන සකස් වූවකි. ඒ අනුව හයවන ශ්‍රේණියේ සිට එකොළොස්වන ශ්‍රේණිය දක්වා වූ ඉතිහාසය විෂය මාලාව ද සැලසුම් කිරීමේදී ද හඳුනාගත් විෂය නිපුණතා පදනම් කරගෙන සකස් කරන ලදී.

හත්වන ශ්‍රේණිය සඳහා වූ මෙම විෂය නිර්දේශය එහි ප්‍රතිඵලයකි. මෙය 2008 වසරේ සිට ක්‍රියාත්මක වීමට නියමිතයි. තේමා හයකින් සමන්විත වූ මෙම විෂය නිර්දේශයට ශ්‍රී ලංකාව හා ලංකාව සම්බන්ධයෙන් බලපෑමක් ඇති කළ ලෝකයේ ඓතිහාසික සිදුවීම් ද තේමා සඳහා තෝරා ගෙන ඇත. ඒ අනුව හත්වන ශ්‍රේණිය සඳහා ලෝකයේ පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාර බිහිවීම හා ඒවා ව්‍යාප්තවීම, ශ්‍රී ලංකාවට එල්ල වූ දකුණු ඉන්දීය ආක්‍රමණ සහ අනුරාධපුර රාජධානිය බිඳ වැටීම, පොළොන්නරු රාජධානිය, මධ්‍යකාලීන යුරෝපය හා මධ්‍යකාලීන ශ්‍රී ලංකාව යන තේමා අධ්‍යයනයට යොමු කර ඇත.

එමෙන් ම හයවන ශ්‍රේණියේ සිට එකොළොස්වන ශ්‍රේණිය දක්වා වූ විෂයමාලාව අධ්‍යයනය කිරීම තුළින් පහත සඳහන් නිපුණතා සිසුන් ලගා කර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- ඓතිහාසික විකාශය හා ප්‍රවණතා පිළිබඳ විමර්ශනයෙහි යෙදෙයි
- වර්තමානය තේරුම් ගැනීම සඳහා අතීතය පිළිබඳ විමර්ශනාත්මක දැනුම උපයෝගී කර ගනියි
- ජාතික ගැටලු  දෙස තුලනාත්මක ව බලමින් කටයුතු කරයි
- වැදගත් ඓතිහාසික පුද්ගලයන්ගේ චරිතාපදාන ආදර්ශයට ගෙන කටයුතු කරයි.
- ජාතික අනන්‍යතාවය හඳුනාගෙන ඒවා අගය කරමින් චරිතායතනය කර ගනියි.
- ඉතිහාසය අත්දැකීම් වර්තමාන සංසිද්ධීන් සඳහා ඵලදායීව භාවිත කරයි.
- ශ්‍රී ලංකාවේ ඓතිහාසික වටිනාකම හා හර පද්ධතීන් පිළිබඳ අභිමානවත් හැඟුමෙන් කටයුතු කරයි.
- විචාරශීලී හා විවේචනාත්මක චින්තන සංකල්ප වර්ධනය කර ගනියි.
- ඓතිහාසික තොරතුරු ඇසුරින් ස්ථාන හඳුනා ගැනීමේ හැකියාව දියුණු කර ගනියි.

## 2.0 7 ශ්‍රේණියට අදාළ විෂයයේ අරමුණු

- පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාර පිළිබඳ තොරතුරු අධ්‍යයනය කිරීම
- ශිෂ්ටාචාර ව්‍යාප්තිය සිදු වූ ආකාරය විස්තර කිරීම.
- දකුණු ඉන්දිය බලපෑම් සහ එය අනුරාධපුර රාජධානිය බිඳ වැටීමට හේතු වූ අයුරු විස්තර කිරීම.
- පොළොන්නරු රාජධානියේ වැදගත් වූ පාලකයන්ගේ දේශපාලන, ආර්ථික හා සංස්කෘතික සේවාවන් පිළිබඳ අධ්‍යයනය කිරීම.
- පොළොන්නරු රාජධානිය බිඳ වැටීමට තුඩුදුන් හේතු විමසා බැලීම.
- මධ්‍යකාලීන යුරෝපයේ ඇති වූ දේශපාලන, සමාජ, ආර්ථික වෙනස්වීම් විමසා බැලීම.
- මධ්‍යකාලීන ශ්‍රී ලංකාවේ වැදගත් ඓතිහාසික සිදුවීම් විමසා බැලීම.

## 3. විෂය නිර්දේශය

### 7.1 පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාර

| නිපුණතා | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| • ලෝක ශිෂ්ටාචාරවල ආරම්භය, වර්ධනය හා ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයනය කර ඉන් පසුකාලීන ශිෂ්ටාචාර ලද උරුම විමර්ශනය කරයි. | • සරුපස, තැනිතලාව හා ජල පහසුව යන කෘෂිකර්මයට හිතකර හේතු අරමුණු කර ගනිමින් මුල් පදිංචිය සඳහා ගංගා නිම්න තෝරා ගත් අයුරු විමර්ශනය කරයි.<br>• පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාරය- යන්හි ව්‍යාප්තිය හා සම්බන්ධ තොරතුරු ඇසුරින් සිතියම් ලකුණු කිරීමේ හැකියාව වර්ධනව කර ගනියි.<br>• පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාර වල සුවිශේෂ ලක්ෂණ විමසා බලයි.<br>• ගංගා නිම්න ශිෂ්ටාචාරවලින් පසු කාලීන ශිෂ්ටාචාරයන්ට ලැබුණ දායාද පිළිබඳ අධ්‍යනය කර ඒවා තවදුරටත් පෝෂණය කිරීමට දායක වෙයි. | 7.1 පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාර<br>7.1.1 පදිංචිය සඳහා ගංගා නිම්න තෝරා ගැනීමට හේතු<br>7.1.2 ගංගා නිම්න ආශ්‍රිතව බිහි වූ ශිෂ්ටාචාර<br>යුප්‍රටීස් - ටයිග්‍රීස් - මෙසපොතේමියාව<br>නයිල් - මිසර<br>සින්ධු - ඉන්දු නිම්න<br>හොවැංහෝ - චීන<br>7.1.2.1 මෙසපොතේමියානු ශිෂ්ටාචාරය<br>- පිහිටීම හා ව්‍යාප්තිය<br>- සුවිශේෂ ලක්ෂණ<br>• පාලන ක්‍රමය<br>• ආර්ථික ක්‍රමය<br>• ආගමික ඇදහිලි හා විශ්වාස<br>• සංස්කෘතිය<br>- පසුකාලීන ශිෂ්ටාචාරයන්ට ලැබුණු දායාද<br>7.1.2.2 මිසර ශිෂ්ටාචාරය<br>- පිහිටීම හා ව්‍යාප්තිය<br>- සුවිශේෂ ලක්ෂණ<br>• පාලන ක්‍රමය | 10 |

| නිපුණතා | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
| --- | --- | --- | --- |
| | | • ආර්ථික ක්‍රමය<br>• ආගමික ඇදහිලි හා විශ්වාස<br>• සංස්කෘතිය<br>- පසුකාලීන ශිෂ්ටාචාරයන්ට ලැබුණු දායාද<br>7.1.2.3 ඉන්දු නිම්න ශිෂ්ටාචාරය<br>- පිහිටීම හා ව්‍යාප්තිය<br>- සුවිශේෂ ලක්ෂණ<br>• පාලන ක්‍රමය<br>• ආර්ථික ක්‍රමය<br>• ආගමික ඇදහිලි හා විශ්වාස<br>• සංස්කෘතිය<br>- පසුකාලීන ශිෂ්ටාචාරයන්ට ලැබුණු දායාද<br>7.1.2.4 චීන ශිෂ්ටාචාරය<br>- පිහිටීම හා ව්‍යාප්තිය<br>- සුවිශේෂ ලක්ෂණ<br>• පාලන ක්‍රමය<br>• ආර්ථික ක්‍රමය<br>• ආගමික ඇදහිලි හා විශ්වාස<br>• සංස්කෘතිය<br>- පසුකාලීන ශිෂ්ටාචාරයන්ට ලැබුණු දායාද | |

## 7.2 ශිෂ්ටාචාර ව්‍යාප්තිය

| නිපුණතා | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| • ලෝක ශිෂ්ටාචාරවල ආරම්භය, වර්ධනය හා ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයනය කර ඉන් පසුකාලීන ශිෂ්ටාචාර ලද උරුම විමර්ශනය කරයි. | • ග්‍රීක හා රෝම ශිෂ්ටාචාර පිළිබඳ තොරතුරු විමසා බලයි. | 7.2 ශිෂ්ටාචාර ව්‍යාප්තිය<br>7.2.1 ග්‍රීසිය<br>- ආරම්භය හා ව්‍යාප්තිය<br>- පාලන කටයුතු<br>• වහල් ක්‍රමය<br>• පෞර රාජ්‍යය<br>• ප්‍රජාතන්ත්‍රවාදයේ ආරම්භය<br>- කෘෂිකර්මය හා වෙළෙඳ කටයුතු<br>- නිදහස් චින්තනය<br>• දාර්ශනිකයෝ<br>• විද්‍යාඥයෝ<br>• චින්තකයෝ<br>- ආගම<br>- කලාව<br>- ජන ජීවිතය<br>- මහා ඇලෙක්සැන්ඩර් රජුගේ නැගීම ( අධිරාජ්‍ය ව්‍යාප්තිය ) | 10 |

| නිපුණතා | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | | 7.2.2 රෝමය<br>- ආරම්භය හා ව්‍යාප්තිය<br>- පාලන ක්‍රමය - ගෝත්‍ර, සමූහාණ්ඩු, අධිරාජ්‍යය<br>- නීතිය හා නීතියේ පාලනය<br>- ආගම<br>- වෙළෙඳාම - කාසි භාවිතය, අභ්‍යන්තර වෙළෙඳාම<br>- ජන ජීවිතය<br>- ප්‍රායෝගිකත්වයට නැඹුරුව<br>උදා : ග්‍රීසියේ න්‍යායාත්මකව පැවති දේ රෝමයේ ප්‍රායෝගිකත්වයට නැඹුරු කිරීම. | |
| | • ඉන්දියානු ශිෂ්ටාචාරයේ කැපී පෙනෙන ලක්ෂණ විමර්ෂණය කරයි. | 7.2.3 ඉන්දියාව<br>- වෛදික යුගයේ සිට මගධ අධිරාජ්‍ය දක්වා<br>• ගෝත්‍ර අවධිය<br>• සොළොස් මහා ජනපද අවධිය<br>• අධිරාජ්‍ය අවධිය | |

| නිපුණතා | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | | - සුවිශේෂ ලක්ෂණ<br>• ආගමික චින්තනයේ වර්ධනය<br>* හින්දු<br>* ජෛන<br>* බෞද්ධ<br>- සාහිත්‍ය හා කලාව<br>• වීර කාව්‍ය<br>• දේශපාලන චින්තනය<br>- සමාජ සංවිධානය<br>• චතුර්වර්ණ<br>- ආර්ථිකය<br>• කෘෂිකර්මය<br>• වෙළෙඳාම<br>• කර්මාන්ත<br>- අධ්‍යාපනය | |
| | • අරාබි ශිෂ්ටාචාරයේ ආරම්භයේ සිට එහි ව්‍යාප්තියේ කැපී පෙනෙන ලක්ෂණ විමර්ෂණය කරයි. | 7.2.4 අරාබිය<br>- ආරම්භය හා ව්‍යාප්තිය<br>- ඉස්ලාම් ධර්මයේ ව්‍යාප්තිය<br>- භාෂාව හා සාහිත්‍ය<br>- වෙළෙඳාම<br>- විද්‍යාව හා වෛද්‍ය කටයුතු<br>- කර්මාන්ත<br>- ගෘහ නිර්මාණ<br>- ජන ජීවිතය | |

## 7.3 දකුණු ඉන්දීය ආක්‍රමණ හා අනුරාධපුර රාජධානිය බිඳවැටීම

| නිපුණතා | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| • ශ්‍රී ලංකාවට එල්ල වූ විදේශීය ආක්‍රමණවල පසුබිම හා එහි බලපෑම පිළිබඳ විමසා බලා එවැනි ආක්‍රමණකාරී තත්වයන්ට මුහුණදීම සඳහා ශක්තිමත් වෙයි. | • ශ්‍රී ලංකාවට විවිධ බලපෑම් ඇති වූ දකුණු ඉන්දීය රාජ්‍යයන් පිළිබඳ ඓතිහාසික තොරතුරු ඇසුරින් සිතියම් ලකුණු කිරීමේ හැකියාව දියුණු කරගනියි. | 7.3 දකුණු ඉන්දීය ආක්‍රමණ හා අනුරාධපුර රාජධානිය බිඳවැටීම<br>7.3.1 දකුණු ඉන්දීය රාජ්‍ය හා එහි බලපෑම<br>- ශ්‍රී ලංකාවට විවිධ බලපෑම් ඇති කළ දකුණු ඉන්දීය රාජ්‍යයන් | 02 |
| | • ශ්‍රී ලංකාව දකුණු ඉන්දීය රාජ්‍ය සමඟ පැවැත්වූ සම්බන්ධතාවල ස්වභාවය විමසා බලයි. | - දකුණු ඉන්දීය රාජ්‍ය සමඟ පැවැත්වූ සම්බන්ධතාවල ස්වභාවය<br>• රාජ්‍ය තාන්ත්‍රික<br>• ආගමික හා සංස්කෘතික<br>• ආර්ථික | |
| | • අනුරාධපුර රාජධානියේ බිඳ වැටීමට දකුණු ඉන්දීය ආක්‍රමණ බලපෑ ආකාරය විග්‍රහ කරයි. | 7.3.2 දකුණු ඉන්දීය ආක්‍රමණ<br>- ශ්‍රී ලංකාව දකුණු ඉන්දීය ආක්‍රමණවලට ලක්වීමට හේතු<br>- ශ්‍රී ලංකාවට එල්ල වූ දකුණු ඉන්දීය ආක්‍රමණවල ස්වභාවය<br>• අදියර1- අවස්ථාවාදී ආක්‍රමණ පාලනයට අනුගත වීම<br>• අදියර2- ආර්ථික වාසි ලබා ගැනීම සඳහා<br>• අදියර 3 - දේශපාලන ආධිපත්‍ය සඳහා | 02 |
| | • අනුරාධපුර බිඳ වැටීම හා ශ්‍රී ලංකාවේ චෝළ පාලනය ක්‍රියාත්මක වූ අයුරු පැහැදිලි කරයි | 7.3.3 අනුරාධපුර රාජධානිය බිඳ වැටීම හා චෝළ ආධිපත්‍යය<br>- අනුරාධපුර රාජධානිය බිඳ වැටීමට හේතු<br>- චෝළ අධිපත්‍යය පිහිටුවීම<br>- චෝළ පාලනය ක්‍රියාත්මක වූ ආකාරය (මුන්මුඩි චෝළමණ්ඩලම් ) | 02 |

# 7.4 පොළොන්නරුව රාජධානිය

| නිපුණතා | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| • ශ්‍රී ලංකාවේ විවිධ කාලවකවානුවල සිදු වූ දේශපාලන සංසිද්ධීන් විමර්ශණය කරමින් ඉන් ලද ආභාෂයන් වර්ථමානය හා අනාගතය සාර්ථක කරගැනීමට ඵලදායීව භාවිත කරයි.<br>• ශ්‍රී ලංකාවේ විවිධ කාලවකවානුතුල ඇති වූ සමාජ, ආර්ථික හා සංස්කෘතික ප්‍රවනතාවන් පිළිබඳ විමසා බලා ජාතික උරුමයන් හා ජාතික අනන්‍යතාවය රැක ගැනීමට පෙළඹෙයි | • පළමුවැනි විජයබාහු, මහා පරාක්‍රමබාහු රජවරුන්ගේ කාර්ය සාපල්‍ය විග්‍රහ කරයි.<br>• පොළොන්නරු යුගයේ අවසාන ශ්‍රේෂ්ඨ පාලකයා වශයෙන් නිශ්ශංකමල්ල රජතුමාගේ කාර්ය සාපල්‍ය විග්‍රහ කරයි.<br>• පොළොන්නරු රාජධානියට නායකත්වය දුන් කාන්තාවන්ගේ දේශපාලන කටයුතු විමර්ශනය කරයි. | 7.4පොළොන්නරුව රාජධානිය<br>7.4.1 පොළොන්නරු යුගයේ පාලකයන් සහ ඔවුන්ගේ කාර්ය සංසිද්ධීන්<br>- පළමුවැනි විජයබාහු රජු<br>- මහා පරාක්‍රමබාහු රජු<br>- නිශ්ශංකමල්ල රජු<br>- ලීලාවතී රැජිණ | 09 |
| • ශ්‍රී ලංකාවට එල්ල වූ විදේශීය ආක්‍රමණවල පසුබිම හා එහි බලපෑම පිළිබඳ විමසා බලා එවැනි ආක්‍රමණකාරී තත්වයන්ට මුහුණදීම සඳහා ශක්තිමත් වෙයි. | • රජරට ශිෂ්ටාචාරයේ පරිහානියට මාඝගේ ආක්‍රමණය බලපෑ අයුරු විමර්ශනය කරයි<br>කරයි. | 7.4.2 මාඝ ආක්‍රමණය<br>- ආක්‍රමණයේ ස්වභාවය<br>- මාඝගේ පාලනය<br>7.4.3 පොළොන්නරුව බිඳ වැටීම<br>- බිඳ වැටීමට හේතු | 06 |

## 7.5 මධ්‍යකාලීන යුරෝපය

| නිපුණතා | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| • ලෝක ඉතිහාසය හැඩගැසීමට බලපෑ යුරෝපා බලවේග පිළිබඳ විමර්ශනය කරයි | • ක්‍රිස්තු ධර්මයේ ආරම්භය හා ව්‍යාප්තිය පිළිබඳ තොරතුරු විග්‍රහ කරයි | 7.5 මධ්‍යකාලීන යුරෝපය<br>7.5.1 ක්‍රිස්තු ධර්මයේ ව්‍යාප්තිය<br>- ක්‍රිස්තු ධර්මයේ ආරම්භය<br>- එය රෝම අධිරාජ්‍යයේ රාජ්‍ය ආගම බවට පත්වීම.<br>- පාප් වහන්සේ සහ ක්‍රිස්තු සභාව | 02 |
| | • වැඩවසම් යුගයේ යුරෝපයේ පැවැති දේශපාලන, ආර්ථික හා සමාජ ව්‍යුහය පිළිබඳ විග්‍රහ කරයි. | 7.5.2 වැඩවසම් ක්‍රමය<br>- ආරම්භය<br>- මූලික ලක්ෂණ<br>- පරිහානිය | 02 |
| | • කුරුස යුද්ධ වලට හේතු සහ ප්‍රතිඵල විග්‍රහ කරයි. | 7.5.3 කුරුස යුද්ධ<br>- හැඳින්වීම<br>- කුරුස යුද්ධවල බලපෑම | 02 |

## 7.6 පොළොන්නරුව බිඳවැටීමෙන් පසු ශ්‍රී ලංකාව

| නිපුණතා | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| • ශ්‍රී ලංකාවේ විවිධ කාලවකවානුවල සිදුවූ දේශපාලන සංසිද්දීන් විමර්ශණය කරමින් ඉන් ලද ආභාෂයන් වර්ථමානය හා අනාගතය සාර්ථක කරගැනීමට එලදායීව භාවිතකරයි. | • ශ්‍රී ලංකාවේ රාජධානී විතැන් වීම කෙරෙහි බලපෑ හේතු සාධක විග්‍රහ කරයි<br>• දහතුන්වන සියවසේ සිට පහළොස්වන සියවස දක්වා සිටි වැදගත් පාලකයින්ගේ දේශපාලන සේවාවන් විග්‍රහ කරයි. | 7.6 පොළොන්නරුව බිඳ වැටිමෙන් පසු ශ්‍රී ලංකාව<br>7.6.1 ශ්‍රී ලංකාවේ රාජධානි විතැන් වීම<br>- දඹදෙණිය, යාපහුව, කුරුණෑගල ගම්පොළ, කෝට්ටේ<br>- ප්‍රධාන රජවරුන්ගේ දේශපාලන සංසිද්ධීන් | 05 |
| • ශ්‍රී ලංකාවේ විවිධ කාලවකවානුතුල ඇති වූ සමාජ, ආර්ථික හා සංස්කෘතික ප්‍රවනතාවන් පිළිබඳ විමසා බලා ජාතික උරුමයන් හා ජාතික අනන්‍යතාවය රැක ගැනීමට පෙළඹෙයි. | • දහතුන්වන සියවසේ සිට පහළොස්වන සියවස දක්වා ශ්‍රී ලංකාවේ ජීවන රටාව ආගමික හා සාහිත්‍ය කටයුතු පිළිබඳ තොරතුරු විග්‍රහ කරයි. | 7.6.2 ජීවන රටාව<br>7.6.3 ආගමික දියුණුව හා සාහිත්‍ය | 05 |
| | • යාපනය රාජ්‍යයේ ප්‍රධාන පාලකයන් පිළිබඳ විමර්ෂණය කරයි. | 7.6.4 යාපනය රාජධානිය | 02 |

# 4.0 පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්

ඉතිහාසය විෂය නිර්දේශයේ අන්තර්ගතය විෂය කරුණු සාර්ථක ව හා ඵලදායී ලෙස අධ්‍යයනය කිරීමටත් ඒ තුළින් ඉගෙනුම් අත්දැකීම් ලබා ගැනීම සඳහාත් ශිෂ්‍ය සහභාගීත්වය වර්ධනය වන ආකාරයට පාසල් වැඩ සටහන් සම්පාදනය කර ගැනීම අතිශයින් ම ප්‍රයෝජනවත් ය.

මෙහි යෝජනා කොට ඇත්තේ එවැනි පාසල් වැඩ සටහන් කිහිපයක් පමණි. මේ අනුව වෙනත් නිර්මාණාත්මක වැඩ සටහන් හා ප්‍රතිපත්ති සකස් කර ගැනීමේ නිදහස ඉතිහාසය උගන්වන ගුරුවරයාට හිමි වන බව සලකන්න.

- ඉතිහාසය සංගමයක් පිහිටුවමෙන් සිසු දැනුම ප්‍රවර්ධනය සඳහා සාකච්ඡා, සම්මන්ත්‍රණ වාද විවාද, ප්‍රදර්ශන, සඟරා, බිත්ති පුවත්පත් නිර්මාණය යන කාර්යයන්ට යොමු කළ හැකි ය.
- යටත් පිරිසෙයින් වසරකට වරක්වත් ඓතිහාසික වැදගත්කමකින් යුත් ස්ථානයකට හෝ ප්‍රදේශයකට අධ්‍යාපන චාරිකා සංවිධානය කළ හැකිය. පන්ති කාමරයේ දී ලබා ගත් දැනුම තහවුරු කර ගැනීමට හා වර්ධනය කර ගැනීමට හැකි වන පරිදි පූර්ව සැලසුමකින් යුතු ව අධ්‍යාපන චාරිකා සංවිධානය කිරීම වැදගත් වෙයි.
- පුද්ගල සම්මන්ත්‍රණ මගින් දිවයිනේ පිළිගත් ඉතිහාසඥයින් පාසලට කැඳවා ඔවුන්ගේ අත්දැකීම් බෙදා හදා ගැනීමට අවස්ථා සැලසිය හැකිය.
- පුරා වස්තු විනාශයට යමින් පවතන මෙවන් යුගයක ප්‍රදේශයේ පුරා විද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්මාරක පිළිබඳ සොයා බැලීම හා ඒවා ආරක්ෂා කිරීම සඳහා පාසල හා සම්බන්ධ ප්‍රජා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට පුළුවන.
- ඉතිහාසය පාඩම්වලට අදාළ වන චිත්‍ර, මූර්ති, කැටයම් හා වෙනත් කෞතුක වස්තු නිරීක්ෂණය කිරමටත්, නිරීක්ෂණ වාර්තා සැපයීමටත් හැකි වන පරිදි කෞතුකාගාර වැඩ සටහන් සංවිධානය කිරීම යෝග්‍ය වෙයි.

දෙවන කොටස

# ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

## හැඳින්වීම

මෙම පාඨමාලාවට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය තීරණය කිරීමේ දී ගවේෂණය පදනම් කර ගෙන සිසු නිපුණතා ගොඩ නැගීමට හැකි වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම් සැලසුම් කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. නිපුණතා පාදක අධ්‍යාපනය සඳහා මෙසේ සූදානම් වීමේ දී ගුරු භූමිකාවේ ද පැහැදිලි වෙනසක් අපේක්ෂා කෙරේ.

ඈත අතීතයේ සිට අපේ පන්ති කාමරවල බහුල ව ක්‍රියාත්මක වූ සම්ප්‍රදායික සම්ප්‍රේෂණ භූමිකාව ( TRANSMISSION ROLE ) හා පසු කාලීනය හඳුන්වා දෙනු ලැබූ ගනුදෙනු භූමිකාව (TRANSACTION ROLE ) වර්තමාන පන්ති කාමර තුළ තවමත් කැපී පෙනේ. පාසල් හැර යන දරු දැරියන්ගේ චින්තන කුසලතා, පුද්ගල කුසලතා හා සමාජ කුසලතාවල අඩ දක්නට ලැබෙන පිරිහීම පිළිබඳ සලකා බලන විට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය සංවර්ධනය විය යුතු බවත් එය සිදුවිය යුතු ආකාරයත් හඳුනා ගැනීම අපහසු නොවේ.

සම්ප්‍රේෂණ ගුරු භූමිකාවේ දී සිසුන් උගත යුතු සියල්ල දන්නා අයෙකු ලෙස ගුරුවරයා පිළිගැනෙන අතර සිසුන් ඒ කිසිවක් නොදන්නා අය ලෙස සලකා ඔවුන් වෙත දැනුම සම්ප්‍රේෂණය කිරීම ගුරු කාර්යය බවට පත් වී තිබේ. ගුරුවරයාගෙන් සිසුනට දැනුම ගලා යාමට පමණක් සීමා වන දේශන මුහුණුවරක් ගන්නා මෙම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිසු චින්තනය අවදි කිරීමට හෝ සිසුන්ගේ පෞද්ගලික හා සමාජ කුසලතා සංවර්ධනය කිරීමට හෝ ප්‍රමාණවත් ව දායක නොවේ.

ගුරුවරයා පන්තිය සමඟ ඇති කර ගන්නා දෙබස සංවාදාත්මක ගුරු භූමිකාවේ ආරම්භක අවස්ථාව වේ. ගුරුවරයාගෙන් සිසුන්ට හා සිසුන්ගෙන් ගුරුවරයාට ගලා යන අදහස්වලට අමතරව සිසු - සිසු අන්තර් ක්‍රියා ද පසුව ඇතිවීම නිසා මෙම දෙබස ක්‍රමයෙන් සංවාදයකට පෙරළේ. දන්නා දෙයින් නොදන්නා දෙයට, සරල දෙයින් සංකීර්ණ දෙයට මෙන් ම සංයුක්ත දෙයින් වියුක්ත දෙයට සිසුන් ගෙනයාම සඳහා ගුරුවරයා දිගින් දිගට ම ප්‍රශ්නකරනයේ නිරත වේ.

නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්යයන් ප්‍රබල ස්ථානයක් ගන්නා අතර පන්තියේ සෑම ළමයෙකු ම ඒ ඒ නිපුණතාව සම්බන්ධ ව අඩු තරමින් ආසන්න ප්‍රවීණතාවයට හෝ ගෙන ඒමට මැදිහත් වන සම්පත් දායකයකුගේ (RESOURCE PERSON ) තත්ත්වයට පත් වේ. ඉගෙනුමට අවශ්‍ය උපකරණ හා අනෙකුත් පහසුකම් සහිත ඉගෙනුම් පරිසරයක් සැලසුම් කිරීම, සිසුන් ඉගෙන ගන්නා අයුරු සමීප ව නිරීක්ෂණය කිරීම, ශිෂ්‍ය හැකියා හා නොහැකියා හඳුනා ගැනීම, අවශ්‍ය ඉදිරි පෝෂණ ප්‍රතිපෝෂණ ලබා දෙමින් සිසුන්ගේ ඉගෙනුම් ප්‍රවර්ධනය කිරීම මෙන් ම පන්ති කාමරයෙන් බැහැරට ඉගෙනුම් හා ඉගැන්වීම් දීර්ඝ කිරීම සඳහා ඇගයීම් උපකරණ සකස් කිරීම ද මෙහි දී ගුරුවරයාගෙන් ඉටුවිය යුතු මූලික කාර්යයන් වේ. යථෝක්ත ගුරු කාර්ය භාරය ඇසුරු කොට ගත් ගුරු භූමිකාව පරිණාමන ගුරු භූමිකාව (TRANSFORMATIO ROLE) ලෙස නම් කර තිබේ.

මෙම පාඨමාර්ගයේ පළමු කොටස මගින් හඳුන්වා දෙනු ලබන විස්තරාත්මක විෂයමාලාව ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රියාකාරකම් සන්නතිය එහි දෙවැනි කොටසට ඇතුළත් කර ඇත. මේ සෑම ක්‍රියාකාරකමක් ම අඩු තරමින් පියවර තුනක් ඇතුළත් වන පරිදි සංවර්ධනය කර තිබේ. ක්‍රියාකාරකම්වල පළමුවන පියවර මගින් සිසුන් ඉගෙනුමට සම්බන්ධ කර ගැනමට අපේක්ෂා කරනු ලැබේ. එබැවින් මෙම පියවර සම්බන්ධ කර ගැනීමේ පියවර (ENGAGEMENT STEP ) වශයෙන් නම් කර තිබේ. මෙහි ආරම්භයක් ලෙස ගුරුවරයා ගනු

දෙනු භූමිකාවේ ලක්ෂණ ප්‍රදර්ශනය කරමින් සිසුන් සමග දෙබසකට මුල පුරයි. පසු ව සංවාදයකට පරිවර්තනය වන මේ දෙබස යටතේ ගවේෂණයේ යෙදීමෙන් සිසුන් සංවර්ධනය කර ගත යුතු මූලික නිපුණතාව හා සම්බන්ධ පෙර දැනුම සිහිපත් කර ගැනීමටත්, ක්‍රියාකාරකමේ ඉදිරිය පිළිබඳ ඉඟි ලබා ගැනීමටත් සිසුන්ට අවස්ථාව සැලසේ. මෙම අදහස් මුවමාරුව සඳහා යොදා ගත හැකි උපක්‍රම රාශියක් ගුරුවරයා සතුව ඇත. ප්‍රශ්න ඉදිරිපත් කිරීම, පින්තූර පුවත්පත් දැන්වීම් හා සැණ පත් ( FLASH CARDS) වැනි උත්තේජක යොදා ගැනීම, ගැටලු ප්‍රහේලිකා හෝ සිද්ධි අධ්‍යයනය භාවිතය, දෙබස් භූමිකා රංගන, කවි, ගීත හා ආදර්ශන (DEMONSTRATIONS ) ශ්‍රව්‍ය දෘශ්‍ය පට යොදා ගැනීම මෙහි දී ගුරුවරයා සතු ව ඇති උපක්‍රම කිහිපයකි. සාරාංශ වශයෙන් පහත සඳහන් අරමුණු තුන සාක්ෂාත් කර ගැනීම මුල් කොට ක්‍රියාකාරකම්වල පළමු පියවර ක්‍රියාත්මක වේ.

- පන්තියේ අවධානය දිනා ගැනීම
- අවශ්‍ය පෙර දැනුම සිහිපත් කර ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දීම
- ක්‍රියාකාරකමේ දෙවැනි පියවර යටතේ සිසුන් යොමු කිරීමට අපේක්ෂා කරන ගවේෂණයේ මූලිකාංග සිසුන්ට හඳුන්වා දීම

ක්‍රියාකාරකමේ දෙවැනි පියවර සැලසුම් කර ඇත්තේ ගවේෂණය ( EXPLIRATION) සඳහා සිසුන්ට අවස්ථාව ලබා දීමට ය. සිසුන් ගවේෂණයේ යෙදෙන්නේ ඒ සඳහා සුවිශේෂ ව සකස් කරන ලද උපදෙස් පත්‍රිකාවක් පදනම් කරගෙනය. ගැටලුවට සම්බන්ධ විවිධ පැති කණ්ඩායම් වශයෙන් ගවේෂණය කරමින් සහයෝගී ඉගෙනුමේ යෙදීමට සිසුනට හැකි වන පරිදි මෙම ගවේෂණය සැලසුම් කිරීමට ගුරුවරයාට සිදුවේ. සපයා ඇති සම්පත් ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගනිමින්, සතිමත් බවෙන් යුතුව කණ්ඩායම් සාකච්ඡා මෙහෙයවමින් සිසුන් ගවේෂණයේ නිරතවීම මෙම පියවරේ වැදගත් ලක්ෂණ කිහිපයක් වේ. කාලයක් තිස්සේ එබඳු කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත වීම නිසා ස්වයං විනය, අන්‍යයන්ට සවන්දීම, අන්‍යයන් සමඟ සහයෝගයෙන් වැඩ කිරීම, ඔවුන්ට උදව් වීම, කාල කළමනාකරණය, ගුණාත්මක භාවයෙන් ඉහළ නිපැයුම් ලබා ගැනීම, අවංක බව ආදී සාමාන්‍ය ජීවිතයට අවශ්‍ය වැදගත් කුසලතා රැසක් සංවර්ධනය කර ගැනීමට ද සිසුන්ට හැකියාව ලැබේ.

සිසුන් ගවේෂණය සඳහා යොමු කිරීමේ දී ශිෂ්‍ය කණ්ඩායම්වල නායකත්වය පිළිබඳ තීරණ ගැනීමෙන් ගුරුවරයා වැළකී සිටිය යුතු අතර සිසුන් අතරින් නායකයන් මතුවීමට අවශ්‍ය පසුබිම පමණක් මැනවින් සූදානම් කළ යුතු ය. සැඟවුනු හැකියා පදනම් කර ගනිමින් අවස්ථාවෝචිත ව නායකත්වය ගැනීමේ වරප්‍රසාදය මේ අනුව සිසුන්ට හිමිවේ.

ක්‍රියාකාරකමේ තෙවන පියවරේ දී සෑම කණ්ඩායමකට ම තම ගවේෂණ ප්‍රතිඵල අන් අයගේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසේ. මෙහි දී ගුරුවරයා කළ යුත්තේ සමූහ ඉදිරිපත් කිරීම් සඳහා සිසුන් දිරිමත් කිරීම ය. සෑම සාමාජිකයෙකුට ම වගකීම් පැවරෙන පරිදි ඉදිරිපත් කිරීම සැළසුම් කිරීමට සිසුන් මෙහෙයවීම ද වැඩදායකය. සිසු අනාවරණ පැහැදිලි කිරීම ( EXPLANATION) හා සම්බන්ධ මෙම පියවරේ වැදගත් ලක්ෂණයන් වන්නේ පන්ති කාමර තුළ නිතර ඇසෙන ගුරු කථනය වෙනුවට සිසු හඬ මතු වීමට අවස්ථා සම්පාදනය වී තිබීමය.

ක්‍රියාකාරකම්වල තෙවන පියවරේ දී සොයා ගැනීම් පැහැදිලි කිරීමෙන් අනතුරුව වැඩිදියුණු කිරීමට නැත්නම් විස්තාරණයට (ELABORATION ) සිසුන් යොමු කිරීමට අවශ්‍ය වේ. එක් එක්

කණ්ඩායම ඔවුන්ගේ ඉදිරිපත් කිරීම අවසන් කළ පසු ඒ පිළිබඳ සංවර්ධනාත්මක යෝජනා මතු කිරීමට ඉදිරිපත් කළ කණ්ඩායම්වල සිසුන්ට දෙවනුව ද මේ සඳහා අවස්ථාව ලැබේ. කෙසේ වෙතත් අවසාන සමාලෝචනය යොමු වන්නේ ගුරුවරයාටය. සිසුන් නිරත වූ ගවේෂණයට අදාළ වැදගත් කරුණු සියල්ල පැහැදිලි වන සේ මෙම සාමාලෝචනය සිදු කිරීම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ.

පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළින් අපේක්ෂිත අරමුණු සාර්ථකව ඉටු වන්නේ දැයි නිරතුරුව සොයා බැලීම මෙම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය යටතේ ගුරුවරුන් සතු ප්‍රධාන වගකීමකි. මේ සඳහා තක්සේරුව හා ඇගයීම් යොදා ගත යුතු අතර ඒ සඳහා ප්‍රමාණවත් ඉඩකඩ ඉගෙනුම ඉගැන්වීම් ක්‍රියාවලිය තුළදී ම ලබා ගැනීමට සැළසුම්කළ ක්‍රියාකාරකම් මගින් ගුරුවරයාට අවස්ථාව සලසා දේ. ක්‍රියාකාරකමේ දෙවන පියවර යටතේ සිසුන් ගවේෂණයේ යෙදෙන විට තක්සේරුවටත් (ASSESSMENT ) ක්‍රියාකාරකමේ තෙවන පියවර යටතේ සිසුන් පැහැදිලි කිරීම හා විස්තාරණයට යොමු වන විට ඇගයීමටත් (EVALUATION ) ගුරුවරයාට ඉඩ තිබේ. තක්සේරුව හා ඇගයීම් පිළිබඳ විස්තරාත්මක විමසුමක් මෙම ලේඛනය යටතේ මතු දැක්වේ.

මේ දක්වා විස්තර කරන ලද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය පරිණාමණ භූමිකාව ක්‍රියාත්මක කිරීම සඳහා ගුරුවරයා යොමු කරවයි. මෙහි දී කණ්ඩායම් ගවේෂණයට මුල් තැන ලැබෙන අතර ගනුදෙනුව, සංවාදය හා කෙටි දේශණ සඳහා ද ගුරුවරයාට අවකාශ සැලසේ. ප්‍රවේශ පියවරේ දී ගනුදෙනුවට හා සංවාදයට අවස්ථා ඇති අතර අවසාන පියවරේ සමාලෝචනය යටතේ කෙටි දෙසුමකට ගුරුවරයාට ඉඩ ඇත. නව සහශ්‍රකයේ පළමු විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ ඉදිරිපත් වන මෙම විෂය මාලාව හා සම්බන්ධ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය සංවර්ධනය කිරීමේ දී පරිණාමන ගුරු භූමිකාවට අමතරව සම්ප්‍රේෂණ හා ගනුදෙනු ගුරු භූමිකාවන්ට අදාළ වැදගත් ලක්ෂණ ගැන ද සැලකිලිමත්වීම මෙම ක්‍රමවේදයේ විශේෂත්වය ලෙස සඳහන් කළ හැකි වේ.

# ඉතිහාසය ඉගැන්වීමේ උපාය මාර්ග

ඉතිහාසය උගන්වන ගුරුවරයා, තොරතුරු ලබා දෙන්නෙකුට වඩා තොරතුරු ලබා ගැනීමට තම සිසුන් පොළඹවන්නෙකු ලෙස කටයුතු කරන්නේ නම් ඉගැන්වීමේ කාර්යය වඩා ඵලදායී වනු ඇත. මේ සඳහා හැකි සෑම අවස්ථාවකදී ම සාකච්ඡාව, මූලාශ්‍ර පරිහරණය, නිරීක්ෂණය වැනි කාර්යයන්ට සිසුන් යොමු කිරීම මැනවි. ඉතිහාසය අර්ථාන්විත ය අධ්‍යයනය කිරීම සඳහා සිසුන් යොමු කරවිය හැකි ක්‍රියාමාර්ග කිහිපයක් පහත දැක්වේ.

- ජාතික කෞතුකාගාරය සහ ප්‍රාදේශීය කෞතුකාගාර යනාදිය මගින් සැලසුම් කළ වැඩ සටහනක් යටතේ කෞතුක වස්තු නැරඹීමට අවස්ථාව සැලසීම.
- සිසුන් ප්‍රදේශයේ ඉතිහාසය සෙවීමට උනන්දු කර ඒ මගින් ජාතික ඉතිහාසය වෙත යොමු කිරීම.
- මාධ්‍යවලින් තොරතුරු ලබා ගැනීමට අවස්ථාව සැලසීම. ( ගුවන් විදුලි හා රූපවාහිනී අධ්‍යාපන සේවා අන්තර් ජාලය )
- ඓතිහාසික වැදගත්කමකින් යුත් ස්ථාන නැරඹීමට උනන්දු කරවීම.
- මූලාශ්‍ර භාවිතයට උනන්දු කරවීම
- සිසු කුසලතාවලට අවස්ථාව සැලසෙන පරිදි බිත්ති පුවත් පත්, සඟරා, ප්‍රදර්ශන, පාසල් කෞතුකාගාර ඇරඹීම වැනි කටයුතු කෙරෙහි ධෛර්යය දීම
- කාලීන ප්‍රශ්න දෙස මධ්‍යස්ථව හා යථාර්ථවාදී ව බැලිය හැකි ඵලදායී පුරවැසියකු බිහි කිරමේ කාර්යයට ඉතිහාසය විෂය ඉගැන්වීමෙන් ඔබට දායක විය හැකි ය. ඒ සඳහා ඔබ සතු වගකීම ඉතා විශාලය.

# පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාර

ඒකකය :- 7.1 කාලච්ඡේද 10

## හැඳින්වීම

ඈත අතීතයේ සිට ම මිනිසා තම යැපීම සඳහා විවිධ ජීවනෝපාය මාර්ගවල නියැලුන බව පෙනේ. ඒ සඳහා සුදුසු බිම් ප්‍රදේශවල තම නිවාස තනා ගැනීමට ඔවුහු කල්පනා කළහ.

දඩයම් යුගයේ ජීවත් වූ මිනිසාට මුල් කාලයේ දී ස්ථිර වාසස්ථාන නොවීය. දඩයමක් නොලද විට නිරාහාරව සිටියහ. ආහාර පිළිබඳ අස්ථිර බව නිසා ස්ථිර නිවාස පිළිබඳ සිතීමට ඔවුහු අපොහොසත් වූහ. මෙසේ අස්ථිර ජීවනෝපායක් ඇති ව ජීවත් වූ දඩයම් යුගයේ මිනිසා පසු කාලයේ දී එක ස්ථානයක පදිංචි වීමට පියවර ගත්හ.

නව ශිලා යුගය වන විට ජීවත් වූ මිනිසුන් දඩයම පමණක් නොව සතුන් ඇති කිරීම හා ධාන්‍ය ගොවිතැන් කිරීමට දැන ගත්හ. කටු මැටි ගෙවල් තැනීම හා ගින්දර ප්‍රයෝජනයට ගෙන ආහාර පිසීමට පුරුදු වූහ.

මෙසේ ජීවත් වූ මිනිසුන් තම ආහාර ස්ථිරවම ලබා ගැනීමට මගක් සෙවූහ. ඒ සඳහා ප්‍රධාන වශයෙන් ගොවිතැනට යොමු වූ ඔවුහු සිය ගොවිතැන් කටයුතු සඳහා ගංගා නිම්න ඉතාමත් සුදුසු ප්‍රදේශ බව අවබෝධකොට ගත්හ. එහෙයින් එම ප්‍රදේශවල පදිංචි වීම ආරම්භ කළහ. එම ප්‍රදේශවල පැවති සරු පස, ජලය, යහපත් දේශගුණය වැනි කරුණු වාසස්ථාන ඉදි කිරීමේ දී ඔවුන්ගේ සැලකිල්ලට යොමු විය.

මෙසේ ගංගාධාරවල පදිංචි වූ මිනිසුන්ට තම ජීවනෝපාය ගෙන යාම වඩාත් පහසු විය. එහි දී ඔවුන්ගේ ආහාරය ස්ථිරවම ලබා ගැනීමට මඟක් ඇති වූ නිසා ජීවිතයට අදාළ වූ වෙනත් කරුණු ගැන සිතීමට වඩාත් අවකාශ ලැබුණි.

පාලන කටයුතු, ආගමික සිතුම් පැතුම් ගොඩනැගැලි සෑදීම, කලා නිපැයුම්, ගමනාගමනය, වෙද හෙදකම් ආදී කටයුතු ගැන වඩාත් උනන්දුවක් දැක්වීම නිසා ඔවුන්ට උසස් ශිෂ්ටාචාරයක් බිහි කර ගැනීමට හැකි විය.

ප්‍රධාන ගංගා නිම්න හතරක් ඇසුරින් බිහි වූ එබඳු උසස් ශිෂ්ටාචාර හතරක් වූ මෙසපොතේමියා, මිසර, ඉන්දු නිම්න හා චීන යන ශිෂ්ටාචාර පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම ඒකකයෙන් අපේක්ෂා කෙරේ.

නිපුණතා : ලෝක ශිෂ්ටාචාරයන් හි ආරම්භය, වර්ධනය හා ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයනය කරමින් ඉන් පසු කාලීන ශිෂ්ටාචාරයන් ලද උරුමයන් පිළිබඳ විමර්ශනය කරයි.

නිපුණතා මට්ටම :

- සරුපස තැනිතලා බිම හා ජල පහසුව යන කෘෂිකර්මයට හිතකර හේතු අරමුණු කර ගනිමින් මුල් පදිංචිය සඳහා ගංගා නිම්න තෝරා ගත් ආකාරය විමර්ශනය කරයි.
- පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාරයන්හි ව්‍යාප්තිය හා සම්බන්ධ ඓතිහාසික තොරතුරු ඇසුරින් සිතියම් ලකුණු කිරීමේ හැකියාව වර්ධනය කර ගනියි.
- පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාරයන්හි සුවිශේෂ ලක්ෂණ විමසා බලයි.
- ගංගා නිම්න ශිෂ්ටාචාරවලින් පසුකාලීන ශිෂ්ටාචාරයන්ට ලැබුණ දායාද තොරතුරු අධ්‍යයනය කර ඒවා තවදුරටත් පෝෂණය කිරීමට දායක වෙයි

විෂය අන්තර්ගතය

## 7.1 පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාර

ගංගා නිම්න ශිෂ්ටාචාර බිහිවීමට බලපෑ ඓතිහාසික පසුබිම


එඬේර යුගයෙන් පසු එළඹෙන නව ශිලා යුගයේ දී මිනිස්සු සත්ව පාලනය හා කෘෂිකර්ම කටයුතු කෙරෙහි තරමක් දුරට නැඹුරුව සිටියහ. පසුව ආහාර සපයා ගැනීම සඳහා ස්ථිර මඟක් සෙවූ ඔවුහු ඒ සඳහා ඉතාමත් ම සුදුසු ප්‍රදේශ ලෙස ගංගා නිම්න තෝරා ගත්හ.

7.1.1 පදිංචිය සඳහා ගංගා නිම්න තෝරා ගැනීමට හේතු

- සාරවත් පස
- ජල පහසුව
- තැනිතලා භූමිය
- යහපත් දේශගුණය

7.1.2 ගංගා නිම්න ආශ්‍රිතව බිහිවූ ශිෂ්ටාචාර

| | | |
|---|---|---|
| යුප්‍රටීස්, ටයිග්‍රීස් | - | මෙසපොතේමියා |
| නයිල් | - | මිසර |
| සින්ධු | - | ඉන්දු නිම්න |
| හොවැංහෝ | - | චීන |



සිතියම 7.1.1

7.1.2.1 මෙසපොතේමියා ශිෂ්ටාචාරය

- පිහිටීම හා ව්‍යාප්තිය

  පර්සියන් බොක්කෙන් අවසන් වන ටයිග්‍රීස් යුප්‍රටීස් දෙගම්මැදි ප්‍රදේශය පුරා ව්‍යාප්ත වීය.




සිතියම 7.1.2

වර්තමාන ඉරාකය යනුවෙන් හඳුන්වන්නේ මෙම ප්‍රදේශයයි.



ශිගුරාත් දේවාලය
රූපය 7.1.1

- සුවිශේෂ ලක්ෂණ
    * පාලන ක්‍රමය
    * මුල් කාලයේ ස්වාධීන වූ පුර රාජ්‍ය ක්‍රමයක් පැවතීම.
    * පටේසීස් නමින් හැඳින්වුන පුජකයන් අතින් පාලනය කිරීම
    * පාලනයේ ප්‍රධාන, මධ්‍යස්ථානය වූයේ දෙවි මැදුරය. එය ශිගුරාත් නමින් හැඳින්විම.
    * පසු කාලයේ දෙගම්මැදි ප්‍රදේශ එකතුකොට හමුරාබි නම් අයෙකු විසින් බැබිලෝනියානු අධිරාජ්‍ය පිහිටු වීම
    * හමුරාබි නමින් නීති පද්ධතිය සකස් කිරීම.

- ආර්ථික තොරතුරු
    * කෘෂිකර්මය මත පදනම් වූ ආර්ථික ක්‍රමයන් පැවතීම
    * කෘෂිකාර්මික නිෂ්පාදන
      ධාන්‍ය - තිරිඟු, බාර්ලි
      එළවළු - රතුළුණු, සුදුළුණු, සලාද, කැරට්
      පළතුරු - රට ඉඳි, දෙළුම්, ඇප්‍රිකට්, පීචස්, ප්ලම්, ෆිග්
      මස්වර්ග - එළුමස්, බැටළු මස්, ගවමස් / බටර්, කේජු, කිරි
      ධීවර කර්මාන්තය - මාළු, කරවල,
      මී මැසි පාලනය
    * කාර්මික නිෂ්පාදන
        - කෘෂි කර්මාන්තයට අවශ්‍ය මෙවලම් - නඟුල, දෑකැත්ත, පිහිය නිපදවීම
    * පූජකයින් විසින් අවශ්‍ය ආහාර හා බීජ බෙදා හැරීම
    * ප්‍රවාහනය
      බූරුවන්, ගවයන්, අශ්වයන් යොදා ප්‍රවාහනය සිදු කිරීම හා බටවලින් තනාගත් වෘත්තාකාර බෝට්ටු භාවිතා කිරීම
      සුමේරියන්වරුන් නැව් තනා වෙළෙඳාම් කිරීම
    * ආගමික ඇදහිලි හා විශ්වාස

ප්‍රධාන දෙවිවරුන් සිව්දෙනෙකු පිළිබඳ සංකල්පය

පෘථිවියට අධිපති - එන්ලේ

දිව්‍යලෝකයට - අනු

සමුද්‍රයට අධිපති - එන්කි

ශිල්ප ශාස්ත්‍රයට අධිපති - එනිල්

- සෑම නගරයකටම දෙවි මැදුරක් පැවතීම
- ග්‍රහ තාරකාවන්ට වැඳුම් පිදුම් කිරීම

* සංස්කෘතිය

- අධ්‍යාපනය
  ප්‍රථම පාසල සුමේරියාවේ ඇති වීම
- රැකියාවල නිරතවීම සඳහා අධ්‍යාපනය ලබා දීම
- කලාශිල්ප
  කම්මල් කරුවන්, රන් කරුවන්, ලෝකුරුවන්, ගල් වඩුවන්, වීදුරු වැඩ කරන්නන් සියුම් කැටයම් කරුවන්, ප්‍රතිමා නිර්මාණකරුවන් මූර්ති තනන්නන්



කලා ශිල්ප මහිමය
කියාපාන ලෝකඩ හිස
රූපය 7.1.3

* ලේඛන කලාව -

- ප්‍රථමයෙන්ම ලේඛන කලාව හඳුන්වාදීම
  රූපාක්ෂර ක්‍රමය, මැටි පුවරු මත ලිවීම
- ඇඳුම් පැළඳුම්
  බැටළු ලෝම බහුල වශයෙන් භාවිත කිරීම, ලිනන් රෙදි මිසරයෙන් ලබා ගැනීම. වියන ලද දළ ලෝම රෙදි සිනිඳු කිරීමට දැන සිටීම.
- ප්‍රභූ පන්තිය මුළු සිරුරම වැසෙන ලෙස ඇඳුම් භාවිතා කළ අතර සාමාන්‍ය වැසියෝ යටිකය වැසෙන ලෙස පමණක් ඇඳුම් භාවිතා කිරීම
- රන් හා රිදීවලින් හා පබළු වලින් ආභරණ තැනීම



මැටි පුවරුව
රූපය 7.1.3


* නිවාස

- නිවාස තෙවැදෑරුම් විය
- දිළිඳු ජනතාව කොත් ආකාර මුදුන් ඇති නිවාසවල වාසය කිරීම
- ඒවා වියලා ගත් අමු ගඩොල්වලින් තැනූ නිවාස විම.
- ධනවතුන්ගේ නිවාස පුළුස්සා ගත් ගඩොල්වලින් තැනූ දිගටි ආකාරයට නිම කළ ඒවා වීම
- උසස් ප්‍රභූන්ගේ නිවාසවල සමචතුරස්‍රාකාර මැද මිදුලක් තිබූ අතර එම නිවාස පිළිස්සූ ගඩොල් වලින් තනා තිබීම.

* පසුකාලීන ශිෂ්ටාචාරයන්ට ලැබූ දායාද
  - ලේඛන කලාව

* අධ්‍යාපනය වර්ධනය වීමට ලේඛන කලාව බලපෑම
  - විද්‍යාව හා තාක්ෂණික දැනුම
  - ලෝකඩ භාවිතය ආරම්භ කිරීම
  - දවසට පැය 12ක් බව ද මාසයට දින 30ක් බව ද අවුරුද්දට දින 365 ක් බව ද දැන සිටීම
  - මිනුම් ශාස්ත්‍රය - තාරකා ශාස්ත්‍රය, ගණිතය පිළිබඳ දැන සිටීම.
  - තාලම්පට, බටනලාව, වීණාව, බෙරය ආදී සංගීත භාණ්ඩ භාවිත කිරීම.
  - කරත්ත වැනි ගොඩබිම් ප්‍රවාහන ක්‍රම හා නැව් වැනි මුහුදු ප්‍රවාහන ක්‍රම
  - කිරුම් මිනුම් ක්‍රම
  - වෘත්තය අංශක $360^0$ කට බෙදීම,
    තත්පර 60 විනාඩි 1, විනාඩි 60 පැය 1 ක් ආදිය සුමේරියන් වරුන්ගෙන් පසුකාලීන ශිෂ්ටාචාරය එකතුවීම
  - ඖෂධ හා ඖෂධ පැලෑටි පිළිබඳ අවබෝධයක් වීම

7.1.2.2 මිසර ශිෂ්ටාචාරය





සිතියම 7.1.3

- පිහිටීම හා ව්‍යාප්තිය
  නයිල් ගංගාව ආශ්‍රිතව ව්‍යාප්තව වීම. නූතන ඊජිප්තුව හා සුඩාන් යන ප්‍රදේශවල ව්‍යාප්තව පැවතීම.
- මුල් කාලයේ ඉහල(දකුණ) ඊජිප්තුව හා පහළ(උතුර) ඊජිප්තුව යනුවෙන් රාජ්‍ය දෙකක් පැවතීම.
- මෙම්පිස් අගනගරය කරගෙන මේගස් රජු විසින් මේ රාජ්‍ය දෙක එක්සත් කිරීම.

* සුවිශේෂ ලක්ෂණ

පාලන ක්‍රමය

- මිසර රජුන් පාරාවෝ ලෙස හැඳින්වීම
- රජුන් දේවත්වයෙන් ලා සැලකීම
- අද්විතීය බලතල හිමිව තිබූ පාරාවෝ වරුන් විසින් නීති සම්පාදනය කිරීම, බදු අය කිරීම වැනි කාර්යයන් කිරීම.
- පූජකවරුන් හා ප්‍රභූවරුන්ගේ ආධාර හා උපදෙස් ලබාගෙන පාලන කටයුතු පවත්වා ගෙන යෑම
- රට, දිස්ත්‍රික්ක, මහ නගර සහ කුඩා නගර වශයෙන් බෙදී තිබුණ අතර පාලනය සඳහා විවිධ තනතුරු දැරූ නිලධාරීන් සිටීම.
- පාරාවෝ රජවරුන් විසින් මරණින් පසු සිය මෘත දේහ තැන්පත් කිරීම සඳහා පිරමීඩ නම් ගොඩනැගිලි විශේෂයක් තැනීම.



ගිට්සා හි පිරමීඩය
රූපය 7.1.4

* ආර්ථික තොරතුරු
  - කෘෂිකාර්මික කටයුතු මත පදනම් වූ ආර්ථික ක්‍රමයක් පැවතීම

* කෘෂිකාර්මික නිෂ්පාදන

ධාන්‍ය - තිරිඟු, බාර්ලි

එළවළු - බෝංචි, ගෝවා, රතු ළූණු

පලතුරු - කොමඩු, මිදි, ඔලිව්, රට ඉඳි

මස් වර්ග - ධීවර නිෂ්පාදන


* කාර්මික නිෂ්පාදන

ලී නගුළ, ආඩියා මැනිමේ ක්‍රමය භාවිත කිරීම , දෑකැත්ත, (මුලින්ම තඹවලින්, පසුව ලෝකඩවලින් හා යකඩවලින් තනාගැනීම)

* ප්‍රවාහනය


- රුවල් නැව්, ඔරු, ගොඩබිම් කරත්ත, අශ්ව කරත්ත

* ආගමික ඇදහිලි හා විශ්වාස
  - බහු දේව වාදය
  - දෙවිවරුන් සඳහා අලංකාර දෙව් මැදුර තැනවීම
  - සෑම නගරයකටම විශේෂිත වූ දෙවියකු සිටීම
  - මරණින් මතු යලි උපදින බව විශ්වාස කිරීම



අබුසිම්බෙල් දේවස්ථානය
රූපය 7.1.5

* සංස්කෘතිය
  - අධ්‍යාපනය හා ලේඛන කලාව
    - ♦ චිත්‍රාක්ෂර ක්‍රමයක් භාවිතා කිරිම
    - ♦ මුල් කාලයේ අක්ෂර ලිවීමේ කලාව පූජකවරුන් හා ලියන්නන් පමණක් දැන සිටීම
    - ♦ පසු කාලයේ සිද්ධස්ථාන ආශ්‍රිතව පාසල් බිහිවීම
    - ♦ ඒවායේ සිසුන්ට කියවීම, ලිවීම හා ගණිතය ඉගැන්වීම
    - ♦ අක්ෂර 24ක හෝඩියක් නිර්මාණය කිරිම



මිසර අක්ෂර
රූපය 7.1.6

* කලා ශිල්ප
  - සිද්ධස්ථාන ඉදි කිරීම
  - එම සිද්ථස්ථානවල බිත්තිවල මිනිසුන්ගේ එදිනෙදා ජීවිතය හා ආගම හා සම්බන්ධ චිත්‍ර වලින් අලංකාර කර තිබීම.
  - ගෘහ නිර්මාණ ශිල්පයේ විශ්මය ජනක නිපැයුමක් ලෙස සැලකෙන පිරමීඩය නිර්මාණය කිරීම

* ඇඳුම් පැළඳුම්
  - ලිනන් රෙදි භාවිතා කිරීම
  - හණ කෙඳිවලින් සියුම් රෙදි වියා ගැනීමත් ඒවා වර්ණවත් කිරීමටත් දැන සිටීම.
  - සැහැල්ලු ඇඳුම් භාවිත කිරීම
  - පාවහන් හා හිස්වැසුම් භාවිතා කිරීම
  - පබළුවලින් සාදාගත් ආභරණ පැළඳීම
  - සුවඳ විලවුන් සුවඳ තෙල් භාවිතා කිරීම

* පසු කාලීන ශිෂ්ටාචාරයන්ට ලැබුණ දායාද
  - ලේඛන කලාව
    - ♦ ලිවීමේ කලාව ලෝකයාට නිර්මාණය කරදීම
    - ♦ කඩදාසි, පෑන්, තීන්ත වැනි ලිවීමේ උපකරණ ලබා දීම
    - ♦ මුල දී පත් ඉරු සකස් කිරීම සඳහා උපයෝගී කරගත් පැළෑටි වර්ගයකින් කඩදාසි නිපදවීම.
    - ♦ එලවළු මැලියම් හා දුඹුල් (දැලි) එකතු කර තීන්ත සාදා ගැනීම

- විද්‍යාව හා තාක්ෂණික දැනුම
    - ප්‍රථම වරට චන්ද්‍රයාගේ ගමන් මඟ පදනම් කර ගෙන දින දර්ශනයක් සකස් කිරීම
    - වඩාත් නිවැරදි වීමට සූර්යාගේ ගමන් මඟ පදනම් කරගෙන දින දර්ශනයක් නිර්මාණය කිරීම
    - සෑම මාසයකටම දින 30ක් සෑම ඍතුවකටම මාස 04ක් ඇතුලත්වන සේ අවුරුද්ද ඍතු 03කට බෙදීම
    - ඔවුන්ගේ සූර්ය වර්ෂ දින දර්ශනය දින 365ක් වීම
    - සූර්යාගේ ඡායාවේ ප්‍රමාණයෙන් වේලාව දැක්වෙන ඔර්ලෝසුවත්, ජල ඔරලෝසුවත්, සහ වේලාව දැක්වෙන වීදුරුවක් නිර්මාණය කිරීම

7.1.2.3 ඉන්දු නිම්න ශිෂ්ටාචාරය




සිතියම 7.1.4

* පිහිටීම හා ව්‍යාප්තිය
    - සින්දු ගංගාව ආශ්‍රිතව පිහිටීම.
    - හරප්පා ශිෂ්ටාචාරය වශයෙන් ද හඳුන්වනු ලැබූ අතර ඉතා විශාල ප්‍රදේශයක පැතිර පැවතීම.
    - ඒ බව පංජාබ්, සින්ඩ් සහ බලුකිස්ථාන යන ප්‍රදේශවල කරන ලද කැණීම්වලින් හෙලි වීම
    - ප්‍රධාන වශයෙන් මොහෙන්දජාරෝ, හරප්පා යන නගර කේන්ද්‍ර කොට ව්‍යාප්තව පැවතිම
* සුවිශේෂ ලක්ෂණ
    - රජ මාලිගයක නටබුන් හමු වී නොමැති නිසා පූජක පාලන ක්‍රමයක් පැවැති බව අනුමාන කෙරේ.
    - ප්‍රභූ පන්තියේ පාලනයක් වීම

* ආර්ථික තොරතුරු
- කෘෂිකර්මය මත පදනම් වූ ආර්ථික රටාවක්
- තිරිඟු, බාර්ලි, ඉඳි, රටඉඳි, තල, එළවළු හා පලතුරු
- මොහෙන්දජාරෝ හි විශාල ධාන්‍යාගාරයක් තිබීම
- සත්ව පාලනය - හරකුන්, බැටළුවන් ඇති කිරීම
- මස් මාළු ආහාරයට ගැනීම
- වෙළදාම - අභ්‍යන්තර හා බාහිර වෙළඳාම තිබූ බවට සාක්ෂි ඇත.
  (ලෝතාල් වරාය, නැව් තටාංගනයක නටබුන් හමු වී ඇත)
- නැවක හා මාලුවන්ගේ රූප මුද්‍රාවල තිබූ නිසා මුහුදු මාර්ග දැන සිටි බව පෙනීම
- ප්‍රවාහනය - තවලම්, කරත්ත මගින් භාණ්ඩ හුවමාරුව කිරීම
  මැණික්, තඹ, වටිනා දැව වර්ග වෙනත් රටවලින් ගෙන ඒම
- කර්මාන්ත - ගඩොල් තැනීම, රෙදිපිළි, ආභරණ තැනීම, මුද්‍රා නිපදවීම
  (වෙලඳ සලකුණු ) ඇත් දළ භාණ්ඩ, දාදු කැට ආදිය

* සමාජ තොරතුරු
- ප්‍රධාන නගර දෙක මුල් කරගෙන නාගරික සමාජ ක්‍රමයක් පැවතීම
- ප්‍රභූ හා කම්කරු ජන සමාජය වෙන්ව සිටීම.
- කම්කරුවන් ශිල්පීය කණ්ඩායම්, කුඹල්කරුවන්, සන්නාලියන්, ලෝකුරුවන් වශයෙන් වර්ග කළ හැක.
- ග්‍රාමීය ජනතාව ගොවිතැනින් යැපීම


* සංස්කෘතිය
- අධ්‍යාපනය හා ලේඛන කලාව,
- අක්ෂර හා රූපාක්ෂර
- ආගම, මාතෘ දේවතා වන්දනාව,
- වෘක්ෂ හා සත්ව වන්දනාව



ඉන්දු නිම්න පූජකවරයෙක්
රූපය 7.1.7

* කලා ශිල්ප
- මව් දෙවගනගේ රූපය මැටිවලින් තැනීම
- පූජක රූපය රතු වැලිගල් වලින් තැනීම
- නාට්‍යංගනාවන්ගේ රූප ලෝකඩවලින් තැනීම
- (මැටි වලින් පුළුස්සන ලද ) මුද්‍රා වර්ග

* ඇඳුම් පැලඳුම්
- ස්ත්‍රීන් අවානක් වැනි හිස් පැළඳුමක් පැළඳීම
- දෝතිය, උතුරු සලුව, ස්ත්‍රී පුරුෂයන් දෙපක්ෂයම ආභරණ පැළඳීම
- වර්ණවත් විසිතුරු ඇඳුම්
- සුවඳ විලවුන් භාවිතය



ඉන්දු නිම්න ආභරණ
රූපය 7.1.8

* පසු කාලීන ශිෂ්ටාචාරයන්ට ලැබුණු දායාද
    - මුද්‍රාවන්
    - ලෝහ කාසි භාවිතය

* විද්‍යාව හා තාක්ෂණික දැනුම
    - ලෝකඩ කර්මාන්තය
    - පිළිස්සු ගඩොල් භාවිතය

7.1.2.4 චීන ශිෂ්ටාචාරය




සිතියම 7.1.5

* චීනයේ පිහිටීම හා ව්‍යාප්තිය
    - ක්‍රි.පූ. දෙවන සහස්‍රය ආරම්භ වන විට හොවැංහෝ ගංගා මිටියාවතේ චීන ජනතාව පදිංචි වීම
    - ගොවිතැනට යෝග්‍ය සාරවත් පස, තැනිතලා භූමිය, ජල පහසුව තිබුණ බැවින් චීන ජනතාව මේ ප්‍රදේශයේ පදිංචි වීම
    - මුල් කාලයේ දී කුඩා රාජ්‍ය වශයෙන් සංවිධානය වීම, ක්‍රි.පූ. 1750 දී ෂෑං රාජවංශය යටතේ එක්සත් වීම, අන්යාන් අගනගරය බවට පත්වීම
    - කලක් ගත වන විට චීනයේ බොහෝ ප්‍රදේශවල ස්වාධීන කුඩා රාජ්‍ය බිහිවීම. බල ව්‍යාප්තිය සඳහා මේ රාජ්‍ය අතර සටන් ඇති වීම
    - ක්‍රි.පූ. පළමුවන සහස්‍රය වනවිට චීනය මධ්‍යගත පාලනයක් සහිත විශාල අධිරාජ්‍යයක් බවට පත්වීම

* චීන ශිෂ්ටාචාරයේ සුවිශේෂ ලක්ෂණ

  * පාලන ක්‍රමය
    - චීන පාලන තන්ත්‍රය රාජාණ්ඩුව මත පදනම් වීම
    - චීන අධිරාජයා විසින් ප්‍රාදේශීය පාලනය සඳහා වංශාධිපතිවරුන් පත් කිරීම

  * ප්‍රාදේශීය පාලකයින්ගේ කාර්ය භාරය
    - අධිරාජයා සඳහා යුද්ධ සේනා සංවිධානය කිරීම, නඩත්තු කිරීම, අවශ්‍ය වූ විට අධිරාජයාට සේනා සැපයීම
    - අධිරාජ්‍යයාට අවශ්‍ය සේවක පිරිස් සැපයීම


  * ආර්ථික තොරතුරු
    - ආර්ථිකය කෘෂිකර්මය මත පදනම් වීම
    - කෘෂිකාර්මික නිෂ්පාදන, වී, මිලම්, තිරිඟු, බාර්ලි
    - සත්ව පාලනය, කිරි, මස්, කේජු, බටර්
    - ගොවීන් සී සාන විට රජු කුඹුරට බැස එම කාර්යයට සහභාගී වීම
    - කර්මාන්ත, කෘෂිකාර්මික මෙවලම් රෙදි පිලි (සේද) ආභරණ, විසිතුරු මැටි බඳුන්, යුද අවි ආයුධ නිපදවීම.
    - වෙළඳාම, ගොඩබිම සේද මාවත හා මුහුදු සේද මාවත ඔස්සේ චීනයේ නිෂ්පාදිත භාණ්ඩ යුරෝපයේ වෙළෙඳ පොළට සැපයීම, සේද, මැටි භාණ්ඩ, පිඟන් භාණ්ඩ
    - භාණ්ඩ ප්‍රවාහන මාධ්‍යය වූයේ නැව් හා තලවම් ය.

* සමාජයීය තොරතුරු
  - රජවරුන් සඳහා මාලිගා ද, ප්‍රභූ පැළැන්තිය සඳහා විශාල මන්දිර ද ඉදි කිරීම
  - විවිධ සැලසුම් නිර්මාණය කරමින් මාලිගා හා මන්දිර ඉදි කිරීම
  - සාමාන්‍ය ජනතාව මැටි හා ගඩොල් භාවිත කරමින් නිවාස තැනීම, පොළොව හාරා පොළොව යට ගෙවල් තැනීම
  - ගොවීන් හා වහලුන්
    - ♦ අතිශය දරුණු ලෙස පීඩාවට පත් වූ සමාජ ස්ථර වන්නේ ගොවීන් සහ වහලුන් ය
    - ♦ චීන අධිරාජයා සටනකින් ජයගත් විට අල්ලා ගන්නා ලද සිරකරුවන් වහල් සේවයේ යෙදවීම
    - ♦ ගොවීන්ගෙන් අධික ලෙස බදු අය කිරීම

* සංස්කෘතිය
  - ආගම
    - ♦ ලාඕට්සේ (ටාඕ) හා කොන්පියුසියස් යන ආගමික කතෘවරුන් විසින් දේශනා කළ ආගම් ඇදහීම.
    - ♦ සේද මාවත ඔස්සේ බුදු දහම, සොරෝස්ට්‍රියන් ( සරතුස්ත්‍රා), ක්‍රිස්තියානි ආගම් පැමිණීම



කොන්පියුසියස්තුමා
රූපය 7.1.9



ලෝකඩවලින් සාදන ලද අශ්වයා
රූපය 7.1.10

  - කලා ශිල්ප
    - ♦ ඔප මට්ටම් කළ අලංකාර මැටි බඳුන් හා පිඟන් භාණ්ඩ තැනීම
    - ♦ තඹ, ඊයම්, ලෝකඩ, රන් යන ලෝහවලින් ප්‍රතිමා, විවිධ මෙවලම් හා ආභරණ තැනීම



අලංකාර මැටි බඳුනක්
රූපය 7.1.11

  - ඇඳුම්
    - ♦ කපු ලිනන් හා සේද රෙදි නිෂ්පාදනය හා භාවිතය, සේද ඉතා වටිනා රෙදි විශේෂයක් වීම
  - සංගීතය හා සාහිත්‍ය
    - ♦ සංගීත භාණ්ඩ, වීනාව, ජන ගී, රාජසභා ගීත, සාමාන්‍ය ජනතාව පොත් ලිවීම.

* පසු කාලීන ශිෂ්ටාචාරවලට ලැබුණු දායාද
  - ලේඛන කලාව
    - ♦ මුල් කාලයේ දී චිත්‍ර අක්ෂර භාවිත කළ ද, පසුව චීන හෝඩිය සකස් කිරීම
    - ♦ ඇට කටු සේද රෙදි, උණ පතුරු, කැස්බෑ ලෙලි ලිවීම සඳහා භාවිත කිරීම, පසුව කඩදාසි භාවිතයට ගැනීම.
  - විද්‍යාව දැනුම
    - ♦ කඩදාසි, වෙඩි බෙහෙත්, මාලිමා යන්ත්‍රය සොයා ගැනීම මේ සොයා ගැනීම නූතන ලෝකයේ ඉතා වටිනා දායාද බවට පත්වීම

# ක්‍රියාකාරකම 7.1.1

නිපුනතා මට්ටම : පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාරයන්හි ව්‍යාප්තිය හා සම්බන්ධ ඓතිහාසික තොරතුරු ඇසුරින් සිතියම් ලකුණු කිරීමේ හැකියාව වර්ධනය කර ගනියි.

ක්‍රියාකාරකම : මුල් ශිෂ්ටාචාරයන් හි ව්‍යාප්තිය හදාරමු

කාලය : විනාඩි 80

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 7.1.1.1 පිරමීඩයේ පින්තූරය
- ඇමුණුම 7.1.1.2 පැරණි ගංගා නිම්න ආශ්‍රිත ශිෂ්ටාචාර දැක්වෙන ලෝක සිතියම හා ඊට අදාළ කාර්ය පත්‍රිකා
- ඇමුණුම 7.1.1.3 වගු සටහන් ඇතුළත් කාර්ය පත්‍රිකාව
- බ්‍රිස්ටල් බෝඩ්
- පෙළ පොත

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.1.1.1

- ඇමුණුම 7.1.1.1 පිරමීඩයේ රූප සටහන ප්‍රදර්ශනය කරන්න. ඒ තුළින් ප්‍රශ්න කීපයක් විමසන්න.
  - * රූපයේ දැක්වෙන්නේ කුමක් ද?
  - * මේවා දක්නට ලැබෙන්නේ කුමන රටේ ද?

  යන ප්‍රශ්න විමසමින් පහත කරුණු ද ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

- පිරමීඩ නිපදවූයේ මිසර වැසියන් බව
- නයිල් නිම්න ශිෂ්ටාචාරය පැරණි ගංගා නිම්න ආශ්‍රිතව බිහි වූ මුල්ම ශිෂ්ටාචාර වලින් එකක් බව
- එවැනි තවත් ශිෂ්ටාචාර තුනක් ඇති බව
- මෙසපොතේමියාව, ඉන්දු නිම්න හා හොවැංහෝ නිම්න ශිෂ්ටාචාර ලෙස ඒවා හඳුන්වන බව
- එම ශිෂ්ටාචාර පිළිවෙලින් යුප්‍රටීස් හා ටයිග්‍රීස් ගංගා නිම්නය, නයිල් ගංගා නිම්නය, සින්දු ගංගා නිම්නය හා හොවැංහෝ ගංගා නිම්නය ආශ්‍රිතව බිහි වූ බව
- එම ශිෂ්ටාචාරවලින් මෙසපොතේමියානු ශිෂ්ටාචාරයේ ප්‍රධාන නගර ලෙස නිප්පූර්, ලාගාෂ්, ඌර් වැදගත් බව
- නයිල් නිම්න ශිෂ්ටාචාරයේ ප්‍රධාන නගර ලෙස නුබියා, අස්වාන්, තීබ්ස්, වැදගත් බව
- ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ප්‍රධාන නගර ලෙස මොහෙන්ජොදාරෝ, හරප්පා, ලෝතාල් වැදගත්වන බව

- හොවැංහෝ ශිෂ්ටාචාරයේ ප්‍රධාන නගර ලෙස අන්යාන්, බීජිං වැදගත් වන බව
- මෙම ශිෂ්ටාචාර වලින් නයිල් නිම්න ශිෂ්ටාචාරය පමණක් අප්‍රිකා මහාද්වීපයටත්, අනෙකුත් ශිෂ්ටාචාර ආසියා මහාද්වීපයටත් අයත් වන බව

මිනිත්තු 10 යි

පියවර 7.1.1.2

- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් හතරකට බෙදන්න
- ඇමුණුම 7.1.1.2 හි සඳහන් සිතියම ප්‍රදර්ශනය කරන්න.
- එම සිතියමේ ගංගා නිම්න ආශ්‍රිත ශිෂ්ටාචාර බිහි වූ ස්ථාන හඳුන්වා දෙන්න.
- ගංගා නිම්න ශිෂ්ටාචාරවලට අදාළ ප්‍රධාන නගර ද හඳුන්වා දෙන්න.
- පසුව අදාළ ශිෂ්ටාචාර නම හා නගර නාම සිතියමෙන් ඉවත් කොට කණ්ඩායම්වලට එක් කණ්ඩායමකට එක් ශිෂ්ටාචාරයක් හා ඊට අදාළ නගරනාම හා ස්ථාන නාම ලබා දෙන්න.
- ලබාදුන් ස්ථාන නාම හා නගර නාම ලෝක සිතියමේ අදාළ තැන්හි රැඳවීමට යොමු කරන්න. ( මේ සඳහා එක් එක් ශිෂ්ටාචාරයට අයත් ප්‍රදේශය වෙන වෙනම ගත හැකි පරිදි ලෝක සිතියම කොටස් හතරකට වෙන් කොට කණ්ඩායම්වලට ලබා දෙන්න.)
- මේ අතර 7.1.1.3 කාර්ය පත්‍රිකාවේ ඇතුළත් වගු සටහන කළු ලෑල්ලේ සටහන් කරන්න.
- අවශ්‍ය විටෙක කණ්ඩායම්වලට සහාය හා උපදෙස් ලබා දෙන්න.

මිනිත්තු 30යි

පියවර 7.1.1.3 :

- සිසුන්ගේ සිතියම් කොටස් ලකුණු කර අවසන් වූ පසු පන්තියට ඉදිරිපත් කිරීමට සලස්වන්න
- මෙහි දී ලෝක සිතියම නැවත සකස්වන අයුරින් සිසු ඉදිරිපත් කළ යුතු බව දන්වන්න
- තමන්ට අදාළ සිතියම් කොටස පන්තියට ඉදිරිපත් කරන අතරතුර කළු ලෑල්ලේ ඇති වගුවේ එක් එක් කණ්ඩායමට අයත් කොටස සම්පූර්ණ කිරීමට උපදෙස් දෙන්න
- සිසු ප්‍රබලතා සහ දුබලතා හඳුනා ගනිමින් පහත දැක්වෙන කරුණු ද ඉස්මතු කරමින් සාමාලෝචනයක යෙදෙන්න.

- ලෝකයේ මුලින් ම බිහි වූ ගංගා නිම්න ශිෂ්ටාචාර හතරක් ඇති බව
- ඒවා පිළිවෙලින් මෙසපොතේමියා, නයිල් නිම්න, ඉන්දු නිම්න, හොවැංහෝ නිම්න වශයෙන් හඳුන්වන බව
- ඒ ආශ්‍රිත ගංගා පිළිවෙලින් යුප්‍රටීස්, ටයිග්‍රීස් /නයිල්/සින්දු හා හොවැංහෝ යන නමින් හඳුන්වන බව
- එම එක් එක් ශිෂ්ටාචාරයේ ප්‍රධාන නගර ලෙස පිළිවෙලින් නිප්පූර්, ලාගාෂ්, ඌර්/ නුබියා/ අස්වාන්, තීබ්ස්, මොහන්ජදාරෝ හරප්පා, ලෝතාල්, අන්යාන්, බීජිං වැදගත් වන බව

මිනිත්තු 40යි

තක්සේරුව හා ඇගයීම්

- ලෝකයේ බිහි වූ මුල් ම ගංගා නිම්න ශිෂ්ටාචාර හතර නම් කරයි.
- එම ශිෂ්ටාචාර ලෝක සිතියමක ලකුණු කරයි.
- එම ශිෂ්ටාචාර බිහි වූ ගංගා නිම්න නම් කරයි.
- එක් එක් ශිෂ්ටාචාරයට අදාළ ප්‍රධාන නගර හඳුනාගෙන නම් කරයි.
- ලොව බිහි වූ ශිෂ්ටාචාර හතර අතරින් තුනක් පිහිටියේ අප ද වාසය කරන ආසියා මහාද්වීපයේ බව අභිමානයෙන් පවසයි.
- සිතියම් නිවැරදිව ලකුණු කිරීමට දායක වෙයි.
- අවශ්‍ය අවස්ථාවල දී ඉදිරිපත් වී කටයුතු කරයි.

පසුවැඩ - ලෝක සිතියමක ගංගා නිම්න ශිෂ්ටාචාර බිහි වූ ස්ථාන හා ඒවායේ ප්‍රධාන නගර ලකුණු කරන්න.


ඇමුණුම 7.1.1.1



පිරමීඩය

ඇමුණුම 7.1.1.2

# කාර්ය පත්‍රිකා



ඇමුණුම 7.1.1.3

| කාර්ය පත්‍රිකාව | | |
|---|---|---|
| ශිෂ්ටාචාරය | ආශ්‍රිත ගංගාව | ප්‍රධාන නගර |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |

## ක්‍රියාකාරකම 7.1.2

නිපුනතා මට්ටම : පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාරයන්හි සුවිශේෂ ලක්ෂණ විමසා බලයි

ක්‍රියාකාරකම : ගංගා මිටියාවතින් මතු වූ ප්‍රබෝධය හදාරමු

කාලය : මිනිත්තු 80

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 7.1.2.1 පැරණි පුදුම 7න් කිහිපයක රූප
- ඇමුණුම 7.1.2.2 කාර්ය පත්‍රිකාව
- ගංගා නිම්න ශිෂ්ටාචාරවල සොයා ගැනීම් ආශ්‍රිත රූප සටහන් හා තොරතුරු ( මේ තොරතුරු හා රූප සටහන් පාඩමට පෙර ගුරුවරයා විසින් සපයා ගත යුතුය.)
- බ්‍රිස්ටල් බෝඩ්
- ගම්
- කතුරු
- පෙළපොත

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.1.2.1 :

- ලෝකයේ පුදුම හතෙන් කීපයක් පිළිබඳ ව රූප සටහන් පත්‍රිකාවක් ප්‍රදර්ශනය කරමින් පහත සඳහන් ප්‍රශ්න විමසන්න
  1. මෙම පින්තූර මොනවා ද?
  2. මෙම පින්තූරවල වැදගත්කම කුමක් ද?
  3. මෙම රූප සටහන්වලට අදාළ රටවල් මොනවා ද?

  යන ප්‍රශ්න සිසුන් වෙත ඉදිරිපත් කරමින් පහත සඳහන් කරුණු ද ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

- ලොව පැරණි පුදුම හතෙන් තුනක්ම ගංගා නිම්න ශිෂ්ටාචාර වලින් ලැබුණු බව
- පිරමීඩය, එල්ලෙන උයන, චීන මහා ප්‍රාකාරය, පිළිවෙලින් නයිල් නිම්න/මෙසපොතේමියා / හොවැංහෝ ශිෂ්ටාචාරවලට අයත්වන බව
- ගංගා නිම්න ශිෂ්ටාචාර වාසීන් දේශපාලන, ආර්ථික, ආගමික, සමාජයීය වශයෙන් වැදගත් අදහස් හා නිමැවුම් ලොවට දයාද කර ඇති බව

මිනිත්තු 10යි

පියවර 7.1.2.2

- පන්තිය සුදුසු පරිදි කණ්ඩයම් කරන්න.
- කණ්ඩායමට එක බැගින් ඇමුණුම 7.1.2.2 හි කාර්ය පත්‍රිකා බෙදා දෙන්න.
- පෙර දිනවල සූදානම් කරගත් පින්තූර ද උපයෝගී කර ගනිමින් අදාළ ක්‍රියාකාරකම් හි නිරත කරවන්න.
- පෙළපොත ඇසුරෙන් ගංගා නිම්න ශිෂ්ටාචාරවල පාලන ක්‍රම, ආර්ථිකය, ආගමික, විද්‍යාත්මක හා කලාත්මක ලක්ෂණ ගොනු කරවන්න.
- අදාළ රූප සටහන් ද ඉදිරිපත් කිරීමට යොමු කරවන්න.
- ක්‍රියාකාරකම සඳහා අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම කරන්න.

මිනිත්තු 30යි

පියවර 7.1.2.3

- සිසුන්ගේ ක්‍රියාකාරකම් පන්තියේ ප්‍රදර්ශනය කරවන්න.
- එක් එක් කණ්ඩායමට තමන්ගේ ක්‍රියාකාරකම විස්තර කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එක් එක් කණ්ඩායම් ඉදිරිපත් කළ තොරතුරු පිළිබඳ ව අනෙකුත් කණ්ඩායම්වල අදහස් විමසන්න.
- සිසුන්ගේ හැකියාවන් හඳුනා ගනිමින් පහත කරුණු ද ඉස්මතු වන සේ සමාලෝචනයක් කරන්න.
- අවශ්‍ය කරුණු සටහන් කර ගැනීමට සිසුන්ට ඉඩ සලස්වන්න.

> - ගංගා නිම්න ශිෂ්ටාචාර ආශ්‍රිත ව විධිමත් පාලන ක්‍රමයක් පැවති බව
> - ගංගා නිම්න ශිෂ්ටාචාර සියල්ලේ ම ආර්ථිකය, කෘෂිකර්මාන්තය මත පදනම් වී තිබූ බව
> - සියළුම ශිෂ්ටාචාරවල මනා සමාජ සංවිධාන පදනමක් පැවති බව
> - ගංගා නිම්න ශිෂ්ටාචාර ආශ්‍රිතව ආගම් හා ඇදහිලි රැසක් පැවති බව
> - ගංගා නිම්න ශිෂ්ටාචාරවල දියුණු විද්‍යාත්මක හා තාක්ෂණික ඥානයක් පැවති බව
> - ගංගා නිම්න ශිෂ්ටාචාර සියල්ලේම ගෘහ නිර්මාණ හා කලා ශිල්ප උසස් තත්වයෙන් පැවති බව

මිනිත්තු 40යි

## තක්සේරුව හා ඇගයීම

- ගංගා නිම්න ශිෂ්ටාචාරවල පාලන ක්‍රම, සමාජ ආර්ථික පදනම හා විද්‍යා කලා තොරතුරු විස්තර කරයි.
- රැස් කර ගත් තොරතුරු වගු ගත කරයි.
- ශිෂ්ටාචාරයක් වශයෙන් එම වැසියන් තුළ තිබූ නිර්මාණශීලී භාවය අගය කරයි.
- කණ්ඩායම් අතර සහයෝගීතාවයෙන් ක්‍රියා කරයි.
- තමන් සොයා ගත් පාලන ක්‍රම, ආර්ථික, සමාජමය ලක්ෂණ පන්තියට ඉදිරිපත් කිරීමට යොමු වෙයි.

ඇමුණුම 7.1.2.1

ලෝකයේ පැරණි පුදුම 7න් කීපයක රූප සටහන්



පිරමීඩ



එල්ලෙන උයන



චීන මහා ප්‍රාකාරය

ඇමුණුම 7.1.2.2

| |
|---|
| කාර්ය පත්‍රිකා අංක - 1<br><br>• ශිෂ්ටාචාර හතරට අයත් ආර්ථික තොරතුරු රැස් කරන්න.<br>• රැස් කර ගත් තොරතුරු නිර්මාණශීලීව ගොනු කරන්න<br>• ඒවා පන්තියට ඉදිරිපත් කරන්න. |
| කාර්ය පත්‍රිකා අංක - 2<br><br>• ශිෂ්ටාචාර හතරට අයත් පාලන ක්‍රම පිළිබඳ ව තොරතුරු රැස් කරන්න.<br>• රැස් කර ගත් තොරතුරු නිර්මාණශීලීව ගොනු කරන්න<br>• ඒවා පන්තියට ඉදිරිපත් කරන්න. |
| කාර්ය පත්‍රිකා අංක - 3<br><br>• ශිෂ්ටාචාර හතරට අයත් ආගමික කටයුතු පිළිබඳ ව තොරතුරු රැස් කරන්න.<br>• රැස් කර ගත් තොරතුරු නිර්මාණශීලීව ගොනු කරන්න<br>• ඒවා පන්තියට ඉදිරිපත් කරන්න. |
| කාර්ය පත්‍රිකා අංක - 4<br><br>• ශිෂ්ටාචාර හතරට අයත් කලාතමක හා විද්‍යාත්මක තොරතුරු පිළිබඳ ව කරුණු රැස් කරන්න.<br>• රැස් කර ගත් තොරතුරු නිර්මාණශීලීව ගොනු කරන්න<br>• ඒවා පන්තියට ඉදිරිපත් කරන්න. |

## ක්‍රියාකාරකම 7.1.3

නිපුනතා මට්ටම : පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාර වලින් ලැබුණු දායාද පිළිබඳ ව අධ්‍යයනය කර ඒවා තව දුරටත් පෝෂණය කිරීමට දායක වෙයි.

ක්‍රියාකාරකම : සියවස් ගණනක විශ්මිත දායාද

කාලය : මිනිත්තු 80

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 7.1.3.1 සඳහන් උපුටා ගැනීම්
- ඇමුණුම 7.1.3.2 කාර්ය පත්‍රිකාව
- බ්‍රිස්ටල් බෝඩ්
- කාඩ්බෝඩ් පත්‍රිකා
- පෙළපොත

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.1.2.1 :
- ඇමුණුම අංක 7.1.3.1 සඳහන් සුමේරියානු (මෙසපොටේමියානු ) පාසලක තොරතුරුවලින් උපුටා ගත් ජේද කොටස පන්තියට පෙනෙන අයුරින් බ්‍රිස්ටල් බෝඩ් එකක ලියා සිසුනට එය කියවීමට අවස්ථාව සලසා දෙන්න.

  පහත සඳහන් ප්‍රශ්න සිසුනට ඉදිරිපත් කරන්න

  1. මෙහි සඳහන් මැටි පුවරු භාවිත කලේ කවරුන්හු ද?
  2. මෙහි දැක්වෙන පරිදි ශිෂ්‍යයා ආහාරයට ගත්තේ මොනවා ද?
  3. මෙහි සඳහන් ශිෂ්‍යයාගේ යහපත් ලක්ෂණ මොනවා ද?

  එම ප්‍රශ්නවලට පිළිතුරු ලබා ගෙන පහත කරුණු ද ඉස්මතු වන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

- මැටි පුවරු ලේඛන කටයුතු සඳහා යොදා ගත්තේ මෙසපොතේමියානු වැසියන් බව
- මෙසපොටේමියානු ශිෂ්ටාචාරය තුළ ආහාරයක් වශයෙන් පාන් වැදගත් වූ බව
- පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාරවල සිසුන් තුළ බොහෝ යහපත් ගුණ ධර්ම තිබූ බව
- මෙසපොතේමියාවෙන් මෙන් ම වෙනත් ගංගා නිම්න ශිෂ්ටාචාර වලින් ද වැදගත් දායාද ලොවට ලැබුණු බව

මිනිත්තු 10යි

පියවර 7.1.2.3

- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කරන්න..
- කාර්ය පත්‍රිකා 7.1.3.2 ඇමුණුම සිසුනට ලබා දෙන්න
- එක් එක් ශිෂ්ටාචාර විසින් ලොවට ලැබුණු දායාද ගොනු කිරීමට සැලස්වන්න.
- ගොනු කරගත් තොරතුරු පන්තියට ඉදිරිපත් කිරීමට සලස්වන්න.

මිනිත්තු 30 යි

පියවර 7.1.2.3

- සිසුන් ගොනුකර ගත් කරුණු ඇතුළත් පත්‍රිකාව පන්තියට ඉදිරිපත් කරවන්න.
- එක් එක් කණ්ඩායමට තම තමන්ගේ කරුණු විස්තර කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- රැස් කරන ලද තොරතුරු හා පහත කරුණු ද ඉස්මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

| |
|---|
| • පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාරවලින් ලොවට බොහෝ දායාද ලැබුණු බව<br>• එම දායාද පාලන කටයුතු, ආර්ථික කටයුතු, ආගමික කටයුතු, විද්‍යාත්මක කටයුතු හා කලා කටයුතුවලදී යොදා ගත හැකි බව<br>• එසේ ලැබුණු දායාද සියවස් ගණනක් ගත වුව ද අදට ද ගැළපෙන බව<br>• එවැනි නිර්මාණ අගය කළ යුතු බව |

මිනිත්තු 40 යි

## තක්සේරුව හා ඇගයීම

- ගංගා නිම්න ශිෂ්ටාචාරවලින් ලැබුණු දායාද නම් කරයි.
- ගංගා නිම්න ශිෂ්ටාචාරවලින් ලද දායාද අගයයි.
- එසේ ලැබුණු දායාද නිර්මාණශීලීව ගොනු කරයි.
- කණ්ඩායම් තුළ හා කණ්ඩායම් අතර සහයෝගයෙන් යුක්තව වැඩ කරයි.
- තමා ගොනු කරගත් ශිෂ්ටාචාරවලට අයත් දායාද පිළිබඳ ව විස්තර පන්තියට ඉදිරිපත් කිරීමට යොමු වෙයි.

පසු වැඩ :- ගංගා නිම්න ශිෂ්ටාචාරවලින් ලද දායාදවල පින්තූර රැස් කරන්න.

ඇමුණුම 7.1.3.1

මම මගේ මැටි පුවරුව කට පාඩමින් කියවමි. දිවා ආහාරය ගැනීමෙන් පසු යළිත් මැටි පුවරුවක් සකස් කළෙමි. ඉන් පසුව ගුරුතුමාගේ නියමය අනුව පාඩම ශබ්ද නගා කියවීමි. සවස් කාලයේ ලිවීමේ අභ්‍යාසයක් දුන්නේය. පාසල අවසන් වූ පසු නිවස කරා ගියෙමි. නිවසට ඇතුළු වන විට පියා නිවසතුළ විවේකයෙන් සිටින ආකරය දුටිමි. මවිසින් අද ලියන ලද අභ්‍යාස ද මැටි පුවරුවේ ලියූ දේ ද පියාට ඇසෙන සේ කියවීමි. ඔහු ඉන් අතිශය සතුටට පත්විය. පසුදින උදයෙන්ම අවදි වූ මා පාසල් යා යුතු බව මවට පැවසීමි. ඇය මට කුඩා පාන් ගෙඩි දෙකක් සාදා දුන්නාය. මම එය රැගෙන ඉක්මණින් ගිය ද ශිෂ්‍ය නායකයා ඔබ ප්‍රමාද වූයේ මක් නිසාදැයි ඇසීය. සසල වූ හදවතින් යුතුව ගුරුතුමා සිටි කාමරයට ඇතුළු වූ මා ඔහුට ගෞරවාන්විතව ආචාර කළෙමි.

ඇමුණුම 7.1.3.2

## කාර්ය පත්‍රිකාව

- පෙළපොත ආධාර කරගෙන පහත වගු සටහන සම්පූර්ණ කරන්න.
- එහි සඳහන් තොරතුරු කෙටියෙන් විස්තර සහිතව පන්තියට ඉදිරිපත් කරන්න.

| ශිෂ්ටාචාරය | දායාද කළ දෑ |
|---|---|
| ඉන්දු නිම්න | |
| හොවැංහෝ | |
| යුප්‍රටීස් - ටයිග්‍රීස් | |
| නයිල් | |

## ඒකකය : 7.2 ශිෂ්ටාචාර ව්‍යාප්තිය

### හැඳින්වීම

ග්‍රීසිය, රෝමය, ඉන්දියාව, ආරාබිය යන රටවල් ලෝකයේ දියුණු ශිෂ්ටාචාර ගොඩනගා ගත් ආකාරය මීට පෙර අප ඉගෙන ගෙන ඇත්තෙමු. මේ යුගවල එම ශිෂ්ටාචාරවල පැවති විවිධ ක්‍රියාතාරකම් ශ්‍රී ලංකාව කෙරෙහි ද බලපා ඇති බව අපගේ ඉතිහාසය තුළින් දැකිය හැකිය. ඔවුන් තම රටවල දේශපාලන බලය ගොඩනගා ගත් අතර විවිධ රටවල් කෙරෙහි පාලන ක්‍රමය, නීතිය, කලාව, ආගම ආදී අංශයන්ගෙන් බලපෑම් කර ඇත. එසේම ලෝකයේ බොහෝ රටවල් සමග වෙළෙඳ සබඳතා පවත්වා ඇත. මේ ශිෂ්ටාචාර අවදිවල සොයා ගනු ලැබූ නොයෙකුත් නිමැවුම් ලෝකයේ දියුණු සංස්කෘතිවල පදනම සකස් කිරීමෙහි ලා බලපා ඇති බව ද පෙනී යයි. එවැනි බලපෑම් ඇති කළ ශිෂ්ටාචාරවල ආරම්භය ව්‍යාප්තිය සහ ඔවුන් ලොවට ලබා දී ඇති දායාද ආදිය පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම ඒකකයෙන් අපේක්ෂා කෙරේ.

නිපුණතා : ලෝක ශිෂ්ටාචාරයන් හි ආරම්භය.වර්ධනය හා ව්‍යාප්තිය පිළිබඳ තොරතුරු විමර්ශනය කර ඉන් පසු කාලීන ශිෂ්ටාචාරයන්ට ලද උරුමයන් පිළිබඳ විමර්ෂණය කරයි.

නිපුණතා මට්ටම :

- ග්‍රීක හා රෝම ශිෂ්ටාචාර පිළිබඳ තොරතුරු විමසා බලයි.
- ඉන්දියානු ශිෂ්ටාචාරයේ කැපී පෙනෙන ලක්ෂණ විමර්ශනය කරයි.
- අරාබි ශිෂ්ටාචාරයේ ආරම්භයේ සිට එහි ව්‍යාප්තියේ වූ කැපී පෙනෙන ලක්ෂණ විමර්ශනය කරයි.

විෂය අන්තර්ගතය :

### ශිෂ්ටාචාර ව්‍යාප්තිය

7.2.1 :- ග්‍රීසිය

- පිහිටීම
  - බටහිරින් අයෝනියානු මුහුදටත් නැගෙනහිරින් ඊජියානු මුහුදටත් මැදිව මධ්‍යධරණී මුහුදට නෙරා ඇති අර්ධ ද්වීපය සහ ඊට දකුණින් පිහිටි ක්‍රීට් දිවයින ඇතුළු දූපත් සමූහය ග්‍රීසියට අයත් ය.

- ආරම්භය හා ව්‍යාප්තිය
    - ග්‍රීක ඉතිහාසය ආරම්භය පිළිබඳ ඉගෙනීමට මූලාශ්‍ර ලෙස සැලකෙන්නේ පුරාවෘත්ත සහ වීර කාව්‍ය ඇතුළත් හෝමර්ගේ 'ඉලියඩ්' සහ 'ඔඩෙසි' යන ග්‍රන්ථ දෙකයි.
    - හෙසියඩ්ගේ වැඩ සහ දවස් කෘතිය ද වැදගත් මූලාශ්‍රයකි. ඒ අනුව ග්‍රීක ශිෂ්ටාචාරයේ ආරම්භය ක්‍රි.පූ. 1000 පමණ කාලයේ සිට සිදු වූ බව පිළිගැනේ. ( මෑතක දී කරන ලද කැනීම්වලින් ක්‍රි.පූ. 1000ට පෙර එම ප්‍රදේශවල මිනෝවන් සහ මයිසීනියන් යනුවෙන් හැඳින්වෙන ශිෂ්ටාචාර දෙකක් පැවති බව සොයා ගෙන ඇත.)

- පාලන කටයුතු
    - මුලින් ම ග්‍රීසියට ඇතුල් වූ සංචාරක ආර්ය ගෝත්‍රිකයන් විසින් කුඩා ගම් තනා ගැනීම
    - ක්‍රි. පූ. 700 පමණ වන විට ඒවා පෞර රාජ්‍ය බවට පත් වීම
    - ඒවාට ආවේණික වූ පාලන ක්‍රමයක් ගොඩනැගීම
    - ස්වාධීන වූ නගර රාජ්‍යවල පාලනය ඒවායේ පුරවැසියන් විසින් ම මෙහෙය වීම
    - විවිධ පෞර රාජ්‍යවල විවිධ ආණ්ඩුක්‍රම පැවතීම
    - ඇතැන්ස් හි ප්‍රජාතන්ත්‍රවාදයත්, ස්පාර්ටා හි රාජාණ්ඩුක්‍රමයත් පැවතීම.
    - ඇතැන්ස්, ස්පාර්ටා, කොරින්ත්, ආකේඩියා වැදගත් පෞර රාජ්‍යයන් වීම

- වහල් ක්‍රමය
    - ග්‍රීක සමාජය පුරවැසියන් හා වහලුන් වශයෙන් කොටස් දෙකකට බෙදී තිබීම
    - පුරවැසියන් බර වැඩ කිරීම නුසුදුසු බව සැළකීම
    - වහලුන් පුරවැසියන් ලෙස නොසැලකීම
    - ආර්ථික කටයුතුවල දී බරවැඩ සඳහා මෙන් ම ගෙදර දොර එදිනෙදා කටයුතු සඳහා වහලුන් යොදා ගැනීම

- ප්‍රජාතන්ත්‍රවාදයේ ආරම්භය
    - ප්‍රජාතන්ත්‍රවාදයේ ආරම්භය ඇතන්ස් පෞර රාජ්‍යයේ සිදු වූ බව සැලකීම
    - වයස 18ට වැඩි ග්‍රීක පිරිමින් පමණක් පුරවැසියන් ලෙස සැලකීම
    - පෞර රාජ්‍ය කුඩා ඒකකයක් වූ බැවින් එහි පුරවැසියන් සංඛ්‍යාව සීමා සහිත වූ බැවින් ඒ සියලු දෙනාට දේශපාලන කටයුතුවලට සම්බන්ධ වීම අසීරු නොවීම

- කෘෂිකර්මය හා වෙළෙඳ කටයුතු
    - තිරිඟු, බාර්ලි වැනි ධාන්‍ය වගා කිරීම
    - ඔලිව්, මිදි වැනි පළතුරු වගා කිරීම
    - සතුන් ඇති කිරීම
    - ග්‍රීක ජාතිකයින් වෙළෙදාමේ යෙදෙන අතර ලංකාවට ද පැමිණි බව ටොලමිගේ සිතියමෙන් පැහැදිලි වීම
    - ඔවුන් ලංකාව තප්‍රොබේන් නමින් හැඳින්වීම

- නිදහස් චින්තනය
    - ග්‍රීක අධ්‍යාපන ක්‍රමයේ අරමුණ වූයේ ශාරිරික හා මානසික වශයෙන් දරුවන්ට පරිපූර්ණ අධ්‍යාපනයක් ලබා දීමයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් නිදහස් චින්තනය ඇති විය.


- දාර්ශනිකයෝ

| | | |
|---|---|---|
| සොක්‍රටීස් | - | කිසියම් නිගමනයක් හෝ මතයක් පිළිගැනීමේ දී දැඩි ලෙස තර්කයට භාජනය කළ යුතු බව පිළිගත් දාර්ශනිකයෙකි. |
| ප්ලේටෝ | - | තම ගුරුවරයා වූ සොක්‍රටීස්ගේ මතවාදය අනුගමනය කිරීම |
| | - | ' රිපබ්ලික් ' හෙවත් සමූහාණ්ඩුව නම් ග්‍රන්ථයෙන් පරමාදර්ශී රාජ්‍යයක් පිළිබඳ දර්ශනයක් ඉදිරිපත් කර තිබීම. |
| | - | ' ඇකඩමි ' නමින් අධ්‍යාපන ආයතනයක් පවත්වා ගෙන යාම |
| ඇරිස්ටෝටල් | - | තාරකා විද්‍යාව, ගණිතය, කාව්‍ය ශාස්ත්‍රය, භෞතික විද්‍යාව අලංකාර ශාස්ත්‍රය, දේශපාලන විද්‍යාව වැනි විවිධ විෂයයන් රාශියක් පිළිබඳ හසල දැනුමක් තිබීම |

- විද්‍යාඥයෝ

| | | |
|---|---|---|
| හිපොක්‍රටීස් | - | වෛද්‍ය විද්‍යාවේ පියා වශයෙන් සලකනු ලැබීම |
| | - | වෛද්‍ය වෘත්තිකයන් සඳහා ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වා දීම |
| ඩිමොක්‍රටස් | - | පරමාණුව පිළිබඳ දර්ශනය හඳුන්වා දීම |
| යුක්ලිඩ් | - | ජ්‍යාමිතිය පිළිබඳ පොතක් ලියූ ගණිත ශාස්ත්‍රඥයකි. |
| පෛතගරස් හා ආකිමිඩීස් | - | ගණිතය විෂය පිළබඳ නව සොයා ගැනීම් කළ ග්‍රීක පඬිවරුන්ය |

සොක්‍රටීස් ප්ලේටෝ ඇරිස්ටෝටල්



රූපය 7.2.1 ග්‍රීක දාර්ශනිකයෝ

- ආගම
  - හිරු, සඳ, සුළඟ වැනි ස්වභාවික වස්තූන්ට වන්දනාමාන කිරීම.
  - විශ්වයට අධිපති සියුස් දෙවියන්ට ප්‍රධාන තැන හිමිවීම
  - සූර්ය දිව්‍ය රාජයා - ඇපලෝ
  - සමුද්‍රයට අධිපති - පොසිඩන්
  - හෙරුනා සහ ඇතිනා යන දෙවඟනන් වෙනුවෙන් වැඳුම් පිදුම් කිරීම හා දේවස්ථාන ඉදි කිරීම
  - සෑම පෞර රාජ්‍යයකටම අධිපති දෙවියෙකු හෝ දෙවඟනක සිටි බව පිළි ගැනීම.

    උදා : ඇතැන්ස්පුර රජයට අධිපති ඇතීනා දෙවඟන



රූපය 7.2.2 ඇතීනා දෙව්මැදුර

- කලාව
  - ගෘහ නිර්මාණ ශිල්පය

    හුණුගල්වලින් හා ඔප දැමූ කිරිගරුඬ වලින් ගොඩනැගිලි ඉදි කිරීම
  - ඇතන්ස්හි ඇක්‍රොපොලිස් නම් ස්ථානයේ ඉදි කරන ලද පාතීනෑන් ගොඩනැගිල්ල ( ඇතීනා දෙවඟනට කැප කරන ලද )
  - ඩොරික් සම්ප්‍රදායක නිම කරන ලද කුළුණු වල දේව කථා අලංකාර ලෙස කැටයමට නගා තිබීම
  - ඩයෝනිසියස්ගේ විශාල රඟ මඩල
  - ප්‍රතිමා
    - ග්‍රීක කලාව පිළිබඳ විවිධ දක්ෂතා දැක් වූ ග්‍රීකයන් විසින් ඇත් දළින් හා රනින් ප්‍රතිමා නෙළීම

      උදා : ඇතීනාගේ ප්‍රතිමාව
      සියුස් දෙවියාගේ ප්‍රතිමාව
      කවපෙත්ත විසිකරන්නාගේ ප්‍රතිමාව



රූපය 7.2.3 ඇතීනා දෙවගන

- සාහිත්‍ය
    - ග්‍රීකයින් සතු උසස් සාහිත්‍ය කලාවක් තිබීම
    - හෝමර් විසින් රචිත ඉලියඩ් සහ ඔඩිසි
    - ඊස්කිලස්, සොපොක්ලීස් හා යුරිපිඩිස් විසින් නාට්‍ය රචනා කිරීම
    - හෙරඩෝටස් ඉතිහාසයේ පියා වශයෙන් සැලකීම




රූපය 7.2.4 කවපෙත්ත විසිකරන්නා

- ජන ජීවිතය
    - ග්‍රීක සමාජය පුරවැසියන් හා වහලුන් වශයෙන් කොටස් දෙකකට බෙදී තිබීම
    - වහලුන්ගේ බර වැඩ ගැනීම නිසා ඔවුන් දුෂ්කර ජීවිත ගත කිරීම
    - සාමාන්‍ය ජනතාව සරල චාම් ජීවිතකයට පුරුදුව සිටීම
    - ස්ත්‍රියට පුරුෂයාට වඩා පහත් තැනක් හිමිවීම
    - නාට්‍ය, සංගීතය හා ක්‍රීඩා උත්සව පිළිබඳ උනන්දුවක් දැක්වීම
    - අධ්‍යාපනය පිරිමින්ට පමණක් සීමා වීම

- මහා ඇලෙක්සැන්ඩර් රජුගේ නැගීම ( අධිරාජ්‍ය ව්‍යාප්තිය )
    - මැසිඩෝනියාවේ පිලිප් රජුගේ මරණින් පසු ක්‍රි.පු. 336 දී ඔහුගේ පුත් ඇලෙක්සැන්ඩර් රජවීම
    - ඔහුගේ දක්ෂ නායකත්වය නිසා ග්‍රීක ප්‍රදේශ තම රාජ්‍යයට ඈඳා ගැනීමට සමත් වීම
    - පර්සියානු අධිරාජ්‍යයාට එරෙහි ව සටන්කොට ජය ගැනීම
    - ෆිනීෂියානු නගර සහ ඊජිප්තුව ඔහුගේ පාලනය යටතට පත්වීම
    - නයිල් ගඟේ මුවදොර ඇලෙක්සැන්ඩ්‍රියා නගරය ඉදි කිරීම
    - ඉන්දියාව දෙසට ආක්‍රමණයක් මෙහෙය වීම
    - බැබිලෝනියාවේ සිය අගනුවර පිහිටුවා ගැනීම
    - වයස අවුරුදු 33 දී මිය යන විට ඔහු සතුව විශාල අධිරාජ්‍යයක් පැවතීම

### 7.2.2 රෝමය

- ආරම්භය හා ව්‍යාප්තිය
    - රෝම නගරය ඉතාලියේ ටයිබර් නදී මුවදොරට ඉහළින් පිහිටා තිබීම
    - ජනප්‍රවාද අනුව රොමියුලස් හා රීමස් යන සොහොයුරන් දෙදෙනා අතර ඇති වූ තරගයක ප්‍රතිඵලයක් වශයෙන් රෝම නගරය ගොඩ නැංවූ බව
    - ක්‍රි.පූ. 753 පමණ මෙය ඉදි කිරීම
    - ඉතාලියේ සිටි ආර්ය ගෝත්‍ර අතරින් ප්‍රධාන වූ ලතින්වරුන් ගේ අගනුවර රෝමය වූ නිසා ඔවුන් රෝමවරුන් නමින් ප්‍රසිද්ධ වීම
    - ක්‍රි.පූ. 270 දී පමණ මුළු ඉතාලි අර්ධ ද්වීපයේ ම පාලන බලය රෝමයට හිමි වීම
    - පසුව රෝම රාජ්‍යය ග්‍රීසිය ඇතුළු මධ්‍යධරණී මුහුද අවට රටවලට තම බලය ව්‍යාප්ත කිරීම
    - ක්‍රි.පූ. 3 වන සියවස අග භාගය වන විට ඇතැම් මධ්‍යධරණී ප්‍රදේශ හා උතුරු අප්‍රිකාව ඇතුළු ප්‍රදේශවල ව්‍යාප්ත වීම
    - ජුලියස් සීසර් රෝම අධිරාජ්‍යයාගේ කීර්තිමත් පාලකයා වීම
    - රයින් ගඟ දක්වා ප්‍රදේශ රෝම අධිරාජ්‍යයට ඈඳා ගැනීම
    - එංගලන්තය ද ජය ගැනීම




ජුලියස් සීසර්
රූපය 7.2.5

- පාලන ක්‍රමය
    - මුලින් ම ගෝත්‍ර ලෙස සමාජය සකස් වී තිබීම
      උදා : එට්‍රස්කන්
    - ක්‍රි.පූ. 500 දී පමණ රෝම සමූහාණ්ඩුව පිහිටු වීම
    - සමූහාණ්ඩු ක්‍රමය යටතේ කොන්සල්වරුන් දෙදෙනෙකු මගින් පාලනය කිරීම
    - ඔවුන් මගින් යුද්ධ කටයුතු මෙන් ම සිවිල් කටයුතු පාලනය කිරීම
    - ජුලියස් සීසර් අධිරාජ්‍ය විසින් අධිරාජ්‍යයාට සුදුසු පරිදි පාලන ක්‍රමයක් සකස් කිරීම
    - සීසර් ආඥාදායකයකු ලෙස කටයුතු කිරීම
    - සෙනට් සභිකයන්ගේ කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් වශයෙන් ජුලියස් සීසර් මරණයට පත්වීම

- ඔගස්ටස් සීසර්ගේ පාලන සමය රෝම අධිරාජ්‍යගේ ස්වර්ණමය යුගය වශයෙන් සැලකීම
- ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ උපත ලැබූයේ ඔගස්ටස් සීසර් රෝම අධිරාජ්‍ය තනතුරු දරණ සමයේ වීම
- රෝම අධිරාජ්‍යවරුන් අතර ක්ලෝඩියස් , නීරෝ, ජස්ටිනියන්, මහා කොන්ස්ටන්ටයින් වැනි අය වැදගත් වීම

- නීතිය හා නීතියේ පාලනය
  - ජස්ටිනියස් අධිරාජ්‍යයා නීතිවේදියකු වශයෙන් ප්‍රසිද්ධ වීම
  - ඔහුගේ නමින් නීති පද්ධතියක් සකස් කිරීම
  - රෝම නීතිය රෝමයෙන් ලොවට ලැබූ විශේෂ දායාදයක් වීම
  - ශ්‍රී ලංකාවේ භාවිතාවන රෝම ලන්දේසි නීති ක්‍රමය රෝම නීතිය ආභාෂයෙන් සකස් වූවක් වීම
  - ජූරි සභා ක්‍රමය රෝම නීතියේ විශේෂිත ම අංගයක් වීම.

- ආගම
  - මුල් යුගයේ සංවිධානාත්මක ආගමක් නොවීම
  - අව්ව, වැස්ස, විදුලිය කෙටීම වැනි ස්වභාවධර්මයේ විවිධ ස්වරූපයන් දේවත්වයේ ලා සැලකීම
  - බහු දේව වාදය
  - ජුපිටර් හා මිනර්වා යන දෙවිවරුන් විශේෂ තැනක් ගැනීම
  - මියගිය හා ජීවමාන අධිරාජ්‍යයන් දේවත්වයෙහි ලා වන්දනා මාන කිරීම.

    උදා : සීසර් අභිවන්දනය
  - කොන්ස්ටන්ටයින් අධිරාජ්‍යයාගේ පාලන සමයේ ක්‍රි.ව. 313 දී ක්‍රිස්තු ධර්මය රෝම අධිරාජ්‍ය තුළ නීත්‍යානුකූල ආගමක් ලෙස ප්‍රකාශයට පත් කිරීම
  - තියඩෝසියස් අධිරාජ්‍යයගේ කාලයේ දී ක්‍රිස්තු ධර්මය රෝම අධිරාජ්‍යයේ එකම නීත්‍යානුකූල ආගම හෙවත් රාජ්‍ය ආගම බවට පත්වීම

- වෙළෙඳාම
    - පෙරදිග හා අපරදිග පැවති වෙළෙඳාමේ කේන්ද්‍ර ස්ථානය රෝමය වීම
    - පෙරදිග සමඟ වෙළෙඳ සබඳතා පැවැත්වීමේ දී රෝමවරුන් ප්‍රධාන මධ්‍යස්ථානය ඇලෙක්සැන්ඩ්‍රියා වීම
    - ඉන්දියාව හා ශ්‍රී ලංකාව වැනි රටවලින් කුළු බඩු මුතු මැණික් ගෙන ඒවා යුරෝපා රටවලට අලෙවි කිරීම




රෝම කාසි
රූපය 7.2.6

    - චීනයෙන් පටපිලි, ඖෂධ වර්ග, සුවඳ විලවුන් අලංකාර විසිතුරු භාණ්ඩ ගෙන ඒම
    - කාසි භාවිතය පැවතීම
    - ශ්‍රී ලංකාවේ මහාතිත්ත, ගොඩවාය වැනි පැරණි වරායවලින් සහ සීගිරියේ විශාල වශයෙන් රෝම කාසි හමු වී තිබීම.
    - එය රෝමය හා ශ්‍රී ලංකාව අතර වෙළෙඳ සබදතා පැවති බවට සාක්ෂි වීම.
    - රජවරු රෝමය සමඟ වෙළෙඳ සබඳතා පැවැත්වූ බව විදේශිකයන්ගේ වාර්තාවල සඳහන් වීම
    - භාතිකාභය රජු රුවන්වැලි සෑය අලංකාර කිරීම සඳහා රෝමයෙන් රතු පබළු ගෙන්වූ බව ප්ලිනිගේ වාර්තාවල සඳහන් වී තිබීම.

- ජන ජීවිතය
    - රෝමවරු සමාජ සම්මතයන්ට අනුකූලව ජීවිත ගත කිරීම ඉතා ඉහලින් අගය කිරීම.
    - පවුල ඉතා පාරිශුද්ධ වස්තුවක් ලෙස සැලකීම හා ප්‍රධානියා පියා වීම
    - පවුලේ සියලු දෙනාම පියාට අවනත වීම
    - දෙමාපියන්ට කීකරුවීම උසස්ම ගුණාංගයක් ලෙස සැලකීම
    - නීති ගරුක බව සහ නීති ගරුක පුද්ගලයාට මහත් ගෞරවයෙන් සැලකීම
    - රෝමවරුන් ප්‍රායෝගිකත්වයට නැඹුරු වූ ජාතියක් වීම
    - ග්‍රීක ශිෂ්ටාචාරය න්‍යායන්ට නැඹුරු වූ අතර රෝම ශිෂ්ටාචාරය ප්‍රායෝගිකත්වයට නැඹුරු වීම

## 7.2.3 අරාබිය

- ආරම්භය හා ව්‍යාප්තිය
    - වර්තමාන මැද පෙරදිග කලාපයට අයත් රටකි. එය කාන්තාර පෙදෙසක්වන අතර රතු මුහුද පර්සියන් බොක්ක සහ අරාබි මුහුදට මායම්ව පිහිටා තිබීම. ක්‍රි.පූ. 7 වන සියවසේ ඉස්ලාම් ධර්මය බිහිවීමත් සමඟ අරාබි සාහිත්‍ය ද ආරම්භ විම.
    - 8 වන සියවස වන විට ආරාබින්, මිසරය, පලස්තීනය, පර්සියාව, උතුරු අප්‍රිකාව හා ස්පාඤ්ඤය දක්වා ද උතුරු ඉන්දියාවේ සින්ද් ප්‍රදේශ දක්වා ද බලය පතුරවා හැරීම

- ඉස්ලාම් ධර්මයේ ව්‍යාප්තිය
    - ක්‍රි.ව. 570 දී ආරාබියේ මක්කම නුවර මහම්මත් තුමා ඉපදීම
    - මව අමිනා පියා අබ්දුල්ලා නම් වීම
    - තරුණ වියේ දී ධනවත් වැන්දඹුවක් සමඟ විවාහ වීම
    - පසුව ඔහු භාවනා කිරීම ආරම්භ කිරීම.
    - අනතුරුව අල්ලාහ් දෙවියන්ගේ පණිවුඩය අනාවරණය කිරීම
    - පිළිම වන්දනාව නිශ්ඵල බව ඔහුගේ ප්‍රධානතම ඉගැන්වීම වීම
    - ක්‍රි. ව. 622 දී මක්කම නුවරින් මදිනා නුවරට යාම හා එහි දී ඉස්ලාම් ධර්මය ජනප්‍රිය වීම
    - මක්කම නුවරින් මදිනාවට යාම හජ්රා නමින් හැඳින්වීම
    - මහම්මත්තුමාගේ ඉගැන්වීම්වලට බොරු නොකීම, සොරකම් නොකිරීම, අනුන්ට උදව් කිරීම වැනි උසස් ගුණාංග ඇතුල්වීම නිසා නොබෝ කලකින් ඉස්ලාම් ධර්මය ජනප්‍රිය වීම
    - ඉස්ලාම් බැතිමතකුගේ යුතුකම් පහක් දේශනා කරන ලද අතර ජීවිත කාලයේ දී එක් වරක්වත් මක්කමේ පිහිටි කාබා නම් දේවස්ථානයට වන්දනාවේ යා යුතු බව ඉගැන්විම
    - මුස්ලිම්වරු දිනකට පස් වතාවක් සහ සිකුරාදා දින මුස්ලිම් දේවස්ථානයට ගොස් අල්ලාහ් දෙවියන්ට යාඥා කළ යුතු වීම
    - අවුරුද්දකට මසක් දිනපතා හිරු උදාවීමට පෙර පටන් හිරු බැසයන තෙක් මුස්ලිම්වරු ආහාර නොගත යුතු වීම ( රාමසාන් කාලය )
    - තව ද ඒ කාලය තුල යහපත් කටයුතුවලට යෙදිය යුතු වීම
    - මේ කරුණු ඇතුලත් ශුද්ධ වූ පොත 'කුරාණය' නමින් හැඳින්වීම
    - මහමුද්තුමාගේ ඇවෑමෙන් නායක තනතුරට පත් වූ කාලිෆ්වරුන් අරාබි බලය පැතිර වීමට කටයුතු කිරීම.

- භාෂාව හා සාහිත්‍යය
    - ඉස්ලාම් ධර්මය පැතිරීමෙන් පසු ආරාබි භාෂාව හා සාහිත්‍යයේ මහත් දියුණුවක් ඇති වීම
    - කුරානය දෙවියන් වැඳීම සඳහා යාඥා ග්‍රන්ථයක් ලෙස ද මුස්ලිම් දරුවන්ට අධ්‍යාපනය ලබා දීම සඳහා වූ පාඨ ග්‍රන්ථයක් ලෙස ද භාවිතා වීම




රූපය 7.2.7 කුරානය

    - යටත් කරගත් රටවලින් ඔවුහු නොයෙක් දේ ඉගෙන ගත් අතර පිටරටවලට තමන්ගේ දෑ ඉගැන්වීම ද කළහ.
    - ග්‍රීක ශිෂ්ටාචාරය පිරිහුණ අවධියේ එම පොත් පත්අරාබි බසට පෙරලීම
    - පිටරටින් ද උගතුන් ගෙන්වීම
    - විද්‍යාව, ඉතිහාසය මෙන් ම රසවත් කවි පොත් ද කතා පොත් ද ලිවීම.
      උදා : අද පවා ජනප්‍රිය " අරාබි නිසොල්ලාසය "
    - පර්සියන් බසින් ලියා ඇති ඔමාර් කයියාම්ගේ 'රුබෙයියාට්' ග්‍රන්ථය මුස්ලිම්වරුන් අතර ජනප්‍රිය වීම

- වෙළෙඳාම
    - ආරම්භයේ සිට ම අරාබිවරුන් වෙළෙඳාමට ප්‍රසිද්ධියක් දැරීම විශේෂ ලක්ෂණයක් වීම
    - ඔවුන් ඉන්දියාව, අප්‍රිකාව, චීනය සමග වෙළෙඳ සබඳතා පැවැත් වීම.
    - ලංකාවෙන් කුරුඳු, ගම්මිරිස්, මැණික්, මුතු, ඇතුන්, ඇත්දල ආදිය වෙලදාම සඳහා ගෙන යාම


- විද්‍යාව
    - තාරකා විද්‍යාව හා ගණිතය පිළිබඳ මනාව දැන සිටීම
    - ඉන්දියාවෙන් ද විවිධ අංශ පිළිබඳ ඉගෙන ගැනීම
    - දශක ක්‍රමය ඉන්දියාවෙන් ඉගෙන ගත් විශේෂ අංශයක් වීම.
    - එය 1, 2, 3 ආදී වශයෙන් දැක්වෙන අලුත් ක්‍රමයකට ලියා යුරෝපයට ඉගැන්වීම
    - අරාබි අංක නමින් අප එය භාවිතා කිරීම
    - වීජ ගණිතය හෙවත් ඇල් - ජිබ්රා යනුවෙන් හඳුන්වා දීම
    - භූගෝල විද්‍යාව පිළිබඳ ඉගෙනීම
    - රසායන විද්‍යාව පිළිබඳ උනන්දු වීම
    - වෛද්‍ය විද්‍යාවෙහි ද නිපුණයන් වීම
    - වෙද විදුහල් කිහිපයක්ම පිහිටු වීම
    - අවිසින්නා උසස් වෛද්‍යවරයෙක් වූ අතර වෛද්‍ය ග්‍රන්ථයක් ලිවීම

- කර්මාන්ත
  - කර්මාන්ත ගැන උසස් දැනුමක් තිබීම
  - නොයෙක් රටා අනුව වටිනා රෙදි විවීම
  - රෙදි සායම් පෙවීම, හා වීදුරු භාණ්ඩ සෑදිම දැන සිටීම
  - ලෝහ වැඩ හා සම්වැඩ දැන සිටීම
  - කඩදාසි භාවිතය යුරෝපයට හුරු කිරීම
  - යුරෝපීය ශාස්ත්‍රඥයන්ට නිහඬව සිටි අවධියේ අරාබීන් එය රැක ගැනීම විශේෂත්වයක් වීම
- ගෘහ නිර්මාණ
  - අරාබිවරුන් අලංකාර ගොඩනැගිලි තැනීමට දැන සිටිම.
  - විසිතුරු මාලිගා, දේවස්ථාන ඉදිකොට තිබීම.
  - දමස්කස්, කෝඩෝවා, සමාරා වැනි නගරවල මෙවැනි විසිතුරු දේවස්ථාන දක්නට ලැබීම
  - මෙම ගොඩනැගිල්ල විශේෂ ලක්ෂණය අශ්ව ලාඩමක හැඩය ගත් ආරුක්කු සහ ගොඩනැගිලි මුදුන්හි අර්ධ ගෝලාකාර ශිඛරයක හැඩයක් තිබීම



සමාරා පල්ලිය
රූපය 7.2.8

- ජන ජීවිතය
  - මුල් පදිංචිකරුවෝ සංචාරක ගෝත්‍රිකයන් වශයෙන් ජීවිත ගත කළහ.
  - පසුව කුඩා ගම්මාන ඇති වී පසුව නගර බිහිවීම.
  - නගර වටා සතුරු උවදුරුවලින් ආරක්ෂා වීමට තාප්ප බැඳීම.
  - සංචාරක ජීවිත ගත කළ අය කූඩාරම්වල ජීවත් වීම.



ප්‍රවාහනය සඳහා ඔටුවන් යොදා ගැනීම
රූපය 7.2.9

  - ඔවුන්ගේ ප්‍රධාන ආහාරය කිරි, රටඉදි හා මස්වීම.
  - ඔවුහු සාමාන්‍යයෙන් කපු පිළියෙන් තැනූ දිග කබායක් ඇඳ ඉණ වටා බඳ පටියක් දැමීම.
  - හිස සහ මුහුණ ආවරණය වන සේ සාලුවක් දමා එය හිසට තදවන සේ පටියක් බැඳීම.
  - ඉතාමත්ම ප්‍රයෝජනවත් සත්වයා ඔටුවා වීම. බීමට ජලය නැතිව දීර්ඝ කාලයක් කාන්තාරයේ ගමන් කිරීමට ඔටුවාට හැකි වීම ඊට හේතුවීම
  - බඩු එහා මෙහා ගෙන යාමට මෙන්ම ප්‍රවාහන කටයුතු සඳහා ද ඔටුවා ප්‍රයෝජනවත් වීම

## 7.2.4 ඉන්දියාව


- වෛදික යුගයේ සිට මගධ අධිරාජ්‍ය දක්වා
  - ගෝත්‍ර අවධිය, කි.පූ. 1500 පමණ කාලයේ දී ගෝත්‍ර කණ්ඩායම් වශයෙන් පැමිණි ආර්යයෝ වයඹ දිග ඉන්දියාවේ සින්දු ගංගා නිම්නයේ පදිංචි වීම
  - ගෝත්‍ර නායකයා රාජන් යනුවෙන් හැඳින්වීම
  - සංක්‍රමණ අවධියේ වයඹදිග ඉන්දියාවේ සිටි ගෝත්‍ර අතරින් පුරු, යදු, තුර්වාශ, අනු, දෘහ්‍යු යන ඒවා ප්‍රධාන ගෝත්‍ර විම.
  - භරත ගෝත්‍රය ප්‍රධාන පෙළේ ගෝත්‍රයක් වන අතර එය රාජන් වූයේ සුදාස්ය. ඔහු තම පුරෝහිත බමුණා වූ විශ්වමිත්‍ර නෙරපා දමා වශිෂ්ඨ නමැති බමුණා පුරෝහිත තනතුරට පත් කර ගති. ඉන් කෝපයට පත් විශ්වමිත්‍ර ඉහත සඳහන් ගෝත්‍ර සමඟ එකතු වී සුදාස්ට එරෙහිව යුද්ධ කළේ ය.
  - මේ යුද්ධයෙන් භරත ගෝත්‍රය ජය ගත් අතර අනෙක් ගෝත්‍ර නායකයින් ගණනාවක් මරා දමන ලදී. පසු කලක භරත ගෝත්‍රයේ නම මුළු ඉන්දියාටම හැඳින්වීම සඳහා යොදා ගන්නා ලදී.

- සොළොස් මහා ජනපද අවධිය
  - ක්‍රි.පු. හයවන සියවස පමණ වන විට උතුරු ඉන්දියාවේ සොළොස් මහ ජනපද යනුවෙන් හැඳින් වූ රාජ්‍ය සමූහයක් පිළිබඳ බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ .
  - අංග, මගධ, කාසි, කෝසල, වජ්ජි, මල්ල, චේදි, වත්ස, කුරු, පංචාල, මත්ස්‍ය, සුරසේන, අස්මත, අවන්ති, ගන්ධාර කම්බෝජ
  - ජෛන මූලාශ්‍රවල සඳහන් නාම මීට වඩා වෙනස් වෙයි.
  - ටික කාලකින් ජනපද දහසයෙන් හතරක් ඉතා බලවත් විය. විදේහ, කෝසල, අවන්ති, මගධ : ඉන් පසුව කෝසල හා මගධ බලවත් ම රාජ්‍යයන් විය.

- අධිරාජ්‍ය අවධිය
  - බිම්බිසාර රජු: අංගයේ රජකම් කළ බ්‍රහ්මදත්ත රජු මරා දැමීම.
  - අජාසත් රජුගේ ජයග්‍රහණ : ලිච්ඡවීන් සමඟ ඇති වූ සංග්‍රාමය කෝසලය මගධයට යටත්වීම
  - අවසානයේ දී මගධය අධිරාජ්‍යයක් බවට පත්වීම


- ආගමික චින්තනයේ වර්ධනය
  - හින්දු : වෛදික යුගයේ ජනතාව ස්වභාවික වස්තූන්ට දේවත්වය ආරෝපණය කිරීම : අග්නි සූර්ය, උෂා වාත, පෘථිවි, මරුත්, අශ්වින් සෝම රුද්‍ර

- රාජ්‍ය සංස්ථාව බිහිවන විට යාග හෝම පැවැත්වීම ඉතා සංකීර්ණ කාර්යයක් බවට පත්වීම
  උදා : අශ්වමෙධ, රාජසූය, වාජපේය යන යාග හෝම
- යාගහෝම පිළිබඳ ව හා ඒවා කිරීමේ දී අනුගමනය කළ යුතු චාරිත්‍ර වාරිත්‍ර ගැන වෙද ග්‍රන්ථවලින් කියවේ



විශ්ණු හා ශිව දෙවිවරු
රූපය 7.2.10

ඍග්, සාම, යජූර්, අතර්වන්, බ්‍රාහ්මණ සාහිත්‍යය, උපනිෂද් ග්‍රන්ථ, ආරණ්‍යක
- මෙම ග්‍රන්ථවලින් හින්දු ආගමේ විකාශය පිළිබඳ අදහසක් ඇති කර ගත හැකි වීම.



ජෛන මහා වීර උපන් පැරණි වෛශාලී නුවර
රූපය 7.2.11

- හින්දු ආගම ආර්ය සංක්‍රමණික කාලයේ සිට විකාශය වීම
- ආගමික විකාශනයේ දී දෙවිවරු, තව තවත් බලවත් වීම, බ්‍රහ්මන් විෂ්ණු රුද්‍රා
- ක්ෂුද්‍රයන්ගේ සහයෝගය ආජීවක පරිබ්‍රාජක නිකායන් ද පරම සත්‍ය සොයා ගැනීම සඳහා විවිධ ව්‍රත අනුගමනය කිරීම
- ජෛන ආගම - වර්ධමාන මහාවීර ආගමේ කතෘවරයා ආගමේ ප්‍රධාන ලක්ෂණ, ආත්මවාදය විශ්වාස කිරීම, අවිහිංසාවාදය අකුරටම අනුගමනය කිරීම. ලෞකික සැප සම්පත් සියල්ල අත්හැර දැමීම, යාග හෝම ප්‍රතික්ෂේප කිරීම, පංචශීලය පිළිගැනීම
  සත්‍ය ගවේශණය සඳහා සිරුරට පීඩා දෙන විවිධ ව්‍රත අනුගමනය කිරීම



බුද්ධගයා ස්තූපය
රූපය 7.2.12

- බුද්ධාගම
    - ක්‍රි.පූ. හයවන සියවසේ දී බුද්ධාගම ඉන්දියාවේ ප්‍රචලිත වීම
    - අනාත්මවාදය විශ්වාස කිරීම
    - යාග හෝම ප්‍රතික්ෂේප කිරීම, පංච ශීලය පිළි ගැනීම
    - අවිහිංසාවාදය, මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කිරීම

- සාහිත්‍ය හා කලාව
    - වෛදික යුගය ඍග් වේදය : මුඛ පරම්පරා ගත ව පැවති ශ්ලෝක පසු කාලයක දී ග්‍රන්ථයක් වශයෙන් සම්පාදනය වීම
    - පශ්චාත් වෛදික යුගය : සාම, යජුර්, අථර්වන් වේද, බ්‍රාහ්මණ ආරණ්‍යක, උපනිෂද් ග්‍රන්ථ වීර කාව්‍ය, මහා භාරතය

- සමාජ සංවිධානය
    - චතුර් වර්ණ : බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර,
    - බ්‍රාහ්මණ : පාලකයින්ට උපදෙස් දීම. පුද පූජා, යාග හෝම කටයුතුවල දී ප්‍රමුඛස්ථානය ගැනීම
    - ක්ෂත්‍රිය : පාලන කටයුතු හා යුධ කටයුතු
    - වෛශ්‍ය : ගොවිතැන, වෙළෙඳ කටයුතු
    - ශුද්‍ර : පහත් පෙලේ රැකියා : කසල සෝධනය හා කර්මාන්ත
    - පශ්චාත් වෛදික සමය එළඹෙන විට සංකීර්ණ කුල ක්‍රමයක් ඇතිවීම

- ආර්ථිකය
    - කෘෂිකර්මය ආර්යන්ගේ ප්‍රධාන ජීවනෝපාය විය
    - වෙළෙඳාම අභ්‍යන්තර හා විදේශීය වෙළෙඳාම පැවති බව, සොළොස්මහා ජනපද සමය එළඹෙන විට දියුණු වෙළෙඳාමක් පැවති බව
    - වෙළෙඳ මාර්ග
    - කර්මාන්ත : අවි ආයුධ, කුඹල්, මෙහෙකාර, වඩු, රන්රිදී ආදිය
    - අධ්‍යාපනය, ප්‍රධානත්වය ගන්නා ලද්දේ බ්‍රාහ්මණයින් විසිනි දිසාපාමොක් ගුරු ගෙදර

## ක්‍රියාකාරකම 7.2.1

නිපුනතා මට්ටම : ග්‍රීක ශිෂ්ටාචාර පිළිබඳ තොරතුරු විමසා බලයි.

ක්‍රියාකාරකම 7.2.1 : ඔලිම්පික් ක්‍රීඩා උපත ලද ග්‍රීසිය

කාලය : මිනිත්තු 80

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 7.2.1.1 - ඔලිම්පික් ලංඡනය හා ක්‍රීඩා දැක්වෙන පින්තූරයක්
- ඇමුණුම් 7.2.1.2 - කාර්ය පත්‍රිකාව

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.2.1.1 :
- ඇමුණුම් අංක 7.2.1.1 හි සඳහන් පින්තූර පන්තියට ඉදිරිපත් කරමින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සිසුන් යොමු කරන්න.
- මෙම පින්තූර ඔබ දැක් තිබේද?
- එය මුලින් ම ආරම්භ වූයේ කුමන රටේ ද?
- මෙම ප්‍රශ්නවලට පිළිතුරු ලබා ගනිමින් පහත දැක්වෙන කරුණු කෙරෙහි ද අවධානය යොමු කරමින්, පෙළපොත ද උපයෝගී කර ගනිමින් සිසුන් සමඟ සාකච්ඡාවක යෙදෙන්න.

- ඉලියඩ් හා ඔඩිසි යන අපරදිග මහා කාව්‍ය වලින් ග්‍රීක ශිෂ්ටාචාරයේ ඉතිහාසය පිළිදව තොරතුරු ලබා ගත හැකි බව
- ග්‍රීසිය ක්‍රි.පූ. 1000 පමණ කාලයේ දී ඇති වූ බව
- ග්‍රීසියට ඇතුල් වූ සංචාරක ගෝත්‍රිකයන් කුඩා ගම්මාන තනාගත් බව
- ක්‍රි.පූ. 700 වන විට ඒවා පෞර රාජ්‍ය බවට පත් වූ බව
- පුරවැසියන් සහ වහලුන් වශයෙන් සමාජයේ කොටස් දෙකක් සිටි බව
- වයස අවු 18ට වැඩි ග්‍රීක පිරිමින් පමණක් සීමා වූ බව
- ස්වභාවික වස්තූන්ට වන්දනාමාන කළ බව
- සොක්‍රටීස්, ප්ලේටෝ, ඇරිස්ටෝටල් වැනි දාර්ශනිකයන් රැසක් එකළ සිටි බව

මිනිත්තු 10යි

පියවර 7.1.2.2 :
- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම්වලට බෙදන්න.
- එක් එක් කණ්ඩායමට ඇමුණුම 7.2.1.2 කාර්ය පත්‍රිකාව දෙන්න.
- ක්‍රියාකාරකම්වලට අවශ්‍ය මඟ පෙන්වීම් කරන්න.
- සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.

මිනිත්තු 30

පියවර 7.1.2.3 :
- එක් එක් කණ්ඩායම් වෙන් වෙන් වශයෙන් තම ක්‍රියාකාරකම් පන්තිය වෙත ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එක් එක් කණ්ඩායමේ අඩුපාඩු හා ප්‍රබලතා හඳුනා ගන්න.
- සෑම කණ්ඩායමක් ම අනෙකුත් කණ්ඩායම්වල කාර්ය පත්‍රිකාවේ සඳහන් කරුණු ද සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- හඳුනාගත් දුබලතා, ප්‍රබලතා සැලකිල්ලට ගනිමින් පහත දැක්වෙන කරුණු කෙරෙහි ද අවධානය යොමු කර පාඩම සමාලෝචනය කරන්න.

- ග්‍රීසිය බටහිරින් අයෝනියන් මුහුදටත් නැගෙනහිරින් ඊජියානු මුහුදටත් මැදි ව මධ්‍යධරණී මුහුදට නෙරා අර්ධ ද්වීපයක් වශයෙන් පිහිටා ඇති බව.
- ස්වාධීන වූ නගර රාජ්‍යවල පාලනය ඒවායේ පුරවැසියන් විසින් ම මෙහයෙ වූ බව
- ඇතන්ස් ස්පාර්ටා වැනි වැදගත් පෞර රාජ්‍ය තිබූ බව
- වහලුන් පුරවැසියන් ලෙස නොසැලකූ බව
- පුරවැසියන් සියලු දෙනා ම දේශපාලන කටයුතුවලට සහභාගී වූ බව
- නැව් මගින් වෙළෙඳ කටයුතුවල යෙදුන බව
- ග්‍රීකයින් ශ්‍රී ලංකාවට ද පැමිණ ඇති බවට සාධක ඇති බව
- ග්‍රීක දරුවන්ට ශාරීරික හා මානසික වශයෙන් පරිපූර්ණ අධ්‍යාපනයක් දුන් බව
- වෛද්‍ය විද්‍යාව පිළිබඳ මුලින් ම සොයා ගත්තේ ග්‍රීකයින් බව
- හෙරඩෝටස් නම් ග්‍රීක ඉතිහාසඥයා ඉතිහාසයේ පියා ලෙස විරුදාවලි ලද බව

මිනිත්තු 40

## තක්සේරුව හා ඇගයීම

- ග්‍රීසියේ ආරම්භය පිළිබඳ විස්තර කරයි.
- ග්‍රීසියේ පාලන ක්‍රමය අගය කරයි.
- කණ්ඩායම තුළ සහයෝගයෙන් කටයුතු කරයි.
- සමානයන්ගෙන් අත්දැකීම් ලබමින් අත්දැකීම් පුළුල් කර ගනියි.
- තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කරයි.

ඇමුණුම 7.2.1.1



ඔලිම්පික් ලාංඡනය



ඔලිම්පික් පහන

ඇමුණුම 7.2.1.2

## කාර්ය පත්‍රිකාව

| 1 වන කන්ඩායම |
|---|
| ග්‍රීසියේ පාලන කටයුතු පිළිබඳ තොරතුරු සපයන්න |
| 1. |
| 2. |
| 3. |
| 4. |
| 5. |

| 2 වන කණ්ඩායම |
|---|
| මෙකළ සිටි දාර්ශනිකයෝ පිළිබඳ තොරතුරු සපයන්න |
| 1. |
| 2. |
| 3. |
| 4. |
| 5. |

| 3 වන කණ්ඩායම |
|---|
| ග්‍රීසියේ සිටි විද්‍යාඥයෝ පිළිබඳ තොරතුරු සපයන්න |
| 1. |
| 2. |
| 3. |
| 4. |

| 4 වන කණ්ඩායම |
|---|
| ග්‍රීකයන්ගේ සංස්කෘතික කටයුතු කලාව, ආගම) පිළිබඳ තොරතුරු සපයන්න |
| 1. |
| 2. |
| 3. |
| 4. |

| 5 කණ්ඩායම |
|---|
| ග්‍රීසියේ ජන ජීවිතය පිළිබඳ තොරතුරු සපයන්න |
| 1. |
| 2. |
| 3. |
| 4. |
| 5. |

## ක්‍රියාකාරකම 7.2.2

නිපුනතා මට්ටම : රෝම ශිෂ්ටාචාරය පිළිබඳ තොරතුරු විමසා බලයි.

ක්‍රියාකාරකම : යුරෝපා ශිෂ්ටාචාරය බැබිළ වූ රෝමය

කාලය : මිනිත්තු 80

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 7.2.2.1 - පාප්වහන්සේගේ හා වතිකානුවේ පින්තූරයක්
- ඇමුණුම් 7.2.2.2 - කාර්ය පත්‍රිකාව
- පෙළ පොත

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.2.2.1 :
- ඇමුණුම් 7.2.2.1 දැක්වෙන පින්තූරය සිසුන්ට ඉදිරිපත් කරමින් පහත දැක්වෙන ප්‍රශ්න ඇසුරෙන් සාකච්ඡාව මෙහෙයවන්න.
- මෙම පින්තූරයෙන් දැක්වෙන්නේ කවුරුන් ද?
- ඔහුගේ නිල නිවාසය පිහිටියේ කොහේ ද?
- එය අයත්වන්නේ කුමන මහාද්වීපයට ද?
- රෝමයෙන් අපට ලැබුණු වැදගත් දායාදයන් දක්වන්න.

යන ප්‍රශ්න සිසුන් වෙත යොමු කරමින් පහත සඳහන් කරුණු ද ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

- ජනප්‍රවාද අනුව රොමියුලස් සහ රීමස් යන සොහොයුරන් දෙදෙනා අතර ඇති වූ තරඟයක ප්‍රතිඵලයක් වශයෙන් රෝම නගරය ඉදි වූ බව
- පසුව රෝම රාජ්‍ය ග්‍රීසිය ඇතුළු මධ්‍යධරණී මුහුද අවට රටවලට තම බලය ව්‍යාප්ත කළ බව
- ජූලියස් සීසර් අධිරාජයා රෝම අධිරාජ්‍යයේ කීර්තිමත් පාලකයකු වූ බව
- ඔගස්ටස් සීසර් පාලන සමය රෝම අධිරාජ්‍යයේ ස්වර්ණමය යුගය බව
- ජස්ටීනියන් අධිරාජයාගේ නමින් නීති පද්ධතියක් සකස් කළ බව
- විවිධ දෙවිවරුන්ට වැඳුම් පිදුම් කළ බව
- පෙරදිග රටවල් සමඟ වෙළෙඳ සම්බන්ධතා පැවැත් වූ බව
- ඔවුන් ඉතා නීති ගරුක පිරිසක් වූ බව

මිනිත්තු 10

පියවර 7.2.2.2 :

- ඇමුණුම් 7.2.2.2 කාර්ය පත්‍රිකාව හුණු පුවරුවේ සටහන් කරන්න.
- පෙළපොත අධ්‍යයනය කරමින් හුණු පුවරුවේ දැක්වෙන වගුව සම්පූර්ණ කිරීමට සිසුන් මෙහෙයවන්න.
- අවශ්‍ය මඟ පෙන්වීම හා උපදෙස් සහිතව කාර්ය පහසු කර ගැනීමට දායක වන්න.

මිනිත්තු 30

පියවර 7.2.2.3 :

- අහඹු ලෙස තෝරා ගත් සිසුන් කීපදෙනෙකුගේ ක්‍රියාකාරකම් පන්තිය ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න.
- අනෙකුත් සිසුන්ගේ අදහස් විමසන්න.
- නැවතත් සාර්ථක පිළිතුරු තම තමන්ගේ අභ්‍යාස පොත් වල සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු වන පරිදි පාඩම සමාලෝචනය කරන්න.


- රෝම නගරය ඉතාලියේ ටයිබර් නදියේ මුවදොරට ඉහළින් පිහිටා ඇති බව
- ක්‍රි.පූ. 270 දී පමණ මුළු ඉතාලි අර්ධද්වීපයේම පාලන බලය රෝමයට හිමි වූ බව
- ජුලියස් සීසර් රයින් ගඟ දක්වා ප්‍රදේශයත් හා එංගලන්තයත් රෝමයට ඈඳා ගත් බව
- ක්‍රි පූ. 500 දී පමණ රෝම සමූහාණ්ඩුව පිහිට වූ බව
- ක්‍රිස්තුන් වහන්සේ උපත ලැබුයේ ඔගස්ටස් සීසර් අධිරාජයාගේ පාලන සමයේ බව
- රෝම නීතිය ඇසුරු කර ගෙන ලංකාවේ රෝම ලන්දේසි නීති ක්‍රමය සකස් වී ඇති බව
- මුල් යුගයේ දී ස්වභාව ධර්මය දේවත්වයේ ලා සැලකූ බව
- මුල් යුගයේ සිටම රෝමයේ කාසි භාවිතා වූ බව
- රෝමවරුන් පාරිශුද්ධ ජීවිත ගත කළ බව

මිනිත්තු 40යි

## තක්සේරුව හා ඇගයීම

- රෝමයේ පාලන, ආර්ථික, ආගමික, සමාජික තොරතුරු විස්තර කරයි.
- රෝම පාලකයන්ගේ කාර්යයන් අගය කරයි.
- රෝමය පිළිබඳ ව තමන් සොයා ගත් කරුණු අන් අයට ඉදිරිපත් කරයි.
- සන්නිවේදන හැකියාවන් වර්ධනය කර ගනියි.
- තමන් සොයා ගත් කරුණු අන් අය සමඟ බෙදා ගනියි.

ඇමුණුම 7.2.2.1



පාප් වහන්සේ හා වතිකානුව

ඇමුණුම 7.2.2.2

## කාර්ය පත්‍රිකාව

- රෝමයේ පාලකයන්, එහි පාලන කටයුතු, සංස්කෘතිය හා ජන ජීවිතය පිළිබඳ තොරතුරු සොයා පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| රෝමයේ පාලකයින් | පාලන කටයුතු | සංස්කෘතිය | ජන ජීවිතය |
|---|---|---|---|
| 1.<br>2.<br>3. | 1.<br>2.<br>3. | 1.<br>2.<br>3. | 1.<br>2.<br>3. |

## ක්‍රියාකාරකම 7.2.3

නිපුනතා මට්ටම : අරාබි ශිෂ්ටාචාරයේ ආරම්භයේ සිට එහි ව්‍යාප්තයේ වූ කැපී පෙනෙන ලක්ෂණ විමර්ශනය කරයි

ක්‍රියාකාරකම : "අරාබි ශිෂ්ටාචාරය හඳුනා ගනිමු.'

කාලය : මිනිත්තු 80

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 7.2.3.1. - කාබා පල්ලියේ පින්තූරයක්
- ඇමුණුම් 7.2.3.2 - මැද පෙරදිග ප්‍රදේශ දැක්වෙන සිතියමක්
- ඇමුණුම් 7.2.3.3 - ගුරුවරයාට උපදෙස්
- පෙළ පොත

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.2.3.1 :
- ඇමුණුම 7.3.2.1 කාබා පල්ලියේ පින්තූරයක් පෙන්වා පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු ලබා ගනිමින් සාකච්ඡාව මෙහෙයවන්න.
  1. මේ පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක් ද?
  2. එය පිහිටා ඇත්තේ කොහේදැ යි ඔබ දන්නවාද?

- පින්තූරයෙන් දැක්වෙන්නේ මක්කම කාබා පල්ලිය බව
- එය පිහිටා ඇත්තේ ආරාබියේ බව (ඇමුණුම් 7.2.3.2 ඇසුරින්)
- රතු මුහුද, පර්සියන් බොක්ක හා අරාබි මුහුද අසල අරාබිය පිහිටා ඇති බව
- ක්‍රි.ව. 6 වන සියවසේ දී ඉස්ලාම් ධර්මය අරාබියේ බිහි වූ බව
- එය පසුව මැද පෙරදිග පුරා ව්‍යාප්ත වූ බව

මිනිත්තු 10යි

පියවර 7.2.3.2 :
- පන්තියේ සිසුන් කුඩා කණ්ඩායම් කිහිපයකට බෙදන්න (එක් කණ්ඩායමකට සිසුන් 4ක් පමණ වන සේ )
- එම කණ්ඩායම්වලට අරාබිය පිළිබඳ පෙළපොත හා අරාබිය සම්බන්ධ වෙනත් මූලාශ්‍ර ද යොදා ගනිමින් හැකි තරම් ප්‍රශ්න සෑදීමට යොමු කරන්න.
- ප්‍රශ්න සෑදීම සඳහා මග පෙන්වීම සහ ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.

මිනිත්තු 30යි

පියවර 7.2.3.3 :

- පන්තිය කණ්ඩායම් දෙකකට බෙදන්න.
- එම කණ්ඩායම් A සහ B යනුවෙන් නම් කරන්න.
- කණ්ඩායම් දෙක සඳහා නායකයින් පත් කරන්න.
- විනාඩි 5ක් පමණ යොදා ගනිමින් කුඩා කණ්ඩායම් විසින් සකස් කරන ලද ප්‍රශ්නවලින් ප්‍රශ්න ඇසීම සඳහා සුදුසු ප්‍රශ්න 20ක් තෝරා ගැනීමට උපදෙස් දෙන්න.
- ඇමුණුම් 7.2.3.3. උපදෙස් පත්‍රිකාව අනුව ප්‍රශ්න විචාරාත්මක තරඟය ආරම්භ කරන්න.
- ප්‍රශ්න විචාරාත්මක තරඟය අවසන් වූ පසු පහත සඳහන් කරුණු මතුවන සේ සමාලෝචනයක යෙදෙන්න.

- අරාබිය මැද පෙරදිග කලාපයට අයත් රටක් බව
- එය බොහෝ දුරට කාන්තාර ප්‍රදේශයක් බව
- 8 වන සියවස වන විට අරාබින්, මිසරය, පලස්තීනය, පර්සියාව, උතුරු අප්‍රිකාව හා ස්පාඤ්ඤය දක්වා ව්‍යාප්තව සිටි බව
- නැගෙනහිර ප්‍රදේශයේ උතුරු ඉන්දියාවේ සින්ද් ප්‍රදේශ දක්වා අරාබි බලය ව්‍යාප්ත වූ බව
- අරාබියේ මක්කම නුවර මුහම්මද්තුමා උපත ලද බව
- මුහම්මද්තුමා 'අල්ලාහ් ' දෙවියන්ගේ පණිවුඩය අනාවරණය කළ බව
- ක්‍රි.ව. 662 දී මක්කම නුවරින් මදිනා නුවරට ගිය අතර එහි දී ඉස්ලාම් ධර්මය ජනප්‍රිය වූ බව
- මක්කම නුවරින් මදිනාවට යාම හිජ්රා නමින් හැඳින්වූ බව
- මුහම්මද්තුමා දේශනා කළ ධර්මය ඉතා ඉක්මණින් ජනප්‍රිය වූ බව
- ඉස්ලාම් භක්තිකයන් ජීවිතයේ එක් වරක්වත් හජ් වන්දනාවේ යා යුතු බව
- මුහම්මද්තුමාට පහළ වූ දේව වාක්‍ය ඇතුළත් ග්‍රන්ථය "කුර්ආණය" නමින් හැඳින්වෙන බව (කුරාණය)
- ඉස්ලාම් ධර්මය පැතිරීමෙන් පසු අරාබි භාෂා සාහිත්‍යයේ මහත් දියුණුවක් ඇති වූ බව
- අරාබියේ ලියවුන අරාබි නිසොල්ලාසය අද පවා ජනප්‍රිය බව
- ඉන්දියාව, අප්‍රිකාව, චීනය, ලංකාව වැනි රටවල් සමඟ අරාබිය වෙළෙඳ සබඳතා පැවැත්වූ බව
- 'අවිසින්නා' නම් උසස් වෛද්‍යවරයෙක් සිටි බව
- කඩදාසි භාවිතය ඔවුන් විසින් යුරෝපයට හුරු කළ බව

මිනිත්තු 40යි

තක්සේරුව හා ඇගැයීම


- අරාබිය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- මුහම්මද්තුමාගේ ඉගැන්වීම් අගය කරයි.
- අරාබිය පිළිබඳ ප්‍රශ්නාවලියක් සකස් කරයි
- කණ්ඩායම් හැගීමෙන් යුතුව ක්‍රියා කරයි.
- අන් අය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමේ ගුණාංගය වර්ධනය කර ගනී.

ඇමුණුම 7.2.3.1



කාබා පල්ලිය

ඇමුණුම 7.2.3.2



ඇමුණුම 7.2.3.3

<u>ගුරුවරයාට උපදෙස්</u>

- පන්තිය කණ්ඩායම් දෙකකට බෙදන්න.
- මෙහි දී කුඩා කණ්ඩායම් වෙන් නොවන සේ බෙදන්න.
- කණ්ඩායම් A හා B වශයෙන් නම් කරන්න.
- තෝරා ගන්නා ලද ප්‍රශ්න 20, කණ්ඩායම් නායක වෙත ලබා දෙන්න.
- කණ්ඩායම් නායක විසින් ප්‍රතිවාදී පිල වෙත ප්‍රශ්න යොමු කරවන්න.
- පිළිතුර දීමේ දී පන්තියේ සියළුම සිසුන් නියෝජනය වන පරිදි සංවිධානය කර ගන්න.
- ලකුණු ප්‍රදානයේ දී
    - ප්‍රශ්නය යොමු කළ සිසුන් එක්වරම පිළිතුරු සැපයීම - ලකුණු 05
    - එම පිළේ ම වෙනත් අයකු පිළිතුරු සැපයීම - ලකුණු 02
    - ප්‍රශ්න යොමු කළ පිළම පිළිතුරු දීම - ලකුණු 01

  වශයෙන් ප්‍රදානය කරන්න.
- ඒ අනුව එක් පිළකට පිළිතුරු දීමට අවස්ථා 02ක් ලැබේ. එම අවස්ථා දෙකේ දී ම පිළිතුරු සැපයීමට නොහැකි වුවහොත් අනික් පිළට අවස්ථාව ලැබේ.
- හුණු පුවරුව දෙකට බෙදා ලකුණු සටහන් කරන්න.
- මෙම උපදෙස් අනුව ඔබගේ ද අත්දැකීම් අනුව තරඟය සංවිධානය කරගන්න.

## 7.3 දකුණු ඉන්දීය ආක්‍රමණ හා අනුරාධපුර රාජධානිය බිඳ වැටීම

කාලච්ඡේද 07

### හැඳින්වීම

භූගෝලීය වශයෙන් ශ්‍රී ලංකාව ඉන්දියාවට ආසන්නව පිහිටා තිබීම ඓතිහාසික වශයෙන් දෙරට අතර විවිධ සම්බන්ධතා ගොඩ නැගීමට බෙහෙවින් බලපෑ සාධයකයක් විය.

උතුරු ඉන්දියාවේ මෙන් ම දකුණු ඉන්දියාවේ ද වරින් වර බලවත් වූ රාජධානි සමග ශ්‍රී ලංකාව විවිධ ආකාරයේ සම්බන්ධතා ගොඩනගා ගත් බව නොයෙකුත් මූලාශ්‍රවලින් හෙළිවේ.

මෙම ඒකකය අධ්‍යයනය කිරීමෙන් විශේෂයෙන් දකුණු ඉන්දියාවේ බලවත් වූ පල්ලව, පාණ්ඩ්‍ය කේරළ හා චෝළ යන රාජධානි සමඟ ශ්‍රී ලංකාව පැවැත් වූ රාජ්‍ය තාන්ත්‍රික, ආගමික, සංස්කෘතික හා ආර්ථික සබඳතාවල ස්වරූපයක් සහ වරින් වර මේ රාජ්‍යයන් ශ්‍රී ලංකාවට එල්ල කළ ආක්‍රමණවල ස්වභාවයත් හැදෑරීම අපේක්ෂිතය.

එමෙන් ම මෙම දකුණු ඉන්දීය ආක්‍රමණවල ප්‍රතිඵලයක් ලෙස අවසානයේ දී අනුරපුර රාජධානිය චෝළ ආධිපත්‍යයට නතු වූ ආකාරයත් එය හේතුකොට ගෙන ශ්‍රී ලංකාවට ඇති වූ විවිධ බලපෑම් පිළිබඳ ව සරල අවබෝධයක් ලබා දීමත් මේ ඒකකය අධ්‍යයනය කිරීමෙන් අපේක්ෂිතය.

නිපුණතා : ශ්‍රී ලංකාවට එල්ල වු විදේශිය ආක්‍රමණවල පසුබිම් හා එහි බලපෑම පිළිබඳ විමසා බලා එවැනි ආක්‍රමණකාරී තත්වයන්ට මුහුණදීම සඳහා ශක්තිමත් වෙයි.


නිපුණතා මට්ටම :

- ශ්‍රී ලංකාවට විවිධ බලපෑම් ඇති කළ දකුණු ඉන්දීය රාජ්‍යයයන් පිළිබඳ ඓතිහාසික තොරතුරු ඇසුරින් සිතියම් ලකුණු කිරීමේ හැකියාව දියුණු කර ගනියි.
- ශ්‍රී ලංකාව දකුණු ඉන්දීය රාජ්‍ය සමඟ පැවැත් වූ සම්බන්ධතාවල ස්වභාවය විමසා බලයි.
- අනුරාධපුර රාජධානියේ බිඳ වැටීමට දකුණු ඉන්දීය ආක්‍රමණ බලපෑ ආකාරය විග්‍රහ කරයි.
- අනුරාධපුර බිඳ වැටීම හා ඉන්පසු ශ්‍රී ලංකාවේ චෝළ පාලනය ක්‍රියාත්මක වූ ආකාරය විමර්ශනය කරයි.

**විෂය අන්තර්ගතය**

7.3 දකුණු ඉන්දීය ආක්‍රමණ හා අනුරාධපුර රාජධානිය බිඳ වැටීම

ලංකාවට විවිධ බලපෑම් එල්ල කළ දකුණු ඉන්දීය රාජ්‍යයන්



සිතියම 7.3.1

7.3.1 දකුණු ඉන්දීය රාජ්‍ය හා එහි බලපෑම

- ශ්‍රී ලංකාවට විවිධ බලපෑම් ඇති කළ දකුණු ඉන්දීය රාජ්‍යයන් හඳුන්වාදීම
  - පල්ලව රාජ්‍යය
  - පාන්ඩ්‍ය රාජ්‍යය
  - කේරළ රාජ්‍යය
  - චෝළ රාජ්‍ය

  මේවායේ පිහිටීම සිතියම මගින් පැහැදිලි කිරීම
- දකුණු ඉන්දීය රාජ්‍ය සමඟ පැවැත් වූ සබඳතාවල ස්වරූපය
  - රාජ්‍ය තාන්ත්‍රික සබඳතා

    සිංහල පාලකයින් සිහසුන සඳහා පැවති අරගලවලට දකුණු ඉන්දීය රාජ්‍යයන්ගෙන් හමුදා ආධාර ලබා ගැනීම

    උදා : ඉලනාග රජු
    පළමුවැනි මුගලන් රජු
    තෙවැනි අග්බෝ රජු
    පළමුවැනි දාඨෝපතිස්ස රජු
    දෙවැනි දාඨෝපතිස්ස රජු
    මානවම්ම රජු - දෙවැනි නරසිංහ වර්මන් පල්ලව රජුගෙන් ආධාර ගැනීම
  - මෙම රජවරුන් රාජ්‍ය බලය තහවුරු කර ගැනීමට දකුණු ඉන්දීය සේනා ආධාර ලබා ගැනීම.

- දකුණු ඉන්දීය රාජ්‍යයන් ද ශ්‍රී ලංකාවේ රජවරුන්ගෙන් හමුදා ආධාර ලබා ගත් බව

  උදා : - වරගුණ වර්මන් පාණ්ඩ්‍ය රජු ලංකාවේ දෙවැනි සේන (851- 887 ) රජුගෙන් හමුදා ආධාර ඉල්ලා සිටීම.

  - පස්වැනි කාශ්‍යප රජු දෙවැනි මාරවර්මන් රාජසිංහ පාණ්ඩ්‍ය රජුට සිහසුනලබා ගැනීම සඳහා ආධාර සේනා යැවීම
  - හතරවැනි දප්පුල රාජ්‍ය සමයේ පාණ්ඩ්‍ය පාලක මාරවර්මන් රාජසිංහ චෝලයන්ට පාණ්ඩ්‍ය සිහසුන හිමිවීම වැළැක්වීමට පාණ්ඩ්‍ය කකුධ භාණ්ඩ ලංකාවට ගෙනවිත් ආරක්ෂාව සඳහා ඒවා සිව්වන දප්පුල රජු භාරයේ තැබීම.

- විවාහ සම්බන්ධතා

  හතරවැනි මිහිඳු රජු කාලිංග කුමරියක් සරණ පාවා ගැනීම

- ආගමික හා සංස්කෘතික සබඳතා
  - දකුණු ඉන්දියානු නාගර්ජුන හා අමරාවතී යන බෞද්ධ මධ්‍යස්ථාන සමඟ ලාංකික භික්ෂූන් සබඳතා පැවැත් වීම.
  - අමරාවතී කැටයම් හා මූර්ති සම්ප්‍රදායන්ගේ බලපෑම ලංකාවට තිබීම.
  - දකුණු ඉන්දියානු මහායාන බෞද්ධ මධ්‍යස්ථාන සමඟ ලාංකික භික්ෂූන් සබඳතා පැවැත්වීම.
  - දකුණු ඉන්දියානු වජ්‍රබෝධි නම් මහායාන පඬිවරයා අභයගිරියෙහි කලක් නැවතී සිට රුහුණේ සංචාරය කොට ජාවා සුමාත්‍රා හරහා චීනයට යාම.
  - වජ්‍රබෝධි භික්ෂුවගේ අමෝඝවජ්‍ර නම් ශිෂ්‍යයා ලංකා රජුගේ දූතයකු ලෙස චීන රාජ සභාවට යාම.

- ආර්ථිකය
  - විජය කුමාරයා විසින් දකුණු මධුරා පුරයෙන් ගෙන්වා ගත් විජායි කුමරිය සමඟ පැමිණි ශිල්ප ශ්‍රේණි දහ අටකට අයත් පවුල්වලින් මෙරට වෙළෙඳ ශ්‍රේණිවල ආරම්භය ඇති වීම.
  - ලංකාවේ වෙළෙඳ තොටුපල සහ දකුණු ඉන්දීය තොටුපල අතර භාණ්ඩ හුවමාරුව පැවැතීම.

    උදා : මහාතිත්ථ වෙළෙඳුන් කාවේරි පටුනට භාණ්ඩ වෙළෙඳාමේ ගිය බව

- වංකනාසික තිස්ස රාජ්‍ය කාලයේ කරිකාලන් චෝළ රජු ලංකාවෙන් තරුණයින් 12000ක් දකුණු ඉන්දියාවේ කාවේරි පටුන ප්‍රදේශයේ ගොවිතැන් කටයුතු සඳහා ගෙනයාම.

7.3.2 දකුණු ඉන්දියානු ආක්‍රමණ

- ශ්‍රී ලංකාව දකුණු ඉන්දීය ආක්‍රමණවලට ලක්වීමට හේතු
  - දකුණු ඉන්දියාව සමඟ පැවති සමීප සම්බන්ධතාවය.
  - දකුණු ඉන්දියාවේ බිහි වූ බලවත් අධිරාජ්‍ය තම බලය උතුරු ඉන්දියාවට වඩා දකුණට ව්‍යාප්ත කිරීමට යොමු වීම

    උදා : පාණ්ඩ්‍ය අධිරාජ්‍යය

    චෝල අධිරාජ්‍යය
  - ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටීම
  - ශ්‍රී ලංකාවේ මෞර්ය හා ලම්බකර්ණ වංශිකයින් අතර සිහසුන සඳහා ගැටුම් ඇතිවීම නිසා දුර්වල රජවරු දකුණු ඉන්දීය කුලී හමුදාවල ආධාර ලබා ගැනීම
  - ආරක්ෂාව සඳහා තබා තිබූ පාණ්ඩ්‍ය රාජ කකුධ භාණ්ඩ චෝළයන්ට ලබා ගැනීමට අවශ්‍ය වීම

- ශ්‍රී ලංකාවට එල්ල වූ දකුණු ඉන්දීය ආක්‍රමණවල ස්වභාවය

1 අදියර - අවස්ථාවාදී ආක්‍රමණ පාලනයට අනුගත වීම

උදා :

| | |
|---|---|
| සූරතිස්ස රාජ්‍ය කාලය | - සේන හා ගුත්තික අශ්ව වෙළෙඳුන් දෙදෙනාගේ ආක්‍රමණය කොට අවු 22ක් පාලනය කිරීම |
| අසේල රාජ්‍ය කාලය | - එළාර රජු ඇතුළු පිරිස මෙරට ආක්‍රමණය කර අවුරුදු 44ක් පාලනය කිරීම |
| වලගම්බා රාජ්‍ය කාලය | - සප්ත ද්‍රවිඩ ආක්‍රමණය දෙදෙනෙක් සෝමාදේවිය හා පාත්‍ර ධාතුව රැගෙන ආපසු ගිය බව, පුලහස්ථ භාහිය පනයමාර, පිලයමාර දාඨික යන පස්දෙනා අවු 14 මාස 7ක් අනුරපුර පාලනය කිරීම |
| මිත්සෙන් රාජ්‍ය කාලය | - ද්‍රවිඩයන් 6 දෙනාගේ ආක්‍රමණය පාණ්ඩු, පාරින්ද, ඛුද්ධපාරින්ද තිරිතර, දාඨිය, පීඨිය - අවුරුදු 27ක් පාලනය මෙහෙයවීම |

2 අදියර - ආර්ථික වාසි ලබා ගැනීම

| | |
|---|---|
| පළමුවැනි සේන රාජ්‍ය කාලය (831-852) | - ශ්‍රී මාර ශ්‍රී වල්ලභ නම් පාන්ඩ්‍ය රජු අනුරාධපුර ආක්‍රමණය කර වස්තුව කොල්ල කෑම |

3 අදියර - දේශපාලන ආධිපත්‍ය සඳහා

| | | |
|---|---|---|
| සිව්වැනි උදය රාජ්‍ය කාලය | - | පළමුවැනි පරන්තක රජු පාණ්ඩ්‍ය රාජ කකුධ භාණ්ඩ ලබා ගැනීමට |
| සිව්වැනි මිහිඳු රාජ්‍ය කාලය | - | තුන්වන ක්‍රිෂ්ණ නම් රාෂ්ට්‍රකූඨ වංශික රජුගේ ආක්‍රමණය |
| පස්වැනි මිහිඳු රාජ්‍ය කාලය | - | පළමුවැනි රාජ රාජ ( ක්‍රි.ව. 993) කකුධ භාණ්ඩ ලබා ගැනීමට සහ මෙරට රාජ්‍ය බලය ලබා ගැනීම |
| පළමුවැනි රාජේන්ද්‍ර ආක්‍රමණය | - | ක්‍රි.ව. 1017 දී රාජ්‍ය බලය ලබා ගැනීමට |

- පළමුවැනි රාජේන්ද්‍ර ශ්‍රී ලංකාවේ උතුරු කොටස අල්ලාගෙන එය චෝළ අධිරාජ්‍යයේ කොටසක් ලෙස නම් කිරීම ( මුම්මුඩි චෝල මණ්ඩලම් )
- චෝලයන් අනුරපුර රාජධානිය අතහැර පොළොන්නරුව චෝළ අගනුවර ලෙස තෝරා ගැනීම
- එම නගරය ජනනාථපුරම් ලෙස නම් කිරීම

### 7.3.3 අනුරාධපුර රාජධානිය බිඳ වැටීම හා චෝළ ආධිපත්‍ය

- අනුරාධපුර රාජධානිය බිඳ වැටීමට හේතු
  - මෞර්ය හා ලම්භකර්ණ රාජවංශ දෙක අතර ගැටුම නිසා රාජ්‍ය තුළ ව්‍යාකූල තත්වයක් පැවතීම
  - දුර්වල පාලකයින්ගේ කාලයේ දී දකුණු ඉන්දීය ආක්‍රමණ එල්ල වීම
    උදා : චෝළ ආක්‍රමණ එල්ල වූ අවධියේ මෙරට රජකළ පස්වැනි මිහිඳු රජු දුර්වල පාලකයකු වීම
  - ආර්ථික වශයෙන් ඇති වූ පරිහානිය.
  - ආක්‍රමණ නිසා ආර්ථික කටයුතු නගා සිටුවීමට රජවරුන් අපොහොසත් වීම.
  - වැව් අමුණු හා ඇළ මාර්ග විනාශ වීම.
  - රාජ්‍ය ආදායම අඩුවීම.
  - අනුරපුර පාලන නිලධාරීන් රජුට විරුද්ධව කැරලි ගැසීම.
  - රජු රුහුණට පලා යාමෙන් අනුරපුර අරාජක වීම.
  - රාජේන්ද්‍ර චෝළ විසින් රුහුණ ආක්‍රමණය කර පස්වැනි මිහිඳු රජු සිරකරුවෙකු ලෙස අල්ලාගෙන පාණ්ඩ්‍ය කකුධ භාණ්ඩ ද ලබා ගැනීම.
  - චෝළයන් අනුරපුරය රාජ්‍ය මධ්‍යස්ථානය වෙනුවට පොළොන්නරුව පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනීම
  - වසර 1500ක් තරම් දීර්ඝ කාලයක් පාලන මධ්‍යස්ථානය සහ අගනුවර වශයෙන් පැවති අනුරාධපුරය බිඳ වැටීම.

- චෝළ පාලනය ක්‍රියාත්මක වූ ආකාරය
  - චෝළ අධිරාජ්‍යය මණ්ඩලම් වශයෙන් හැඳින්වෙන පාලන ඒකක 08කට බෙදා තිබුණු අතර ශ්‍රී ලංකාවේ ඔවුන් යටතේ පැවති ප්‍රදේශය ද එම පාලන ව්‍යුහයට ඇතුළත් කර ගත් බව
  - ලංකාවේ චෝළ පාලන ප්‍රදේශය මුම්මුඩිචෝල මණ්ඩලම් නමින් හැඳින්වීම.
  - පොළොන්නරුව චෝලයන්ගේ අගනුවර ලෙස තෝරා ගැනීම.
  - එම නගරය ජනනාථ පුරම් (ජනනාථ මංඩලම් ) නමින් හැඳින්වීමත්
  - මුම්මුඩි චෝළ මණ්ඩලම් ප්‍රදේශයේ යුද්ධමය ස්වරූපයකින් පාලනය ගෙන යාම
  - චෝළ අධිරාජයා විසින් පත් කළ සෙන්පතියකු විසින් පාලනය මෙහෙයවීම.
  - ඉහළ තනතුරුවලට චෝළයන් පමණක් පත් කිරීම.
  - විධිමත් පරිදි බදු අය කිරීම හා ඒවා තම මව්බිමට යැවීමට කටයුතු කිරීම.
  - ප්‍රධාන වශයෙන් ඉඩම් බදු අය කිරීම තුළින් රාජ්‍ය ආදායම තරකර ගැනීම.
  - ප්‍රතිරාජයා ප්‍රමුඛ නිලධාරීන් විසින් අයබදු කප්පම් හා පුද පඬුරු එකතු කර වාර්ෂිකව චෝළ දේශයට යැවීම
  - එම කටයුතු විධිමත් ව තිබූ බැවින් චෝළ අධිරාජයාගේ මැදිහත් වීමක් නැතිව ලංකාවේ චෝළ ප්‍රදේශ ඔවුන්ට අභිමත පරිදි පාලනය කිරීම.

## ක්‍රියාකාරකම 7.3.1

නිපුණතා මට්ටම :
- ශ්‍රී ලංකාවට විවිධ බලපෑම් ඇති කළ දකුණු ඉන්දීය රාජ්‍යයන් පිළිබඳ ඓතිහාසික තොරතුරු ඇසුරින් සිතියම් ලකුණු කිරීමේ හැකියාව දියුණු කර ගනියි.
- ශ්‍රී ලංකාව දකුණු ඉන්දීය රාජ්‍ය සමඟ පැවැත් වූ සම්බන්ධතාවල ස්වභාවය විමසා බලයි.

ක්‍රියාකාරකම 7.3.1 : දකුණු ඉන්දියානු රාජ්‍යයන් හා ලංකාව අතර පැවති සම්බන්ධකම් හඳුනා ගනිමු.

කාලය : මිනිත්තු 80

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම අංක 7.3.1.1 - දකුණු ඉන්දීය රාජධානි (පල්ලව, පාණ්ඩ්‍ය, කෝරළ, චෝල ) දැක්වෙන සිතියම
- ඇමුණුම් අංක 7.3.1.2 - කාර්ය පත්‍රිකාව I - කණ්ඩායම I
- ඇමුණුම් අංක 7.3.1.3 - කාර්ය පත්‍රිකාව II - කණ්ඩායම II
- ඇමුණුම් අංක 7.3.1.4 - කාර්ය පත්‍රිකාව III - කණ්ඩායම III
- ඇමුණුම් අංක 7.3.1.5 - කාර්ය පත්‍රිකාව IV - කණ්ඩායම IV
- A4 කඩදාසි
- සිතියම් ඇඳීමට අවශ්‍ය පාට පැන්සල්
- මූලාශ්‍ර ග්‍රන්ථ - 7 ශ්‍රේණිය ඉතිහාසය පෙළ පොත

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.3.1 :
- ඇමුණුම් 7.3.1.1 හි සඳහන් දකුණු ඉන්දියානු රාජ්‍යයන් හා ශ්‍රී ලංකාවේ පිහිටීම දැක්වෙන සිතියම පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- එහි දැක්වෙන දකුණු ඉන්දීය රාජ්‍යයන් මොනවාදැයි විමසන්න.
- ශ්‍රී ලංකාවට වඩාත් ආසන්න රාජ්‍යයන් මොනවාදැයි විමසන්න.
- ශ්‍රී ලංකාවට ආසන්නව පිහිටි මෙම දකුණු ඉන්දීය රාජ්‍යයන් පිළිබඳව කෙටි විස්තරයක් ඉදිරිපත් කරමින් ශ්‍රී ලංකාව සමඟ එම රාජ්‍යයන් අතීතයේ පැවැත් වූ සබඳතා පිළිබඳ සාකච්ඡාවක් ගොඩ නගන්න. මෙහි දී පහත දැක්වෙන තොරතුරු ද ඉස්මතු වන සේ සාකච්ඡාව ගොඩ නගන්න.

  - චෝළ, පාණ්ඩ්‍ය, කේරළ හා පල්ලව යන ඒවා දකුණු ඉන්දියානු රාජධානි බව
  - මෙම රාජධානිවල සීමාවන් හා ඔවුන්ගේ බලය කලින් කලට වෙනස් වූ බව
  - මෙම රාජ්‍යයන් විවිධ ආකාරයෙන් ලංකාව කෙරෙහි බලපා ඇති බව

මිනිත්තු 10යි

පියවර 7.3.1.2 :

- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම්වලට බෙදන්න.
- කළ යුතු කාර්යයන් පිළිබඳ පොදු සාකච්ඡාවක් මගින් උපදෙස් දෙන්න.
- ඇමුණුම 7.3.1.2, 3, 4, සහ 5 කාර්ය පත්‍රිකා එක් එක් කණ්ඩායම්වලට ( එක් කණ්ඩායමකට එක් කාර්ය පත්‍රිකාවක වනසේ බෙදා දෙන්න.
- කණ්ඩායමේ සියළු දෙනාම ක්‍රියාකාරකමෙහි යෙදිය යුතු බවට වග බලා ගන්න.
- කණ්ඩායම් සෑම සාමාජිකයෙකුගේ ම ක්‍රියාකාරීත්වය පිළිබඳ ඇගයීමක් කරන බව සඳහන් කරන්න.
- දෙන ලද කාර්ය පත්‍රිකාවට අනුව කණ්ඩායම් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- ගුරුවරයා හැම විටදීම සියලුම කණ්ඩායම්වලට අවශ්‍ය උපදෙස් දෙන්න.

මිනිත්තු 30යි

පියවර 7.3.1.3 :

- එක් එක් කණ්ඩායමේ නිර්මාණය පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- කණ්ඩායමේ ඉදිරිපත් කිරීම්වලින් පසු අවශ්‍ය තැන්වල දී ඌන පූරණය කරමින් පහත සඳහන් කරුණු මතුවන පරිදි සමාලෝචනයක යෙදෙන්න.
- වැදගත් තොරතුරු සටහන් කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.

- දකුණු ඉන්දියාවේ වරින් වර බලවත් වූ පල්ලව පාණ්ඩ්‍ය කේරළ හා චෝළ යන රාජ්‍යයන් ශ්‍රී ලංකාවට ආසන්නව පිහිටීම නිසා ඒවායේ විවිධ බලපෑම්වලට ශ්‍රී ලංකාව ගොදුරු වූ බව.
- මේ සම්බන්ධතා රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා, ආගමික සංස්කෘතික සම්බන්ධතා හා ආර්ථික සම්බන්ධතා ලෙස විස්තර කළ හැකි බව.
- සිංහල රජවරු සිහසුන සඳහා පැවති අරගලවල දී දකුණු ඉන්දීය රාජ්‍යයන්ගෙන් හමුදා ආධාර ලබා ගත් බව.
- ඉලනාග, පළමුවැනි මුගලන්, තෙවැනි අග්බෝ, පළමුවැනි දාඨෝපතිස්ස, දෙවැනි දාඨෝපතිස්ස, මානවම්ම වැනි රජවරු එසේ දකුණු ඉන්දීය රාජ්‍යවල ආධාර ලබා සිය රාජ්‍ය බලය තහවුරු කර ගත් බව.
- දකුණු ඉන්දීය රාජ්‍යයන්හි රජවරු ද සිය බලය තහවුරු කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ රජවරුන්ගේ සහාය ලබා ගත් බව
- වරගුණ වර්මන් පාන්ඩ්‍ය රජු ලංකාවේ දෙවැනි සේන රජුගෙන්ද දෙවැනි මාරවර්මන් පාන්ඩ්‍ය රජු පස්වැනි කාශ්‍යප රජුගෙන් ද, මාරවර්මන් රාජසිංහ පාන්ඩ්‍ය රජු සිව්වැනි දප්පුල රජුගෙන් ද සිය රාජ්‍ය බලය තහවුරු කර ගැනීම සඳහා එසේ ආධාර ලබා ගත් බව

- ශ්‍රී ලංකාවේ සිංහල රජවරු දකුණු ඉන්දීය හමුදා ආධාර ලබා ගැනීම නිසා පසු කාලීනව ශ්‍රී ලංකාවේ ද්‍රවිඩ කුලී හේවායන්ගේ ක්‍රියා කලාපය රටේ ස්වාධීනත්වයට තර්ජනයක් වූ බව

මිනිත්තු 40 යි

## තක්සේරුව හා ඇගයීම

- ශ්‍රී ලංකාව හා දකුණු ඉන්දීය රාජ්‍යයන් අතර පැවති රාජ්‍ය තාන්ත්‍රික, ආගමික, සංස්කෘතික සම්බන්ධතා විස්තර කරයි.
- මූලාශ්‍රවලින් තොරතුරු ලබාගෙන ඓතිහාසික තොරතුරු සම්පිණ්ඩනය කරගත හැකි බව පිළිගනී.
- දකුණු ඉන්දීය රාජ්‍ය හා ශ්‍රී ලංකාවේ පිහිටීම ආකෘති සිතියමක ලකුණු කොට නම් කරයි.
- කණ්ඩායම තුළ සාමූහිකව කටයුතු කරයි.
- විවේචනාත්මක චින්තනයෙන් යුතුව කටයුතු කරයි.

පසු වැඩ :-
- පාඩම අවසානයේ පහත සඳහන් අභ්‍යාසවලට සිසුන් යොමු කරන්න.
  - දකුණු ඉන්දීය රාජධානි හා ශ්‍රී ලංකාවේ පිහිටීම දැක්වෙන සිතියමක් සැකසීම
  - ශ්‍රී ලාංකික රජවරු දකුණු ඉන්දීය රාජධානිවලින් හමුදා ආධාර ලබාගත් අවස්ථා ලැයිස්තුවක් සකස් කිරීම
  - දකුණු ඉන්දීය රජවරු ශ්‍රී ලාංකික රජුන්ගේ සහාය ලබා ගත් අවස්ථා ලැයිස්තුවක් සැකසීම
  - ශ්‍රී ලංකාව හා දකුණු ඉන්දියාව අතර පැවති ආගමික සංස්කෘතික හා ආර්ථික සබඳතා ලැයිස්තු ගත කරන්න.

ඇමුණුම 7.3.1.1



ඇමුණුම 7.3.1.2

## කණ්ඩායම 1 කාර්ය පත්‍රිකාව 1

ඔබේ කණ්ඩායමට පැවරෙන්නේ දකුණු ඉන්දියාවේ පාන්ඩ්‍ය, කේරළ, පල්ලව හා චෝළ රාජධානිවල පිහිටීම හා ශ්‍රී ලංකාවේ පිහිටීම දැක්වෙන සිතියමක් සකස් කිරීමයි. ඒ සඳහා ඔබ වෙත සපයා ඇති සිතියම උපකාර කර ගන්න.

එම සිතියමෙහි පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න.

1. පාන්ඩ්‍ය රාජ්‍යයෙහි පිහිටීම
2. චෝළ රාජ්‍යයෙහි පිහිටීම
3. පල්ලව රාජ්‍යයෙහි පිහිටීම
4. කේරළ රාජධානියේ පිහිටීම
5. ක්‍රිෂ්ණා තුංග භද්‍රා ගංගාව
6. කාවේරි ගංගාව
7. කාංචි නගරය
8. කාවේරි පටුන
9. තංජෝර් නගරය
10. මධුරා නගරය
11. කුමාරි තුඩුව
12. ලංකාවේ මහාතිත්ථ වරාය

සියලුම ගංගා නිල් පාටින් ලකුණු කරන්න. පැහැදිලිව සිත් ගන්නා අයුරින් නිර්මාණය කරන්න. අවශ්‍ය විට ගුරුතුමාගේ සහාය ලබා ගන්න. ඔබේ නිර්මාණය පන්තියට ඉදිරිපත් කරන්න.

ඇමුණුම 7.3.1.3

# කාර්ය පත්‍රිකාව II

කණ්ඩායම II

ඔබේ කණ්ඩායමට පැවරෙන්නේ දකුණු ඉන්දියානු රාජ්‍යයන් හා ශ්‍රී ලංකාව අතර පැවති රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා පිළිබඳ විස්තර ඇතුළත් වගුවක් සකස් කිරීමයි.

පහත සඳහන් ශීර්ෂ යටතේ එය සකස් කරන්න.

1. සිංහල රජවරු දකුණු ඉන්දියානු රාජ්‍යයන්ගෙන් උපකාර ලබාගත් අවස්ථා
2. දකුණු ඉන්දියානු රාජ්‍යයන් සිංහල රජවරුන්ගෙන් උපකාර ලබා ගත් අවස්ථා

මේ එක් එක් ශීර්ෂයක් යටතේ පහත සඳහන් තොරතුරු වගු ගත කරන්න.

| උපකාර ලබා ගත් රජතුමාගේ නම | උපකාර ලබාගත්තේ කවර රජකුගෙන් ද යන වග | උපකාර ලබා ගැනීමට හේතුව |
|---|---|---|
| ............... ............... | .................. .................. | ................. ............... |

- මේ තොරතුරු වගුව සකස් කිරීම සඳහා ඊට පෙර මෙහි ඇතුළත් තොරතුරු පත්‍රිකාව හොඳින් කියවා බලන්න.
- පෙළපොතින් ද තොරතුරු ලබා ගන්න. අවශ්‍ය විට ගුරුතුමාගේ සහාය ලබා ගන්න.
- ඔබේ නිර්මාණය පන්තියට ඉදිරිපත් කරන්න.

කාර්ය පත්‍රිකාව **II** සඳහා තොරතුරු පත්‍රිකාව

දකුණු ඉන්දීය රාජ්‍යයන් සමඟ ශ්‍රී ලංකාව පැවැත් වූ රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා

දකුණු ඉන්දියාවේ වරින් වර බලවත් වූ පල්ලව, පාණ්ඩ්‍ය, කේරළ හා චෝළ රාජ්‍යයන් විවිධ හේතූන් මත ශ්‍රී ලංකාව වෙත නොයෙකුත් බලපෑම් ඇති කිරීමට හේතුවක් වූයේ මේ රාජ්‍යයන් ශ්‍රී ලංකාවට ආසන්නව පිහිටීමයි.

මේ ආසන්නතාව නිසා ශ්‍රී ලංකික පාලකයින් මෙන් ම දකුණු ඉන්දියානු පාලකයින් ද විවිධ අවස්ථාවල දී එකිනෙකාගෙන් උදව් උපකාර ලබා ගැනීමට පෙළඹුණ බව පහැදැලිව පෙනී යන කරුණකි.

මේ සම්බන්ධතාවල ස්වභාවය අනුව ඒවා අංශ කීපයක් යටතේ දැක්විය හැකිය. ඉන් ප්‍රධාන තැනක් ගන්නේ රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතාය.

මේ යටතේ සමබන්ධතා දෙවර්ගයක් දැක්විය හැකිය.

1. * සිංහල රජවරු සිංහාසනය සඳහා පැවති අභ්‍යන්තර අරගලවල දී ඒවායින් ජය ගැනීමට දකුණු ඉන්දීය රාජ්‍යයන්ගෙන් උපකාර ලබා ගත් අවස්ථා

2. * දකුණු ඉන්දීය රාජ්‍ය පාලකයන් ඔවුන්ගේ සිංහාසනය සඳහා ඇති වූ අරගලවල දී ඒවායින් ජය ගැනීමට ලංකාවේ සිංහල රජවරුන්ගෙන් උපකාර ලබා ගත් අවස්ථා

1. • දකුණු ඉන්දීය පාලකයන් ශ්‍රී ලංකාවේ රජවරුන්ගෙන් උදව් උපකාර ඉල්ලූ අවස්ථා

   1. දකුණු ඉන්දියාවේ පාණ්ඩ්‍ය රාජ්‍යයේ රජකම ලබා ගැනීම සඳහා වරගුණවර්මන් කුමාරයා ශ්‍රී ලංකාවේ දෙවැනි සේන රජතුමාගෙන් උපකාර ඉල්ලා සිටීම. සිංහල හමුදාවල උපකාරයෙන් වරගුණවර්මන් රජු පාණ්ඩ්‍ය රජකම ලබා ගත්තේ ය.

   2. මාරවර්මන් රාජසිංහ දෙවැනි පාණ්ඩ්‍ය රජු පළමුවැනි පාරාන්තක නම් චෝළ රජුට විරුද්ධව ශ්‍රී ලංකාවේ පස්වැනි කාශ්‍යප රජුගෙන් උදව් ඉල්ලීම

   3. දෙවැනි මාරවර්මන් රාජසිංහ පාණ්ඩ්‍ය රජු හතරවැනි දප්පුල නම් සිංහල රජතුමාගෙන් චෝළයන්ට විරුද්ධව සටන් කිරීමට ආධාර ඉල්ලා සිටීම හා පාණ්ඩ්‍ය රාජ කකුධ භාණ්ඩ ආරක්ෂාව සඳහා හතරවැනි දප්පුල රජුට භාර දී නැවත ඉන්දියාවට යාම.

2. • සිංහල රජවරු දකුණු ඉන්දියානු රාජ්‍යයන්හි රජවරුන්ගේ උදව් උපකාර ඉල්ලූ අවස්ථා

   1. අනුරාධපුරයේ රජබවට පත් ඉළනාග රජුට ලම්බකර්ණ වංශිකයන්ගෙන් එල්ල වූ විරෝධය නිසා ඉන්දියාවට පළා යාමට සිදුවීම. පසුව ඉන්දියානු හමුදාවක් කැටුව පැමිණ ලම්බකර්ණ වංශිකයින් පරදා නැවත රජකමට පත්වීය.

   2. පළමුවැනි මුගලන් රජු සිය සොහොයුර පළමුවැනි කාශ්‍යප (සීගිරි කාශ්‍යප) රජුට විරුද්ධව දකුණු ඉන්දියානු හමුදාවක් රැගෙන විත් රාජ්‍ය බලය ලබා ගැනීමට සමත්වීම.

   3. තෙවැනි අග්බෝ රජු ජෙට්ඨතිස්ස නම් කුමාරයෙකු ගෙන් එල්ල වූ විරෝධතාවක් නිසා ඔහුට විරුද්ධව සටන් කිරීම සඳහා දකුණු ඉන්දියානු රාජ්‍යයකින් හමුදාවක් රැගෙන විත් ජෙට්ඨතිස්ස පරදා රජකම ලබා ගැනීම.

4. ජේට්ඨතිස්ස රජුගේ සෙනවියකු වූ දාඨශිව ඉන්දියාවෙන් හමුදාවක් රැගෙන විත් තෙවැනි අග්බෝ පරදා  පළමුවැනි දාඨෝපතිස්ස නමින් රජවිය.

5. පළමුවැනි දාඨෝපතිස්ස රජුට පසු රජ වූ දප්පුල නම් රජුට විරුද්ධව දකුණු ඉන්දීය හමුදාවක සහාය ලබා ගත් පළමුවැනි දාඨෝපතිස්ස රජුගේ බෑනා කෙනෙකු දෙවැනි දාඨෝපතිස්ස නමින් දප්පුල රජු පරදා රජවිය.

6. මනවම්ම කුමාරයා දෙවැනි නරසිංහ වර්මන් පල්ලව රජුගෙන් ආධාර ලබාගෙන අනුරාධපුරයේ රජකම ලබා ගැනීම

7. සිව්වැනි මිහිඳු රජු කාලිංග වංශික කුමරියක් ඉන්දියාවෙන් ගෙන්වාගෙන විවාහ කර ගැනීම.

ඇමුණුම 7.3.1.4

### කාර්ය පත්‍රිකාව III - කණ්ඩායම III

ඔබේ කණ්ඩායමට පැවරී ඇත්තේ දකුණු ඉන්දීය රාජ්‍යයන් සමඟ ශ්‍රී ලංකාව පැවැත්වූ ආගමික හා සංස්කෘතික සම්බන්ධතා පිළිබඳ තොරතුරු පත්‍රිකාවක් සකස් කිරීමයි. එය පහත සඳහන් ශීර්ෂ යටතේ සකස් කරන්න.

| ආගමික හා සංස්කෘතික සම්බන්ධතා පැවැත් වූ දකුණු ඉන්දීය මධ්‍යස්ථාන | ආගමික හා සංස්කෘතික සබඳතා පැවැත් වූ ශ්‍රී ලංකාවේ මධ්‍යස්ථාන | ආගමික හා සංස්කෘතික සම්බන්ධතාවල දී සඳහන්වන පුද්ගලයින්ගේ නම් |
|---|---|---|
| . . . . . . . . . . . . . . .. . . . .<br>. . . . . . . . . . . . . . . . . . | . . . . . . . . . . . . . . . . . .<br>. . . . . . . . . . . . . . . . . . | . . . . . . . . . . . . . . . . . .<br>. . . . . . . . . . . . . . . . . . |

- මේ වගුව සකස් කිරීමේ දී ඒ සඳහා සපයා ඇති තොරතුරු පත්‍රිකාව හොඳින් කියවා බලන්න.
- පෙළපොතින් ද අවශ්‍ය තොරතුරු ලබා ගන්න.
- අවශ්‍ය විට ගුරුතුමාගේ සහාය ලබා ගන්න.
- ඔබේ නිර්මාණය පන්තියට ඉදිරිපත් කරන්න.

### කාර්ය පත්‍රිකාව III සඳහා තොරතුරු පත්‍රිකාව

#### දකුණු ඉන්දීය රාජ්‍යයන් සමඟ පැවති ආගමික හා සංස්කෘතික සම්බන්ධතා

- දකුණු ඉන්දියාවේ නාගර්ජුන කොණ්ඩ හා අමරාවතී යන බෞද්ධ මධ්‍යස්ථාන සමග ලාංකික භික්ෂූන් වහන්සේලා සම්බන්ධකම් පැවැත්වූහ
- අමරාවතී කැටයම් හා මූර්ති සම්ප්‍රදායන් ගේ බලපෑම ලංකාවේ කැටයම් හා මූර්ති කලාවේ දක්නට ඇත.
- දකුණු ඉන්දියාවේ මහායාන බෞද්ධ මධ්‍යස්ථාන සමඟ ශ්‍රී ලංකාවේ භික්ෂූන් වහන්සේලා සම්බන්ධකම් පැවැත් වූ බව පෙනේ. චෝළ රාජ්‍යයේ කාවේරි පට්ඨනමෙහි වූ ආරාමයක ලංකාවෙන් පිටුවහල් කළ මාහායාන ශික්ෂූන් වාසය කලබව මූලාශ්‍රවල දැක්වේ.
- දකුණු ඉන්දියාවේ වජ්‍රබෝධි නම් මහායාන පඬිවරයා ලංකාවේ අභයගිරි විහාරයේ කලක් වාසය කලබව මූලාශ්‍රවල සඳහන් වේ.

ඇමුණුම 7.3.1.5

කාර්ය පත්‍රිකාව **IV** - කණ්ඩායම **IV**

ඔබේ කණ්ඩායමට පැවරෙන්නේ ශ්‍රී ලංකාව හා දකුණු ඉන්දියාව සමඟ පැවති ආර්ථික සම්බන්ධතා ඇතුළත් කෙටි තොරතුරු පත්‍රිකාවක් සකස් කිරීමයි.

මේ තොරතුරු පත්‍රිකාවේ පහත සඳහන් කරුණු ඇතුළත් කරන්න.

- මෙරට වෙළෙඳ ශ්‍රේණි ආරම්භ වූ ආකාරය.
- වෙළෙඳ භාන්ඩ හුවමාරුව දකුණු ඉන්දීය මධ්‍යස්ථානවල හා ශ්‍රී ලංකාවේ වෙළෙඳ මධ්‍යස්ථානවල නම්.
- වෙනත් ආර්ථික කටයුතු පිළිබඳ තොරතුරු.

- මේ තොරතුරු පත්‍රිකාව සකස් කිරීමට පෙර දී ඇති විස්තර පත්‍රිකාව අධ්‍යයනය කරන්න.
- පෙළපොතින් ද තොරතුරු ලබා ගන්න.
- ඔබේ නිර්මාණය පන්තියට ඉදිරිපත් කරන්න.
- අවශ්‍යවිට ගුරුතුමාගේ සහාය ලබා ගන්න.

කාර්ය පත්‍රිකාව **IV** සඳහා තොරතුරු පත්‍රිකාව

දකුණු ඉන්දියානු රාජ්‍යයන් සමඟ පැවති ආර්ථික සම්බන්ධතා

- විජය කුමාරයා දකුණු ඉන්දියාවේ මධුරා පුරයෙන් ගෙන්වාගත් බිසව සමඟ පැමිණි ශිල්ප ශ්‍රේණි 18කට අයත් පවුල්වලින් මෙරට වෙළෙඳ ශ්‍රේණිවල ආරම්භය ඇතිවිය.
- ලංකාවේ මහාතිත්ථ හා අනෙකුත් වෙළෙඳ තොටුපලවල් හා දකුණු ඉන්දියාවේ තොටුපලවල් අතර වෙළෙඳ භාණ්ඩ හුවමාරුව සිදුවිය.
- මහාතිත්ථ වරායේ සිට දකුණු ඉන්දියාවේ කාවේරි පටුනට භාණ්ඩ රැගෙන වෙළෙඳාමට ගිය බව මූලාශ්‍රවල සඳහන් වේ.
- වංකනාසික තිස්ස රාජ්‍ය කාලයේ චෝළ රජකෙනෙකු ලංකාවෙන් තරුණයින් 12000ක් දකුණු ඉන්දියාවේ කාවේරි පටුන ප්‍රදේශයේ ගොවිතැන් කටයුතු සඳහා ගෙන ගිය බව මූලාශ්‍රවල සඳහන් වේ.

## ක්‍රියාකාරකම 7.3.2

නිපුණතා මට්ටම : අනුරාධපුර රාජධානියේ බිඳ වැටීමට දකුණු ඉන්දීය ආක්‍රමණ බලපෑ ආකාරය විග්‍රහ කරයි.

ක්‍රියාකාරකම : දකුණු ඉන්දියානු රාජ්‍ය ශ්‍රී ලංකාව ආක්‍රමණය කරයි.

කාලය : මිනිත්තු 80

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 7.3.2.1 - දකුණු ඉන්දීය රාජධානි දැක්වෙන සිතියම
- ඇමුණුම් 7.3.2.2 - කාර්ය පත්‍රිකාව
- A4 කඩදාසි

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.3.2.1 :
- ඇමුණුම 7.3.2.1 සිතියම පන්තියේ ප්‍රදර්ශනය කරන්න. පෙර පාඩමේ දී සාකච්ඡා කළ ලංකාව හා දකුණු ඉන්දීය සබඳතා සිහිපත් කරමින් එම සබඳතාවල තවත් ස්වභාවයක් වූ දකුණු ඉන්දීය ආක්‍රමණ පිළිබඳ ව සිසුන් සමඟ කෙටි සාකච්ඡාවක් කරන්න.

  මෙම සාකච්ඡාවේ දී පහත සඳහන් කරුණු ඉස්මතු කර දක්වන්න.

  - ඉන්දියාවට ආසන්නයේ ශ්‍රී ලංකාව පිහිටා ඇති නිසා දකුණු ඉන්දියානු ආක්‍රමණවලට ශ්‍රී ලංකාව ලක් වූ බව.
  - ආසන්න පිහිටීම නිසාම ශ්‍රී ලංකාවේ ඇතැම් බලපෑම්වලට දකුණු ඉන්දියාව ද හසු වූ බව
  - මේ ඇසුරින් ද ඉන්දයාව හා ශ්‍රී ලංකාව අතර අන්තර් සබඳතාවයන් ගොඩ නැගුනු බව

මිනිත්තු 10යි

පියවර 7.3.2.2 :
- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම්වලට බෙදන්න
- කළ යුතු කාර්යයන් පිළිබඳ පොදු සාකච්ඡාවක් මගින් උපදෙස් දෙන්න.
- ඇමුණුම 7.3.2.2 කාර්ය පත්‍රිකාව හා තොරතුරු පත්‍රිකාව කණ්ඩායම්වලට බෙදාදෙන්න.
- කණ්ඩායමේ සියලු දෙනා ම ක්‍රියාකාරකමෙහි යෙදිය යුතු බව අවධාරනය කරන්න.

- කණ්ඩායමේ සෑම සාමාජිකයෙකුගේ ම ක්‍රියාකාරීත්වය පිළිබඳ ඇගයීමයක් කරන බව සඳහන් කරන්න.
- දෙන ලද කාර්ය පත්‍රිකාවට අනුව කණ්ඩායම් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- ගුරුවරයා හැම විට ම සියළු ම කණ්ඩායම්වලට උපදෙස් දෙන්න.

මිනිත්තු 30යි

පියවර 7.3.2.3 :
- එක් එක් කණ්ඩායමේ නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- කණ්ඩායම් ඉදිරිපත් කිරීම්වලින් පසු අවශ්‍ය තැන්වල දී ඌණ පූරණය කරමින් පහත සඳහන් කරුණු මතුවන පරිදි සමාලෝචනයක යෙදෙන්න.

- ශ්‍රී ලංකාවේ හා දකුණු ඉන්දීය සබඳතාවල අහිතකර බලපෑම් ලද අවස්ථා ලෙස දකුණු ඉන්දීය ආක්‍රමණ දැක්විය හැකි බව
- ශ්‍රී ලංකාවට දකුණු ඉන්දීය ආක්‍රමණ එල්ලවීමට බලපෑ හේතු ගණනාවක් බලපෑ බව.
- දකුණු ඉන්දියාවේ බලවත් රාජධානී ඇතිවීම, ලංකාවේ වරින්වර දුර්වල පාලකයින් බිහිවීම, ලංකාව දකුණු ඉන්දියාවට ආසන්නව පිහිටීම සහ ලංකාවේ දුර්වල රජවරු බලය තහවුරු කර ගැනීමට දකුණු ඉන්දීය රජුන්ගේ සහාය පැතීම වැනි හේතු මේ ආක්‍රමණවලට මුල් වූ බව.
- ශ්‍රී ලංකාවට එල්ල වූ දකුණු ඉන්දීය ආක්‍රමණ අවස්ථාවාදී ආක්‍රමණ, දේශපාලන ආධිපත්‍ය සඳහා වූ ආක්‍රමණ හා ආර්ථික වාසි තකා සිදුකළ ආක්‍රමණ වශයෙන් වෙන්කර දැක්විය හැකි බව.
- පස්වැනි මිහිඳු රජුගේ දුර්වල රාජ්‍යකාලය නිසා දකුණු ඉන්දියාවේ එවකට බලවත් වූ චෝල අධිරාජ්‍යයෙන් එල්ල වූ ආක්‍රමණයක් නිසා ලංකාවේ උතුරු ප්‍රදේශ චෝල අධිරාජ්‍යයේ කොටසක් වූ බව
- දකුණු ඉන්දීය ආක්‍රමණ නිසා ශ්‍රී ලංකාවේ අනුරාධපුර රාජධානිය පිරිහීමට ලක් වූ බව
- දකුණු ඉන්දියාවේ බලවත් වූ රාජධානි සිය බලය දකුණට ව්‍යාප්ත කිරීමේ අරමුණු නිසා ශ්‍රී ලංකාව බහුලව දකුණු ඉන්දීය ආක්‍රමණවලට ගොදුරු වූ බව

- ලංකාවේ රජ පෙළපත් අතර සිහසුනට ඇති වූ අරගල නිසා පාලනය අස්ථාවරවීම දකුණු ඉන්දීය ආක්‍රමණිකයන්ට මෙරට බලය ලබා ගැනීමට පහසු වූ බව.
- ලංකාවේ දුර්වල පාලකයින් දකුණු ඉන්දීය හමුදා ආධාර ලබා ගැනීම නිසා දකුණු ඉන්දීය ආක්‍රමණිකයින්ට මෙරට සිටි දකුණු ඉන්දීය කුලී හමුදාවල සහාය ලැබුණ බව.
- සූරතිස්ස, අසේල, වලගම්බා , මිත්සෙන් වැනි රජවරුන් කල අස්ථාවර දේශපාලන තත්වය නිසා දකුණු ඉන්දියාව ලංකාව ආක්‍රමණය කළ බව.
- ආර්ථික වාසි ලබා ගැනීමට පළමුවැනි සේන රජකල පාණ්ඩ්‍යයන් ලංකාව ආක්‍රමණය කල බව.
- දකුණු ඉන්දියාවේ බලවත් වූ චෝළ අධිරාජ්‍යය සිව්වැනි උදය රජු කළ ශ්‍රී ලංකාව ආක්‍රමණය කළ බව.
- සිව්වැනි මිහිඳු රජු කල දකුණු ඉන්දියාවේ රාෂ්ට්‍රකූට පාලකයෙකු ලංකාව ආක්‍රමණය කළ බව
- පස්වැනි මිහිඳු නම් දුබල සිංහල රජු කළ චෝළයන් ලංකාව ආක්‍රමණය කොට 1017 දී අනුරාධපුර රාජධානිය සිය අධිරාජ්‍යයට යටත් කළ බව.
- චෝළයන් අනුරාධපුරය අතහැර පොළොන්නරු අගනුවර කර ගැනීම නිසා අනුරපුර රාජධානිය බිඳ වැටුන බව.
- සිංහල පාලකයන්ගේ දුර්වලතා නිසා අනුරපුර රාජධානියේ පැවති කීර්තිමත් ආර්ථික හා සංස්කෘතික දියුණුව පිරිහී ගිය බව

මිනිත්තු 40යි


## තක්සේරුව හා ඇගයීම

- ශ්‍රී ලංකාවට දකුණු ඉන්දීය ආක්‍රමණ එල්ලවීමට බලපෑ හේතු විස්තර කරයි.
- ශ්‍රී ලංකාවට දකුණු ඉන්දීය ආක්‍රමණ එල්ලවීමට නිසා අනුරාධපුර රාජධානිය බිඳ වැටුන බව  පිළිගනිමින් අදහස් දක්වයි.
- ශ්‍රී ලංකාවට එල්ල වූ දකුණු ඉන්දීය ආක්‍රමණ පිළිබඳ තොරතුරු වගු ගත කරයි.
- කණ්ඩායමේ සාමූහික ප්‍රයත්නයෙන් වඩා සාර්ථක නිර්මාණ බිහි කිරීමට හැකි බව පසක් කර ගනිමින් කටයුතු කරයි.
- නායකත්ව ගුණාංග පෙන්වයි.

පසුවැඩ :- පාඩම අවසානයේ පහත සඳහන් අභ්‍යාසවලට සිසුන් යොමු කරන්න.

1. ශ්‍රී ලංකාවට එල්ල වූ දකුණු ඉන්දීය ආක්‍රමණ හා ඒවා මෙහෙය වූ ඉන්දීය පාලකයින් හා එවකට ශ්‍රී ලංකාවේ සිටි පාලකයින් පිළිබඳ තොරතුරු වගුවක් සැකසීම.
2. දකුණු ඉන්දීය ආක්‍රමණ නිසා ශ්‍රී ලංකාවට අත් වූ අහිතකර ප්‍රතිඵල ලැයිස්තුවක් සැකසීම.

ඇමුණුම 7.3.2.1



ඇමුණුම 7.2.2.2

## කාර්ය පත්‍රිකාව

ඔබට පැවරෙන කාර්යය වන්නේ ශ්‍රී ලංකාවට එල්ල වූ දකුණු ඉන්දීය ආක්‍රමණ පිළිබඳ විස්තර ඇතුළත් වගුවක් සකස් කිරීමයි.

පහත සඳහන් ශීර්ෂ යටතේ ඔබේ නිර්මාණය සකස් කරන්න.

1. ශ්‍රී ලංකාව දකුණු ඉන්දීය ආක්‍රමණවලට ලක්වීමට බලපෑ හේතු
2. ශ්‍රී ලංකාවට එල්ල වූ ආක්‍රමණ පිළබඳ විස්තර, පහත දැක්වෙන ආකෘතියට අනුව සකස් කරන්න.

| ශ්‍රී ලංකාව ආක්‍රමණය කළ දකුණු ඉන්දීය පාලකයා | එවකට ශ්‍රී ලංකාවේ සිටි පාලකයා | ආක්‍රමණයට හේතු | ආක්‍රමණයෙහි ප්‍රතිඵල |
|---|---|---|---|
| ................. ................. | ............... ............... | .......... .......... | .......... .......... |

- ක්‍රියාකාරකමෙහි නිරතවීමට පෙර දී ඇති තොරතුරු පත්‍රිකාව අධ්‍යයනය කරන්න.
- පෙළපොතින් හා වෙනත් පතපොතින් ද අවශ්‍ය තොරතුරු ලබා ගන්න.
- ඔබේ නිර්මාණය පන්තියට ඉදිරිපත් කරන්න.

කාර්ය පත්‍රිකාව I සඳහා තොරතුරු පත්‍රිකාව

ශ්‍රී ලංකාවට එල්ල වූ දකුණු ඉන්දියානු ආක්‍රමණ

ශ්‍රී ලංකාව ඈත අතීතයේ සිටම ඉන්දියාවේ බලපෑම්වලට ලක්විය. මේ බලපෑම් අතර හිතකර මෙන් ම අහිතකර බලපෑම් ද විය.

මේ අතරින් අහිතකර බලපෑම් ලෙස විශේෂයෙන් සඳහන් කළ හැකි වන්නේ දකුණු ඉන්දියානු රාජ්‍යවලින් වරින් වර ශ්‍රී ලංකාවට එල්ල වූ ආක්‍රමණයි.

- ශ්‍රී ලංකාව දකුණු ඉන්දීය ආක්‍රමණවලට ලක්වීමට හේතු ගණනාවක් විය.
  1. දකුණු ඉන්දියාවට වඩාත් සමීපව ශ්‍රී ලංකාව පිහිටා තිබීම.
  2. දකුණු ඉන්දියාවේ වරින් වර බිහි වූ බලවත් රාජ්‍යවලට සියබලය වඩා පහසුවෙන් ශ්‍රී ලංකාවට පැතිරවිය හැකි වීම.
  3. ශ්‍රී ලංකාවේ රජ පෙළපත් අතර ඇති වූ අරගලවල දී සිය බලය තහවුරු කර ගැනීම සඳහා ඇතැම් රජවරු දකුණු ඉන්දීය කුලී හමුදාවල සහාය ලබා ගැනීම.
  4. ආරක්ෂාව සඳහා පාන්ඩ්‍ය රාජ කකුධ භාණ්ඩ ශ්‍රී ලංකාවේ රජුවෙත තබා යාම නිසා ඒවා ලබා ගැනීමට චෝළයන්ට අවශ්‍ය වීම.

ශ්‍රී ලංකාවට එල්ල වූ දකුණු ඉන්දීය ආක්‍රමණවල ස්වභාවය

1 අදියර

- ඒ ඒ අවස්ථාවල ශ්‍රී ලංකාවේ පැවති දුර්වල පාලනයෙන් ප්‍රයෝජන ගැනීම සඳහා කළ ආක්‍රමණ.
- සූරතිස්ස රාජ්‍ය කාලය
  සේන හා ගුත්තික අශ්ව වෙළෙඳුන් දෙදෙනා මෙරට ආක්‍රමණය කොට අවු. 22ක් රජකම් කිරීම.
- අසේල රාජ්‍ය කාලය
  එළාර නම් චෝළ සෙන්පතියා මෙරට ආක්‍රමණය කොට අවු 44ක් රාජ්‍ය පාලනය කිරීම.
- වළගම්බා රාජ්‍ය කාලය
  ද්‍රවිඩයින් සත් දෙනෙකුගේ ආක්‍රමණය ඉන් දෙදෙනෙක් පාත්‍රාධාතුව හා සෝමා දේවිය රැගෙන ආපසු ඉන්දියාවට ගිය අතර ඉතිරි පස් දෙනා වූ පුලහත්ථ, භාතිය, පනයමාර, පිළියමාර හා දාඨික යන අය අවු. 14ක් හා මාස 07ක් අනුරාධපුරයේ රජකිරීම.
- මිත්සෙන් රජ කාලය
  ද්‍රවිඩයින් සය දෙනාගේ ආක්‍රමණය පණ්ඩු, පාරින් ද, ඛුද්ධපාරින්ද, තිරිතර දාඨිය, පීඨිය යන සය දෙනා අවු 27ක් අනුරපුරය පාලනය කිරීම.

2 වන අදියර - ආර්ථික වාසි ලබා ගැනීම සඳහා

- පළමුවැනි සේන රාජ්‍ය කාලය
  ශ්‍රී මාර ශ්‍රී වල්ලභ නම් පාන්ඩ්‍ය රජු අනුරාධපුරය ආක්‍රමණය කර වස්තුව කොල්ල කෑම

3 වන අදියර - දේශපාලන ආධිපත්‍ය සඳහා

- සිව්වැනි උදය රාජ්‍ය කාලය
  පළමුවැනි පරාන්තක චෝළ රජු පාන්ඩ්‍ය රාජ කකුධ භාන්ඩ ලබා ගැනීම සඳහා ලංකාව ආක්‍රමණය කිරීම
- සිව්වැනි මිහිඳු රාජ්‍ය කාලය
  රාෂ්ට්‍රකූඨ රාජ්‍යයේ පාලකයා වූ තෙවැනි ක්‍රිෂ්ණ ලංකාව ආක්‍රමණය කිරීම
- පස්වැනි මිහිඳු රාජ්‍ය කාලය
  පළමුවැනි රාජරාජ චෝළ රජු ලංකාව ආක්‍රමණය කිරීම ( ක්‍රි.ව. 993 දී )
  පළමුවැනි රාජේන්ද්‍ර චෝළ රජුගේ ආක්‍රමණය (ක්‍රි.ව. 1017 දී ) අනුරාධපුරය යටත් කර ගැනීම
- පළමුවැනි රාජේන්ද්‍ර ලංකාවේ උතුරු කොටස යටත් කර එය චෝල අධිරාජ්‍යයේ කොටසක් කර ගැනීම. (මුම්මුදි චෝළ මණ්ඩලම් යන නමින් )
  චෝළයන් අනුරාධපුරය අතහැර පොළොන්නරුව අගනුවර ලෙස තෝරා ගෙන එය ජනනාථපුරම් නමින් හැඳින්වූහ.

# ක්‍රියාකාරකම 7.3.3

නිපුණතා මට්ටම : අනුරපුර බිඳ වැටීම හා ඉන්පසු ශ්‍රී ලංකාවේ චෝළ පාලනය ක්‍රියාත්මක වූ ආකාරය විමර්ශනය කරයි.

ක්‍රියාකාරකම : අනුරපුර බිඳ වැටීම හා චෝළ පාලන සංවිධානය මෙරටට බලපෑ අයුරු විමසමු.

කාලය : මිනිත්තු 80

ගුණාත්මක යෙදවුම් :
1. ඇමුණුම 7.3.3.1 - දකුණු ඉන්දීය ආක්‍රමණවල විස්තර දැක්වෙන වගුව
2. ඇමුණුම 7.3.3.2 - කාර්ය පත්‍රිකාව හා තොරතුරු පත්‍රිකාව
3. A4 කඩදාසි
4. මූලාශ්‍ර ග්‍රන්ථ
   * පෙළපොත

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.33.1 :
- ඇමුණුම් අංක 7.3.3.1 හි දැක්වෙන වගුව පන්තියට ඉදිරිපත් කරන්න. ඒ ඇසුරෙන් ශ්‍රී ලංකාවට එල්ල වූ දකුණු ඉන්දීය ආක්‍රමණ පිළිබඳ සිසුන්ගේ පෙර දැනුම ඉස්මතු කරමින් සාකච්ඡාව ගොඩ නගන්න. එහි දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

- අනුරපුර රාජධානිය බිඳවැටීමට බලපෑ හේතු ගණනාවක් වූ බව.
- සිංහල රාජවංශ අතර වූ අරගල, සහ දුර්වල පාලකයන් හේතු වූ බව.
- දකුණු ඉන්දීය ආක්‍රමණ නිසා රටේ ආර්ථිකය බිඳ වැටුණු බව
- රාජ්‍ය ආදායම අඩු වූ බව.
- රාජ්‍ය නිලධාරීන් හා ප්‍රාදේශීය පාලකයින් රජුට විරුද්ධව කැරලි ගැසූ බව.
- රජු රුහුණුට පලායාම හා අනුරපුරය අරාජික වූ බව.
- චෝළරාජ්‍යයේ ආක්‍රමණ මෙකල ඇති වූ බව.
- රාජ්‍ය මධ්‍යස්ථානය පොළොන්නරුවට ගෙන ගිය බව.
- ලංකාවේ උතුරු ප්‍රදේශ චෝළ අධිරාජ්‍යයේ මණ්ඩලම් නම් වූ ඒකකයක් බවට පත් වූ බව.
- චෝළයන් යුද්ධමය පාලනයක් ගෙන ගිය බව.

මිනිත්තු 15යි

පියවර 7.3.3.2 :

- කේවල ක්‍රියාකාරකමක් ලෙස කළ යුතු බව දැනුම් දෙන්න.
- කළයුතු කාර්යය පිළිබඳ පොදු සාකච්ඡාවක් මගින් උපදෙස් දෙන්න.
- ඇමුණුම 7.3.3.1 කාර්ය පත්‍රිකාව සෑම සිසුවෙකුටම බෙදා දෙන්න.
- සෑම සිසුවෙකුගේම ක්‍රියාව ඇගයීමට ලක් කරන බව දන්වන්න.
- සිසුන් ක්‍රියාකාරකමෙහි යෙදෙනවිට අවශ්‍ය උපදෙස් ගුරුවරයා ලබා දිය යුතුය.

මිනිත්තු 25යි

පියවර 7.3.3.3 :

- සිසුන්ගේ නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට ඉඩ දෙන්න. ඉදිරිපත් කිරීම්වලින් පසු අවශ්‍ය තැන්වල ඌණ පූරණය කරමින් පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.

- අනුරාධපුර රාජධානිය බිඳවැටීමට කරුණු ගණනාවක් හේතු වූ බව.
- මෝරිය හා ලම්භකර්ණ රාජවංශ අතර වූ ගැටුම් නිසා පාලනය අවුල්වීම බිඳවැටීමට ප්‍රධාන හේතුවක් වූ බව.
- දුර්වල පාලකයන්ගේ කාලවල දී දකුණු ඉන්දීය බලවත් රාජ්‍ය ලංකාව ආක්‍රමණය කිරීමට අවස්ථා උදාකරගත් බව.
- මෙරට සිටි දකුණු ඉන්දීය කුලී හමුදාවල ක්‍රියා කලාපය ද රාජධානිය බිඳවැටීමට හේතු වූ බව.
- ආක්‍රමණ නිසා රටේ ආර්ථිකය බිඳ වැටීම ද පරිහානියට හේතු වූ බව.
- වැව් හා වාරි මාර්ග විනාශවීම ද බිඳ වැටීමට හේතු වූ බව.
- පස්වැනි මිහිඳු දුර්වල පාලකයකු වූ අතර අනුරපුර අතහැර රුහුණට පලායාම නිසා අනුරපුර රාජ්‍යය අරාජිකවීම ද බිඳවැටීමට හේතු වූ බව.
- ප්‍රාදේශීය පාලකයින්ගේ කැරලි ගැසීම් රජය බිඳ වැටීමට බලපෑ බව
- රාජේන්ද්‍ර චෝළ රජු අනුරපුර ආක්‍රමණය කර යටත් කර ගැනීම රාජ්‍ය මධ්‍යස්ථානය පොළොන්නරුවට ගෙන යාම ද අනුරපුර බිඳ වැටීමට ප්‍රධාන හේතුවක් වූ බව
- චෝළයන් යුදමය පාලනයක් ගෙන ගිය බව
- බදු අය කිරීම, කප්පම් ගැනීම ආදිය මගින් විශාල ධනයක් චෝළ දේශයට ගෙන ගිය බව

මිනිත්තු 40යි

තක්සේරුව හා ඇගයීම

- අනුරපුර රාජධානිය බිඳ වැටීමට හේතු පැහැදිලි කරයි.
- අනුරපුර රාජධානියට එල්ල වූ දකුණු ඉන්දීය ආක්‍රමණ වගු ගත කරයි.
- මූලාශ්‍රවලින් තොරතුරු ලබා ගෙන ක්‍රමවත්ව ඉදිරිපත් කිරීමේ හුරුවක් ලබයි.
- සාමූහික ප්‍රයත්නයක් මගින් තොරතුරු ඉදිරිපත් කිරීම වඩා පහසුබව පිළිගනියි.
- දේශීය පාලකයින්ගේ එකමුතු බව නොමැතිවීම පහසු වූ බව අතීත සිදුවීම් ඇසුරින් අවබෝධකරගෙන අනාගතයේ එවැනි තත්වයන් ඇතිවීම වලක්වා ගැනීමට ඉන් පාඩම් උගත යුතු බව අන්‍යයන්ට වටහා දෙයි.

අභ්‍යාස :- පාඩම අවසන පහත සඳහන් කරුණු පිළිබඳ ව වැඩිමනත් තොරතුරු පොතපත ඇසුරින් රැස් කිරීමට යොමු කරවන්න.

- ශ්‍රී ලංකාවට එල්ල වූ දකුණු ඉන්දීය ආක්‍රමණ හා ඒවායේ බලපෑම
- ශ්‍රී ලංකාවේ චෝළ පාලනය සංවිධානය වූ ආකාරය

ඇමුණුම 7.3.3.1

ශ්‍රී ලංකාවට එල්ල වූ දකුණු ඉන්දීය ආක්‍රමණ

| ආක්‍රමනිකයා | එවකට ලංකාවේ සිටි පාලකයා | ආක්‍රමණයට හේතු | ආක්‍රමණයේ ප්‍රතිඵල |
|---|---|---|---|
| සේන ගුත්තික | සූරතිස්ස | ශ්‍රී ලංකාවේ පැවති දුර්වල පාලනය | අවුරුදු 22ක් ශ්‍රී ලංකාවේ රජ කිරීම |
| එළාර නම් චෝළ සෙන්පතියා | අසේල | ශ්‍රී ලංකාවේ පැවති දුර්වල පාලනය | අවුරුදු 44ක්රජරට පාලනය කිරීම |
| සත්ද්‍රවිඩ ආක්‍රමණිකයන් | වලගම්බා | ශ්‍රී ලංකාවේ අභ්‍යන්-තර පාලනයේ අවුල් සහගත බව | පාත්‍රා ධාතුව ඉන්දි-යාවට ගෙනයාම. අවු.14ක් අනුරාධපුර පාලනය කිරීම |
| හය ද්‍රවිඩ ආක්‍රමණිකයන් | මිත්සෙන් | දුර්වල පාලනය | වසර 27ක් අනුරාපුර පාලනය කිරීම |
| ශ්‍රීමාර ශ්‍රී වල්ලභ චෝළ රජු | I සේන | වස්තුව කොල්ලකෑම | කොල්ලකාගත් වස්-තුව දකුණු ඉන්දියා-වට ගෙන යාම |
| I පරාන්තක චෝළ රජු | IV උදය | දේශපාලන ආධිපත්‍ය ලබා ගැනීම හා පංච කුකුධ භාණ්ඩ ලබා ගැනීම | පංච කුකුධ භාණ්ඩ ගෙන යාම සහ ලංකාවෙන් වාර්ෂි-කව කප්පම් ලබා ගැනීම |
| III ක්‍රිෂ්ණ - රාෂ්ට්‍රකූට රජු | IV මිහිදු | දේශපාලන ආධිපත්‍යය | |
| I රාජ රාජ චෝළ සහ I රාජේන්ද්‍ර | V මිහිදු | දේශපාලන ආධිපත්‍යය සඳහා | අනුරාධපුර රාජ්‍යය බිඳ වැටීම සහ ලංකාවේ උතුරු ප්‍රදේශ චෝළ ආධි-පත්‍යයට නතුවීම |

ඇමුණුම 7.3.3.2

## කාර්ය පත්‍රිකාව

ඔබට පැවරෙන්නේ අනුරාධපුර රාජධානිය බිඳ වැටීම හා ඉන් පසුව ඇති වූ චෝළ පාලනය පිළිබඳ තොරතුරු පත්‍රිකාවක් සකස් කිරීමයි.

ඒ සඳහා දී ඇති විස්තර පත්‍රිකාව අධ්‍යයනය කරන්නී පෙළපොතින් ද කරුණු රැස් කර ගන්න.

1. අනුරපුර රාජධානිය බිඳ වැටීමට බලපෑ හේතු
2. චෝළ පාලනය සංවිධානය වී තිබූ ආකාරය

ඔබට ගැටලු සහගත අවස්ථාවල දී ගුරුතුමාගේ සහාය ලබා ගන්න.

ඔබේ නිර්මාණය පන්තියට ඉදිරිපත් කරන්න.

## කාර්ය පත්‍රිකාව සඳහා තොරතුරු පත්‍රිකාව

අනුරාධපුර රාජධානිය බිඳවැටීම හා චෝළ අධිපත්‍යය

වසර 1500ක් පමණ දීර්ඝ කාලයක් පාලන මධ්‍යස්ථානය ලෙස පැවති අනුරාධපුරය ක්‍රි.ව. 1017 දී චෝළ ආක්‍රමණය නිසා බිඳ වැටීම සිදුවිය.

අනුරාධපුර රාජධානිය බිඳ වැටීමට බලපෑ හේතු ගණනාවක් විය.

- මෞර්ය හා ලම්බකර්ණ යන රාජවංශ අතර සිහසුන ලබා ගැනීම සඳහා වූ අරගලය නිසා රටතුල අවුල් සහගත තත්ත්වයක් පැවතීම.
- දුර්වල පාලකයන්ගේ කාලවල දී ඉන් වාසි ලබා ගැනීමට දකුණු ඉන්දීය ආක්‍රමණ එල්ල වීම
- චෝළ ආක්‍රමණ අවධියේ මෙරට පාලනය කල පස්වැනි මිහිඳු රජු දුර්වල පාලකයෙක් වීම
- ආක්‍රමණ නිසා රජවරුන්ට ආර්ථික කටයුතු නඟා සිටුවීමට අවස්ථාවක් නොලැබීම.
- වැව් සහ වාරි කර්මාන්ත විනාශවීම.
- රාජ්‍ය ආදායම අඩුවීම.
- අනුරපුර පාලන නිලධාරීන් රජුට විරුද්ධව කැරලි ගැසීම.
- පස්වැනි මිහිඳු රජු රුහුණට පලායාම නිසා අනුරාධපුරය අරාජික වීම.
- රාජේන්ද්‍ර චෝළ රජු රුහුණු ආක්‍රමණය කර පස්වැනි මිහිඳු රජු සිරභාරයට ගැනීම.
- චෝළයින් අනුරාධපුරය අතහැර පොලොන්නරුවට පරිපාලන මධ්‍යස්ථානය ගෙන යාම.

චෝල පාලනය ක්‍රියාත්මක වූ ආකාරය

- චෝළ අධිරාජ්‍ය 'මණ්ඩලම් ' නමින් වූ ඒකක අටකට බෙදා තිබූ අතර ශ්‍රී ලංකාවේ ඔවුන් යටත් කරගත් ප්‍රදේශ එක් මණ්ඩලයක් ලෙස පැවතිනි.
- ලංකාවේ චෝළ බල ප්‍රදේශය මුම්මුදි ශෝලි මණ්ඩලම්' නමින් හැඳින්වින.
- යුද්ධමය පාලනයක් ගෙන ගිය බව පෙනේ.
- චෝළ අධිරාජයා විසින් පත් කරන ලද සේනාධිපතියකු විසින් පාලනය ගෙන යෑම.
- රජයේ ඉහළ තනතුරුවලට චෝළයින්ව පත් කරන ලදී.
- ඉඩම් බදු අය කිරීම තුළින් රාජ්‍ය ආදායම තර කිරීම.
- අය බදු, කප්පම් හා පුද පඬුරු වාර්ෂිකව චෝළ දේශයට යැවිණි.

## 7.4 පොළොන්නරු රාජධානිය

කාලච්ඡේද 15

### හැඳින්වීම

අනුරාධපුර රාජධානිය බිඳ වැටීමෙන් පසු චෝළ ආධිපත්‍යයට නතු වූ ශ්‍රී ලංකා රාජ්‍යය එකොළොස් වැනි සියවස අවසාන භාගයේ දී නැවතත් විදේශාධිපත්‍යයෙන් මිදී පොළොන්නරුව අගනුවර කොට ගෙන බලවත්වීම දක්නට ලැබිණි. පොළොන්නරු අවධිය ලංකා ඉතිහාසයේ වැදගත් යුගයක් ලෙස සනිටුහන් කිරීමට මාහැඟි මෙහෙයක් ඉටු කරන ලද්දේ පළමුවැනි විජයබාහු මහා පරාක්‍රමබාහු, නිශ්ශංකමල්ල වැනි බල පරාක්‍රමයෙන් යුත් වීරෝධාර රජුන් විසිනි. මේ යුගයේ කාන්තා නායකත්වය දුන් රැජිණියන් අතර ලීලාවතී, හා කල්‍යාණවතී යන රැජිණියන් ද මිත්තා හා සුගලා යන රජ මෙහෙසියන් ද ප්‍රමුඛස්ථානයක් ගනී. සිංහල රාජධානිය පරසතුරු ආධිපත්‍යයෙන් මුදාගෙන ආර්ථික, සමාජ, සංස්කෘතික හා ආගමික වශයෙන් විශිෂ්ටත්වයට පත් කිරීමේ උදාර කර්තව්‍යයක් ඉටු කළ පොළොන්නරු රාජධානියේ රජකම්කල රජුන්ගේ, රැජිණියන්ගේ හා රජ මෙහෙසියන්ගේ දේශ හිතෛෂී කාර්ය සාඵල්‍යය විමසා බැලීමත් අගය කිරීමත්, මේ පාලකයින්ගේ චරිතාපදාන ඇසුරින් වත්මන් පරපුරට ලබා ගත හැකි ආදර්ශනයන් පිළිබඳව දැනුවත් කිරීමත් එමෙන් ම එම පාලකයන් පිළිබඳ අභිමානයක් සිසුන් තුළ ඇති කිරීමත් මේ ඒකකය අධ්‍යයනය කිරීමෙන් අපේක්ෂිතය.

පොළොන්නරු අවධියේ අවසාන භාගයේ රජකම් කළ දුර්වල පාලකයන්ගේ අසංවිධිත පාලන ක්‍රම හා ක්‍රියා කලාපයන් නිසා සමෘද්ධිමත් පොළොන්නරු රාජධානිය දේශපාලන ආර්ථික සමාජ සංස්කෘතික හා ආගමික අංශවලින් ක්‍රමයෙන් පරිහානියට පත් වූ අතර මේ තත්ත්වයෙන් උපරිම ප්‍රයෝජන ගත් කාලිංග වාංශික මාඝ නම් ආක්‍රමණිකයා විසින් මෙහෙයවන ලද හමුදාවක් මගින් පොළොන්නරු රාජධානියේ බිඳ වැටීම සනිටුහන් විය.

මේ ඒකකය අධ්‍යයනයෙන් අපේක්ෂිත තවත් අරමුණක් වනුයේ පොළොන්නරු රාජධානියේ පරිහානියට මුල් වූ කරුණු සොයා බැලීමයි. එහි දී 'මාඝ' නම් වූ විදේශීය ආක්‍රමණිකයා පොළොන්නරු රාජධානියෙහි පැවති සමෘද්ධිමත් බව විනාශ කිරීමටත් රජරට ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ බිඳ වැටීමට බලපෑ ආකාරයත් පිළිබඳ අවබෝධයක් ලබා දීම ද අපේක්ෂා කෙරේ.

නිපුණතා :

- ශ්‍රී ලංකාවේ විවිධ කාලවකවානුවල සිදු වූ දේශපාලන සංසිද්ධීන් විමර්ශනය කරමින් ඉන් ලද ආභාෂයන් වර්තමානය හා අනාගතය සාර්ථක කර ගැනීමට ඵලදායි ව භාවිත කරයි.
- ශ්‍රී ලංකාවේ විවිධ කාලවකවානු තුළ ඇති වු සමාජ, ආර්ථික හා සංස්කෘතික ප්‍රවනතාවයන් පිළිබඳ විමසා බලා ජාතික උරුමයන් හා ජාතික අනන්‍යතාවයන් රැක ගැනීමට පෙළඹෙයි.
- ශ්‍රී ලංකාවට එල්ල වු විදේශිය ආක්‍රමණවල පසුබිම් හා එහි බලපෑම පිළිබඳ විමසා බලා එවැනි ආක්‍රමණකාරී තත්ත්වයන්ට මුහුණදීම සඳහා ශක්තිමත් වෙයි.

නිපුණතා මට්ටම : 
- පළමුවැනි විජයබාහු හා මහාපරාක්‍රමබාහු යන රජවරුන්ගේ කාර්ය සාඵල්‍යය විග්‍රහ කරයි.
- පොළොන්නරු යුගයේ අවසාන ශ්‍රේෂ්ඨ පාලකයා වශයෙන් නිශ්ශංකමල්ල රජතුමාගේ කාර්ය සාඵල්‍යය විග්‍රහ කරයි.
- පොළොන්නරු රාජධානියට නායකත්වය දුන් කාන්තාවන්ගේ දේශපාලන කටයුතු පිළිබඳ ව තොරතුරු විමර්ශණය කරයි.
- රජරට ශිෂ්ටාචාරයේ පරිහානියට මාඝගේ ආක්‍රමණය බලපෑ අයුරු විමර්ශනය කරයි

විෂය අන්තර්ගතය :

## 7.4 පොළොන්නරු රාජධානිය

### 7.4.1 ඃ පොළොන්නරු යුගයේ පාලකයින් සහ ඔවුන්ගේ කාර්ය සංසිද්ධි

- පොළොන්නරුව අගනුවර කර ගැනීම පිළිබඳ හැඳින්වීම.
  - අනුරාධපුර යුගයේ දී ද එය වැදගත් මධ්‍යස්ථානයක් ලෙස පැවතීම.
  - එම ප්‍රදේශයේ වැව් ඉදිකර තිබීම.
  - රජවරුන්ගේ මාළිගා තිබීම.
  - පිහිටීමේ වැදගත්කම
  - දකුණු ඉන්දියාවෙන් එල්ලවන ආක්‍රමණ වලට මුහුණ දීමේ දී අනුරාධපුරයට වඩා පොළොන්නරුව ආරක්ෂා සහිත වීම.
  - රුහුණ පාලනය කළ හැකි මධ්‍යස්ථානයක් ලෙස පිහිටා තිබීම.
  - මහවැලි ගඟ අසබඩ පිහිටා තිබීම නිසා වාරි කර්මාන්ත ඉදි කිරීමට සුදුසු වීම.

- පළමුවැනි විජයබාහු රජු ( ක්‍රි.ව. 1055 - 1110 )
  දේශපාලන කාර්ය භාරය
  - රුහුණේ මුලසාල ගමෙහි මොග්ගල්ලාන (මුගලන්) කුමාරයාගේ හා ලෝකිතා කුමරියගේ පුත් කුමරු වීම.
  - විජයබාහු රජු කිත්ති කුමරු ලෙස මුලින් හැඳින්වීම.
  - බුද්ධරාජ (බුදල්නා) නැමැත්තාගේ රැකවරණය යටතේ ඇති දැඩි වීම.
  - බුදල්නාගේ ආධාර ඇතිව සේනා සංවිධානය කළ ප්‍රදේශය ශ්‍රී පාදය පාමුල පිහිටි හුණුවල (චුණ්ණසාල ) නම් ගම් ප්‍රදේශය බව.
  - මෙකල රුහුණේ කතරගම පාලනය කළ ලෝක හෙවත් ලොකේශ්වර නැමැත්තාට විරුද්ධව යුද්ධ කිරීමට බුද්ධරාජ හා දේවමල්ල යන සෙන්පතීන්ගෙන් උදව් ලබා ගැනීම.
  - ලෝකේශ්වර පරාජය කර ''මහානාග කුල'' තම යුද්ධ මධ්‍යස්ථානය කර ගැනීම.
  - පසුව කතරගම බලය පිහිටුවා ගත් ලෝකේශ්වරගේ සොහොයුරු කේශධාතු කාශ්‍යප පරාජය කර රෝහණයේ බලය තහවුරු කර ගැනීම.

- ක්‍රි.ව. 1055 දී කිත්ති කුමරු විජයබාහු නමින් රජ වීම
- ඉන් පසු රජරට චෝළ ආධිපත්‍යයෙන් මුදා ගැනීමට සටන් මෙහෙයවීම
- සටන් අවස්ථා තුනකදීම පැරදී හතරවන අවස්ථාවේ ජයග්‍රහණය කළ බව

| | | |
|---|---|---|
| පළමු සටන | - | චෝළයින් රුහුණ ආක්‍රමණය කිරීම සහ ඒ අවස්ථාවේ කතරගම සිටි විජයබාහු රජු මලය දේශයට පසු බැසීම. |
| දෙවන සටන | - | මහාතිත්ථයෙන් ගොඩබට චෝළ හමුදාවට විජයබාහු රජුගේ සෙන්පතීන් දෙදෙනකු වූ රවිදේව හා චල යන දෙදෙනා චෝළයන්ට එක්වීම නිසා දුර්වල වූ රජු පලුටිඨගිරි (වත්මන් පළටුපාන) ස්ථානයේ සැඟවී සිටීම. |
| තුන්වන සටන | - | වීර රාජේන්ද්‍ර නම් චෝළ රජුගේ හමුදාවට මුහුණ දීමට අපොහොසත් ව කෑගල්ලේ වාකිරිගල (වාතගිරි) නම් ස්ථානයේ සැඟවී සිටීම. |
| හතරවන සටන | - | රජරටට තුන් පැත්තකින් පහර දී චෝළ හමුදාව දුර්වල කොට පොළොන්නරුව අල්ලා ගැනීම ( ක්‍රි.ව. 1070) |



සිතියම 7.4.1 I විජයබාහු රජු සොළීන්ට විරුද්ධව හමුදා මෙහෙය වූ මාර්ග

- ආර්ථික කටයුතු

  චෝළ විරෝධී සටන් ව්‍යාපාර නිසා පළමුවැනි විජයබාහු රජුට අලුතින් වාරිකර්මාන්ත කිරීමට අවස්ථාවක් උදා නොවූ හෙයින් පැවති වාරිකර්මාන්ත පිළිසකර කිරීමට වෙහෙසීම.

  උදා : - ඇලහැර ඇළේ කැඩීබිඳී ගිය තැන් පිළිසකර කරවීම.
  - ඌවේ ගිණිකොණ කෙළවර පිහිටි බුදුගුණ වැව අලුතින් ඉදි කිරීම.
  - මහකන්දරාව, ඉනාමලුව, නාච්චදූව, මහගල්කඩවල යන වැව් පිළිසකර කිරීම.

- ආගමික හා සංස්කෘතික කටයුතු
  - බුරුමයේ අනුරුද්ධ රජුගේ උදව් ඇතිව උපසම්පදා කර්මයක් කිරීම
  - රුහුණේ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම
  - තිස්සමහාරාමය, සඳගිරි විහාරය දෙව්නුවර උරුවෙල විහාරය
  - මහියංගනය චෛත්‍යය නැවත ඉදි කරවීම
  - ශ්‍රී පාදයට පුද සත්කාර කොට ගිලීමලේ ගම එහි නඩත්තුවට පූජා කිරීම
  - පොළොන්නරුවේ තුන් මහල් දළදා මන්දිරයක් කරවා දළදාව එහි තැන්පත් කිරීම
  - භික්ෂූන්ට දන් දීම - ඇලහැර ජනපදයෙන් ලැබුන ආදායම පූජා කිරීම
  - අනුරපුර වෙහෙර විහාර පිළිසකර කිරීම
    උදා : මහා විහාරය, අභයගිරිය, ජේතවනාරාමය, ශ්‍රී මහා බෝධියේ බෝධිඝරය

පළමුවන පරාක්‍රමබාහු රජතුමා

- දේශපාලන කාර්ය භාරය
  - දක්ඛිණ දේශයේ කෑගලු දිස්ත්‍රික්කයේ දැදිගම ඔහුගේ උපන් ස්ථානය වීම
  - දක්ඛිණ දේශයේ පාලකයාව සිටි යුවරජු මාණාභරණ හා රත්නාවලී බිසව මව්පිය දෙදෙනා වීම.
  - පියාගේ (මාණාභරනගේ ) මරණය නිසා පරාක්‍රමබාහු කුමරු රැකවරණය පතා රුහුණේ සිට කීර්ති ශ්‍රී මේඝ (කිත්සිරි මෙවන් ) නම් සුළු පියා වෙත යාම.
  - කීර්ති ශ්‍රී මේඝ පරාක්‍රමබාහු කුමාරයා ද කැටුව විත් දක්ඛිණ දේශයේ පාලකයා ලෙස යුවරජ පදවිය භාරදීම.
  - ශ්‍රී වල්ලභ නම් කුමාරයාට මුළු රෝහණ දේශයේ ම පාලනය භාර දීම.

- කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල් කොරළයේ හත්නාගොඩ රාජධානිය කරගෙන දක්ෂිණ දේශය පාලනය කළ කීර්ති ශ්‍රී මේඝ සමඟ වාසය කළ පරාක්‍රමබාහු කුමාරයා එහි දී භාෂාව සාහිත්‍යය, ආගම ධර්මය, රාජ්‍ය පාලනය, ක්‍රීඩා, කඩු ශිල්පය, ධනු ශිල්පය ඉගෙන ගැනීම.
- කිත්සිරිමෙවන්ගේ මරණයෙන් පසු පරාක්‍රමබාහු කුමරු දක්ඛිණ දේශයේ යුවරජු ලෙස බලය මෙහෙයවීම.
- දක්ඛිණ දේශය සංවර්ධනය කිරීම, දැදුරු ඔය ආශ්‍රිත වාරිමාර්ග ඉදි කිරීම.
- රජරට දෙවැනි ගජබාහු රජුට විරුද්ධව වරින් වර සටන් මෙහෙයවීමෙන් රජ රට බලය ලබා ගැනීමට ක්‍රියා කිරීම.
- රජරට දෙවැනි ගජබාහු රජු සමඟ (ක්‍රි.ව. 1132 - 1153 ) ඇතිකරගත් ගිවිසුමට අනුව (සංගමු විහාර ලිපිය ) පොළොන්නරුවේ බලය ලබා ගැනීම
- ක්‍රි.ව. 1153 දී පොළොන්නරුවේ රජවීම
- රුහුණේ පාලකයා වූ දෙවැනි මනාභරණ (පරාක්‍රමබාහු රජුගේ ඥාති සොහොයුරා) කුමාරයාගෙන් සහ ඔහුගේ මව සුගලා දේවියගෙන් අභියෝග එල්ල වීම.
- එම අභියෝග ජයගෙන මුළු රට එක්සේසත් කිරීම.

විදේශ සබඳතා


- විදේශ වෙළෙඳ කටයුතු වර්ධනය කර ගැනීම සඳහා කටයුතු කිරීම.
- බුරුමයෙන් ලංකාවේ වෙළෙඳාමට බාධා එල්ල වීම.
- ක්‍රි.ව. 1164 - 65 කාලයේ බුරුමය ආක්‍රමණය කිරීම හා ඊට බලපෑ හේතු පෙන්වා දීම
- බුරුමයට කරන ලද ආක්‍රමණය ජය ගත් නිසා නගරගිරි කිත්ති සෙන්පතියාට ඔහුට ගම්වර ප්‍රදානය කිරීමක් සිදු වූ බව කෑගල්ලේ දෙවනගල සෙල්ලිපියේ සඳහන් වීම.
- ක්‍රි.ව. 1169 දී පාණ්ඩ්‍ය දේශය හෙවත් දකුණු ඉන්දීය ආක්‍රමණ මෙහෙයවීම.

ආර්ථික කටයුතු

- දක්ඛිණ දේශයේ පාලකයාව සිටි කාලයේ කළ වාරි කටයුතු
  - දැදුරු ඔය තුන් පලකින් වේලි බැඳ ජලය ලබා ගෙන ගොවිතැන් කිරීම
    1. කොට්ටබද්ද වේල්ල- ගඟේ පහළම කොටස (දැනට හඳුනාගෙන නැත)
    2. සුකර නිජ්ජරවේල්ල - මාගල්ල වැවට ජලය ලබා ගැනීම
    3. දෝර දන්තික වේල්ල - වත්මන් දෙමෝදර - තලගල්ල වැවට ජලය ලබා ගැනීමට
  - පණ්ඩාවැව පිළිසකර කර බෑණ සමුද්‍රය ලෙස නම් කිරීම
  - කළුතර පස්දුන් කොරලයේ වගුරු බිම් සංවර්ධනය කිරීම. (ජලය බස්සවා කුඹුරු ගොවිතැන් කිරීම )
  - දක්ඛිණ දේශයේ වැව් 53ක් අලුත්වැඩියා කිරීම
  - අහසින් වැටෙන එක දිය බිඳක්වත් මිනිසාගේ ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලා යෑමට ඉඩ නොදිය යුතුය යන අදහසෙහි පිහිටා වාරිමාර්ග සංවර්ධනයට යොමු වීම.

- රජරට පාලකයා වූ පසු ඉදිකළ වාරි කර්මාන්ත
  - පරාක්‍රම සමුද්‍රය ඉදි කිරීම (තෝපා, දුඹුටු හා එරමුදු යන වැව් තුන ඒකාබද්ධ කර )
  - අඹන්ගඟේ අගමැඩිල්ල ඇළෙන් එයට ජලය ලබා ගැනීම
  - රජරට වැව් අමුණු ප්‍රතිසංස්කරණය කිරීම
  - රුහුණේ වැව් ඉදි කිරීම (වීරවිල, රිදියගම හා ඇතිමලේ යන වැව් )

- ආගමික හා සංස්කෘතික කටයුතු
  - බෙහෙවින් පිරිහී තිබු සංඝ සමාජය සමගි කරවීම සඳහා ශාසන සංශෝධනයක් කිරීම.
  - පොළොන්නරු කතිකාවත නමින් භික්ෂු විනය මාලාවක් සැකසීම.
  - පොළොන්නරුවේ ආගමික ගොඩනැගිලි ඉදි කිරීම.
    උදා : අලාහන පිරිවෙන, රූපවතී චෛත්‍යය, ලංකා තිලක පිළිම ගෙය, ගල් විහාරය (උත්තරාරාමය, කිරි වෙහෙර )
  - කාමර දහසකින් යුත් සුවිසල් රාජමාලිගාව ඉදි කිරීම.



ලංකා තිලක පිළිම ගෙය



රන්කොත් වෙහෙර



රජ මාලිගය

රූපය 7.4.1


- නිශ්ශංකමල්ල රජු ක්‍රි.ව. 1187 - 1196
  - දෙවැනි විජයබාහුගේ පසු පොළොන්නරුවේ බලයට පත්වීම.
  - කාලිංග වංශික රජකු නිසා මෙරට රාජ්‍ය උරුමය කාලිංග පෙළපතට මාරුවීම.
  - දිවයිනේ විවිධ ස්ථානවල සෙල්ලිපි පිහිටුවීමෙන් තම බලය ව්‍යාප්තව පැවති බව පෙන්වීමට උත්සාහ ගත් බව.
    ( රුහුණේ මාදුරුප්ප ලිපිය, පොළොන්නරුවේ ගල්පොත ශිලා ලිපිය, දඹුලු සෙල්ලිපිය )
  - දිවයිනේ එක්සේසත් කර පවත්ගෙන යාමට කටයුතු කළ රජෙකු වීම.

- ආර්ථික කටයුතු
  - නිශ්ශංක සමුද්‍රය නමින් වැවක් කරවූ බව සෙල්ලිපිවල සඳහන් වීම.

- ආගමික හා සංස්කෘතික කටයුතු
  - තුන් නිකාය එක්සත් කළ බව සෙල්ලිපිවල සඳහන් වීම.
  - දඹුලු විහාරයේ බුදු පිළිම හැත්තෑ තුනක් රන් අලේප කර ස්වර්ණ ගිරි ගුහා නමින් නම් කිරීම.
  - පොළොන්නරුවේ ගොඩනැගිලි ඉදි කිරීම.
    උදා : රන්කොත් වෙහෙර, නිශ්ශංක ලතා මණ්ඩපය, හැටදාගෙය, සත්මහල් ප්‍රාසාදය.
  - දිවයිනේ එක්සේසත් කර පවත්ගෙන යාමට කටයුතු කළ රජෙකි.



නිශ්ශංකලතා මණ්ඩපය



සත්මහල් ප්‍රසාදය

රූපය 7.4.2

- ලීලාවතී රැජින
    - පාණ්ඩ්‍ය වාංශික ජගතිපාලගේ දියණියයි.
    - පළමුවැනි පරාක්‍රමබාහුරජුගේ ද බිසව වූවා ය
    - පොළොන්නරුවේ සිහසුන තුන් වරක් දැරීම.

      පළමුවර - ක්‍රි.ව. 1197 - 1200

      දෙවනවර ක්‍රි.ව. 1209 - 1210

      තෙවන වර ක්‍රි.ව. 1211 - 1212
    - සසදාවත හා මුවදෙව්දාවත යන කෘතීන් ලිවීමට අනුග්‍රහය දැක්වීම
    - තම නමින් කාසි නිකුත් කිරීම
    - සෙල්ලිපි පිහිටුවීම (පුලියන්කුලම ලිපිය )

මේ හැර තවත් කාන්තාවන් කීප දෙනෙක් ම මෙකල දේශපාලන කටයුතුවලට සම්බන්ධ වී ඇත.

- මිත්තා කුමරිය
    - පළමුවැනි විජයබාහු රජුගේ නැගෙණියයි
    - පාණ්ඩ්‍ය කුමරකුට විවාහ කර දෙන ලදී
    - පළමුවැනි විජයබාහු රජුගෙන් පසු ඔහු පුත් වික්‍රමබාහු කුමරුට රාජ්‍ය උරුමය අහිමි කොට භික්ෂූන් වහන්සේලාගේ සහාය ලබා ගනිමින් තම පුතුන් වූ මාණාභරන, කිත්සිරිමෙවන්, ශ්‍රී වල්ලභ යන අය රාජත්වයට පත් කිරීම සඳහා සැළසුම් කිරීම
- සුගලා බිසව
    - රුහුණේ පාලකයා වූ ශ්‍රී වල්ලභ කුමරුගේ බිසවයි.
    - ශ්‍රී වල්ලභගේ මරණයෙන් පසු තම පුත් දෙවැනි මාණාභරනට රාජ්‍ය පාලන කටයුතු සහාය වීම.
    - දන්ත ධාතුව හා පාත්‍රා ධාතුව තමා භාරයේ තබා ගෙන තම පුතුට පොළොන්නරුවේ අගරජ තනතුර ලබාදීමට සටන් වැදීම.
    - පළමුවන පරාක්‍රමබාහු රජු විසින් රුහුණ ආක්‍රමණය කර සුගලා බිසව ජීවග්‍රහනයෙන් අල්ලා ගෙන ඇය සතුව තිබූ දන්ත ධාතුව හා පාත්‍රා ධාතුව ලබා ගෙන තම සිහසුනේ අයිතිය තහවුරු කර ගැනීමට පියවර ගැනීම.

- කල්‍යාණවතී රැජින
    - කාලිංග වංශික කුමරියකි
    - නිශ්ශංකමල්ල රජුගේ අග බිසොව වීම
    - අයශ්මන්ත සෙනෙවි විසින් ඇය සිහසුනේ තැබීම
    - අවුරුදු හයක් රාජ්‍ය විචාරණය කිරීම

### 7.4.2 මාඝ ආක්‍රමණය

- මාඝ ආක්‍රමණයේ ස්වභාවය
    - ක්‍රි.ව. 1215 දී කාලිංග මාඝගේ ආක්‍රමණය සිදුවීම
    - කේරළ කුලී හමුදාව 24000ක් කැටිව පැමිණි පොළොන්නරුවේ පාලකයා බලයෙන් පහකොට රාජ්‍යය අල්ලා ගැනීම.
    - මහා වංශයේ දැක්වෙන විස්තරයට අනුව මෙය විශාල ව්‍යසනයක් වීම.
    - මෙම ආක්‍රමණයෙන් පසු ශ්‍රී ලංකාවේ අගනුවර කලින් කලට තෙත් කලාපයේ විවිධ මධ්‍යස්ථාන කේන්ද්‍රකොට ගොඩ නැගීම

- මාඝ පාලනයේ ලක්ෂණ
    - සැළසුම් සහගත ආක්‍රමණයක් වීම
    - මෙරට ආර්ථික හා දේශපාලන රටාව පුළුල් වෙනස්කම්වලට භාජනය වීම
    - බෞද්ධ විරෝධී ක්‍රියා මාර්ග අනුගමනය කිරීම
        * බෞද්ධ සිද්ධස්ථාන විනාශ කිරීම
        * භික්ෂූන්ට ශාරීරික වද හිංසා කිරීම
        * බෞද්ධ පොත්පත් විනාශ කිරීම
    - ප්‍රභූ ජනයා පීඩාවට පත් කිරීම
        * ප්‍රභූන්ගේ ධන සම්පත් පැහැරගෙන ඔවුන් දිළින්දන් කිරීම
    - සාමාන්‍ය ජනයාට පීඩා කිරීම
        * ශාරීරික වද හිංසා
        * ළමයින් මරා දැමීම
        * පාරම්පරික කුල සිරිත් අවුල් කිරීම
    - යුද්ධමය ස්වරූපයකින් පාලනය ගෙන යාම.
    - රට ඇතුළත හා මුහුදුබඩ සන්නද්ධ බලකොටු ඉදිකොට පාලනය කිරීම
      උදා : පොළොන්නරුව, කොටසර, කවුඩුල්ල, පදවිය, කන්තලේ, මන්නාරම, ඌරාතොට

7.4.3 පොළොන්නරුව බිඳ වැටීම

- බිඳ වැටීමට බලපෑ හේතු
  - පාණ්ඩ්‍ය හා කාලිංග පෙළපත් අතර ඇති වූ තරංගය
  - දක්ෂ රජවරුන් බිහි නොවීම
  - සෙනෙවිවරුන් බලවත් වීම
  - කාලිංග මාඝ ආක්‍රමයෙන් සිදු වූ විනාශය
  - රජරට වාරි කර්මාන්ත බිඳ වැටීම
  - වසංගත ලෙඩ රෝග පැතිර යාම

## ක්‍රියාකාරකම 7.4.1

නිපුණතා මට්ටම : පලමුවැනි විජයබාහු හා මහා පරාක්‍රමබාහු යන රජවරුන්ගේ කාර්ය සාඵල්‍යය පිළිබඳ විග්‍රහ කරයි.

ක්‍රියාකාරකම : "පළමුවැනි විජයබාහු රජතුමා " පිළබඳ ව උගනිමු.

කාලය : මිනිත්තු 80

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 7.4.1.1 සඳහන් ඡේදය
- ඇමුණුම 7.4.1.2 කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 7.4.1.3 ලංකා සිතියම
- භාග ප්‍රමාණයේ කඩදාසි
- පෙළ පොත

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.4.1.1 :
- ඇමුණුම අංක 7.4.1.1 සඳහන් ඡේදය පන්තියට පෙනෙන අයුරු ඩිමයි කඩදාසියක ලියා සිසුන්ට එය කියවීමට අවස්ථාව සලසා දෙන්න.

පහත සඳහන් ප්‍රශ්න සිසුන් වෙත ඉදිරිපත් කරන්න

මෙම ඡේදයෙන් කියවෙන රජතුමා කවුද?
එම රජතුමාට රුහුණේ පාලන බලය ලබා ගැනීමට උදව් කළේ කවුද?
ලබාගත් පිළිතුරු ඇසුරින් පළමුවැනි විජයබාහු රජතුමා හඳුන්වා දෙන්න.
පහත දැක්වෙන කරුණු ඉස්මතු වන අයුරින් කෙටි සාකච්ඡාවක යෙදෙන්න.

- අනුරාධපුර රාජධානිය 1017 දී චෝළ ආක්‍රමණයකට ලක් වූ බව.
- රාජධානිය පොළොන්නරුවට ගෙන ගොස් චෝළයන් රජරට පාලනය කළ බව
- බුදල්නාගේ ආධාර ඇති ව පළමුවැනි විජයබාහු රජු රුහුණේ පාලකයා වී පසුව රජරට මුදා ගෙන රට එක්සේසත් කළ බව

මිනිත්තු 10යි

පියවර 7.4.1.2 : • පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.

- එක් කණ්ඩායමට ඇමුණුම් අංක 7.4.1.2 හි කාර්ය පත්‍රිකා එක බැගින් බෙදා දෙන්න.
- ක්‍රියාකාකරම නිම කිරීම සඳහා සිසුනට සහාය වන්න

මිනිත්තු 30යි

පියවර 7.4.1.3 : • කණ්ඩායම්වල ක්‍රියාකාරකම් පන්තිය වෙත ඉදිරිපත් කිරීමට සිසුනට අවස්ථාව ලබා දෙන්න

- එක් කණ්ඩායමක් ඉදිරිපත් කරන තොරතුරු පිළිබඳ අදහස් දැක්වීමට සෙසු කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.
- ඉදිරිපත් කළ තොරතුරු පහත සඳහන් කරුණු ද ඉස්මතුවන අයුරින් සමාලෝචනය කරන්න

- කීර්ති කුමරු බුදල්නාගේ සහාය ඇති ව රුහුණේ පාලන බලය ලබා ගත් බව
- ක්‍රමවත් යුධ සැලැස්මක් යටතේ සටන් කර රජරට සොලී පාලනයෙන් මුදාගත් බව
- රට එක් සේසත් කිරීම එතුමාගෙන් සිදු වූ වැදගත් ම දේශපාලන සේවාව බව
- බුදු සසුනේ දියුණුවට විශාල මෙහෙයක් පළමුවැන විජයබාහු රජතුමාගෙන් ඉටු වූ බව
- විනාශ වී ගිය වාරි මාර්ග ප්‍රතිසංස්කරණය කර රටේ ආර්ථික දියුණුවට කටයුතු කළ බව

මිනිත්තු 40යි

## තක්සේරුව හා ඇගයීම

- විදේශ අධිපත්‍යයෙන් රජරට මුදා ගැනීම සඳහා පළමුවැනි විජයබාහු රජුගෙන් සිදු වූ සේවය අගය කරමින් ඒ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- පළමුවැනි විජයබාහු රජුගේ හමුදා රජරට දක්වා ගමන් ගත් මාර්ගය වැදගත් ස්ථාන සහිතව සිතියමක දක්වයි.
- පළමුවැනි විජයබාහු රජුගේ දේශපාලන ආගමික හා ආර්ථික සේවා විස්තර කරයි.
- කණ්ඩායම් හැඟීමෙන් යුතුව ක්‍රියාකාරකම්වල නිරත වෙයි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් මගින් පන්තියේ සිසුන් දැනුවත් කරයි.

ඇමුණුම 7.4.1.1

" මම රුහුණු දේශයේ මූලසාල ගමේ මුගලන් කුමාරයාගේ හා ලෝකිතා කුමරියගේ පුත්‍රයා වෙමි. රුහුණේ අධිකරණ නායකයෙකු වූ "බුද්දල්නා" ගේ රැකවරණය යටතේ කුඩා කළ සිට හැදී වැඩී ඔහුගේ ආධාරයෙන් රුහුණෙන් සේනා සංවිධානය කොට සටන් මෙහෙයවා සොළින්ගෙන් රජරට මුදාගෙන පොළොන්නරුව අගනුවර කරගෙන රජවීමි."

ඇමුණුම අංක 7.4.1.2

## කාර්ය පත්‍රිකාව 01

පහත සඳහන් අනු මාතෘකා යටතේ පළමුවන විජයබාහු රජතුමාගේ දේශපාලන සේවා පිළිබඳ කෙටි වාර්තාවක් සැකසීම හා එය පන්තියට ඉදිරිපත් කිරීම ඔබ කණ්ඩායමට පැවරෙන කාර්යයයි.

- පළමුවැනි විජයබාහු රජුගේ ළමා කාලය
- රුහුණේ පාලකයා වීම
- දිවයින එක්සේසත් කිරීම

## කාර්ය පත්‍රිකාව 02

- පළමුවන විජයබාහු රජතුමාගේ ආගමික සේවා විස්තර කරමින් කෙටි වාර්තාවක් සකස් කරන්න.
- පළමුවන විජයාබාහු රජුගේ හමුදා රජරට ජය ගැනීම සඳහා ගමන් ගත් ගමන් මාර්ගය ඇමුණුම 7.4.1.3 ලංකා සිතියමෙහි ඇඳ දක්වන්න.
- පළමුවන විජයබාහු රජතුමාගේ කෘෂි කාර්මික සේවා දැක්වෙන කෙටි වාර්තාවක් සකස් කරන්න.

ඇමුණුම අංක 7.4.1.3



ලංකා සිතියම

## ක්‍රියාකාරකම 7.4.2

නිපුණතා මට්ටම : • පළමුවැනි විජයබාහු හා මහා පරාක්‍රමබාහු යන රජවරුන්ගේ කාර්ය සාඵල්‍යය විග්‍රහ කරයි.

ක්‍රියාකාරකම : " පළමුවැනි පරාක්‍රමබාහු රජතුමාගේ සේවය අගය කරමු"

කාලය : මිනිත්තු 80

ගුණාත්මක යෙදවුම් : • ඇමුණුම අංක 7.4.2.1 - පාරාක්‍රමභාහු රජතුමාගේ පිළිරුව යැයි සැලකෙන රූපය
• ඇමුණුම් අංක 7.4.2.2 - කාර්ය පත්‍රකාව
• පෙළ පොත

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.4.2.1 : • ඇමුණුම් අංක 7.4.2.1 හි සඳහන් පරාක්‍රමබාහු රජතුමාගේ යැයි පිළිරුව දැක්වෙන ඡායා රූපය පන්තියට ඉදිරිපත් කර ඒ පිළිබඳ පහත සඳහන් ප්‍රශ්න සිසුන් වෙත යොමු කරන්න.
- මෙම රූපය කවර රජෙකුගේදැ යි සැක කරන්නේ ද?
- එම රජතුමා රාජ්‍ය කළ රාජධානියේ නම කුමක්ද?

මෙම ප්‍රශ්නවලට ලැබෙන පිළිතුරු විමසමින් පළමුවන පරාක්‍රමබාහු රජතුමා හඳුන්වා දී පහත සඳහන් කරුණු ඉස්මතු වන පරිදි කෙටි සාකච්ඡාවක් කරන්න.

- මානාභරණ කුමරු හා රත්නාවලී බිසව පරාක්‍රමබාහු කුමරුගේ දෙමාපියන් බව
- සුළු පියා වූ කීර්ති ශ්‍රී මේඝ ගේ ඇවෑමෙන් පසු පරාක්‍රමබාහු කුමරු දක්ඛිණ දේශයේ පාලකයා වූ බව
- පසුව දෙවැනි ගජබාහු රජු සමග ඇති කර ගත් ගිවිසුමක් අනුව ගජබාහු රජු ඇවෑමෙන් රජරට පාලන බලය ද ලබා ගත් බව

මිනිත්තු 10යි

පියවර 7.4.2.2 : • පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
• එක් එක් කණ්ඩායම ඇමුණුම් අංක 7.4.2.2 කාර්ය පත්‍රිකාව බැගින් බෙදා දෙන්න.
• ක්‍රියාකාරකම නිම කිරීමට සිසුන්ට සහාය වන්න.

මිනිත්තු 30 යි

පියවර 7.4.2.3 :

- සකස් කරන ලද වාර්තා පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එක් එක් කණ්ඩායම ඉදිරිපත් කරන තොරතුරු පිළිබඳ අදහස් දැක්වීමට සෙසු කණ්ඩායම්වලට අවස්ථාව සලසා දෙන්න.
- පහත සඳහන් කරුණු ද ඉස්මතු වන පරිදි සමාලෝචනයක යෙදෙන්න.
- ඉදිරිපත් කරන වැදගත් කරුණු අවශ්‍ය අවස්ථා වල සටහන් කර ගැනීමට අවස්ථාව දෙන්න.

- කීර්ති ශ්‍රී මේඝගේ ඇවෑමෙන් පරාක්‍රමබාහු කුමරු දක්ඛිණ දේශයේ පාලකයා වූ බව.
- දක්ඛිණ දේශයේ පාලකයා වීමෙන් පසු දැදුරු ඔය ආශ්‍රිතව සංවර්ධන ව්‍යාපාර ඇරඹූ බව.
- පඬා වැව විශාල කර විශාල ජලාශයක් තැන වූ බව
- කළුතර දිස්ත්‍රික්කයේ පස්දුන් කොරලයේ වගුරු බිම් සංවර්ධනය කළ බව.
- පඬුවස් නුවර අගනුවර ලෙස තෝරා ගත් බව.
- දෙවැනි ගජබාහුගේ ඇවෑමෙන් රජරට පාලනය ලබා ගත් බව.
- සුගලා දේවිය පරාජය කර රුහුණ යටත් කර ලංකාව එක් සේසත් කළ බව.
- " අහසින් වැටෙන එක් දිය බිඳක් හෝ මිනිසාගේ ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලා යාමට ඉඩ නොතබමි" යන මෙහෙවර ප්‍රකාශයෙහි පිහිටා කෘෂි කාර්මික සංවර්ධනය සඳහා කටයුතු කළ බව.
- ශාසන සංශෝධනයක් කිරීමට ක්‍රියාකළ බව.
- පොළොන්නරු කතිකාවත නමින් භික්ෂු විනය නීති මාලාවක් සැකසූ බව.
- පොළොන්නරුවේ ආගමික ගොඩනැගිලි ඉදි කළ බව.
- රාමඤ්ඤ දේශය හා පාණ්ඩ්‍ය දේශය ආක්‍රමණය කළ බව.

මිනිත්තු 40යි

## තක්සේරුව හා ඇගයීම

- රට සංවර්ධනය කිරීම සඳහා පළමුවැනි පරාක්‍රමබාහු රජතුමා අනුගමනය කළ ක්‍රියාමාර්ග අගය කරමින් තොරතුරු ඉදිරිපත් කරයි.
- පළමුවැනි පරාක්‍රමබාහු රජතුමා ප්‍රතිසංස්කරණය කළ හා ඉදි කළ ඇළ මාර්ග පිළබඳ ලේඛනයක් සකස් කරයි.
- පළමුවැනි පරාක්‍රමබාහු රජතුමාගේ ආර්ථික දේශපාලන හා ආගමික සේවා විස්තර කරයි.
- කණ්ඩායම සමඟ සහයෝගයෙන් කටයුතු කරයි.
- නායකත්ව ගුණාංග ප්‍රදර්ශනය කරයි.

ඇමුණුම අංක 7.4.2.1



ඇමුණුම අංක 7.4.2.2

## කාර්ය පත්‍රිකාව 01

- පළමුවන පරාක්‍රමබාහු රජතුමා පිළිබඳ පහත සඳහන් මාතෘකා යටතේ කරුණු රැස් කරන්න.
  - * දෙවැනි ගජබාහු රජුට විරුද්ධව සටන් මෙහෙය වූ ආකාරය
  - * ගිවිසුම අනුව රජරට බලය හිමි වූ අයුරු
  - * සුගලා බිසව පරාජය කිරීම
  - * රට එක්සේසත් කිරීම

  මෙම කරුණු වාර්තා කරන්න.
- ඔබ කණ්ඩායම සැකසූ වාර්තාව පන්තියට ඉදිරිපත් කරන්න.

## කාර්ය පත්‍රිකාව 02

- "අහසින් වැටෙන එක දිය බිඳක්වත් මිනිසාගේ ප්‍රයෝජනයට නොගෙන මුහුදට යෑමට ඉඩ නොදිය යුතුය" යන මෙහෙවර ප්‍රකාශයෙහි පිහිටා ලංකාවේ වාර්මාර්ග දියුණුවට රජරට පාලකයා වීමට පෙර හා පසු සිදුකළ සේවා පිළිබඳ විස්තර වාර්තාවක් සකස් කරන්න.
- එය පන්තියට ඉදිරිපත් කරන්න

## කාර්ය පත්‍රිකාව 03

- මහා පරාක්‍රමබාහු රජතුමාගේ ආගමික හා සංස්කෘතික සේවා පිළිබඳ කෙටි විස්තර වාර්තාවක් සකස් කරන්න.
- එය පන්තියට ඉදිරිපත් කරන්න.

## කාර්ය පත්‍රිකාව 04

- මහා පරාක්‍රමබාහු රජතුමාගේ විදේශ සබඳතා පිළිබඳ කෙටි වාර්තාවක් සකස් කරන්න.
- එය පන්තියට ඉදිරිපත් කරන්න

# ක්‍රියාකාරකම 7.4.3

නිපුණතා මට්ටම : • පොළොන්නරු රාජධානියට නායකත්වය දුන් කාන්තාවන්ගේ දේශපාලන කටයුතු පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි.

ක්‍රියාකාරකම : " පොළොන්නරු යුගයේ කාන්තා නායකත්වය පිළිබඳ ව හදාරමු."

කාලය : මිනිත්තු 80

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම අංක 7.4.3.1 - කාර්ය පත්‍රිකාව
- පෙළ පොත

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.4.3.1 :
- මෑත කාලයේ ශ්‍රී ලංකා දේශපාලන ක්ෂේත්‍රයේ නායක්වයට පත් කාන්තාවන් ගැන ඔබ අසා තිබේ ද?
- එවන් කාන්තාවන් නම් කරන්න.

  යන ප්‍රශ්න සිසුනට යොමු කර ඒවාට පිළිතුරු ලබාගෙන, පොළොන්නරු රාජධානි සමයේ දී ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලනයට සහභාගී වූ කාන්තාවන් පිළිබඳ පහත සඳහන් කරුණු ද ඉස්මතු වන සේ කෙටි සාකච්ඡාවක් කරන්න.

> - පළමුවැනි විජයබාහු රජුගෙන් පසු පොළොන්නරු රාජධානියේ යුව රජ තනතුර තම පුතුට ලබා දීමට මිත්තා කුමරිය විසින් කටයුතු කළ බව
> - පළමුවැනි පරාක්‍රමබාහු රජතුමා රජරට බලය ලබා ගන්නා විට සුගලා බිසව රුහුණ පාලනය කළ බව
> - ලීලාවතී සහ කල්‍යාණවතී යන රැජිනියන් පොළොන්නරු රාජධානිය පාලනය කළ බව

මිනිත්තු 10යි

පියවර 7.4.3.2 :
- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් හතරකට බෙදන්න.
- එක් කණ්ඩායමට එක් කාර්ය පත්‍රිකාව බැගින් බෙදා දෙන්න.
- තොරතුරු වාර්තා කිරීම සඳහා ප්‍රමාණවත් කාලය ලබා දෙන්න

මිනිත්තු 30යි

පියවර 7.4.3.3 : 

- එක් එක් කණ්ඩායමට තොරතුරු වාර්තා ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලය ලබා දෙන්න.
- එක් කණ්ඩායමක් ඉදිරිපත් කරන තොරතුරු වාර්තා පිළිබඳ අදහස් දැක්වීමට අනෙක් කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.
- ඉදිරිපත් කළ තොරතුරු පිළබඳ පහත සඳහන් අදහස් ද ඉස්මතුවන අයුරින් සාකච්ඡාව මෙහෙයවන්න.

- පළමුවැනි විජයබාහු රජුගෙන් පසු ඔහුගේ සහෝදරයා වූ ජයබාහු පොළොන්නරුවේ රජ වූ බව.
- යුවරජ තනතුර පළමුවැනි විජයබාහුගේ පුත් වික්‍රමබාහුට හිමි විය යුතු වුවද, මිත්තා කුමරිය එය තම පුත් මානාභරණට ලබා දීමට ක්‍රියාකළ බව.
- වික්‍රමබාහු මෙම සිද්ධියෙන් පසු රජරට බලය ලබා ගත් බව.
- මිත්තා කුමරිය තම පුතුන් සමග රුහුණට පැමිණ එම ප්‍රදේශවල පාලනය තම පුතුන්ට ලබා දීමට කටයුතු කළ බව
- සුගලා කුමරිය ශ්‍රී වල්ලභ ගේ බිසවූ වූ බව.
- පළමුවැනි පරාක්‍රමබාහු රජු රජරට පාලන බලය ලබා ගන්නා අවස්ථාව වන විට සුගලා බිසව රුහුණ පාලනය කළ බව
- රුහුණු ප්‍රදේශය යටත් කිරීමටත්, සුගලා දේවිය සතුව පැවැති දන්ත ධාතූන් වහන්සේ ලබා ගැනීමටත් පළමුවැනි පරාක්‍රමබාහු රජු සුගලා දේවිය සමඟ සටන් කළ බව.
- ලීලාවතී දේවිය පරාක්‍රමබාහු රජුගේ මෙහෙසිය වූ බව.
- පරාක්‍රමබාහු රජුගේ ඇවෑමෙන් ඇය පොළොන්නරුවේ රාජ්‍ය කළ බව.
- කලණ්‍යවතී බිසව නිශ්ශංකමල්ල රජුගේ මෙහෙසය වූ බව.
- ඇය පොළොන්නරුවේ රජකමට පත් වූ බව.

මිනිත්තු 40

## තක්සේරුව හා ඇගයීම

- පොලොන්නරුව රාජධානි සමයේ රාජ්‍ය පාලනයට සම්බන්ධ වු කාන්තාවන් පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි.
- පොළොන්නරු යුගයේ කාන්තාව ට සමාජයේ ඉහළ පිළිගැනීමක් තිබූ බවට සාක්ෂි ඉදිරිපත් කරයි.
- තොරතුරු සංවිධානාත්මකව පන්තියට ඉදිරිපත් කරයි.
- උත්සාහයෙන් යුතුව තොරතුරු රැස් කරයි.
- කණ්ඩායමට පැවරුණු වගකීම ඉටු කිරීමට දායක වෙයි.

ඇමුණුම 7.4.3.1

## කාර්ය පත්‍රිකාව 01

මිත්තා කුමරිය පිළිබඳ පහත සඳහන් මාතෘකා යටතේ තොරතුරු රැස් කරන්න.

- පළමුවැනි විජයබාහු රජුට ඇති සම්බන්ධය
- පාලන කටයුතුවලට සම්බන්ධ වූ ආකාරය
- මනාභරණ කුමරුට පාලන බලතල ලබා දීමට උත්සාහ ගත් අයුරු
- රුහුණු ප්‍රදේශයට පැමිණීම හා එම ප්‍රදේශවල පාලන බලය ඇයගේ පුතුන් විසින් බෙදා ගත් අයුරු

පන්තියට ඉදිරිපත් කිරීමට සුදුසු පරිදි තොරතුරු වාර්තාවක් ලෙස සකස් කරන්න.

## කාර්ය පත්‍රිකාව 02

සුගලා දේවිය පිළිබඳ පහත සඳහන් මාතෘකා යටතේ තොරතුරු රැස් කරන්න.

- රජ පවුලට ඇති සම්බන්ධය
- රුහුණේ බලය ලබා ගත් ආකාරය
- පරාක්‍රමබාහු රජු ඇය සමඟ සටන් කිරීමට හේතු

ඔබ සකස් කළ තොරතුරු පන්තියට ඉදිරිපත් කිරීමට සුදුසු පරිදි වාර්තාවක් ලෙස සකස් කරන්න.

## කාර්ය පත්‍රිකාව 03

ලීලාවති රැජින පිළිබඳ ව පහත සඳහන් මාතෘකා යටතේ තොරතුරු රැස් කරන්න.

- පොළොන්නරු රජ පවුලට ඇති සම්බන්ධතාවය.
- බලයට පත්වීමට පසුබිම් වූ හේතු
- ඇයගේ පාලන කාලය තුළ සිදු වූ වැදගත් සිදුවීම්
- ඔබ රැස් කළ තොරතුරු පන්තියට ඉදිරිපත් කිරීමට සුදුසු පරිදි වාර්තාවක් ලෙස සකස් කරන්න.

## කාර්ය පත්‍රිකාව 04

කල්‍යාණවතී රැජින පිළිබඳ ව පහත සඳහන් මාතෘකා යටතේ තොරතුරු රැස් කරන්න.

- රජ පවුලට ඇති සම්බන්ධයතාවය
- බලයට පත්වීමට පසුබිම් වූ හේතු
- ඇගේ පාලන කාලය තුළ සිදු වූ වැදගත් සිදුවීම්
- ඔබ රැස් කළ තොරතුරු පන්ති කාමරයට ඉදිරිපත් කිරීමට සුදුසු පරිදි වාර්තාවක් ලෙස සකස් කරන්න.

# 7.5 මධ්‍යකාලීන යුරෝපය

කාලච්ඡේද 06 යි

## හැඳින්වීම

යුරෝපා ඉතිහාසයේ මධ්‍යකාලීන අවධිය ලෙස සැලකෙන්නේ ක්‍රි.ව. 5 වන සිය වසේ සිට 15 වන සියවස දක්වා කාලයයි. 5 වන සියවසට පෙර අවධිය පැරණි යුගය ලෙස ද 15 වන සියවසෙන් පසු අවධිය නූතන යුගය ලෙස ද හැඳින්වේ.

රෝම අධිරාජ්‍යය තුළ ආරම්භ වූ ක්‍රිස්තු ධර්මය එම අධිරාජ්‍යය අවසාන කාලය වන විට බෙහෙවින් ජනප්‍රිය වී තිබිණ. ක්‍රිස්තු ධර්මය රෝම අධිරාජ්‍යයේ රාජ්‍ය ආගම බවට පත් වීමෙන් පසුව පාප් වහන්සේ ප්‍රධාන කොට ගත් ක්‍රිස්තු සභාව ගොඩ නැගින. එමගින් යුරෝපය පුරා කිතු දහම වේගයෙන් ව්‍යාප්ත විය. ඒ පිළිබඳ ඉගෙනීම නූතන අවධියේ ක්‍රිස්තු ධර්මයේ සහ ක්‍රිස්තු සංවිධාන වල ස්වභාවය අවබෝධ කොට ගැනීමට ප්‍රයෝජනවත් වේ.

මධ්‍යකාලීන යුරෝපයේ විවිධ ප්‍රදේශවල ක්‍රියාත්මක වූ දේශපාලන, සමාජ, ආර්ථික හා සංස්කෘතික ක්‍රම පොදුවේ වැඩවසම් ක්‍රමය ලෙස හැඳින් වේ. එය එකී ක්ෂේත්‍රවල නූතන යුගයේ ක්‍රියාත්මක වන ක්‍රමවලට වඩා බෙහෙවින් වෙනස් විය. එහෙයින් නූතන යුගය පිළිබඳ ඉගෙනීම අර්ථවත් කරවීම සඳහා මධ්‍යකාලීන යුරෝපයේ වැඩ වසම් ක්‍රමය පිළිබඳ දැනුවත් වීම ප්‍රයෝජනවත් වේ.

මධ්‍යකාලීන යුරෝපයේ සිදු වූ වැදගත් ඓතිහාසික සිද්ධි අතර කුරුස යුද්ධවලට ප්‍රධාන ස්ථානයක් හිමි වේ.

ක්‍රිස්තු භක්තිකයන් හා ඉස්ලාම් භක්තිකයින් අතර දෙවන සියවසේ සිට 15 වන සියවස දක්වා ඇති වූ ආගමික යුද්ධ මාලාව කුරුස යුද්ධ නමින් හැඳින්වේ. එහි උච්චතම අවස්ථාව 1453 දී ඇති වූ යුද්ධයයි. එහි ප්‍රතිඵල වශයෙන් එතෙක් ක්‍රිස්තු භක්තිකයින්ගේ ප්‍රධාන මධ්‍යස්ථානයක් වූ කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කීහු අත්පත් කර ගත්හ. පෙර අපර දෙදිග වෙළෙඳ සම්බන්ධතාවල මධ්‍යස්ථානය වූ එම නගරය යුරෝපයේ ක්‍රිස්තු භක්තිකයින්ට අහිමි වීම දීර්ඝකාලීන ප්‍රතිඵල රාශියක් ඇති කිරීමට හේතු විය.

වෙළෙඳ කටයුතු පුළුල් වීම. දේශගවේෂණවලට යොමු වීම සහ යුරෝපයේ පුනරුදය වැනි වැදගත් සිද්ධි රාශියකට පාදක වූ කුරුස යුද්ධ පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම නූතන ඉතිහාසය ඉගෙනීමට අවතීර්ණවීමේ දී අතිශයින් ප්‍රයෝජනවත් වේ.

නිපුණතා : • ලෝක ඉතිහාසය හැඩ ගැසීමට බලපෑ යුරෝපා බලවේග පිළිබඳ විමර්ශනය කරයි

නිපුණතා මට්ටම : • ක්‍රිස්තු ධර්මයේ ආරම්භය හා ව්‍යාප්තිය පිළිබඳ තොරතුරු විග්‍රහ කරයි.
• වැඩවසම් යුගයේ යුරෝපයේ පැවති දේශපාලන, ආර්ථික හා සමාජ ව්‍යුහය පිළිබඳ විග්‍රහ කරයි.
• කුරුස යුද්ධ ආරම්භයට හේතු සහ ප්‍රතිඵල විග්‍රහ කරයි.

## විෂය අන්තර්ගතය

## 7.5 මධ්‍යකාලීන යුරෝපය

### 7.5.1 ක්‍රිස්තු ධර්මයේ ව්‍යාප්තිය

- ක්‍රිස්තු ධර්මයේ ආරම්භය

ක්‍රිස්තු ධර්මයේ ආදී කර්තෘවරයා වූ ජේසු තුමා ජේරුසලම අසල බෙත්ලෙහෙම නම් ග්‍රාමයේ උපත ලැබීය. යුදෙව් ජාතිකයෙකු වූ ජුසේතුමා ඔහුගේ පියා වූ අතර කන්‍යා මරියා තමෝ ඔහුගේ මව වූවාය. එය මිනිස් වර්ගයා දුකෙන් මුදවා ගැනීම සඳහා ගැලවුම්කරුවකු පැමිණෙන තෙක් ජනතාව බලා සිටි අවධියක් විය. ක්‍රමයෙන් සංචාරක ධර්ම දේශකයකුබවට පත් වූ ජේසුතුමා විශ්වයේ මැවුම්කරුවා වූ සර්ව බලධාරී දෙවියන් වහන්සේ පිළිබඳ ඉගැන්වීම් ඉදිරිපත් කිරීමට පටන් ගත්තේ ය.

- සාධාරණය, ආදරය, කරුණාව, පිරි පවතින දෙවියන්ගේ රාජ්‍යය පිළිබඳ දේශනා කළ අතර අනුගාමිකයන් එතුමා වටා රොක් වීම.
- එතුමා ගත කළ චාම් ජීවිතය හේතුකොට දුප්පත් ජනතාව එතුමාට සමීපවීම
- යහපත් ක්‍රියා මගින් පාරිශුද්ධ චරිත ගොඩනගා ගත යුතු බව පැවසීම
- සහෝදරත්වය, ආදරය, අනුකම්පාව, දයාව, ධාර්මික ජීවිතය, යහපත් පැවැත්ම නිහතමානිකම, මානුෂිකත්වය ප්‍රගුණ කළ යුතු බව යනාදිය ජේසුතුමාගේ ප්‍රධාන ඉගැන්වීම් විය
- ක්‍රමයෙන් එතුමාගේ අනුගාමිකයින් දෙවියන් විසින් එවන ලද, ගැලවුම්කරු ලෙස අභිෂේකලත් යන අදහසින් ' ක්‍රිස්ටෝස් ' යන වචනයෙන් හැඳින්වීම.
- ක්‍රිස්තුන්වහන්සේගේ ධර්මයට එරෙහිව යුදෙව්වන් සතුරුකම් කිරීම.
- එතුමා රෝම අධිරාජ්‍යයට විරුද්ධව බලය ලබා ගැනීමට ක්‍රියා කරනබවට සැක කොට රෝම අධිරාජයා ජේසු තුමාට විරුද්ධව පියවර ගැනීම අනතුරුව සිරභාරයට ගැනීම
- රාජද්‍රෝහියකු බවට චෝදනා එල්ල කොට වරදකරු බවට තීන්දු කරනු ලැබූ ජේසුතුමා කුරුසියේ ඇණ ගැසීම.
- ඇපෝස්තුලුවරු යනුවෙන් හැඳින්වෙන ශ්‍රාවකයින් දොලොස්දෙනා තවදුරටත් එම ධර්මය ප්‍රචාරය කිරීමේ කටයුතුවල නිරත වීම.

- ක්‍රි.ව. 313 දී නිකුත් කළ "මිලාග් " අඥාව මගින් කොන්ස්ටන්ටයින් අධිරාජයාගේ කාලයේ ක්‍රිස්තු ධර්මය රෝම අධිරාජ්‍යයේ නීත්‍යානුකූල ආගමක් බවට පත්වීම.
- පාප් තනතුර සහ ක්‍රිස්තු සභාව බිහිවීම
  - ධර්ම ප්‍රචාරය කළ අපොස්තලුවරුන් අතර පේදුරු තුමාට ප්‍රධාන ස්ථානයක් හිමිවීම හා එතුමා ප්‍රථම පාප් වහන්සේ බවට පත් වීම.
- පාප්වහන්සේගේ ප්‍රධානත්වයෙන් ක්‍රිස්තු සභාව පිහිටුවා ගැනීම
- පාප්වරුන් කතෝලික ආගමේ ජීවමාන නායකයින්බවට පත්වීම ක්‍රිස්තු සභාවේ බලය වර්ධනය වීම.
- රෝම අධිරාජ්‍යයා බිඳ වැටීමෙන් පසු බිහි වූ යුරෝපා රාජ්‍ය තුළ ක්‍රිස්තු සභාවේ මෙහෙයවීමෙන් ක්‍රිස්තු ධර්මය ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වීම

## 7.5.2 වැඩවසම් ක්‍රමය

වැඩවසම් ක්‍රමය හැඳින්වීම

ක්‍රි.ව. 5 වන සියවසේ සිට 15 වන සියවස දක්වා යුරෝපයේ සියලු ම රටවල පාහේ පැවති දේශපාලන, ආර්ථික සමාජ හා සංස්කෘතික ක්‍රමවල පොදු ලක්ෂණ රාශියක් පැවතුණි. මධ්‍යකාලින යුරෝපයේ සෑම රටක ම පැවති එම ක්‍රමය පොදුවේ වැඩවසම් ක්‍රමය යනුවෙන් හැඳින්වේ. වැඩවසම් ක්‍රමය යනු ඉඩම් භුක්තිය හා ඒ වෙනුවෙන් සේවය සැපයීම පදනම් කොටගත් දේහපාලන, ආර්ථික සමාජ මෙන් ම සංස්කෘතික සංවිධාන ක්‍රමයක් ලෙස විග්‍රහ කළ හැකිය.

- වැඩ වසම් ක්‍රමයේ ආරම්භය
  - ක්‍රි.ව. 5 වන සියවසේ දී පමණ යුරෝපයට එල්ල වූ ම්ලේච්ඡ ආක්‍රමණවලට මුහුණ දීමට තරම් රෝම අධිරාජ්‍යයේ පාලකයින් ශක්තිමත් නොවීම.
  - මේ අතර යුද්ධ සෙන්පතීන් වශයෙන් සිටි වංශාධිපතීන්ට සාමාන්‍ය ජනයාගේ ද හමුදාවේ ද සහයෝගය ලැබීම
  - මේ නිසා රජවරුන්ගේ බලතල ඉක්මවා වංශාධිපතීන්ගේ බලය වර්ධනය වීම හේතුකොට ගෙන වැඩ වසම් ක්‍රමය බිහිවීම.

- වැඩවසම් ක්‍රමයේ මූලික ලක්ෂණ
  - * දේශපාලන ලක්ෂණ
  - රජු නීත්‍යානුකූලව රටේ නායකයා විය. එහෙත් ඔහු ශක්තිමත් පාලකයකු නොවීම.
  - පාලනය විකේන්ද්‍රගත වීම
  - වංශාධිපති ප්‍රාදේශීය පාලකයෝ රජුට වඩා බලවත් වීම
  - විවිධ ප්‍රදේශවල විශේෂිත වූ නීති ක්‍රම පැවතීම
  - වංශාධිපතින් යටතේ හමුදා සංවිධානය වීම

- ආර්ථික ලක්ෂණ
    - කෘෂිකර්මය මත පදනම් වූ ස්වයංපෝෂිත ආර්ථික රටාව
    - ග්‍රාමීය ආර්ථික රටාවකි.
    - ප්‍රවේණි ක්‍රමය
    - රටේ තිබූ සියලු ඉඩම් රජු සතු බව පිළිගැනීම
    - සටහනේ දැක්වෙන පරිදි බෙදා දුන් ඉඩම් භුක්ති විඳීම හා බැඳුන සේවා ක්‍රමයක් පැවතීම
    - භාණ්ඩ හුවමාරු ක්‍රමය බහුලව පැවතීම
    - නගර සුලභ නොවීම
    - වෙළඳාම හා මුදල් භාවිතය පැවතුනේ සුළු වශයෙන් වීම

ඉඩම් බෙදී ගිය ආකාරය
↓
සියලුම ඉඩම් රජු සතු වීම
↓
- වංශාධිපතිවරුන්
- ප්‍රදේශීය පාලකයන්
- හමුදාපතිවරුන්

↓
සාමාන්‍ය ජනතාව

- සමාජයීය ලක්ෂණ
    - සමාජ තරාතිරම උත්පත්තිය මත තීරණය වීම
    - රජු, රදළ, පූජක සාමාන්‍ය ජනතාව ආදී වශයෙන් බෙදී තිබීම
    - වංශාධිපතිවරුන් සුඛෝපභෝගී ජීවිත ගත කළ අතර සාමාන්‍ය ජනතාව දුක්ඛිත ජීවිත ගත කිරීම
    - පුද්ගලයා වැදගත් කොට නොසැලකීම
    - විවිධ ශිල්පවල නිරත වූවන් ශ්‍රේණි වශයෙන් සංවිධානය වී සිටීම
    - ග්‍රාමීයත්වය
    - සාමූහික බව

- සංස්කෘතික ලක්ෂණ
    - එක්සත් ක්‍රිස්තු සභාවක් පැවතීම
    - පාප් වහන්සේ ප්‍රමුඛ ක්‍රිස්තු සභාව බලවත් වීම
    - අධ්‍යාපනික කටයුතු පූජකයින් ප්‍රමුඛ ක්‍රිස්තු සභාව මගින් මෙහෙයවීම
    - ලෞකික රසවින්දනය කෙරෙහි සැලකිලිමත් නොවීම
    - ආගමානුකූල විනය හා සදාචාරය අගය කිරීම

- වැඩවසම් ක්‍රමයේ පරිහානිය
    - 12, 13 වන සියවස් වනවිට විශ්ව විද්‍යාල බිහිවීම
    - කුරුස යුද්ධ
    - ප්‍රවේණි ක්‍රමය බිඳ වැටීම
    - නගර බිහිවීම
    - වෙළෙඳාමේ දියුණුව හා මුදල් භාවිතය බහුල වීම
    - ජාතික රාජ්‍ය බිහිවීම
    - 13 වන සියවසේ පමණ සිට 15 වන සියවස දක්වා වූ යුරෝපයේ සිදු වූ පුනරුදය

### 7.5.3 කුරුස යුද්ධ

හැඳින්වීම

යුරෝපයේ සිටි ක්‍රිස්තු භක්තියන් විසින් 11 වන සියවස අවසානයේ සිට 15 වන සියවස මැද භාගය දක්වා ඔවුන්ගේ ප්‍රධානතම ආගමික ශුද්ධ භූමිය වූ ජෙරුසලම මුස්ලිම් ආධිපත්‍යයෙන් මුදවා ගැනීම සඳහා ඔවුන්ට විරුද්ධව ගෙන යන ලද යුද්ධ මාලාව කුරුස යුද්ධ නමින් හැඳින්වේ. මෙම කුරුස යුද්ධ මාලාව 1096 පමණ ආරම්භ වූ අතර වරින් වර දෙපක්ෂයම ජය පරාජය ලබමින් පැවති අතර ක්‍රිස්තු භක්තික යුරෝපියයන්ගේ ප්‍රධාන අගනගරය වූ කොන්ස්තන්තිනෝපලය ක්‍රි.ව. 1453 දී මුස්ලිම්වරුන් සතු කර ගැනීමෙන් පසු අවසන් විය.

- කුරුස යුද්ධ වල බලපෑම
  - වැඩවසම් ක්‍රමය බිඳ වැටීම.
  - පෙර අපර දෙදිග වෙළෙඳාම පුළුල් වීම.
  - කුරුස යුද්ධවලට සහභාගී වීම නිසා පෙරදිග රටවල් සමග සම්බන්ධවීමට යුරෝපා ජාතීන්ට අවස්ථාව ලැබීම හා එමගින් අලුත් අදහස් යුරෝපයට පැමිණීම

    උදා : චීනයේ - කඩදාසි, වෙඩි බෙහෙත්, මාලිමා යන්ත්‍රය

    ඉන්දියාවේ විද්‍යාත්මක දැනුම

    අරාබි, ගණිත ක්‍රම

- කොන්ස්තන්තිනෝපලය තුර්කිය සතු වීම නිසා යුරෝපියන්ට පෙරදිගට යාමට තිබූ මාර්ග වැසී යාම නිසා යුරෝපියයන්ට අත්‍යවශ්‍ය වූ ආසියාතික භාණ්ඩ ලබා ගැනීමට අවහිර ඇති වීම.
- පෙරදිගට යාමට නව මුහුදු මාර්ග සෙවීමට යොමු වීම.
- පුනරුදයට මග පෑදීම
- කොන්ස්තන්තිනෝපලය තුර්කීන් සතුවීම නිසා එහි තිබූ පැරණි ග්‍රීක, රෝම, පොත් පත් රැගෙන උගතුන් යුරෝපයට පලා ගිය අතර යුරෝපා ජාතීන්ට එම පොත්පත් පරිශීලනය කිරීමට අවස්ථාව උදාවිය. එය යුරෝපයේ පුනරුදයට බලපෑ ප්‍රධාන සාධකයක් වීම.
- යුරෝපා සංස්කෘතිය හා ක්‍රිස්තු ධර්මය ලොව පුරා ව්‍යාප්ත වීම.

# ක්‍රියාකාරකම 7.5.1

නිපුණතා මට්ටම : • ක්‍රිස්තු ධර්මයේ ආරම්භය හා ව්‍යාප්තිය පිළිබඳ තොරතුරු විග්‍රහ කරයි.

ක්‍රියාකාරකම : "කිතු දහමේ උදාව"

කාලය : මිනිත්තු 40

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම අංක 7.5.1.1 - යේසුස් වහන්සේගේ පින්තූරයක්
- ඇමුණුම් අංක 7.5.1.2 - කාර්ය පත්‍රිකාව
- පෙළ පොත

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.5.1 :
- ඇමුණුම් අංක 7.5.1.1 හි දැක්වෙන යේසුස් වහන්සේගේ පින්තූරය ඉදිරිපත් කර පහත දැක්වෙන ප්‍රශ්න සිසුන්ගෙන් විමසන්න.
- මෙම පින්තූරයේ සිටින්නේ කවු ද?
- එතුමා අපට වැදගත්වන්නේ ඇයි ?
  ඒවාට පිළිතුරු ලබා ගනිමින් පහත දැක්වෙන කරුණු ඉස්මතු වන සේ සිසුන් සමඟ සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - පින්තූරයෙන් දැක්වෙන්නේ ක්‍රිස්තියානි ආගමේ නායකයා බව
> - ජුසේතුමා හා කන්‍යා මරියතුමිය යේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දෙමාපියන් වූ බව
> - ජේරුසලම අසල බෙත්ලෙහෙම නම් ග්‍රාමයේ එතුමා උපත ලද බව
> - එතුමා සදාචාරය හා මානුෂිකත්වය පිළිබඳ අදහස් දේශනා කළ බව
> - යුදෙව්වන් එතුමාට විරුද්ධව චෝදනා එල්ල කර කුරුසියේ ඇණ ගැසූ බව

මිනිත්තු 10යි

පියවර 7.5.1.2 :
- ඇමුණුම් අංක 7.5.1.2 හි කාර්ය පත්‍රිකාවේ දැක්වෙන කෙටි ප්‍රශ්න සියල්ල කළු ලෑල්ලෙහි සටහන් කරන්න.
- සිසුන් සියලු දෙනාටම එම ප්‍රශ්න තම තමන්ගේ අභ්‍යාස පොත්වල සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- අනතුරුව නැවත පෙළපොත කියවමින් එම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සලස්වන්න.
- කාර්ය පහසු කරවීමට සිසුන්ට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.

මිනිත්තු 20යි

පියවර 7.5.1.3 :

- අහඹු ලෙස හෝ පන්තියේ වැඩි පිරිසකගේ පිළිතුරු ඇගයීමට ලක් කරන්න.
- ඔවුන්ගේ ප්‍රබලතා හා දුබලතා සාකච්ඡා කරන්න.
- විශේෂිත කරුණු අගය කරන්න.
- පාඩම සමාලෝචනය කරන්න.
- සමාලෝචනයේ දී පහත දැක්වෙන කරුණු පිළිබඳ අවධානය යොමු කරන්න.


- ක්‍රිස්තුන්වහන්සේ උපත ලැබුවේ රෝමයේ ඔගස්ටස් සීසර් රජුගේ පාලන කාලයේ බව
- කොන්ස්ටන්ටයින් රෝමයේ ප්‍රථම ක්‍රිස්තියානි අධිරාජයා වූ බව
- ඇතැම් රෝම අධිරාජයින් ක්‍රිස්තියානි ආගම විනාශ කිරීමට උත්සාහ කළත් එය අසාර්ථක වූ බව
- ක්‍රිස්තු භක්තිකයින් ජීවිත පරිත්‍යාගයෙන් ආගම රැක ගැනීමට උත්සාහ ගත් බව
- ක්‍රි.ව. 4 වන සියවසේ දී එනම් ක්‍රි.ව. 380 දී තියඩෝසියස් අධිරාජයා කිතුදහම රෝම අධිරාජ්‍යයේ එකම නීත්‍යානුකූල ආගම බවට පත්කල බව
- ලෝක ජනගහනයෙන් වැඩි ප්‍රමාණයක් ක්‍රිස්තු භක්තිකයන් බව
- පාප්තුමා දෙවියන් වහන්සේගේ ජීවමාන නියෝජිතයා බව
- පේදුරු තුමා ප්‍රථම පාප් වහන්සේ බව

මිනිත්තු 10 යි

## තක්සේරුව හා ඇගයීම

- යුරෝපයේ ප්‍රධාන ආගම වූ ක්‍රිස්තියානි ආගමේ ආරම්භය විස්තර කරයි.
- ක්‍රිස්තියානි ආගමේ ගුණාංග අගය කරයි.
- ක්‍රිස්තු දහමේ උදාව පිළිබඳ ව ප්‍රශ්ණ සඳහා නිවැරදි පිළිතුරු ගොනු කරයි.
- සාමුහිකත්වයෙන් යුතුව කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යෙදේ.
- අවශ්‍ය අවස්ථාවල දී ඉදිරිපත් වී කරුණු දක්වයි.

ඇමුණුම් අංක 7.5.1.1



යේසුස් වහන්සේ

ඇමුණුම් අංක 7.5.1.2

## කාර්ය පත්‍රිකාව

පහත සඳහන් සියලුම ප්‍රශ්නවලට පෙළපොත ඇසුරෙන් පිළිතුරු සපයන්න.

1. ජේසුතුමාගේ මව සහ පියා කවුද?
2. එවකට සිටි රෝම අධිරාජයා කවුරුන් ද?
3. ජේසුතුමාගේ ධර්මයේ අඩංගු යහපත් කරුණු 05ක් ලියන්න.
4. එතුමාගේ මරණය සිදුවූයේ කෙසේද?
5. ප්‍රථම පාප්වහන්සේ කවුරුන්ද ?
6. ක්‍රිස්තියානි ආගම රෝම අධිරාජ්‍යයේ රාජ්‍ය ආගම බවට පත් කළේ කවුරුන්ද?
7. ජේසුතුමාගේ අදහස් ඇතුළත් වූ ශුද්ධ වූ ග්‍රන්ථය කුමක් ද?
8. දෙවියන් වහන්සේගේ ජීවමාන නියෝජිතයා .................... වේ.

   වරහන් තුළ ඇති පිළිතුරුවලින් නිවාරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
9. ජේසුතුමා ඉපදුනේ ( මක්කම, බෙත්ලෙහෙම, ඉන්දියාව, පලස්තීනයේ දී ය)
10. රෝමයේ ප්‍රථම ක්‍රිස්තියානි අධිරාජයා ( කොන්ස්ටන්ටයින්, ඔගස්ටස් සීසර්, ජුලියස් සීසර්, ක්ලෝඩියස් සීසර් ය )

## ක්‍රියාකාරකම 7.5.2

නිපුණතා මට්ටම : • වැඩවසම් යුගයේ යුරෝපයේ පැවති දේශපාලන ආර්ථික හා සමාජ ව්‍යුහය පිළිබඳ තොරතුරු විග්‍රහ කරයි.

ක්‍රියාකාරකම : ' වැඩයසම් ක්‍රමය ' හඳුනා ගනිමු

කාලය : මිනිත්තු 80

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම අංක 7.5.2.1 - යුරෝපා සිතියම
- ඇමුණුම් අංක 7.5.2.2 - කාර්ය පත්‍රිකාව
- පෙළ පොත

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.5.2.1 :
- පාසල් පෙළපොතෙහි වැඩවසම් යුගය පිළිබඳ පරිච්ඡේදය කියවා ගැනීමට සිසුන්ට අවස්ථාව දී වැඩ වසම් ක්‍රමය යනු කුමක් ද? යන ප්‍රශ්නය සිසුන්ට යොමු කරමින් පහත සඳහන් කරුණු ද ඉස්මතුවන සේ සාකච්ඡාවක් මෙයෙවන්න.

- යුරෝපයට එල්ල වූ ම්ලේච්ඡ ආක්‍රමණ හේතු කොට ගෙන පැරණි යුගය බිඳ වැටී වැඩවසම් ක්‍රමය ආරම්භ වූ බව
- වැඩවසම් යුගයේ දී රටේ සියලුම ඉඩම් රජු සතු වූ බව
- එය සේවා භුක්ති ක්‍රමය මත පදනම් වූවත් බව
- රජුට වඩා රදළයන් බලවත් වූ බව
- ස්වයංපෝෂිත ආර්ථිකයක් පැවති බව
- පන්ති සහිත සමාජයක් තිබූ බව
- සාමුහික බව
- ශාස්ත්‍රීය පුනරුදය වැඩවසම් ක්‍රමය බිඳ වැටීමට හේතු වූ බව

මිනිත්තු 10යි

පියවර 7.5.2.2 :
- පන්තිය කණ්ඩායම් පහකට බෙදන්න.
- එක් එක් කණ්ඩායම් සඳහා නායකයකු පත් කරන්න.
- එක් කණ්ඩායමකටම ඇමුණුම අංක 7.5.2.1 හි දැක්වෙන යුරෝපයේ සිතියම ලබා දෙන්න
- ඇමුණුම් අංක 7.5.2.2 සඳහන් කාර්ය පත්‍රිකාව එක් එක් කණ්ඩායමට එක් කාර්ය පත්‍රිකාවක් වනසේ ලබා දෙන්න. ( සිතියම ලබා දුන් කණ්ඩායමට ඊට අදාළ කාර්ය පත්‍රිකාව ලබා දෙන්න.)
- ක්‍රියාකාරකම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම කරන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකමෙහි යොදවන්න.

මිනිත්තු 30යි

පියවර 7.5.2.3 :

- ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- කණ්ඩායම් තම අදහස් ඉදිරිපත් කිරීමේ දී ඔවුන්ගේ හැකියා ප්‍රබලතා ඇගයීමට ලක් කරන්න.
- අනෙකුත් කණ්ඩායම්වල ක්‍රියාකාරකම් සටහන් කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න
- පහත සඳහන් කරුණු ඉස්මතු කර දක්වමින් පාඩම සමාලෝචනය කරන්න.

- ක්‍රි.ව. 5 සියවසේ සිට 15 වන සියවස දක්වා යුරෝපයේ වැඩවසම් ක්‍රමය ක්‍රියාත්මක වූ බව.
- කෘෂිකර්මය මත පදනම් වූ ආර්ථික රටාවක් පැවති බව.
- වංශාධිපතීන් බලවත් වීම නිසා ජනතාවගේ පක්ෂපාතීත්වය ඔවුන්ට ලැබුණු බව.
- උත්පත්තිය අනුව සමාජ තරාතිරම තීරණය වූ බව
- මුදල් භාවිතය සුළු වශයෙන් පැවති අතර භාණ්ඩ හුවමාරු ක්‍රමයට ප්‍රධාන තැනක් ලැබුණු බව.
- කුරුස යුද්ධ වැඩවසම් ක්‍රමය බිඳ වැටීමට ප්‍රබල හේතුවක් වූ බව

මිනිත්තු 40යි

## තක්සේරුව හා ඇගයීම

- වැඩවසම් යුගයේ පැවති දේශපාලන ආර්ථික හා සමාජ ලක්ෂණ සහ වැඩවසම් ක්‍රමය පිරිහීමට හේතු වූ කරුණු විස්තර කරයි.
- වැඩවසම් යුගයේ පැවති ස්වයංපෝෂිත බව හා සාමූහික බව අගය කරයි.
- වැඩ වසම් ක්‍රමය පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- කණ්ඩායම් ලෙස කටයුතු කිරීමට පුරුදු පුහුණු වේ.
- සාකච්ඡා සඳහා දායකත්වය ලබා දෙයි.

ඇමුණුම අංක 7.5.2.1

යුරෝපා සිතියම





ඇමුණුම අංක 7.5.2.2

ඇමුණුම 7.5.2.2

## කාර්ය පත්‍රිකාව

1 කණ්ඩායම

1. යුරෝපයේ වැඩවසම් ක්‍රමය ක්‍රියාත්මක වූ රටවල් ලකුණු කොට නම් කිරීම (සිතියමක ඇසුරෙන් )

1.
2.
3.
4.
5.

2 කණ්ඩායම

1. වැඩ වසම් ක්‍රමයේ පැවති දේශපාලන ලක්ෂණ පෙළපොත ඇසුරෙන් දක්වන්න

1.
2.
3.
4.
5.

3 කණ්ඩායම

1. වැඩවසම් ක්‍රමයේ පැවති ආර්ථික ලක්ෂණ පෙළපොත ඇසුරෙන් දක්වන්න

1.
2.
3.
4.
5.

4 කණ්ඩායම

1. වැඩ වසම් ක්‍රමයේ පැවති සමාජීය ලක්ෂණ පෙළපොත ඇසුරෙන් පැහැදිලි කරන්න.

1.
2.
3.
4.
5.

5 කණ්ඩායම

1. වැඩවසම් ක්‍රමය පිරිහීමට හේතු පෙළපොත ඇසුරෙන් දක්වන්න.

1.
2.
3.
4.

# ක්‍රියාකාරකම 7.5.3

නිපුණතා මට්ටම : • කුරුස යුද්ධ ආරම්භයට හේතු හා ප්‍රතිඵල විග්‍රහ කරයි.

ක්‍රියාකාරකම : ' යුරෝපය නවලොවක් කරා යොමු කළ කුරුස යුද්ධ පිළිබඳ උගනිමු '

කාලය : මිනිත්තු 80

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම අංක 7.5.3.1 - කුරුස යුද්ධය දැක්වෙන පින්තූරය
- ඇමුණුම් අංක 7.5.3.2 - පෙර අපර දෙදිග වෙළඳ මාර්ග දැක්වෙන සිතියම
- ඇමුණුම අංක 7.5.3.3 - කාර්ය පත්‍රිකා ( භූමිකා රංගනය )
- ඇමුණුම අංක 7.5.3.4 - කාර්ය පත්‍රිකාව

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.5.3.1 :
- ඇමුණුම් අංක 7.5.3.1 කුරුස යුද්ධය දැක්වෙන පින්තූරය පෙන්වා පහත දැක්වෙන ප්‍රශ්න ඇසුරෙන් පහත සඳහන් කරුණු ද ඉස්මතු වන සේ සාකච්ඡාව මෙහෙයවන්න.
  - පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක් ද?
  - කුරුස යුද්ධ යනු කුමක් ද?
  - කුරුස යුද්ධය ඇතිවූයේ කවුරුන් අතර ද?
  - කුරුස යුද්ධය ඇතිවීමට හේතු මොනවා ද?

- ක්‍රිස්තියානින් හා මුස්ලිම්වරුන් අතර කුරුස යුද්ධ ඇති වූ බව.
- ක්‍රිස්තු භක්තිකයින් කුරුසයක් පැළඳ ගෙන යුද්ධයට සහභාගී වූ නිසා කුරුස යුද්ධය නමින් හඳුන්වා දුන් බව
- කුරුස යුද්ධ ඇතිවූයේ ක්‍රි.ව. 11 වන සියවසේ සිට 15 වන සියවස දක්වා කාලය තුළ බව.
- මේ කාලයේ දී කුරුස යුද්ධ මාලාවක් ඇති වූ බව
- ආගමික සිද්ධස්ථාන මුල්කරගෙන ඇති වූවක් බව.
- පාප් වහන්සේ ක්‍රිස්තියානි පක්ෂයේ නායකත්වය දැරූ බව.
- එහි උච්චතම අවස්ථාව 1453 දී කොන්ස්තන්තිනෝපලය තුර්කීන් අතට පත්වීම.
- කුරුස යුද්ධය නිසා යුරෝප ජාතීන්ට වෙළඳ භාණ්ඩ ලබා ගැනීම සඳහා පෙරදිගට යාමට තිබූ මාර්ග අවහිර වූ බව

මිනිත්තු 10යි

පියවර 7.5.3.2 :
- රංගනයට දක්ෂ සිසුවකු තෝරා ගන්න.
- ඇමුණුම් අංක 7.5.3.3 භූමිකා රංගනය සඳහා පත්‍රිකාව ලබා දෙන්න.
- එය ඉදිරිපත් කළ යුතු ආකාරය පිළිබඳ අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.
- සෙසු සිසුන්ගේ අවධානය ඒ සඳහා යොමු කරවන්න.
- ඉන්පසු කාර්ය පත්‍රිකාවෙහි ඇති ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට සලස්වන්න.

මිනිත්තු 30යි

පියවර 7.5.3.3 :
- සිසුන්ගේ පිළිතුරු ඇගයීමට ලක් කරන්න.
- වැඩි ලකුණු ගත් සිසුන් ඇගයීමට ලක් කරමින් පහත දැක්වෙන කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් පාඩම සමාලෝචනය කරන්න.

- යුරෝපය පුරා මුස්ලිම් ආධිපත්‍යයේ ව්‍යාප්ත වීම වැළැක්වීම කුරුස යුද්ධවල අරමුණු වූ බව.
- පෙර අපර දෙදිග වෙළෙඳාමේ දී කොන්ස්තන්තිනෝපලය මධ්‍යස්ථානය වූ බව. ( ඇමුණුම අංක 7.5.3.2 සිතියම ඇසුරෙන්)
- කුරුස යුද්ධය නිසා පෙරදිගට යාමට නව මුහුදු මාර්ග සෙවීමට සිදු වූ බව.
- වැඩවසම් ක්‍රමය බිඳ වැටීමට කුරුස යුද්ධ බලපෑ බව
- කොන්ස්තන්තිනෝපලයේ තිබූ පැරණි පොත්පත් යුරෝපයට ගෙනයාම නිසා ග්‍රීක රෝම ශිෂ්ටාචාරය පිබිදීමට ලක් වූ බව
- විද්‍යාත්මක, කලා ආදී ක්ෂේත්‍රවල දියුණුවක් ඇති වූ බව


මිනිත්තු 40යි

## තක්සේරුව හා ඇගයීම

- කුරුස යුද්ධ යනු කුමක්දැයි පැහැදිලි කරයි.
- දේශ ගවේෂණ කටයුතුවල වැදගත්කම අගය කරයි.
- කුරුස යුද්ධ පිළබඳ තොරතුරු පෙළගස්වයි.
- සහයෝගීව කටයුතු කරයි.
- මූලාශ්‍ර ආශ්‍රයෙන් තොරතුරු රැස්කිරීමේ නිපුණතාවය ලබයි.


ඇමුණුම් 7.5.3.1

කුරුස යුද්ධය



ඇමුණුම් 7.5.3.2

පෙර අපර දෙදිග වෙළෙඳ මාර්ග දැක්වෙන සිතියම



ඇමුණුම අංක 7.5.2.3

## භූමිකා රංගනය සඳහා

මම යුරෝපා මහාද්වීපයට අයත් ප්‍රංශයේ ඉපදුන ප්‍රැන්කෝ. මම ඉපදුනේ ක්‍රි.ව. 1420 දී ජේනව ද මගේ හැට්. මේ මගේ අතයි කකුලයි කොරවෙලා ඉන්න හැටි. ඔයාලා මට හිනාවෙන්න එපා. මම මෙහෙම වෙන්න හේතුව මම යුද්ධ භටයෙක් වීම. ඔයාලා දන්නවද? ක්‍රි.ව. 1453 දී ක්‍රිස්තු භක්තිකයන් හා ඉස්ලාම් භක්තික තුර්කීන් අතර ලොකු යුද්ධයක් ඇති වූ බව. ඒක අවුරුදු සිය ගණනක් පැවතුනා. එකට කියන්නේ කුරුස යුද්ධ කියලා. මම හරිම භක්තිමත් කිතුනුවෙක්. අපේ රටේ සොල්දාදුවෝ විතරක් නොවෙයි ජර්මනිය, එංගලන්තය වැනි රටවල සොල්දාදුවොත් මීට සහභාගී වුනා. අපි හිතුව විදියට අපට ජයගන්න බැරිවුනා. තුර්කීන් අපි හිතුවට වඩා බොහෝ සෙයින් බලවත්. ඒ නිසා අපි පැරදුනා විතරක් නොවෙයි. අපේ ශුද්ධ භූමිය වූ ජේරුසලමත් ඔවුන්ට අයත් වුණා. ඒ විතරක් ද අපට වෙළෙඳාම සඳහා පෙරදිගට ඇතුල් වීමට තිබූ ප්‍රධාන දොරටුව වූ කොන්ස්තන්තිනෝපලය ඔවුන්ට අයත් වුණා. මේ නිසා අපේ වෙළෙඳාමට මහත් පාඩුවක් වුණා. ඒ වුනාට අපිත් නිකම්ම හිටියේ නෑ. නව මුහුදු මාර්ග සොයා ගැනීමට වෙහෙසුනා. ඒකේ ප්‍රතිඵලයක් වශයෙන් අපට ආසියාවට, අප්‍රිකාවට, ඇමරිකාවට, යන්න මුහුදු මාර්ග සොයා ගන්න පුළුවන් වුණා. මේ නිසා අපට අපේ ආගමත් ලෝකයේ සෑම මහාද්වීපයකටම පාහේ ව්‍යාප්ත කරන්න පුළුවන් වුනා.

ඇමුණුම අංක 7.5.3.4

## කාර්ය පත්‍රිකාව

- කුරුස යුද්ධ යනු කුමක් ද?
- කුරුස යුද්ධ ඇති වූයේ ඇයි ?
- කුරුස යුද්ධවලට සහභාගී වූ යුරෝපා රටවල් 3ක් නම් කරන්න.
- කුරුස යුද්ධවල උච්චතම අවස්ථාව ඇති වූ අවස්ථාව ඇති වූ වර්ෂය දක්වන්න.
- කුරුස යුද්ධයෙන් කිතුනුවන් පරාජය වූයේ ඇයි ?
- කුරුස යුද්ධවල ප්‍රතිඵල දක්වන්න.

# 7.6 පොළොන්නරුව බිඳ වැටීමෙන් පසු ශ්‍රී ලංකාව

කාලච්ඡේද 12 යි

## හැඳින්වීම

ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ දෙවන අගනුවර වූ පොළොන්නරුව කාලිංග මාඝගේ ආක්‍රමණයෙන් බිඳ වැටීමත් සමඟ 13 සියවසේ දී සිංහල රාජධානිය නිරිතදිගට විතැන්වීම ඇරඹිණ.

දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොළ හා කෝට්ටේ දක්වා සිංහල රාජධානිය නිරිත දිගට විතැන් වූ අතර මෙකී රාජධානී එක් අගනුවරක වැඩි කලක් නොරැඳින. මෙසේ රාජධානි නිරිතදිගට ඇදී යාමේ දී රජරට ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ පදනම වූ කෘෂිකාර්මික ජීවන රටාව වෙනුවට වෙළෙඳ ආර්ථිකයක නැගී ඒම සිදු වූ ආකාරය පිළිබඳ අධ්‍යයනයක් මෙම ඒකකයෙන් අපේක්ෂිතය.

සිංහල රාජධානිය නිරිත දිගට විතැන්වන විට උතුරේ ස්වාධීන රාජ්‍යයක් ලෙස යාපන රාජ්‍යයේ නැගී ඒම පිළිබඳවත් එමෙන් ම මෙම රාජධානි සමයන්හි ජීවන රටාව, ආර්ථික පදනම, ආගම හා සාහිත්‍යය පිළබඳවත් ලිහිල් අවබෝධයක් ලබාදීම තවදුරටත් අපේක්ෂිතය

නිපුණතා :
- ශ්‍රී ලංකාවේ විවිධ කාලවකවානුවල සිදු වු දේශපාලන සංසිද්ධීන් විමර්ශනය කරමින් ඉන් ලද ආභාෂයන් වර්තමානය හා අනාගතය සාර්ථක කර ගැනීමට ඵලදායි ව භාවිත කරයි.
- ශ්‍රී ලංකාවේ විවිධ කාලවකවානු තුළ ඇති වු සමාජ, ආර්ථික හා සංස්කෘතික ප්‍රවනතාවයන් පිළිබඳ විමසා බලා ජාතික උරුමයන් හා ජාතික අනන්‍යතාවයන් රැක ගැනීමට පෙළඹෙයි

නිපුණතා මට්ටම :
- ශ්‍රී ලංකාවේ රාජධානී විතැන්වීමට බලපෑ හේතු සාධක විග්‍රහ කරයි.
- දහතුන්වන සියවසේ සිට පහළොස්වන සියවස දක්වා සිටි වැදගත් පාලකයින්ගේ දේශපාලන සේවාවන් විග්‍රහ කරයි.
- දහතුන්වන සියවසේ සිට පහළොස්වන සියවස දක්වා ශ්‍රී ලංකාවේ ජීවන රටාව ආගමික හා සාහිත්‍ය කටයුතු පිළිබඳ තොරතුරු විග්‍රහ කරයි.
- යාපන රාජ්‍යයේ ප්‍රධාන පාලකයන් පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි.

විෂය අන්තර්ගතය

7.6 පොළොන්නරුව බිඳවැටීමෙන් පසු ශ්‍රී ලංකාව

7.6.1 ශ්‍රී ලංකාවේ රාජධානි විතැන්වීම

- රජරට වාරි ශිෂ්ටාචාරය විනාශ වීමත් සමඟ ජනයා මලය රටට හා නිරිතදිග ප්‍රදේශ කරා සංක්‍රමණය වීම.
- රජරට කුඩා වැව් ආශ්‍රිතව සුළු ජන කොටසක් රැඳී සිටි අතර ඔවුන් වන්නිවරුන් නමින් හැඳින්වින.

- මාඝගේ කෲර පාලනය නිසා රුහුණුට හා නිරිතදිගට සංක්‍රමණය වූ රජරට ප්‍රධානී හූ වන දුර්ග හා ගිරි දුර්ගයන්ගෙන් ආරක්ෂිත ස්ථානයන්හි සිය පාලන මධ්‍යස්ථාන පිහිටුවා ගත්හ.

  උදා : යාපහුව- සුභ සේනාපති
  ගෝවින්ද හෙල - බුවනෙකබාහු ආදිපාද
  දඹදෙණිය - විජයබාහු
  මිනිපේ - සංඛ සේනාපති



සිතියම 7.6.1 රාජධානි විතැන්වීම

## රාජධානි විතැන්වීම

දඹදෙණිය රාජධානිය ( ක්‍රි.ව. 1232 - 1270)

- පොළොන්නරුව බිඳ වැටීමෙන් පසුව බිහි වූ ප්‍රථම රාජධානිය වීම
- තුන්වන විජයබාහු ( ක්‍රි.ව. 1232 - 1236 ) දඹදෙණිය රාජ වංශයේ ආරම්භක පාලකයා වීම.
- කොත්මලේ සඟවා තිබූ දන්ත ධාතූන් වහන්සේ : කෑගලු දිස්ත්‍රික්කයේ බෙලිගල පර්වත මුදුනේ දළදා මාළිගයක් කරවා එහි තැන්පත් කිරීම. එමඟින් සිය රාජ්‍ය උරුමය තහවුරු කර ගැනීම.
- ක්‍රි.ව. 1236 දී තුන්වන විජයබාහු රජුගේ ඇවෑමෙන් ඔහුගේ පුත්‍රයා වූ දෙවැනි පරාක්‍රමබාහු දඹදෙණියේ රජවීම.
- ක්‍රි.ව. 1255 දී තෙවැනි පරාක්‍රමබාහු රජු විසින් පාණ්ඩ්‍ය සේනා ආධාර ද ලබා ගෙන වසර හතළිහක් මෙරට පාලනය කළ කාලිංග මාඝ පලවා හරින ලදී.

- චන්ද්‍රභානු නැමැති ජාවක රජු විසින් එල්ල කරන ලද ආක්‍රමණ දෙකකට මුහුණ දීමට දෙවැනි පරාක්‍රම බාහු රජුහට සිදුවීම.
- පාණ්ඩ්‍ය ආධාර ලබා 1261 දී ජාවක ආක්‍රමණය පරාජය කිරීමට රජු සමත්වීම.
- ක්‍රි.ව. 1236 - 1270 දක්වා රජකළ දෙවැනි පරාක්‍රමබාහු රජු දඹදෙණි රාජධානියේ ශ්‍රේෂ්ඨතම පාලකයා ලෙස සැලකීම.
- විදේශ අධිපත්‍යයෙන් රට මුදවා ගැනීම.
- ශ්‍රේෂ්ඨ පඬිවරයෙකු වීම සහ කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන උපාධි නාමය දැරීම වැනි කරුණු ඔහුගේ ශ්‍රේෂ්ඨත්වයට හේතු වීම.
- දෙවැනි පරාක්‍රමබාහු රජුට පසුව ඔහුගේ පුත්‍රයා හතරවැනි විජයබාහු (බෝසත් විජයබාහු ) නමින් දඹදෙණියේ රජවීම.
- හතරවැනි විජයබාහු රජු මරණයට පත්කළ මිත්ත සෙනෙවියා රාජ්‍ය බලය පැහැර ගැනීමෙන් පසුව උදාවූ දේශපාලන ව්‍යාකූලත්වය හමුවේ දඹදෙණි රාජධානිය අවසන් වීම.

යාපහුව රාජධානිය ( ක්‍රි.ව. 1272 - 1300 )

- යාපහුව රාජධානිය බවට පත්කරගත් ප්‍රථමයා වූයේ පළමුවැනි බුවනෙකබාහු රජුය.
- ඨකුරක සෙනෙවියා මිත්ත සෙනෙවියා මරා හතරවැනි විජයබාහු රජුගේ සහෝදරයා වූ බුවනෙකබාහු කුමරුට රජකම පැවරීම.
- දඹදෙණියට වඩා යාපහුව ආරක්ෂාකාරී වීම
- එම නිසා බුවනෙකබාහු රජු යාපහුව තම රාජධානිය ලෙස තෝරා ගැනීම
- මෙකල බලවත්ව තිබූ දකුණු ඉන්දියානු පාණ්ඩ්‍ය අධිරාජ්‍යයේ සෙනෙවියෙකු වූ ආර්ය චක්‍රවර්තී ලංකාව ආක්‍රමණය කොට දන්ත ධාතූන්වහන්සේ හා පාත්‍රා ධාතුව පැහැරගෙන පාණ්ඩ්‍ය දේශයට රැගෙන යාම.
- පළමුවැනි බුවනෙකබාහු රජුගේ මරණයෙන් පසු හතරවැනි විජයබාහු රජුගේ පුත් පරාක්‍රමබාහු කුමරා පාණ්ඩ්‍ය දේශයට ගොස් දන්ත ධාතූන් වහන්සේ හා පාත්‍රා ධාතුව නැවත ලබා ගෙන පැමිණ ක්‍රි.ව. 1287 දී තුන්වන පරාක්‍රමබාහු නමින් පොළොන්නරුවේ රජ බවට පත්වීම.

කුරුණෑගල රාජධානිය - (ක්‍රි.ව. 1300 - 1347 )

- තුන්වැනි පරාක්‍රමබාහු පරාජය කළ දෙවැනි බුවනෙකබාහු ( පළමුවැනි බුවනෙකබාහු රජුගේ පුත්‍රයාය ක්‍රි.ව. 1300 දී කුරුණෑගල සිය රාජධානිය පිහිටුවා ගැනීම.
- ඔහු කුරුණෑගල රාජධානියේ ආරම්භක පාලකයා වීය.
- දෙවැනි බුවනෙකබාහු රජුගේ පුතා හතරවැනි පරාක්‍රමබාහු (ක්‍රි.ව. 1302 - 1325 ) නමින් කුරුණෑගල රජවීම.
- හතරවැනි පණ්ඩිත පරාක්‍රමබාහු නමින් හැඳින්වෙන මෙතුමා කුරුණෑගල රාජධානියේ ශ්‍රේෂ්ඨතම පාලකයා වීම.
- සිරිවර්ධන ප්‍රතිරාජ ඇමතියා විසින් වත්මන් මහනුවර නගරය සිරිවර්ධනපුරය නමින් ඇරඹීම.
- හතරවැනි පරාක්‍රමබාහු රජුගෙන් පසුව වසර 15 පමණ කාලයක් පිළිබඳ ව දේශපාලන තොරතුරු අප්‍රකට වීම.

ගම්පොළ රාජධානිය - ( ක්‍රි.ව. 1341 - 1415 )

- කුරුණෑගල රාජධානිය අතහැර ගම්පොළ රාජධානිය පිහිටුවීමට තුඩුදුන් හේතු අපැහැදිලිය.
- මෙම යුගයේ රාජ්‍ය පාලනයට සම්බන්ධ වූ ප්‍රකට ප්‍රභූ පවුල් දෙක වූයේ සේනාධිලංකාර පවුල හා අලගක්කෝනාර පවුලය.
- ක්‍රි.ව. 1341 දී හතරවැනි බුවනෙකබාහු ගම්පොල අගනුවර කොටගෙන රජ බවට පත්වීම.
- සේනාධිලංකාර සෙනෙවියා හතරවැනි බුවනෙකබාහු රජුගේ අගමැති ලෙස කටයුතු කිරීම.
- හතරවැනි බුවනෙකබාහුගේ සහෝදරයා පස්වැනි පරාක්‍රමබාහු නමින් ක්‍රි.ව. 1344 සිට කෑගලු දිස්ත්‍රික්කයේ දැදිගම රජ කිරීම.
- ක්‍රි.ව. 1344 දී ඉබන් බතූතා ලංකාවේ සංචාරය කිරීම.
- ක්‍රි.ව. 1338 දී පමණ වික්‍රමබාහු නම් කුමරෙක් නිශ්ශංක අලගක්කෝනාරගේ ආධාරය ලබා කැරැල්ලක් ඇතිකොට තුන්වැනි වික්‍රමබාහු නමින් ගම්පොළ සිහසුන පැහැරගෙන රජවීම.
- ක්‍රි.ව. 1374 දී පස්වැනි බුවනෙකබාහු ගම්පොල රජවීම.
- නිශ්ශංක අලගක්කෝනාර ඔහුගේ ද අගමැති වශයෙන් කටයුතු කිරීම.
- මේ වනවිට යාපන පාලක ආර්ය චක්‍රවර්තී මන්නාරමේ සිට පානදුර දක්වා වෙරළබඩ තොටුපලවල අයබදු රැස් කිරීම තමා යටතේ තබා ගැනීම.
- කෝට්ටේ බලකොටුව ඉදිකල නිශ්ශංක අලගක්කෝනාර එහි සිට ප්‍රහාර එල්ල කොට ආර්ය චක්‍රවර්තී බටහිර වෙරළේ තොටුපල වලින් පලවා හැරීම.
- නිශ්ශංක අලගක්කෝනාරගේ ක්‍රියා කලාපය කෙරේ කෝපයට පත් ආර්ය චක්‍රවර්තී රට මැදින් ගම්පොල දක්වා ප්‍රහාරයක් එල්ල කිරීම.
- නිශ්ශංක අලගක්කෝනාර ආර්ය චක්‍රවර්තී පරාජයට ගත් කිරීම
- පස්වැනි බුවනෙකබාහු ගම්පොළ පාලකයාව සිටිය දී ගම්පොළ ආධිපත්‍යය පිළිනොගෙන වීර අලකේෂ්වර රයිගම පාලනය කිරීම.
- ක්‍රි.ව. 1409 දී චීන ජාතික චෙං හෝ නිසි අයුරින් පිළිනොගැනීමට එරෙහිව වීර අලකේශ්වර සිරකරුවෙකු ලෙස ක්‍රි.ව. 1411 දී චීනයට රැගෙන යාම.

කෝට්ටේ රාජධානිය ( ක්‍රි.ව. 1415 - 1521 )

- ක්‍රි.ව. 1415 - 1467 දක්වා වසර 53 රජකළ හයවැන පරාක්‍රමබාහු කෝට්ටේ යුගයේ ආරම්භක පාලකයා වීම
- ජයමහලෑන සිටුවරයා හා සුනේත්‍රා දේවී මෙතුමාගේ දෙමාපියන් වීම.
- හයවැනි පරාක්‍රමබාහු රජවන විට ස්වාධීන පාලන ප්‍රදේශයක්ව තිබූ යාපන ප්‍රදේශය සපුමල් කුමරු යවා යටත් කර ගැනීම.
- ක්‍රි.ව. 1462 දී ජෝතිය සිටානන් විසින් උඩරට ඇතිකළ කැරැල්ල මැඩ පැවැත්වීම.
- ලංකාව අවසන් වරට එක්සේසත් කළ පාලකයා වීම.
- හයවැනි බුවනෙකබාහු නමින් 1469 රජ වූ සපුමල් කුමාරයා ක්‍රි.ව. 1478 දක්වා කෝට්ටේ රජ කිරීම.

7.6.2 පොළොන්නරුව බිඳවැටීමෙන් පසු අවධියේ ජීවන රටාව

- රජරට ජලාශ්‍රිත ශිෂ්ටාචාරය පදනම් කර ගත් කෘෂි ආර්ථික රටාව බිඳ වැටෙමින් පැවතීම.
- රාජධානිය තෙත් කලාපයට විතැන්වීම සමග ගොවිතැන සඳහා වැසිදිය උපයෝගී කර ගැනීම.
- වී ප්‍රධාන භෝගය වූ අතර ජලහිඟ ප්‍රදේශයන්හි හේන් ගොවිතැන සිදු කිරීම.
- තෙත් කලාපයේ පොල් වගාව මැනවින් කළ හැකි වූ නිසා වෙනම බෝගයක් ලෙස පොල් වගාව ව්‍යාප්ත වීම.
- තෙත් කලාපයේ වනගත බෝගයක් වූ කුරුඳු වෙළෙඳ බෝගයක් ලෙස ජනප්‍රිය වීම.
- පුවක්, ගම්මිරිස්, සාදික්කා, එනසාල් වැනි තෙත් කලාපීය බෝග අපනයනයට හුරුවීම.
- මුතු, මැණික්, ඇතුන්, ඇත්දළ වැනි වෙළෙඳ ද්‍රව්‍ය ද අපනයන අතරට එක්වීම.
- ගොවිතැන් කටයුතු අඩපන වීම හා විදේශ වෙළෙඳාම පුළුල් වීම.
- 13 වන සියවස වනවිට ලංකාවේ වූ කුල ක්‍රමය රජ, බමුණු, වෙළෙඳ හා ගොවි යනුවෙන් ප්‍රධාන කොටස් හතරකට බෙදී පැවතීම.
- ගොවිතැන හා වෛද්‍ය වෘත්තිය වැනි වෘත්තීන් එක් කුලයකට පමණක් සීමා නොවීම.
- සමාජය විනය මූලික වීම.
- බුදු දහමින් ඔප නැගුණු සමාජය තුළ කාන්තාවට හිමි තත්ත්වය මෙකල ද දක්නට ලැබීම.

7.6.3 ආගමික දියුණුව හා සාහිත්‍ය

- දඹදෙණි යුගයේ තුන්වැනි විජයබාහු රජු විසින් බෙලිගල දළදා මාළිගයක් කරවා දන්ත ධාතූන්වහන්සේ වැඩම කරවීම.
- දඹදෙණි විජයසුන්දරාරාමය හා වත්තල විජයබාහු නමින් විහාරයක් කරවීම, කැළණි විහාරය හා අත්තනගලු විහාරය අළුත්වැඩියා කිරීම
- දෙවැනි පරාක්‍රමබාහු රජු දඹදෙණි විජය සුන්දරාරාමයේ දළදා ප්‍රදර්ශනයක් හා පූජෝත්සවයක් පැවැත්වීම.
- දඹදෙණියේ සංඝ සම්මේලනයක් පවත්වා භික්ෂු විනය නීති පිළිබඳ දඹදෙණි කතිකාවත පිළියෙළ කිරීම.
- දෙවැන පරාක්‍රමබාහු රජුගේ අනුග්‍රහයෙන් විසුද්ධිමාර්ග සන්නස, කව්සිළුමිණ, සද්ධර්ම රත්නාවලිය, භේසජ්ජ මඤ්ජුසා සහ සමන්තකූට වර්ණනාව වැනි පොතපත රචනා වීම.
- යාපහුව රාජධානී සමයේ දකුණු ඉන්දියානු ගෘහ නිර්මාණ ශිල්පයේ බලපෑම ඇතිවීම.

- කුරුණෑගල යුගයේ හතරවැනි පරාක්‍රමබාහු රජු වීදාගම ශ්‍රී ඝණානන්ද පිරිවෙන කරවීම.
- මහනුවර අස්ගිරි සේනාසනයේ ආරම්භය සිදුවීම.
- හතරවැනි පරාක්‍රමබාහු රජ සමයේ පන්සිය පනස් ජාතකපොත, දළදා සිරිත, එළුබෝධි වංශය, අනාගත වංශය හා ධාතු මංජුසා නම් ග්‍රන්ථ රචනා කිරීම.
- ගම්පොළ යුගයේ දී ප්‍රභූ පවුල් ආගමික සේවාවේ පෙරමුණට පැමිණීම.
- ගඩොලාදෙණිය, ලංකාතිලකය සහ ඇම්බැක්කේ දේවාලය වැනි ගොඩනැගිලි ඉදිවීම.
- සංදේශ සාහිත්‍යයේ ආරම්භය සිදුවීම.
- මයුර සන්දේශය, තිසර සන්දේශය, විමුක්ති සංග්‍රහය, එළු අත්තනගලු වංශය, සද්ධර්මාලංකාරය හා නිකාය සංග්‍රහය ගම්පොළ අවධියේ ලියැවුණු ප්‍රකට ග්‍රන්ථ වීම.
- කෝට්ටේ හයවැනි පරාක්‍රමබාහු රජු තම මෑණියන් සිහිවීමට පැපිලියානේ සුනේත්‍රාදේවී පිරිවෙන කරවීම.
- වීදාගම, ඝනානන්ද පිරිවෙණ, කෑරගල පද්මාවතී පිරිවෙන, තොටගමුවේ විජයබා පිරිවෙන, දෙවිනුවර ඉරුගල් කුලතිලක පිරිවෙන, ආදී අධ්‍යාපන මධ්‍යස්ථානයන්හි දියුණුවට අනුග්‍රහ දැක්වීම.
- තොටගමුවේ ශ්‍රී රාහුල හිමි, වීදාගම මෛත්‍රී හිමි, කෑරගල වනරතන හිමි ඇතුළු හයවැනි පරාක්‍රමබාහු රජු ද කෝට්ටේ යුගයේ ප්‍රකට උගතුන් විය.
- පරෙවි සන්දේශය, සැළලිහිණි සන්දේශය, කෝකිල සංදේශය, ගුත්තිලය, කාව්‍යශේකරය, ලෝවැඩ සඟරාව සහ පැරකුම්බා සිරිත කෝට්ටේ අවධියේ ලියැවුණු ප්‍රකට ග්‍රන්ථ වීම.
- හයවැනි පරාක්‍රමබාහු රජු කොට්ටේ දළදා මාළිගාව කරවීම හා සපුමල් කුමරු යාපන අර්ධද්වීපයේ නල්ලූර් කන්දසාමි කෝවිල කරවීම.

7.6.4 යාපන රාජ්‍යය

- යාපන රාජ්‍යය ආරම්භ වූයේ 13 වන සියවසේ දී බව විශ්වාස කෙරේ.
- ආර්ය චක්‍රවර්තී නම් රජ්‍ය පරපුරක් එය පාලනය කිරීම.
- ක්‍රි.ව. 1415 දී කෝට්ටේ රජ වූ සයවැනි පරාක්‍රමබාහු රජු සපුමල් කුමරු යවා යාපනය කෝට්ටේ රාජ්‍යයට ඈඳා ගැනීම.
- සයවැනි බුවනෙකබාහු නමින් රජ වූ සපුමල් කුමරු ගේ පාලන කාලය අවසානයේ යාපනය ස්වාධීන රාජ්‍යයක් බවට පත්වීම.
- ආර්ය ජක්‍රවර්තී පරපුරට අයත් පාලකයින් එහි ප්‍රබල පාලකයින් වීම.
- ඉහත දැක්වූ පරිදි (ගම්පොළ රාජධානිය යටතේ ) ගම්පොළ තෙවැනි වික්‍රමබාහු රජ සමයේ  යාපන පාලක ආර්‍ය චක්‍රවර්ති ගම්පොළට ආක්‍රමණයක් එල්ල කිරීම
- ක්‍රි.ව. 1619 දී යාපනය පෘතුගීසීන් විසින් යටත් කර ගැනීම.

## ක්‍රියාකාරකම 7.6.1

නිපුණතා මට්ටම : දහතුන් වන සියවසේ සිට පහළොස්වන සියවස දක්වා වැදගත් පාලකයින්ගේ දේශපාලන සේවාව විග්‍රහ කරයි.

ක්‍රියාකාරකම : ' නිරිතදිග රාජධානිවල දේශපාලන තොරතුරු හදාරමු. '

කාලය : කාලපරිච්ඡේද 05

ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම අංක 7.6.1.1 - දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොළ හා කෝට්ටේ යන යුගයන් කිහිපයකට අයත් පින්තූර කීපයක්
- ඇමුණුම් අංක 7.6.1.2 - සිංහල රාජධානිය නිරිත දිගට විතැන්වීම දක්වන සිතියම
- ඇමුණුම අංක 7.6.1.3 - ශිෂ්‍ය තොරතුරු පත්‍රිකාව
- ඇමුණුම අංක 7.6.1.4 - ශිෂ්‍ය පැවරුම් පත්‍රිකාව
- පෙළපොත
- බ්‍රිස්ල් බෝඩ්

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.6.1.1 :

- ඇමුණුම 7.6.1.1 හි දැක්වෙන පින්තූර පන්තියට ඉදිරිපත් කරන්න.
- මෙම පින්තූරවලින් දැක්වෙන්නේ මොනවාද?
- මෙම පින්තූර අයත් වන යුග මොනවා ද?
  යනා දී ප්‍රශ්න නගමින් පාඩමට පිවිසෙන්න.
- ඇමුණුම 7.6.1.2 පන්තියට ඉදිරිපත් කරමින් පෙළපොතෙහි සඳහන් කරුණු ද ඉස්මතු වන ලෙස සාකච්ඡාව මෙහෙයවන්න.

> - කාලිංග මාඝගේ ආක්‍රමණයෙන් පොළොන්නරු රාජධානිය බිඳ වැටුනු පසු සිංහල රාජධානිය නිරිත දිගට විතැන් වූ බව.
> - පාලකයන් දුර්ගස්ථාන තම රාජධානි ලෙස තෝරා ගත් බව.
> - මෙකී පාලන මධ්‍යස්ථාන පැවති කාලය කෙටි බව.
> - රාජධානි කාලය කෙටි වූවද ඒවායෙහි විසූ රජවරුන්ගෙන් ලංකා රාජධානිය ආරක්ෂා කර ගැනීමට අපමණ මෙහෙයක් සිදු වූ බව

මිනිත්තු 15යි

පියවර 7.6.2 :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් වලට බෙදන්න.
- ක්‍රියාකාරකම පිළිබඳ ව සිසුන් දැනුවත් කරන්න.
- ඇමුණුම 7.6.1.3 ශිෂ්‍ය තොරතුරු පත්‍රිකා කණ්ඩායමකට එක බැගින් බෙදා දෙන්න.
- ඇමුණුම 7.6.1.4 ශිෂ්‍ය කාර්ය පත්‍රිකාව කණ්ඩායමට එක බැගින් බෙදා දෙන්න.
- කණ්ඩායමට පැවරී ඇති ක්‍රියාකාරකම් හි සිසුන් නිරත කරවන්න.
- අවශ්‍ය අවස්ථා වල දී උපදෙස් ලබා දෙන්න.

මිනිත්තු 25යි

පියවර 7.6.3 :

- දඹදෙණිය රාජධානිය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමට කාල පරිච්ඡේද 1 ද, යාපහුව හා කුරුණෑගල රාජධානි සඳහා කාල පරිච්ඡේද එකක් ද, ගම්පොළ හා යාපන රාජධානි සඳහා එක් කාල පරිච්ඡේදයක් ද කොට්ටේ රාජධානිය සඳහා එක් කාල පරිච්ඡේදයක් ද යොදා ගන්න.
- එක් එක් කණ්ඩායමට තම ක්‍රියාකාරකම ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම් වලට ද එම ක්‍රියාකාරකම පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම ඇසුරින් සිසු දුබලතා හා ප්‍රබලතා හඳුනා ගන්න.
- රාජධානි සියල්ල පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීමෙන් පසුව පහත සඳහන් කරුණු ද ඉස්මතු වන ලෙස සමස්ථ ක්‍රියාකාරකම සමාලෝචනය කරන්න.
- සිසුන් ඉදිරිපත් කළ නිර්මාණ පන්තියෙහි ප්‍රදර්ශනය කර, එම තොරතුරු සටහන් කර ගැනීමට සිසුන් යොමු කරවන්න.

- සිංහල රාජධානිය රජරට සිට තෙත් කලාපය දක්වා විතැන් වූ බව.
- සිංහල රාජධානිය නිරිත දිගට විතැන් වීමට විවිධ හේතු සාධක බලපෑ බව.
- දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොළ හා කෝට්ටේ යනුවෙන් පැවති මෙකී රාජධානි වල පැවති රාජධානි කාලය කෙටි බව.
- රාජධානි පැවති කාලය කෙටි වුවද ලංකා ඉතිහාසයේ වැදගත් සිදුවීම් රැසක් මෙකල ද සිදු වූ බව

- දුෂ්කර සමයන්හි දී දුර්ගස්ථානයන්හි රැඳී සිටිමින් රජවරු සිංහල රාජධානිය රැක ගැනීමට උත්සාහ ගත් බව
- මෙකී රජවරුන්ගේ නොමඳ කැපවීම නිසා සමාජ, ආර්ථික හා සංස්කෘතික දියුණුවක් ද ඇති වූ බව
- යාපනය ස්වාධීන රාජ්‍යයක් ලෙස නැගී ආ බව

මිනිත්තු 160යි

තක්සේරුව හා ඇගයීම

- සිංහල රාජධානිය නිරිත දිගට විතැන් වූ අයුරු විස්තර කරයි.
- එක් එක් රාජධානි සතුරු ආක්‍රමණයන් මුදා ගත් ආකාරය අගය කරයි.
- තොරතුරු පත්‍රිකාවේ ඇති තොරතුරු ඇසුරින් රාජධානි විතැන්වීම පිළිබඳ කරුණු ගොනු කරයි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් මගින් තොරතුරු රැස් කිරීමේ යෙදෙයි.
- එක් රැස් කළ කරුණු විස්තර කරයි.

පසුවැඩ :- සිංහල රාජධානිය නිරිතදිග විතැන් වූ සමයේ රාජ්‍ය පාලනය ගෙන ගිය රජ කෙනෙකු තෝරා ගෙන ඔහු පිළිබඳ වාර්තාවක් පිළියෙළ කරන්න.


ඇමුණුම 7.6.1.1







ඇමුණුම 7.6.1.2



ඇමුණුම 7.6.1.3

## ශිෂ්‍ය තොරතුරු පත්‍රිකාව

දෙවැනි පරාක්‍රමබාහු - සංදේශ සාහිත්‍යය ආරම්භය. ගම්පොළ - චන්ද්‍රභානු ආක්‍රමණය ; සපුමල් කුමරු යවා යාපනය රාජ්‍යය කෝට්ටේ රාජධානියට ඈඳා ගැනීම ආර්ය චක්‍රවර්තී පලවා හැරීම නිශ්ශංක අලගක්කෝනාර සෙනවියා - දඹදෙණිය - දන්ත ධාතුව පාණ්ඩ්‍ය දේශයට ගෙනයාම - කාලිංග මාඝ පලවා හැරීම - සංදේශ සාහිත්‍යයේ ස්වර්ණමය යුගය - තුන්වන විජයබාහු - ජෝතිය සිටානන් පරදවා උඩරට රාජධානිය කෝට්ටේ ට ඈඳා ගැනීම - කෝට්ටේ බලකොටුව ඉදි කිරීම - පළමුවන බුවනෙකබාහු - සිරිවර්ධන ප්‍රතිරාජ සෙනවියා සෙංකඩගල නගරය ඉදි කිරීම - අස්ගිරි සේනාසනය පිහිටුවීම - හතරවන පරාක්‍රමබාහු - චෙං හෝ සෙනෙවියා ලංකාව ආක්‍රමණය කිරීම - බෝදා මාපානන්දඃ නැමැත්තෙකු කැරැල්ලක් ඇති කිරීම - දෙවැනි බුවනෙකබාහු - සෙනෙවිවරුන් රාජ්‍ය පාලන කටයුතු වලදී පෙරමුණ ගැනීම - සේනාධිලංකාර සෙනෙවියා - බෙලිගල දළදා මාලිගයක් කරවා දළදාව තැන්පත් කිරීම - කුරුණෑගල - සයවන පරාක්‍රමබාහු - කාලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත නාමය දැරීම - හතරවන බුවනෙකබාහු - ආර්ය චක්‍රවර්තී ලංකාවේ බටහිර වෙරළබඩ තොටුපොල වලින් බදු රැස් කිරීම - තුන්වන වික්‍රමබාහු - දඹදෙණි කතිකාවත පිළියෙළ කිරීම - පස්වන බුවනෙකබාහු - ලංකාව අවසන් වරට එක් සේසත් කළ පාලකයා වීම - ආර්ය චක්‍රවර්තී පරපුර මගින් පාලනය වීම - පණ්ඩිත පරාක්‍රමබාහු නමින් හැඳින්වීම - 13 සියවසේ ආරම්භ වූ රාජ්‍යයක් වීම - නල්ලූර් නගරය අගනුවර ලෙස භාවිතා කිරීම - තුන්වන වික්‍රමබාහු රජ සමයේ ගම්පොළ රාජධානිය ආක්‍රමණය කිරීම - දඹදෙණිය දළදා ප්‍රදර්ශනයක් පැවැත්වීම - පාණ්ඩ්‍ය දේශයෙන් ආධාර ලබා ගැනීම - 1344 දී ඉබන් බතූතා ලංකාවේ සංචාරය කිරීම - වීර අලකේශ්වර සිරකරුවෙකු ලෙස චීනයට ගෙනයාම.

ඇමුණුම 7.6.1.4

## ශිෂ්‍ය පැවරුම් පත්‍රිකාව

පැවරුම - 1

- සපයා ඇති ශිෂ්‍ය තොරතුරු පත්‍රිකාව හා පෙළපොත හොඳින් අධ්‍යයනය කරන්න.
- සපයා ඇති තොරතුරු පත්‍රිකාවේ ලංකාවේ රාජධානි හා ඒවායේ රජවරුන් පිළිබඳ විවිධ තොරතුරු අඩංගු වේ.
- ඒ අතරින් ගැලපෙන තොරතුරු පමණක් තෝරාගෙන දඹදෙණි රාජධානිය පිළිබඳ පහත සඳහන් කරුණු අඩංගු තොරතුරු පත්‍රිකාවක් පිළියෙල කරන්න.
    * රාජධානිය
    * ආරම්භක පාලකයා
    * ශ්‍රේෂ්ඨතම පාලකයා
    * දේශපාලනික වශයෙන් වැදගත් සිදුවීම්

පැවරුම - 2

- සපයා ඇති ශිෂ්‍ය තොරතුරු පත්‍රිකාව හා පෙළපොත හොඳින් අධ්‍යයනය කරන්න.
- සපයා ඇති තොරතුරු පත්‍රිකාවේ ලංකාවේ රාජධානි හා ඒවායේ රජවරුන් පිළිබඳ විවිධ තොරතුරු අඩංගු වේ.
- ඉන් ගැලපෙන තොරතුරු පමණක් තෝරා ගෙන යාපහුව හා කුරුණෑගල රාජධානි පිළිබඳ පහත සඳහන් කරුණු අඩංගු තොරතුරු පත්‍රිකාවක් පිළියෙල කරන්න.
    * රාජධානිය
    * ආරම්භක පාලකයා
    * ශ්‍රේෂ්ඨතම පාලකයා
    * දේශපාලනික වශයෙන් වැදගත් සිදුවීම්

පැවරුම - 3

- සපයා ඇති ශිෂ්‍ය තොරතුරු පත්‍රිකාව හා පෙළපොත හොඳින් අධ්‍යයනය කරන්න.
- සපයා ඇති තොරතුරු පත්‍රිකාවේ ලංකාවේ රාජධානි හා ඒවායේ රජවරුන් පිළිබඳ විවිධ තොරතුරු අඩංගු වේ.
- ඉන් ගැලපෙන තොරතුරු පමණක් තෝරාගෙන ගම්පොළ හා යාපනය රාජධානි පිළිබඳ පහත සඳහන් කරුණු අඩංගු තොරතුරු පත්‍රිකාවක් පිළියෙල කරන්න.
    * රාජධානිය
    * ආරම්භක පාලකයා
    * ශ්‍රේෂ්ඨතම පාලකයා
    * දේශපාලනික වශයෙන් වැදගත් සිදුවීම්

පැවරුම - 4

- සපයා ඇති ශිෂ්‍ය තොරතුරු පත්‍රිකාව හා පෙළපොත හොඳින් අධ්‍යයනය කරන්න.
- සපයා ඇති තොරතුරු පත්‍රිකාවේ ලංකාවේ රාජධානී හා ඒවායේ රජවරුන් පිළිබඳ විවිධ තොරතුරු අඩංගු වේ.
- ඉන් ගැලපෙන තොරතුරු පමණක් තෝරාගෙන කෝට්ටේ රාජධානිය පිළිබඳ පහත සඳහන් කරුණු අඩංගු තොරතුරු පත්‍රිකාවක් පිළියෙල කරන්න.
    - * රාජධානිය
    - * ආරම්භක පාලකයා
    - * ශ්‍රේෂ්ඨතම පාලකයා
    - * දේශපාලනික වශයෙන් වැදගත් සිදුවීම්

# ක්‍රියාකාරකම 7.6.2

නිපුණතා මට්ටම : • දහතුනවන සියවසේ සිට පහළොස්වන සියවස දක්වා ශ්‍රී ලංකාවේ ජීවන රටාව, ආගමික හා සාහිත්‍ය කටයුතු පිළිබඳ තොරතුරු විග්‍රහ කරයි.

ක්‍රියාකාරකම : දඹදෙණිය යුගයෙන් ඇරඹී කොට්ටේ යුගය දක්වා වර්ධනය වූ ආර්ථික ආගමික හා සාහිත්‍ය ඉතිහාසය විමසා බලමු.

කාලය : කාලච්ඡේද 7

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම අංක 7.6.2.1. - ගුත්තිල කාව්‍යයෙන් හා ලෝ වැඩ සඟරාවෙන් උපුටාගත් කවි දෙකක්
- ඇමුණුම අංක 7.6.2.2 - ශිෂ්‍ය කාර්ය පත්‍රිකාව
- පෙළ පොත

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.6.2.1 :
- ඇමුණුම 7.6.2.1 හි දැක්වෙන පද්‍ය සිසුවකු ලවා පන්තිය ඉදිරියේ ගායනා කරවන්න. ( ඒ සඳහා පළමුව සිසුවෙකු සූදානම් කරගන්න)
- මෙම කවි උපුටා ගත්තේ කුමන ග්‍රන්ථවලින් ද ?
- එම ග්‍රන්ථ රචනා කළ යුගය කුමක් ද?
- යනා දී ප්‍රශ්න විමසමින් පාඩමට පිවිසෙන්න. පහත සඳහන් කරුණු ඉස්මතු වන අයුරින් සාකච්ඡාව මෙහෙයවන්න.

- පොළොන්නරු රාජධානිය බිඳවැටීමෙන් පසු දුර්ගස්ථානයන්හි පිහිටි දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොළ හා කෝට්ටේ දක්වා සිංහල රාජධානිය විතැන් වූ බව.
- මෙම රාජධානි කෙටි කාලයක් පැවති බව.
- රාජධානි පැවති කාලය කෙටි වුවද රජවරුන් ආගමික හා සාහිත්‍ය සේවාවන්හි යෙදුනු බව.
- සිංහල රාජධානිය රජරට සිට නිරිත දිගට විතැන් වීමේ දී අර්ථ ක්‍රමයෙහි ද වෙනස්කම් ඇති වූ බව.
- දේශපාලන ස්ථාවරත්වය ආගමික හා සාහිත්‍ය සංවර්ධනයෙහි ලා දායක වූ බව

මිනිත්තු 15යි

පියවර 7.6.2.2 :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් වලට බෙදන්න.
- ක්‍රියාකාරකම පිළිබඳව සිසුන් දැනුවත් කරන්න.
- අදාළ පොතපත සපයා ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- ඇමුණුම 7.6.1.2 කණ්ඩායම් පැවරුම් පත්‍රිකාව කණ්ඩායමකට එක බැගින් බෙදා දෙන්න.
- කණ්ඩායමට පැවරී ඇති ක්‍රියාකාරකම් හි සිසුන් නිරත කරවන්න.
- අවශ්‍ය අවස්ථාවන්හි දී සිසුනට උපදෙස් ලබා දෙන්න.

මිනිත්තු 25 යි

පියවර 7.6.2.3 :

- එක් රාජධානී සමයක් සඳහා එක් කාල පරිච්ඡේදයක් පමණ යොදා ගැනීම ප්‍රමාණවත් වේ.
- එක් එක් කණ්ඩායමට තම තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඉදිරිපත් කරනු ලබන තොරතුරු පිළිබඳ ව අදහස් දැක්වීමට අනෙක් කණ්ඩායම් වලට ද අවස්ථාව සලසා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් ඇසුරින් ශිෂ්‍ය දුබලතා ප්‍රබලතා හඳුනා ගන්න.
- රාජධානී සියල්ල පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමෙන් පසු පහත සඳහන් කරුණු ද ඉස්මතු වන ලෙස සමස්ථ ක්‍රියාකාරකම සමාලෝචනය කරන්න.

- සිංහල රාජධානිය රජරට සිට නිරිත දිගට විතැන් වූ බව.
- විවිධ හේතු මුල් කොට ගෙන රාජධානි විතැන් වීම සිදුවන අතර ආරක්ෂක ස්ථාන තම රාජධානි ලෙස තෝරා ගත් බව.
- රාජධානිය නිරිත දිගට විතැන් වීමේ දී ආර්ථික කටයුතු අතර වෙළෙඳාමට වැදගත් තැනක් ලැබුණු බව.
- ආගමික දියුණුව සමඟ සාහිත්‍ය දියුණුව සිදු වූ බව.
- ආගමික හා සාහිත්‍ය දියුණුවට රාජානුග්‍රහය ලැබුණු බව.
- තුන්වන විජයබාහු, දෙවැනි පරාක්‍රමබාහු, හතරවැනි පරාක්‍රබාහු, සේනාධිලංකාර සෙනවියා, අලගක්කෝනාර සෙනවියා, සයවැනි පරාක්‍රමබාහු යන අය මෙකී ආගමික සාහිත්‍ය සේවාවේ කැපී පෙනෙන මෙහෙයක් ඉටු කළ බව.
- මෙකල ලියවුණු පොතපතේ ශ්‍රී ලාංකික අනන්‍යතාව ප්‍රකට වන බව

මිනිත්තු 240යි

තක්සේරුව හා ඇගයීම

- සිංහල රාජධානිය නිරිත දිගට විතැන් වීම සමග ආර්ථික කටයුතු වෙනස් වූ අයුරු විස්තර කරයි.
- මෙකල සිදු වූ ආගමික සේවාව අගය කරමින් කථා කරයි.
- රාජධානි විතැන් වීම සහ එහි ආර්ථික, ආගමික තොරතුරු ගොනුවක් සකසයි.
- අවශ්‍ය අවස්ථාවන්හිදී ඉදිරිපත් වී කටයුතු කරයි.
- සමූහයක් වශයෙන් එක්ව වැඩ කිරීමට හුරුවේ.

පසුවැඩ :-

- සිංහල රාජධානිය නිරිත දිගට විතැන්ව ගිය ආකාරය පිළිබඳ පාසල් බිත්ති පුවත්පතට ලිපියක් සකසන්න.
- සිංහල රාජධානිය නිරිත දිගට විතැන් වූ සමය පිළිබඳ ව පින්තූර එකතුවක් සකසන්න.

ඇමුණුම - 7.6.2.1

රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙලදිදි විදුලිය පබා
රන් රසේ එක්වන ලෙසේ වෙණ නාදනු පා තබ තබා
කම්පසේ දෙන සැරලෙසේ දෙස බලා බලා නෙතගින් සබා
මම් කෙසේ පවසම් එසේ වර සුර ලඳුන් දුන් රඟ සොබා

පුන්මදාරා මල්දමින් මුදු දිගු සුනිල් වරලස ගොතා
මන්මදා කිතු ලිය ලෙසින් උරතුර සරා දිලි මුතු ලතා
මන් මදා වන මිණි මෙවුල් නද වෙන නදින් එක්කොට ඉතා
උන්එදා දුන් රඟ දුටොත් තව සක් සැපත් කවරෙක් පතා

ගුත්තිල කාව්‍යය -

කලකිනි බුදු කෙනෙකුන් උපදින්නේ
දුකකිනි මිනිසත් බව ලැබ ගන්නේ
මෙදෙකිනි මෙසසර දුක් දුරලන්නේ
සුදනෙනි කිම වීරිය නොකරන්නේ

- ලෝ වැඩ සඟරාව -

ඇමුණුම 7.6.1.2 -ශිෂ්‍ය කාර්ය පත්‍රිකාව

ඔබට පැවරෙන කාර්ය වනනේ පහත දැක්වෙන වගුව සම්පූර්ණ කිරීමය.

දඹදෙණි යුගයේ සිට කෝට්ටේ යුගය දක්වා ආර්ථික හා සාහිත්‍ය තොරතුරු

| සාධකය | දඹදෙණි රාජධානිය | යාපහුව රාජධානිය | කුරුණෑගල රාජධානිය | ගම්පල රාජධානිය | කෝට්ටේ රාජධානිය |
|---|---|---|---|---|---|
| ආර්ථික කටයුතු | | | | | |
| ආගමික සේවාව | | | | | |
| ඉදිකළ ආගමික ගොඩනැගිලි | | | | | |
| රචිත ග්‍රන්ථ | | | | | |

# තුන්වන කොටස

# තක්සේරුව හා ඇගයීම

# තක්සේරුව හා ඇගයීම

## හැඳින්වීම

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය මගින් අපේක්ෂිත ඉගෙනුම් ඵල සිසුන් විසින් සාක්ෂාත් කර ගැනීම තහවුරු කිරීම සඳහාත් සිසුන් ළඟා කරගත් ප්‍රවීණතා මට්ටම් හඳුනා ගැනීම සඳහාත් පන්ති කාමරයේ පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි අන්තර් සම්බන්ධතාවකින් යුත් වැඩ සටහන් දෙකක් ලෙස තක්සේරුව හා ඇගයීම හඳුන්වා දිය හැකි ය. තක්සේරුව නිසි පරිදි සිදුවන්නේ නම් පන්තියේ ඉගෙනුම ලබන සිසුන්ට අපේක්ෂිත නිපුනතාවන්ට අදාළ ආසන්න ප්‍රවීණතාවවත් ලබා ගැනීම අපහසු නොවේ. ඇගයීමෙන් අපේක්ෂා කරන්නේ සිසුන් ළඟා කරගත් ප්‍රවීණතා මට්ටම් කවරේදැයි හඳුනා ගැනීමට ය.

තක්සේරුවෙහි යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වයක් ලබාදිය හැකි ය. එම මාර්ගෝපදේශක පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back ) හා ඉදිරි පෝෂණය (Feed Forward ) යනුවෙනි. සිසුන්ගේ දුබලතා හා නොහැකියා අනාවරණය කර ගත් විට ඔවුන්ගේ ඉගෙනුම් ගැටලු මඟ හරවා ගැනීමට ප්‍රතිපෝෂණයත් සිසු හැකියා සහ ප්‍රබලතා හඳුාගත් විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයක් ලබා දීම ගුරු කාර්යය වේ.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා විෂයයේ නිපුණතා අතුරෙන් කවර නිපුණතා කවර මට්ටමින් සාක්ෂාත් කළ හැකි වූයේදැයි සිසුන් විසින් හඳුනා ගැනීම අවශ්‍ය වේ. ඇගයීම වැඩපිළිවෙල සිසු සාර්ථකත්වය මට්ටම් ඔස්සේ සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් විනිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර සිසුන් හා දෙමාපියන් ඇතුලු අදාළ පාර්ශවයන්ට සිසු ප්‍රගතිය සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමු විය යුතු වේ.

ඔබ වෙත ඉදිරිපත් කරන මෙම විෂය මාලාව ශිෂ්‍ය කේන්ද්‍රීය (Student-Centred ) නිපුණතා පාදක (Competency - Based ) ක්‍රියාකාරකම් දිශාභිමුඛ ( Activity Oriented ) කර ගත් ප්‍රවේශයකින් යුක්ත වේ. ජීවිතය අර්ථවත් කර ගැනීම සඳහා ක්‍රියාවෙන් ඉගෙනුම,ගුරුවරයාගේ පරිනාමන භූමිකාවේ (Transformation Role ) හරය වේ.

පූර්වයෙන් සංවර්ධනය කළ ක්‍රියාකාරකම් සමුහයක් ඔස්සේ ක්‍රියාත්මක වන මෙම විෂය මාලාවේ ඉගෙනුම් හා ඉගැන්වීම්, තක්සේරුව හා ඇගයීම සමඟ සමෝධානය කිරීමට උත්සාහ දරා ඇත. ඒ ඒ ක්‍රියාකාරකම්වල දෙවැනි පියවරේද සිසුන් කණ්ඩායම් වශයෙන් ගවේෂණයේ යෙදෙන විට ඔවුන් තක්සේරු කිරීමටත්, ක්‍රියාකාරකම්වල තුන්වැනි පියවරේ දී සිසුන් ස්වකීය අනාවැකි ඉදිරිපත් කිරීමට හා විස්තාරණයට යොමු වන විට ඔවුන් ඇගයීමටත් ගුරුවරයාට හැකි වේ. සිසුන් ගවේෂණයේ යෙදෙන විට සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටු කරන කාර්යය නිරීක්ෂණය කරමින් සිසුන් මුහුණ පා ඇති ගැටලු පන්ති කාමරය තුළ දී විසදා ගැනීම පහසුකම් සහ මාර්ගෝපදේශකත්වය සපයා දීම ගුරුවරයාගෙන් අපේක්ෂා කරන කාර්ය වේ.

තක්සේරුව හා ඇගයීම් පහසුවෙන් සිදු කළ හැකි වන පරිදි පොදු නිර්ණායක පහක් යෝජනා කෙරේ. මෙම නිර්ණායක අතරෙන් පළමු නිර්ණායක තුන ඒ ඒ නිපුණතාව ගොඩ නැගීමට ඒකරාශී වී තබෙන දැනුම කුසලතා හා ආකල්ප මූලික කොටගෙන සැකසී ඇත. අවසාන නිර්ණායක දෙක ජීවිතයට වැදගත් වන හැකියා දෙකක් ප්‍රගුණ කර ගැනීමට සිසුන්ට උපකාරී වේ. මේ නිර්ණායක හා සම්බන්ධ චර්යා වෙනස්කම් පහ පන්තිකාමරය තුළ දී සිසුන් ක්‍රියාත්මක වීමේ දී හඳුනා ගැනීමට ගුරුවරයා උත්සාහ කළ යුතු අතර තක්සේරුව යටතේ එම චර්යා ශක්තිමත් කිරීමත් ඇගයීම යටතේ ඒවා ප්‍රමාණය කිරීමටත් ගුරුවරයා යොමු විය යුතු ය.

ඇගයීම් වැඩ පිළිවෙල වැඩි දියුණු කිරීමෙන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පුළුල් කළ හැකිය. ඒ සඳහා ක්‍රියාකාරකම් සන්නතිය ( Activity Continium) ඔස්සේ ඇගයීම් කිහිපයක් ඇති කිරීමට ගුරුවරයාට අවස්ථාව ඇත. ඇගයීම් ලක්ෂණ (Evaluation Points ) හඳුනා ගැනීමට පහසු වන පරිදි ක්‍රියාකාරකම් සන්නතිය පොකුරු ක්‍රියාකාරකම් (Activity Cluster ) කිහිපයකට වෙන් කිරීමෙන් ඇගයීම් වැඩ පිළිවෙල අර්ථවත් කළ හැකි ය. සෑම ක්‍රියාකාරකම් පොකුරක් ආරම්භයේ දී ඒ ඒ ක්‍රියාකාරකම සඳහා යොදා ගන්නා ඇගයීම් උපකරණ කවරේදැයි සිසුන්ට හඳුන්වා දීම අවශ්‍ය වේ. ඇගයීම් ප්‍රභේද තෝරා ගැනීමේ දී සිසු ඉගෙනුම් පෙළඹවීම විකසිත කරවන ප්‍රබෝධාත්මක ක්‍රියාකාරකම් යොදා ගැනීම අත්‍යවශ්‍ය වේ. මීට අදාළ ක්‍රියාකාරකම් ලැයිස්තුව මතු දැක්වේ.

සංකල්ප සිතියම ( Concept Maps )
බිත්ති පුවත්පත් (Wall News Papers )
ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන් (Quizzes )
ප්‍රශ්න සහ පිළිතුරු පොත් ( Question and aswer Books)
ශිෂ්‍ය කාර්ය සාධන ගොනු (Portfolios )
සිසු නිර්මාණ ප්‍රදර්ශන (Exihibitions )
විවාද (Debates )
සාකච්ඡා මණ්ඩල (Panel Discussions )
සම්මන්ත්‍රණ ( Seminars)
ක්ෂණික කථා (Impromitu speeches )
භූමිකා රංග (Role Plays )
සාහිත්‍ය විසුම් ඉදිරිපත් කිරීම (Presentation of Literature Reviews )
ක්ෂේත්‍ර පොත් ස්වභාව අධ්‍යයන දින පොත්, හොඳ වැඩ පොත්
ප්‍රායෝගික පර්යේෂණ

පාඨ මාර්ගයේ තුන්වන කොටස යෝජක ඇගයීම් ලක්ෂයක් ඒ සඳහා තෝරාගෙන ඇති ඇගයීම් උපකරණය හඳුන්වා දීමට සැලසුම් කර තිබේ. මේ ආකාරයට ක්‍රියාකාරකම් තුළත් ඒවා අතරත් ඇගයීම දෙයාකාරයකින් සිදු කිරීමෙන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තව දුරටත් පුලුල් වන අතර කැමැත්තෙන් හා ප්‍රබෝධයෙන් ඉගෙනුමෙහි නියැලීමට සිසුන්ට හැකි වේ. මීට අමතරව පන්ති කාමරය තුළ ලිඛිත පරීක්ෂණ ව්‍යාපෘති වැඩ ආදිය හා වසර අවසානයේ පවත්වන පාසල් මට්ටමේ හෝ කලාපීය මට්ටමේ ලිඛිත. පරීක්ෂණයකට සිසුන් ඉදිරිපත් කළ හැකි ය.
එමෙන් ම වාර අවසානයේ ඇගයීම සඳහා සපයා ඇති ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය දීර්ඝ කිරීමේ උපකරණ භාවිත කරන්න.

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය දීර්ඝ කිරීමේ උපකරණය

ශ්‍රේණිය - 7

0.1 ඇගයීම් අවස්ථාව - වාරය 01
- උපකරණය 01

0.2 ආවරණය කරන නිපුණතා මට්ටම් -

- සරුපස, තැනිතලා බිම් හා ජල පහසුව යන කෘෂිකර්මයට හිතකර හේතු අරමුණු කර ගනිමින් මුල් පදිංචිය සඳහා ගංගා නිම්න තෝරා ගත් ආකාරය විමර්ශනය කරයි.
- පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාරයන්හි ව්‍යාප්තිය හා සම්බන්ධ ඓතිහාසික තොරතුරු ඇසුරින් සිතියම් ලකුණු කිරීමේ හැකියාව වර්ධනය කර ගනියි.
- පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාරයන්හි සුවිශේෂ ලක්ෂණ විමසා බලයි.
- ගංගා නිම්න ශිෂ්ටාචාර වලින් පසුකාලීන ශිෂ්ටාචාරයට ලැබුණු දායාද පිළිබඳ අධ්‍යයනය කර ඒවා තවදුරටත් පෝෂණය කිරීමට දායක වෙයි.
- ග්‍රීක හා රෝම ශිෂ්ටාචාර පිළිබඳ විමසා බලයි.
- ඉන්දියානු ශිෂ්ටාචරයේ කැපී පෙනෙන ලක්ෂණ විමර්ශනය කරයි
- අරාබි ශිෂ්ටාචාරයේ ආරම්භයේ සිට ව්‍යාප්තිය දක්වා කැපී පෙනෙන ලක්ෂණ විමර්ශනය කරයි

3.0 ආවරණය වන විෂය සන්ධාරය - 7.1, 7.2

4.0 උපකරණයේ ස්වභාවය - ප්‍රදර්ශන පුවරුව සඳහා සුදුසු පත්‍රිකාවක් සැකසීම

5.0 උපකරණයේ අරමුණු -

- ගංගාශ්‍රිත ශිෂ්ටාචාරයන්හි ආරම්භය ව්‍යාප්තිය යන ලක්ෂණ පිළිබඳ තොරතුරු රැස් කිරීමට යොමු කිරීම.
- ග්‍රීක, රෝම, ඉන්දියානු හා අරාබි ශිෂ්ටාචාරයන්හි කැපී පෙනෙන ලක්ෂණ පිළිබඳ අධ්‍යයනයට යොමු කිරීම.

6.0 උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්

<u>ගුරු උපදෙස්</u> :-

- ක්‍රියාකාරකම හා එහි අරමුණු පිළිබඳව සිසුන් දැනුවත් කරන්න.
- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- එක් එක් කණ්ඩායමට අදාළ මාතෘකා බෙදා දෙන්න

I කණ්ඩායම - මෙසපොතේමියා හා මිසර ශිෂ්ටාචාරය
- පිහිටීම හා ව්‍යාප්තිය
- පාලන ක්‍රමය
- ආර්ථික කටයුතු
- ආගමික ඇදහිලි හා විශ්වාස
- සංස්කෘතිය

II කන්ඩායම - ඉන්දු නිම්න හා හොවැංහෝ ශිෂ්ටාචාර
- පිහිටීම හා ව්‍යාප්තිය
- පාලන ක්‍රමය
- ආර්ථික කටයුතු
- ආගමික ඇදහිලි හා විශ්වාස
- සංස්කෘතිය

III කණ්ඩායම - ග්‍රීසිය හා රෝමය
- පාලන ක්‍රමය
- ආර්ථික කටයුතු
- ආගමික චින්තනය
- කලාව හා ජන ජීවිතය

IV කණ්ඩායම - ඉන්දියාව හා ආරාබිය
- පාලන ක්‍රමය
- ආර්ථික කටයුතු
- ආගමික චින්තනය
- කලාව හා ජන ජීවිතය

- එක් එක් කණ්ඩායමට බෙදා දෙන ලද මාතෘකාව පිළිබඳව තොරතුරු සපයා ගත හැකි මූලාශ්‍ර පිළිබඳව සිසුන් දැනුවත් කරන්න.
- තම කණ්ඩායමට ලැබුණු මාතෘකාව පිළිබඳව ප්‍රදර්ශන පුවරුවෙහි ප්‍රදර්ශනය කිරීමට සුදුසු නිර්මාණාත්මක පත්‍රිකාවක් සැපයීමට උපදෙස් දෙන්න.
- ඇගයීම් නිර්ණායක මත කණ්ඩායම් ක්‍රියාකාරකම ඇගයීමට ලක් කරන්න.

<u>සිසු උපදෙස්</u> :-

- ගුරුතුමාගේ/ගුරුතුමියගේ උපදෙස් පරිදි තම කණ්ඩායමට ලැබුණු මාතෘකාව පිළිබඳ අදාළ මූලාශ්‍ර ඇසුරින් තොරතුරු රැස් කරන්න.
- ප්‍රදර්ශණ පුවරුවෙහි ප්‍රදර්ශනය කළ හැකි ප්‍රමාණයේ කඩදාසියක ප්‍රදර්ශණ පත්‍රිකාව නිර්මාණය කරන්න.
- සුදුසු පරිදි සිතියම් හා පින්තූර යොදා පත්‍රිකාව නිර්මාණාත්මකව නිමවන්න.
- තම කණ්ඩාමයෙහි නිර්මාණය පන්තියට ඉදරිපත් කරන්න.
- පන්තියේ ප්‍රදර්ශන පුවරුවෙහි ඔබ කණ්ඩායමේ නිර්මාණය ප්‍රදර්ශනය කරන්න.

ඇගයීම් නිර්ණායක

- ඉදිරිපත් කරනු ලබන තොරතුරුවල නිවැරදි බව.
- ප්‍රමාණවත් බව
- තොරතුරු නිර්මාණශීලීව ඉදිරිපත් කිරීම.
- කණ්ඩායම ක්‍රියාකාරකම් සඳහා දක්වන ක්‍රියාකාරී සහභාගීත්වය
- පිරිසිදුකම හා සමස්ත නිමාව.

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය දීර්ඝ කිරීමේ උපකරණය

ශ්‍රේණිය - 07

1.0 ඇගයීම් අවස්ථාව - 2 වන වාරය
උපකරණය 02

2.0 ආවරණය කරන නිපුණතා මට්ටම

- ශ්‍රී ලංකාවට විවිධ බලපෑම් ඇති වූ දකුණු ඉන්දීය රාජ්‍යයන් පිළිබඳ තොරතුරු ඇසුරින් සිතියමක ලකුණු කිරීමේ හැකියාව දියුණු කර ගනියි.
- ශ්‍රී ලංකාව දකුණු ඉන්දීය රාජ්‍ය සමග පැවැත් වූ සම්බන්ධතාවල ස්වභාවය විමසා බලයි.
- අනුරාධපුර රාජධානියේ බිඳ වැටීමට දකුණු ඉන්දීය ආක්‍රමණ බලපෑ ආකාරය විග්‍රහ කරයි.
- ශ්‍රී ලංකාවේ චෝළ පාලනය ක්‍රියාත්මක වූ ආකාරය විමර්ශනය කරයි.
- පළමුවැනි විජයබාහු සහ මහා පරාක්‍රමබාහු රජවරුන්ගේ කාර්ය සාපල්‍යය විග්‍රහ කරයි.
- පොළොන්නරු යුගයේ අවසාන ශ්‍රේෂ්ඨ පාලකයා වශයෙන් නිශ්ශංකමල්ල රජතුමාගේ කාර්ය සාඵල්‍යය විග්‍රහ කරයි.
- රජරට ශිෂ්ටාචාරයේ පරිහානියට මාඝ ගේ ආක්‍රමණය බලපෑ අයුරු විමර්ශනය කරයි.

3.0 ආවරණය වන විෂය ක්ෂේත්‍රය
7.3.1, 7.3.2, 7.3.3, 7.4.1, 7.4.2, 7.4.3

4.0 උපකරණයේ ස්වභාවය
තොරතුරු ගොනුවක් සකස් කිරීම

5.0 උපකරණයේ අරමුණු

- අනුරාධපුර යුගයේ ශ්‍රී ලංකාවට බලපෑම් කළ දකුණු ඉන්දීය රාජ්‍ය සිතියමක හඳුනා ගැනීමට යොමු කිරීම.
- ශ්‍රී ලංකාව හා දකුණු ඉන්දීය රාජ්‍ය අතර පැවති සබඳතාවල ස්වභාවය අධ්‍යයනය කිරීමට යොමු කිරීම.
- අනුරාධපුර රාජධානියේ බිඳ වැටීමට දකුණු ඉන්දීය ආක්‍රමණ බලපෑ ආකාරය විමසා බැලීමට යොමු කිරීම.
- පළමුවැනි විජයබාහු, මහා පරාක්‍රමබාහු, නිශ්ශංකමල්ල යන රජවරුන්ගේ දේශපාලන ආර්ථික හා සංස්කෘතික සේවා අගැයීමට අවස්ථාව ලබා දීම.
- රජරට ශිෂ්ටාචාරයේ පරිහානිය කෙරෙහි මාඝ ආක්‍රමණය බලපෑ ආකාරය අවබෝධ කර ගැනීමට සිසුන් යොමු කිරීම.

උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා ගුරුවරයාට උපදෙස්

- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- තොරතුරු සපයා ගැනීමට ආධාර කර ගතහැකි මූලාශ්‍ර පිළිබඳ සිසුන් දැනුවත් කරන්න.
- එක් එක් කණ්ඩායමට මාතෘකා බෙදා දෙන්න. එම මාතෘකාවට අදාළව තොරතුරු රැස් කර නිර්මාණශීලීව වාර්තා කිරීමට උපදෙස් දෙන්න.

I කණ්ඩායම - ශ්‍රී ලංකාවට එල්ල වූ දකුණු ඉන්දීය ආක්‍රමණ හා අනුරපුර රාජධානිය බිඳ වැටීම

<u>අනු මාතෘකා</u>

- අනුරාධපුර යුගයේ ශ්‍රී ලංකාවට ආක්‍රමණ එල්ල කළ දකුණු ඉන්දීය රාජ්‍ය සිතියමක් ඇසුරෙන් දැක්වීම.
- දකුණු ඉන්දීය රාජ්‍ය සමග ඇති වූ සබඳතාවල ස්වරූපය
- දකුණු ඉන්දීය ආක්‍රමණ එල්ලවීමට තුඩු දුන් හේතු
- ආක්‍රමණ ඇති වූ අවස්ථා
- අනුරාධපුර රාජධානියේ බිඳ වැටීම

II කණ්ඩායම - පොළොන්නරු රාජධානිය

- මහා විජයබාහු රජතුමාගේ ළමා කාලය
  - දේශපාලන සේවා
  - ආගමික සේවා
  - ආර්ථික සේවා
  - විදේශ සබඳතා

III කණ්ඩායම - පළමුවන පරාක්‍රමබාහු රජතුමා

- ළමා කාලය
- දක්ඛිණ දේශයේ පාලකයා වීම
- රජරට පාලකයා වීම
- දේශපාලන සේවා
- ආර්ථික සේවා
- ආගමික සේවා
- විදේශ සබඳතා

IV කණ්ඩායම - නිශ්ශංකමල්ල රජතුමා

- දේශපාලන සේවා
- ආගමික හා ආර්ථික සේවා
- විදේශ සබඳතා

- මාඝ ආක්‍රමණය හා එහි ස්වභාවය
- මාඝ ආක්‍රමණයේ ප්‍රතිඵල

- එක් එක් කන්ඩායම රැස්කළ තොරතුරු පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එක් එක් කණ්ඩායම ඉදිරිපත් කළ තොරතුරු පිළිබඳ අදහස් දැක්වීමට සෙසු කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.
- කණ්ඩායම් ඉදරිපත් කළ කරුණු මැනවින් සමාලෝචනය කරන්න.
- කණ්ඩායම් ඉදිරිපත් කළ තොරතුරු පත්‍රිකා එක් කර තොරතුරු ගොනුවක් සකස් කිරීමට උපදෙස් දෙන්න.
- අවශ්‍ය අවස්ථාවල ඉගෙනුම් මූලාශ්‍රයක් ලෙස තොරතුරු ගොනුව භාවිතයට ගන්නා ලෙස උපදෙස් දෙන්න.

<u>සිසුන්ට උපදෙස්</u>

- ගුරුතුමාගේ /ගුරුතුමියගේ උපදෙස් පරිදි ඔබ කණ්ඩායමට ලැබුණු මාතෘකාවට අදාළව තොරතුරු රැස් කර නිර්මාණශීලීව තොරතුරු පත්‍රිකා සකස් කරන්න.
- එය පන්තියට ඉදරිපත් කරන්න.
- සියලුම කණ්ඩායම්වල වාර්තා එක් කර තොරතුරු ගොනුවක් සකස් කරන්න.
- අවශ්‍ය අවස්ථාවල එය ඉගෙනුම් මූලාශ්‍රයක් ලෙස භාවිතයට ගන්න.

ඇගයීම් නිර්ණායක

1. තොරතුරුවල අදාළ බව
2. ප්‍රමාණවත් බව
3. නිර්මාණශීලීව ඉදිරිපත් කිරීම
4. කණ්ඩායම් වැඩවල උනන්දුවෙන් යුතුව යෙදීම
5. සමස්ත නිමාව.

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය දීර්ඝ කිරීමේ උපකරණය

ශ්‍රේණිය - 07

1.0 ඇගයීම් අවස්ථාව - 3 වන වාරය
උපකරණය 03

2.0 ආවරණය කරන නිපුණතා මට්ටම
- ක්‍රිස්තු ධර්මයේ ආරම්ය හා ව්‍යාප්තිය පිළිබඳ තොරතුරු විග්‍රහ කරයි.
- වැඩවසම් යුගයේ යුරෝපයේ පැවති දේශපාලන ආර්ථික හා සමාජ ව්‍යුහය පිළිබඳ විග්‍රහ කරයි.
- කුරුස යුද්ධ ආරම්භවීමට හේතු හා කුරුස යුද්ධවල ප්‍රතිඵල විග්‍රහ කරයි.
- ශ්‍රී ලංකාවේ රාජධානි විතැන් වීම කෙරෙහි බලපෑ හේතු සාධක විග්‍රහ කරයි.
- දහතුන්වන සියවසේ සිට පහළොස්වන සියවස දක්වා සිටි වැදගත් පාලකයන්ගේ දේශපාලන සේවාවන් විග්‍රහ කරයි .
- යාපන රාජ්‍යයේ ප්‍රධාන පාලකයන් පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි.

3.0 විෂය සන්ධාරය
7.5, 7.6

4.0 උපකරණයේ ස්වභාවය
- ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන

5.0 උපකරණයේ අරමුණු
- ක්‍රිස්තු ධර්මයේ ආරම්භය හා ව්‍යාප්තිය පිළිබඳ තොරතුරු අධ්‍යයනය කිරීම.
- වැඩවසම් යුගයේ යුරෝපයේ පැවති දේශපාලන ආර්ථික හා සමාජ ව්‍යුහය පිළිබඳ තොරතුරු සෙවීමට සිසුන් යොමු කිරීම.
- කුරුස යුද්ධවල ආරම්භය හා ප්‍රතිඵල පළිබඳ විමසා බැලීමට අවස්ථාව සලසා දීම.
- දහතුන්වන සියවසේ සිට පහළොස්වන සියවස දක්වා ශ්‍රී ලංකාවේ ඇති වූ දේශපාලන, ආගමික, හා සංස්කෘතික පසුබිම පිළිබඳ තොරතුරු විමර්ශනය කිරීම.

උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා ගුරුවරයාට උපදෙස්

- ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන පිළිබඳ සිසුන් දැනුවත් කරන්න.
- විෂය ඒකක 7.5 සහ 7.6 හොඳින් අධ්‍යයනයට සිසුන් යොමු කරන්න.
- සිතියම්, චිත්‍ර, ඡායාරූප ආදිය ඇසුරින් ප්‍රශ්න සකස් කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- ප්‍රශ්න සකස් කිරීම සඳහා සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.

I කණ්ඩායම - මධ්‍යකාලීන යුරෝපය
- ක්‍රිස්තු ධර්මයේ පැතිරීම
- වැඩවසම් ක්‍රමය
- කුරුස යුද්ධ

II කණ්ඩායම - දඹදෙණි යුගය
- ප්‍රධාන රජවරු
- වැදගත් සමාජ හා සංස්කෘතික තොරතුරු

III කණ්ඩායම - යාපහුව, කුරුණෑගල, ගම්පල රාජධානි
- වැදගත් රජවරු
- සමාජ සංස්කෘතික තොරතුරු

IV කණ්ඩායම - කෝට්ටේ රාජධානිය
- වැදගත් රජවරු
- සමාජ සංස්කෘතික තොරතුරු

- එක් එක් කණ්ඩායම විසින් සකස් කර ගෙන ආ යුතු ප්‍රශ්න සංඛ්‍යාව සිසුනට දැනුම් දෙන්න.
- ප්‍රශ්න සකස් කර ගෙන ආ යුතු දිනය දැනුම් දෙන්න.
- සකස් කළ ප්‍රශ්න කියවා අවශ්‍ය සංස්කරණයන් කරන්න.
- සෑම ශිෂ්‍යයෙකුටම මෙම වැඩ සටහනෙන් ආවරණය වන විෂය ක්ෂේත්‍ර හොඳින් අධ්‍යයනය කර වැඩ සටහනට සහභාගීවීමට සූදානම්වන ලෙස දැනුම් දෙන්න.
- නියමිත දින වැඩ සටහන පැවැත්වීමට අවශ්‍ය කටයුතු සංවිධානය කර ගන්න.
- සිසුන්ගේ මෙහෙයවීමෙන් ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන පවත්වන්න.
- ප්‍රශ්න සඳහා සිසුන් දෙන වැරදි පිළිතුරු වෙතොත් ඒවා නිවැරදි කරන්න.
- සුදුසු පරිදි ලකුණු පවරන්න.

<u>සිසුන්ට උපදෙස්</u>

- ගුරුතුමාගේ /ගුරුතුමියගේ උපදෙස් පරිදි තම කණ්ඩායමට ලැබුණු ඒකකවලට අදාළව නියමිත ප්‍රශ්න සංඛ්‍යාව සකස් කරන්න.
- 7.5 හා 7.6 ඒකක මැනවින් අධ්‍යයනය කර ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සූදානම් වන්න.
- වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට සහාය වන්න.

ඇගයීම් නිර්ණායක

1. සකසා ගත් ප්‍රශ්න වල අදාළ බව
2. නිර්මාණශීලීව ප්‍රශ්න සැකසීම
3. සහභාගීත්වය
4. කණ්ඩායම් වැඩ සඳහා දක්වන උනන්දුව
5. ජය පරාජය භාර ගැනීම